එම්. ඉලීන් වයි. සෙගාල්

මිනිසා යෝධයකු වූයේ කෙසේද

පටුන

මිනිසා යෝධයෙකි 6

පළමුවැනි පරිච්ඡේදය

අදිසි සිර මැදිරිය 7
වන මැදින් චාරිකාවක් 8
වන සිරකරුවෝ 9
මාළු කෙසේ වෙරළට ආවෝ ද? . . 11
නිශ්ශබ්ද සාක්කිකරුවෝ . . . 14
මිනිසා සිය නිදහසට මහ තනා ගනී 17
අපේ මුතුන් මිත්තන් හමුව . . . 20

දෙවැනි පරිච්ඡේදය

අපේ වීරයාගේ ආත්තම්මා හා මස්සිනා වරු 23
විමපන්සියකුට මිනිසකු විය හැකි ද? 24
අපේ වීරයා ඇවිදින්නට උගනී . . 27
මිනිසාගේ දෙපා, ඔහුගේ අත් වැඩ කිරීමට මුදා හැරියේ කෙසේ ද? . . 28
අපේ වීරයා මිහි තලයට බසී . . . 29
ගිලිහුණු පුරුක 32

තුන්වැනි පරිච්ඡේදය

මිනිසා නිති කඩයි 39
මිනිස් අතින් සටහන් වුණු සලකුණු ඔස්සේ 40
පණ ඇති ඉස්කෝප්පය සහ බැරලය 42
අතක් වෙනුවට ඉස්කෝප්පයක් සහිත මානවයා 44
කාර්යශිල්පී මිනිසා සහ ගහ . . . 45
මිනිසාගේ පිවන චරිතය පටන් ගැනීම 47
මිනිසා කාලය නිපදවයි 49
මිනිස් නම දැරූ එක රැස් කරන්නා . . 51

හතරවැනි පරිච්ඡේදය

ව්‍යසනය මහා වෙයි 53
වන යුදු 54
ලෝකාවසානය 57
ලෝකාරම්භය 59
ගල් පිටු පොත 60
මිනිසා වනය අත් හරී 61
ඕනෑ ම දෙයක් ගැන අවබෝධය පිරිපුන් හා නිවරදි විය යුතුයි . . . 62
තරහ නිමාව 65
මිනිසා තමාගේ ම ලොවක් බිහි කර ගනී 66

පස්වැනි පරිච්ඡේදය

අතීතයට යන මුල් ගමන . . . 69
දහස් වස් සිප් හල 71
අතීතයට දෙවැනි ගමනක් . . . 74
ඉහි බස 76
කතා කරන අත් 79
ඉහි බස් වදන් කොස්සෙන් පිටුවක් 79
අපේ ම ඉහි බස 81
මිනිසා සිය මනස සරි කර ගනී 82
දිව හා අත්, තැන් මාරු කෙළේ කෙසේ ද? 83
නදිය හා එහි උල්පත් 86

හයවැනි පරිච්ඡේදය

අත් හළ නිවස තුළ 89
දිග අත 93
නව මානවයෝ 95
නිවහන් යට ගියාවේ පළමුවැනි පරිච්ඡේදය 97
ප්‍රාගෛතිහාසික දඩයම් කරුවන්ගේ නිවහන 98

මිහිගබ කලා භවන 104
අභිරහස සහ එහි විසඳුම . . . 105

හත්වැනි පරිච්ඡේදය

මෙවන් අරුමයෝය: පිසාචයෙක්
තැනින් තැන සැරිසරයි 109
අපේ මුතු-මිත්තෝ ලෝකය ගැන
කුමක් සිතුවෝ ද? 110
අපේ මුතුන්-මිත්තන් සමඟ සංවා-
දයක් 113
පැරණි බස් එහරේ අස් කොන් . . 115

අටවැනි පරිච්ඡේදය

ග්ලැසියරයෝ පසු බසිත් . . . 119
හිම මැද කොටු වුවෝ 120
මිනිසා වනය හා සටන් වදී . . . 122
මිනිසාගේ සතර පා මිතුරා . . . 124
මිනිසා ගහ හා සටන් වදී . . . 126
සියලු ම නැව් වල මුත්තා . . . 127
මුල් ම ශිල්පියෝ 129
ධාන්‍ය බීජය සාක්කිකරුවෙකි . . 131
වර්තමානය තුළ අතීතය . . . 134
අරුම පුදුම සුරැකුම් පොළ . . . 135

නවවැනි පරිච්ඡේදය

කාලය නමැති ඖර්ලෝසුවේ කටු
ඉදිරියට කැරකෙයි 139
විලේ කතාව 141
ලෝකයේ මුලින් ම විසූ රෙද්ද . . 143
මුල් ම පතල් කරුවෝ හා වානේ
කරුවෝ 144
රුසියාවේ මුල් ම ගොවියෝ . . . 146
මානව ප්‍රයත්නයේ යුග දර්ශනය . . 147

දහවැනි පරිච්ඡේදය

නීති දෙකක් 151
පැරණි "අලුත් ලොව" . . . 152
වැරදි වැල 156

එකොළොස්වැනි පරිච්ඡේදය

හත් ගවු පාවහන් 161
පැරණි ගොඩනැගිල්ලේ මුල් ඉටි
තැලීම 162
මුල් ම සංචාරක එඬේරු 166
පණ ඇති මෙවලම 168
ස්මෘතිය හා ස්මාරකය 170
වහල්ලු සහ නිවහල්ලු 172
කුඩාරම නිවෙසක් වූයේත්, නිවෙස
පුරයක් වූයේත් කෙසේද? . . . 174
මළ ගිය ඇත්තෝ පිවත් වන්නවුන්
ගැන අපට කියත් 178
මිනිසා අලුත් ලෝහයක් නිම-
වයි 180
මමත්වය හා ඔබත්වය 181
නව නැමීමෙක උදාව 182

දොළොස්වැනි පරිච්ඡේදය

විද්‍යාවේ මුල් බිපුවට 185
දෙවිවරු ඔලිම්පස් කඳු මුදුනට පසු
බසිත් 187
අවබෝධයේ සීමා පුළුල් වෙයි . . 188
මුල් ම ගායකයෝ 191

තෘතීය අවධිය

ඔලිගොසීනය

අවුරුදු 26000000 පෙර

මයොසීනය

අවුරුදු 17000000 පෙර



ප්‍රොකොන්සල්

ඩ්‍රයොපිතේකස්

ඔරියොපිතේකස්

ආකෘතික අවධිය

ප්ලියෝසීනය

අවුරුදු 3000000 පෙර

අවුරුදු 1200000 පෙර



රාමෙපිතේකස්

අප්‍රිකානු
ඔස්ට්‍රලොපිතේකස්

මහත
ඔස්ට්‍රලොපිතේකස්

උරුංගු
ඔස්ට්‍රලෝ

මිනිසා යෝධයකු වූයේ කෙසේද

එම්. ඉලීන් වයි. සෙගාල්

ප්‍රගති ප්‍රකාශක මන්දිරය. මොස්කව්

අනුවාදය: නාරවීල පැටරික්
සැකැස්ම: ලියොනිද් ෂ්කානොව්, ඇතැම් ඡායාරූප කෞතුකාගාරය විසින් සපයන ලදි
ඡායාරූප: වලෙන්ටිනා වෙරිතෝක
චිත්‍ර: අලෙක්සේයි කෝලි
දිමිත්‍රි ග්‍රොමෝ

М. Ильин и Е. Сегал
КАК ЧЕЛОВЕК СТАЛ ВЕЛИКАНОМ
На языке сингала

පාඨකයින් වෙතටයි

මෙම පොතෙහි අඩංගු කරුණු, අනුවාදය හා මුද්‍රණය පිළිබඳ ඔබගේ අදහස් දන්වා එවීමෙන් ප්‍රගති ප්‍රකාශක මන්දිරයේ කෘතඥතාවය ඔබට හිමිවේ. ඔබගේ වෙනත් යෝජනා ඇතොත් අපි එය කරුණාවෙන් භාර ගනිමු.

අපේ ලිපිනය:
Progress Publishers,
17, Zubovsky Boulevard,
Moscow, USSR

© අනුවාදය සහ චිත්‍ර. ප්‍රගති ප්‍රකාශක මන්දිරය. මොස්කව් 1982

සෝවියට් සංගමයේ මුද්‍රණය කරන ලදි

И $\frac{70803-851}{014(01)-82}$ без объявления.

4803010102

මේ පොත සඳහා වූ විෂය
මාතෘකාව අලෙක්සෙයි මක්සිමවිච්
ගෝර්කි විසින් ඉදිරිපත් කරන ලද්දකි.
ඔහු මෙසේ පැවසුවේය:
මා මේ පොත ලිවීම ආරම්භ කරන්නේ කෙසේදයි
ඔබ දන්නෙහිද කෙලවරක් නැති අවකාශය සිහියට
නගාගන්න. දුවිලි මෙන් විසිරී ඇති තරු... එම දුවිලි
අතර ගැඹුරු අවකාශය තුළ සූර්යයා ආලෝක ධාරා
විහිදුවයි. සූර්යයාගෙන් ග්‍රහලෝක වෙන්ව ඇත ඉන් එක්
කුඩා ග්‍රහලෝකයක වස්තූන් පිවය ලබා විඥාවබෝධයට
මූල පුරයි. මානවයා බිහිවෙයි...
මානවයා බිහිවූයේ කෙසේද, ඔහු වැඩ කිරීමට හා
කල්පනා කිරීමට උගත්තේ මොන ආකාරයටද,
ඔහු ගින්දර හා යකඩ තම අතට ගත්තේ
කෙසේද, ඔහු ස්වභාව ධර්මය තම
අනසකට යටකර ගැනීම සඳහා සටන්
කළේ කෙසේද යන කතාව
ලිවීමට මෙම පොතෙහි කර්තෘ වරු
ආරම්භ කළේ 1936 දීය

මිනිසා යෝධයෙකි

මේ මිහි තල මත යෝධයෙක් සිටී.

ඔහුගේ දැත් යෝධ යන්ත්‍ර-සූත්‍ර සැණෙකින් ක්‍රියාශීලී කරයි.

ඔහුගේ දෙපා වලට දිනකට මයිල දහසෙක මහ වුවත් ගෙවාලිය හැකිය.

ඔහුගේ පියාපත් වලට මොනම කුරුල්ලකුටවත් ළං නොවිය හැකි වලා රොදින් ඔබබට ඔහු ගෙන යා හැකිය.

ඔහුගේ වරල් කවර ම මසකුගේවත් වරලට වඩා ශක්තිමත්ය.

ඔහුගේ දැස් නොදැකිය හැකි දේ දකී. ඔහුගේ කන් ලොව තවත් කෙළවරක කතා කරන දේ අසයි.

මහ කඳු විනිවිද යන්නට තරම් හේ ශක්තිමත්ය. හේ ඇද හැලෙන දිය ඇලි අහස් කුස අතර මහ නතර කරයි.

හේ මහ වන වගා කරමින් ද, මුහුදු යා කරමින් ද, කාන්තාර වලට ජලය ගෙන යමින් ද, මිහි කත් මුහුණතට නව හැඩ-වැඩක් දෙමින් සිටී.

මේ යෝධයා කවරෙක් ද?

ඒ අන් කිසිවෙක් නොව "මිනිසා" යි.

එහෙත් ඔහු යෝධයකු වුයේ කෙසේ ද? ඔහු මිහි තලට අධිපති වුයේ කෙසේ ද? මේ පොත කියන කතාව එයයි.





අදිසි සිර මැදිරිය

ඇත එපිට එක් යුගයෙක මිනිසා, සොබා දහම තමා නතු කොට ගැනීමේ ලා වාමනයෙක් විය. ''යෝධයෙකැ'' යි කවර කතා ද? හේ සොබා දහමෙහි අභිංසක වහලකු මිස ස්වාමියෙක් නොවිය.

සොබා දහම කෙරෙහි ඔහුට පැ හැකි වූ බලය අල්ප වූවෙකි. ඔහුගේ නිදහස මහ වන මැද සිටු පාවකුගේ හෝ නිලඹර මැද සියොතකුගේ හෝ නිදහසට දෙවැනි නොවිය.

''මිටින් ඇරපු කුරුල්ලකු වගේ'' යන කියමනක් අප අතර ඇත.

එහෙත් සැබැවින් ම කුරුල්ලෙක් අප සිතන තරම් නිදහස් ද?

ඇත්තෙන් ම ඌට පියාපත් තිබේ. ඒ පියාපත් මහ වන ගළ හිසින්, උස් කඳුහෙල් මතින් හෝ මහ සයුරු මැදින් ඌ ඇතින් ඇත ඕනෑ ම තැනෙකට ගෙන යනු ඇත.

එහෙත් ඇත්ත එය ද? මේ සියොතුන් සැතපුම් දහස් ගණනක් නිලඹර විනිවිද පියාඹන්නේ විනෝද සචාරියකට ඇති ආසාවෙන් ද? නැත, ඔවුන් ඉදිරියට යවන්නේ අවශ්‍යතාව මිස ප්‍රීතිය නොවේ. ඇත එපිට රටින් රට පියාඹා යාමේ මේ පුරුද්ද වසර දහස් ගණනක් පුරා, නොගිණිය හැකි පරම්පරා ගණනක් තුළ සිය වර්ගයා නොනසා පවත්වා ගැනීමේ සටන තුළින් ලත් ඇබැහියෙකි!

කුරුල්ලකුට තැනෙකින් තැනෙකට පියාඹීම පහසු කාරියෙක් වනු ඇත. ඒ නිසා ඕනෑ ම කුරුලු වර්ගයක් ලෝකයේ ඕනෑ ම තැනෙක සිටිය යුතුයැ යි සිතනොත් එය හුදු තර්කයෙක් පමණි.

මෙය ඒ අයුරින් සිදු වී නම් උතුරේ පයින් ලඳුත්, ඛර්ච් ලැහැබවලුත් කෙළි ලොල් පියාපතින් යුත්, ගිරවුන්ගෙන් හා කොවුලන්ගෙනුත්, පිරෙන්නට තිබිණි. එහෙත් එය එසේ නොවිය. දැනුදු නොවෙයි.

නිසැකයෙන් ම ඉදිරියටත් නොවනු ද නියතයි.

අදිසි බාධකයන් විසින් වනය තැන්නෙන් වෙන් කරනු ලැබේ. මේ බාධක එක ද සිව් පාවකු හෝ සියොතකු විසින් ඉක්මවනු නොහැකියි.

එක් එක් වනයෙක හා තැන්නෙක, ඒ එක එකක් පුංචි ලෝක වලට බෙදනු ලබන කුඩා අදිසි බාධක-යෝ වෙත්.

වන මැදින් චාරිකාවක්

ඔබ වනයක් තරණය කරන්නට ගියොත් ඔබ ද යට කී අදිසි බාධකයන් පසු කරනු ඇත. ඔබ ගසකට නැග්ගොත් ඔබේ හිසට තවත් අදිසි බාධක විනිවිද යන්නට සිදු වෙයි. සුවිසල් පහයෙක මහල් හා කාමර මෙන් මුළු මහත් වනය ද කොටස් වලට බෙදී ඇත. ඔබට දකිනු නොහැකි වුවත් එය සත්‍ය යෙකි. වනයෙහි ඇවිදිනවිට වනය වෙනස්වන හැටි ඔබටම දකින්නට ලැබේ.

වනයෙහි ගෙවල් ඇතැ යි සලකා ඒවා නම් කළොත් ''උකුසු හාමි'', ''පිළිහුඩු රාළ'', හා ''කොටෝරු හාමිනේ'' යනුයෙන් නම් පුවරු දේවදාරු වනයෙක ගස්වල දකින්නට ලැබෙනු ඇත. ලිය ගොමුවෙන් යුත් වන ලැහැබ වල ''කොළ කොටෝරු හාමි'', ''රන් කුරුලු හාමිනේ'', ''කවුඩු පණික්කි හාමි'', ''කොණ්ඩ කුරුලු හාමි'', ''කළු කොටෝරු හාමි'' හා තවත් නන් අයුරු ''නම්'' පවරු දකින්නට ලැබෙනු ඇත.

හැම වනයෙක ම පොළොවේ සිට ඉහලට තට්ටු කීපයක් වෙයි.

පයින් වනයෙක තට්ටු දෙකක් හෝ තුනක් ඇත. යට ම තට්ටුවේ පාසි හෝ තණ කොළයි. මැද තට්ටුව පදුරු වලින් ගහනයි. තුන් වැනි තට්ටුව පයින් ගසින් සැකසෙයි.

ඕක් වනයෙක තට්ටු හතක් ඇත. ඉහළ ම තට්ටුව ඕක්, ලින්ඩන් හා මේපල්ස් ඇ තුරු මුදුන් වලින් යුක්තය. ඒවා ගිම්හානයේ දී කොළ පැහැති වුත්, සරදයේ දි රන් වන් වුත් පියස්සක් ලෙස පෙනෙනු

ඇත. දැවැන්ත ඕක් තුරු මුදුන් වලට ළං වන කල වන ඇපල් හා වන පෙයාර්ස් තුරු මුදුන් දක්නට ලැබේ.

මිනිස්සු නිතර නිතර සිය නවාතැන් වෙනස් කරමින් ගෙන් ගෙටත්, මහලින් මහලටත් යති. එහෙත් වනයක් තුළ එවැන්නක් අපහසුය.

කොටෝරුවකු කිසි දාක සිය නෙත් අදුරු නිවහන ඉරු රැස් පතිත වන උණුසුම් අටල්ලක් සඳහා වෙනස් නොකරනු ඇත. එසේ ම අටලු පියෙස ප්‍රිය කරන උකුස්සා කිසි විටෙකත් සිය කැදැල්ල රුප්පාවක් මත තනන්නට නොගෙනෙයි.

වන සිර කරුවෝ

ලේනකු සිය නිවහන ජර්බෝවකු සමඟ මාරු කර ගත්ත යි මොහොතකට සිතමු. ලේනා වන වැසියෙකි. ජර්බෝවා තැනි බිම් හෝ වැලි බිම් වැසියෙකි.

ලේනාගේ නිවහන උස් රුකෙක සිදුරක් තුළ හෝ අතු පතර අතුරෙහි වෙයි. ජර්බෝවාගේ නිවහන බිම් ගෙයෙකි.

ජර්බෝවාට සිය නිවහන පිණිස ගසක් මුදුනට නගින්නට සිදු වෙයි. එහෙත් උෆට එය කළ නොහැකිය. ඒ උගේ අත්ල ගසකට නගින්නට සකස් වී නැති නිසයි.

අනෙක් අතින් ලේනාට කවර දාකවත් බිම් ගෙයක් තුළ පිවත් වන්නට ද නොහැකිය. උගේ ගති පැවතුම් රුක් සැරියකුට උචිත ලෙස සකස් වී ඇති හෙයිනි.

ලේනාගේ වලිගයත්, අත්ලත් විමැසීමෙන් උෆ කොහේ පිවත් වන්නෙක් ද යන්න අනුමාන කරන්නට හැකියි.

ලේනාගේ අත්ල අතු රිකිලි තරව ගන්නටත් පයින් හෝ වෙනත් ගෙඩි ජාති කඩා ගන්නටත් සුදුසු සේ සැකසී ඇත. වල්ගය, උෆ අත්තෙන් අතට පනින කල හිස් අවකාශයේ දී රුකුලක් ව සිටින පැරවුටයක් වැන්න. එය උෆ ලොම් මුගටියෙකුගෙන්

බෙරෙන්නට හි සැරෙන් පනින විට කදිම සහා-
යයකු වනු ඇත.

එහෙත් තැනි වැසියකු වූ ජර්බෝවාගේ අත්තල
හා වලිගත් එහැම පිටින් ම ලේනාගේ එම අංගයන්-
ගෙන් වෙනසි. හිස් තැන්නෙක අනතුරු ඇහවීමෙක
දී සැඟවෙන්නට පඳුරක් හෝ නහින්නට ගසක්
හෝ නැත. සතුරාගෙන් ගැලවෙන්නට ඇති එක ම
මඟ පලා යෑම හෝ නොපෙනී සිටීම හෝ පොළෝ
තුළට වැදීම පමණි. නිසැකයෙන්ම ජර්බෝවා කර-
න්නේ එයයි. බකමූණකු හෝ උකුස්සකු අහස් කුස
පියා සරනු දුටු විගස ඌ කරන්නේ හැකි පමණ
වේගයෙන් පැන ගොස් මිහි කුස තුළ ඇති අපමණ
වූ ඵරෝ වලින් එකකට වැද සැඟවීමයි. ඌට එබඳු
අත්ල ඇත්තේ ඒ සඳහායි. ඌට උගේ දික් වූ පසු
පස ගාත් දෙක, පනින කල වේගවත් පිම්මක් සඳහා
උපකාර වෙයි. කෙටි වූ ඉදිරි ගාත් දෙක පොළොව
හැරීමට රුකුලෙකි. ඌ සිය සතුරන්ගෙන් සැඟ-
වෙන්නේ ගිම්හානයේ දී උණුසුමෙන් හා සිසිරයේ
දී සිතලෙන් ආරක්ෂා වන්නේත් බිම් ගෙය තුළයි.

දැන් ඉතින් උගේ වල්ගය ගැන කිය යුත්තේ
කිමෙක් ද? උගේ වල්ගය අත්ලෙහි හොඳම සහකා-
රයාය. යම් විටෙක ඌ අවට පිරික්සනු වස් පසු
පස ගාත් දෙක මත හිඳ ගත් කල වල්ගය තුන්
වැනි කකුලක් ලෙස එයට උපකාර කරයි. පනින
කල සුක්කානමක් ලෙස පිම්ම පාලනය කරයි. වලි-
ගය හොතිබෙන්නට ජර්බෝවා පනින හැම පිම්මක්
ම උඩ කරණමක් බවට පත්ව පොළොවෙහි පතිත
වනු ඇත.

එබැවින් ලේනාත්, ජර්බෝවාත් සිය නිවහන්
මාරු කළහොත් ඔවුනට එකෙකාගේ වලිගත්, අත්-
ලවලුත් මාරු කර ගන්නට සිදු වනු නියතයි.

මෙලෙසින් වන වැසි හා තැනි වැසි සතුන් ගැන
පරීක්ෂාවෙන් විමසුවොත් ඔවුන් හැමෙකකු ම ලෝ-
කය තුළ තමා කිසියම සීමාවක් තුළ බැඳ තැබෙන,
බිඳලීමට බෙහෙවින් අපහසු අදිසි දම් වැලෙකින්
බැඳී ඇති බව දැන ගන්නට ලැබෙනු ඇත.

කොටටෝරුවා සිය ආහාරය ගස කෙරෙන් සපයා ගනී. උගේ ආහාරය වන්නෝ කුරුමිණියෝ පමණක් නොවෙති. අනෙකුත් කෘමී ප්‍රාණීහු ද, ඔවුන්ගේ පිළවු ද ආහාර වෙති. සිසිරයේ දී කොටටෝරුවා පයින් කරල් වලින් ඉමහත් දක්ෂතාවෙකින් ඇට උදුරා ගනී. ඌ මේ කාරියේ දී පයින් කරල ස්ථීර ව පිහිටනු පිණිස ගස් කඳ සහ අත්තත් අතර කුඤ්ඤයක් සේ ගසයි. කොටටෝරුවා ගස් කඳෙහි සිය පවුල සඳහා බිලයක් ද හාරා ගනී. උගේ සෘජු වලිගයත්, අත්ල මෙන් සැකසුණු ශක්තිමත් නිය ගස් කඳ මත ඉහළ හෝ පහළ යාමට සුදුසු ස්ථිරත්වයක් ලබා දෙයි. ඉතින් ඌ කවර දා හෝ ගස් අතර ගත කරන පීවිතය වෙනස් කර අන් මහකට පිවිසෙන්නේ කෙසේ ද?

මේ අනුව කොටටෝරුවාත් ලේනාත් වන වැසියන් නොව වන සිර කරුවන් බව අපට පෙනේ.

මාළු කෙසේ
වෙරළට
ආවෝ ද?

පුංචි වන ලොව, වනාහි අති විශාල මේ මහා ලෝකය ගොඩ නංවන අසීමිත පුංචි ලෝක වලින් එකක් පමණි.

මහ පොළොව මත ඇත්තේ වන පෙත් හා තණ බිම් පමණක් නොවේ. කඳු, සයුරු, විල්, ඇ නොයෙක් දෑ ද ඇත.

හැම කඳු වැටියෙක හෝ පර්වතයෙක ඇති අදිසි බාධකයන් හෝ සීමාවන් විසින් එහි ඇති පුංචි ලෝක එකෙකක් අනෙකෙන් වෙන් කරනු ලැබේ.

හැම මුහුදක් හෝ මහ සයුරක් ගැනත් කිය යුත්තේ ද මේ ටික මයි.

මහ සයුරෙහි වඩදිය හා බාදිය පිළිබඳ ජල සීමාවෙහි ඇති ගල් පර්වත අසංඛ්‍ය වූ බෙල්ලන්ගෙන් වැසී ඇත. ඔවුන් කොතරම් තදින් ගල බදා ගෙන ඇති දැයි කිවහොත් මහ කුණාටුවෙකින් පවා යමතම්වත් ගුරුල් කරන්නට බැරී තරම්.

තව ද හිරු රැසින් බබළන දිය තුළ, කොළ හා දුඹුරු වන් මුහුදු පැළැටි අතරින් නන් වන් මසුන් හී වේගයෙන් විනිවිද යනු දකිනු හැකිය. විනිවිද පෙනෙන ජල්ලියෝ ඔබ මොබ පාවෙති. තරු වන් මස්සු මුහුදු පත්ලේ හෙමින් ඇදි යති. මුහුදු පත්ලේ ඇති ගල්, ගහ කොළ මෙන් ස්ථාවර වූ අරුම පුදුම සතුන්ගෙන් වැසී ඇත. ඔවුනට තම බඩ වියත පිණිස වෙහෙසෙන්නට වුවමනා නැත. ඔවුන්ගේ ආහාර නිරායාසයෙන් ම කටේ වැටේ. මේ මාළුවෝ නම් බැලු බැල්මට දෙපස දෙකටක් ඇති කුඩා කළයක් වැනි, රතු පැහැත්තෝය. මොවුහු තම පෝෂණය දිය තුළින් ඇද ගනු ලබන ක්ෂුද්‍ර ප්‍රාණීන්ගෙන් ලබා ගනිති. ඇතැම් දිප්තිමත් මුහුදු ප්‍රාණියෙක් තමන් අසළින් පිනා යන මසුන් සිය මල් පෙති බදු අඬු වලින් අල්ලා ගනී.

මීට ඉඳුරා වෙනස් ලොවක් ගැඹුරු මුහුදු පත්ලේ ඇත.

ගැඹුරු මුහුදේ ආලෝකයක් නැත. එහෙයින් එහි වැවෙන්නේ ජලය තුලින් යන්තම් විනිවිද යන හිරු එළිය ලබාගැනීමට හැකි රත්පැහැති පැළෑටි වර්ගය.

සාගර පතුල, ඉහළින් වැටෙන සත්ව හා වෘක්ෂ ද්‍රව්‍යයන්ගේ සුන් බුන් වලින් පිරී ගිය අඳුරු සොහොන් බිමෙකි.

කකුළුවෝ සිය දිග අඬු පඬු වලින් බුරුල් වැල්ලේ ඔබ මොබ සරති. අයා ගත් පුළුල් මුව යුත් මාළුවෝ අඳුරේ ඔබ මොබ කිමිදිති. ඇතැමකුට ඇස් කොහෙත් ම නැත. ඇතැමකුට දුර දක්නයක් සවි කළා වැනි දැසක් වෙයි. තව ද සිරුර පුරා දිදුලන තරු වන් ව විහිදුණු නිත් ඇති මස්සු වෙති. ඔවුහු ආලෝකයෙන් දිප්තිමත් ව බබළන කවුළුවෙන් යුත් කුඩා නැව් වැන්න. වැළිදු හිසින් විහිදුණු සියුම් නළ අග දිදුලන, එලියෙන් අනතුරු අහවන විදුලි පන්දමක් සිහි ගන්වන මස්සු ද වෙත්. මේ අරුම පුදුම ලොව අප වසන ලොවින් කොතරම් වෙනස් ද?

එසේ ම එක ම වැලි රේණුවෙන් එනම් වෙරළේ රේණුවෙන් පමණක් වෙන් වුණු ගොඩ බිමේ හා නොගැඹුරු මුහුදු පටු බිම් තිරුවේ වෙනසද කොතරම් ද?

ඉහත කී එක් ලොවෙක වසන්නවුනට තවත් ලොවකට පිවිසිය හැකි ද? මසකුට මුහුදු අත හැර ගොඩ බිමට පිවිසිය හැකි ද?

එය කිසි සේත් නොහැකිසේ පෙනේ. මාළුවා ජලජ පිවිතයට හැඩ ගැසුනෙක් වෙයි. ගොඩ බිම පිවත් වීමට නම් උෆට කරමල් වෙනුවට පෙණහලුත්, වරල් වෙනුවට කකුලුත් අවශ්‍ය වනු ඇත. සැබැවින් ම මාළුවකුට මුහුදු පිවිතය ගොඩ බිම් පිවිතයට මාරු කළ හැක්කේ උගේ මත්ස්‍යත්වය ද අතුරුදන් කිරීමෙනි.

එහෙත් මාළුවකුට උගේ මත්ස්‍යත්වය නැති කළ හැකි ද?

ඔබ මේ ප්‍රශ්නය විද්‍යාභූයකුගෙන් ඇසුවොත් වසර ලක්ෂ ගණනකට පෙර ඇතැම් මත්ස්‍ය වර්ගයක් ඇත්ත වශයෙන් ම මුහුදු වෙරළට පැමිණ සිය මත්ස්‍ය ජීවිතය නතර කොට ගොඩ බිමට පුරුදුවූ බව කියනු ඇත. මෙසේ දියෙන් ගොඩට වූ මාරුව වසරක් හෝ දෙකක් තුළ නොව වසර ලක්ෂ ගණනක් තුළ සිදු වූවෙකි.

කෙමෙන් වියළි බවට යන ඕස්ට්‍රේලියානු ගංගා වල පෙණහලු වල හැඩ ඇති, පිහිනීමට උපකාර වන හුළං මල්ලක් ඇති, අං සහිත මාළු වර්ගයක් ඇත. අවුරුද්ද තුළ වූ ඉඩෝර සමයේ දී මේවායේ ජල මට්ටම කෙමෙන් බසින්නට පටන් ගනී. එකල ගංගාවෝ මඩ කඩිති ගොඩක් බවට යෙත්. අනෙක් සියලු මාළුවෝ මැරෙත්. ඔවුන්ගේ කුණු වූ සිරුරු වලින් වැසී ගිය ජලය නොමඳ දුගඳක් වහනය කරයි. ඉඩෝරයෙදී දිවි රැකෙන්නේ යටි කී අං සහිත මාළුවන්ගේ පමණි. එයට හේතුව ඔවුනට කරමල් පමණක් නොව පෙණහලු ද තිබීමයි. ඔවුනට වාතය දුවමනා වූ විට හිස ජලයෙන් පිටත දමා ශ්වසනය කරනු ලැබේ.

ඇෆ්‍රිකාවේත්, දකුණු අමෙරිකාවේත් මුළු ඉඩෝර සමය තුළ ම ජලය රහිත ව දිවි පවත්වන මසුන් වර්ග ඇත. උහු ඉඩෝර සමයේ දී තුමූ ම වැලි යට වැළලී නිසල ව වැතිරෙත්. යළින් වැසි සමය උදා වන තුරු පෙණහලු මගින් ශ්වසනයේ යෙදෙත්.

ඉන් පෙනෙන්නේ මසුනට පෙණහලු තිබිය හැකි බවයි.

එහෙත් මසුන්ගේ කකුල් ගැන කිය හැක්කේ කිමෙක් ද? සැබැවින් ම පා සහිත මාළුවෝ ද සිටිත්. එය ඔප්පු කරන්නට අත් වුටු නිදසුන් පෑ හැකිය. සර්ම කලාපික පෙදෙස්හි ගං ඉවුරු දිගේ මඩ මත පැන පැන යන්නට පමණක් නොව, ගස් නහින්නටත් හැකි මාළුවෝ වෙත්. ඔවුන්ගේ යුගල වරල්හු දෙපා මෙන් ක්‍රියා කරත්. අත්ලවලට සමාන වරල් ඇති මාළුවකු ගැඹුරු මුහුදු පත්ලෙන් මෑතකදී සො-

යාගෙන ඇත. එම මාළුවාගේ වරල් මීනිසකුගේ අත් දෑස්ටි මෙන් පිහිටා තිබේ.

අපි සාමාන්‍ය මැඩියා දෙස පරීක්ෂාවෙන් බලමු. බිජුවටින් එලියට ආ ඌ ඉස් ගෙඩියෙකි. ඉස් ගෙඩියාත් මාළුවාත් අතර ඇත්තේ මඳ වෙනසෙකි. ඇතැම් මසුන් වර්ගයන් අවුරුදු ලක්ෂ ගණනකට පෙර ගොඩින් මුහුදු වෙන් කරනු ලබන බාධකය ඉක්මවූ බවට මේ එක් නිදසුනෙකි. මේ ක්‍රියාවලියේ දී ඔවුහු කෙමෙන් විකාශනය වූහ. භූ-ජලචරයා මාළුවාගෙන් පැවතෙන්නෙකි. තව ද ඌ උරගයන්ගේ මුතු මිත්තා ද විය. උරගයෝ ක්ෂීර පායින්ගේත්, කුරුල්ලන්ගේත් මී මුත්තෝය. තවත් නොයෙක් සතුන් ඇතුළු සියල්ලෝම දියට ආපසු යන පාර අමතක ව සිටින ජලචරයෝ ය.

"නිශ්ශබ්ද සාක්කි කරුවෝ"

පාෂාණීභූත සතුන්ගේ ඇට කටු වසර දශ ලක්ෂ ගණනක් තුළ සත්ව ගණයා පරිණාමයට පත් අයුරු අපට කියා පාන සාධකයෝය.

ඔවුන් වෙනස් බවට පත් කෙලේ කවරෙක් ද?

චාල්ස් ඩාවින් නම් ඉංග්‍රීසි මානව විද්‍යාඥයා පරිණාම වාදය පිළිබඳ සිය මතය ඉදිරිපත් නොකරන තෙක් එය අබිරහසෙක් විය. ඔහු පටන් ගත් කටයුත්ත රුසියන් විද්‍යාඥයන් දෙදෙනකු වන වී. කවලෙව්ස්කි හා කේ. තිමීර්යාසිව් ඇතුළු බොහෝ විද්‍යාඥයන් විසින් තවත් ඉදිරියට ගෙන යන ලදී. ඔවුන් විසින් කරන ලද සවිස්තර අධ්‍යයනයෙකින් පසු අපේ මුතුන් මිත්තනට කවර දාකවත් තේරුම් ගත නුහුණු දේ අපට පැහැදිලි ලෙස අනාවරණය කර ගත හැකි විය.

හැම පීවියෙක් ම ලොවෙහි ඔහුට හිමි තැනෙහි ලා, ඔහු වසන පරිසරය හෝ වටපිටාව විසින් බැඳ තබා ඇත. සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යයහ. උණුසුම සිසිලට හැරෙයි. පෙර තැනි බිම පසුව කඳු ගොඩ නැගෙයි. මුහුදු ගොඩ බිමට ඉඩ දෙයි. තමා වටා වූ පරිසරය වෙනස් වන විට පීවී සතුනට කිමෙක් වේ ද?

ඔවුහු ද ඒ අනුව වෙනස් වෙති.

ජීවී සත්වයන් වෙනස් වන්නේ සිය කැමැත්තෙන් නොවේ. අලුත් ආහාර වර්ග ගන්නටත්, නව තත්ත්වයන් යටතේ ජීවත් වන්නටත් බල කරනු ලබන නිසාය. මේ වෙනස් වීම් හැම විට ම ඔවුන්ගේ වාසිය පිණිස ම සිදු නොවේ.

සොබා දහම විසින් ඉතා සුළු ශාරීරික වෙනස පවා ගොඩ බිමේ දී වැදගත් වන්නක් සේ හැඩ යස්සන ලදී. අර මාළුන්ගේ පිහිනුම් වායු කෝෂය කෙමෙන් පෙණහලු බවට හැඩ ගැසිණි. වරල යුගලයෝ දෙපා ලෙස හැඩ ගැසුණාහ. ඇතැම් ජලචරයන් කෙමෙන් භූචරයන් බවට පත් වුයේ මෙසේයි.

මාළුවාගේ වරලත්, පිහිනුම් වායු කෝෂයත්, වේරාකෘතියත් නව පරිසරයට උචිත ලෙස සකස් කෙළේ මේ නම්‍යතා හැකියාවයි.

ඉතිරි කර ගන්නට තෝරා ගත් යමක් වී නම්, එය අත් නැර ම නතර වුයේ ප්‍රයෝජනවත් නම් පමණෙකි. මෙලෙසින් හිරිහැර දායක හැම දෙයක් ම කෙමෙන් ඉවත් කරන ලදී. පාරම්පරික උරුමය, එලවත් මාරු කිරීම් එක් රැස් කරමින් හා තහවුරු කරමිනුත් පරපුරින් පරපුරට හිමි කොට දුනි.

වී. කවලෙව්ස්කි විසින් අධ්‍යයනය කළ පරිදි අශ්වයාගේ පරිණාමයෙන් මෙය තව දුරටත් අපට අවබෝධ කටහැකිය.

සැබෑවින් ම ඇතුළු වනගැබින් පිටත් ව, පතිතවූ රුක් මතින් පැන හෝ යටින් රිංගා ගෙන යුහු ව හා කුඩා සිවු පාවකුගෙන් අශ්වයා පැවතෙතැ යි සැඳහිම එතරම් පහසු නොවේ. මේ කුඩා සිවු පාවාට අශ්වයකුට මෙන් කුර නොතිබිණි. ඌට තිබුණේ ඉිය සහිත ඇඟිලි පහකිනුත් කෙළවර වූ කෙටි පාදයි. විසම වන බිමෙහි සුස්ථිරව පා පිහිටුවීමට මේ ඇඟිලි උපකාර විය.

යටා කාලයේ දී යෝධ මුකලෙන් තැනිතලා වලට ඉඩ දෙමින් කුනී වන්නට විය. මේ හේතුවෙන් අශ්වයාගේ වන වැසි මුතුන් මිත්තනට නිතර නිතර

තැනි තලා වලට එන්නට සිදු විය. එහි දී කිසියම් අනතුරක් විසින් තර්පිත කල වනයේ මෙන් සැහැවෙන්නට තැනෙක් තැන්නෙහි නොවීය. පලායාම බේරීමට තිබුණු එක ම මහයි. වනයේදි දී මුහුණ පෑ අනතුරින් බේරීමට කරන ලද හැංගි මුත්තන් කෙළිය තැනි තලාවේදී අත්තාපල් මුත්තාපල්... ධාවන කෙළියක් බවට පත් වූ අතර සමහර වන සතුන්ට මෙම ධාවන කෙළිය පරාජයෙන් කෙළවර විය. දික් වූත්, වේගවත් වූත් පා ඇත්තවුනට පමණක් බිහිසුණු වන මෘගයන්ගෙන් පණ බේරා ගත හැකි විය.

තමන්ගේ මුල් නිවහන වූ වනය අත් හැරීමේ දී වෙනසට ගියේ අශ්වයාගේ අත් පා පමණක් නොවේ. උගේ මුළු සිරුර ද වෙනස් විය. නිදසුනකට බෙල්ල ගනිමු. බෙල්ල කොට ව තිබිය දී පාද පමණක් දික් වී නම් යම් මොහොතෙක දී, උගේ පා මුල පිහිටි තණ කොළ වෙත මුව ළං කොට ලිය නොහැකි වනු ඇත. එහෙත් එය එසේ නොසිදු විණි. සොබා දහම විසින් කෙටී පා ඇත්තවුන් පිළිකෙව් කැරුණා සේ ම කෙටී බෙල්ල ඇත්තෝ ද පිළිකෙව් කැරුණාහ.

අශ්වයාගේ දත් ගැන කෙසේ ද? ඒවා ද වෙනස් විය. තැනි තලා වල දී ඌට රළු, ගොරෝසු පැළෑටි වර්ග කෑමට සිදු වූයේය. මේවා පළමු ව ඇඹරුම් දත් වලින් ඇඹරිය යුතු විය. ඊට අනුව දත් වල ද වෙනසෙක් ඇති වූයේය. එහෙත් නූතන යුගයේ අශ්වයාට පිදුරු පවා පොඩි කර ගත හැකි වන සේ දත් වෙනුවට ඇඹරුම් ගල් වැනි කොටස් හා කටු වැනි ගොරෝසු කොටසුත් ඇත.

අශ්වයාගේ අත් පා හා ඇහිලිත්, බෙල්ල හා දතුත් මෙලෙසින් වෙනස් වීමේ අරුම පුදුම වැඩ කොටස සපුරා ලීමට අවුරුදු වලින් නම් කෝටි පහක් ගත වූයේය. මේ ක්‍රියා පද්ධතිය තුළ අශ්වයන්ගෙන් පමණක් නමුදු කී දාහක් මැරෙන්නට ඇද්ද!

වැළිදු මෙයින් පැහැදිලි වන තවත් දෙයක් ඇත. එනම් මුහුදින් ගොඩත්, වනයෙන් තැන්නත් වෙන්

කරන බාධක හෝ සීමාවන් ස්ථිර ඒවා නොවන බවයි. ඇතැම් විට මුහුදු වියළී යෙයි. නැතහොත් ගොඩ බිම් ගිල්ලා දමයි. තැනි තලාවෝ කාන්තාර බවට යෙත්. මුහුදු වැසි සත්තු ගොඩට බඩ ගා ගනිත්. වන වැසියෝ තැනි වැසියන් බවට යෙත්. එහෙත් සිවු පාවකුට උගේ පුංචි ලෝකය අත් හැරීම කොතරම් අසිරු ද? ඒ පරිසරයට ඌ බැඳ තැබුණු අදිසි යදම් දෙදරවීම කොතරම් අපහසු ද? ඒ යදම් බිඳලූ පසු ව එත් ඌ නිදහස් ද? ඒත් නැත.

එයට හේතුව නමට පමණක් නිදහස් වුවත්, එක් අදිසි සිර කුඩුවෙකින්, තවත් අදිසි සිර කුඩුවකට පිවිසීමයි. අශ්වයා වනයෙන් නික්ම තැන්නට යන කල්හි වන වැසියකු වෙනුවට, තැනි වැසි යකු බවට පත් විය. එක් සමයෙක්හි ඇතැම් මාළු වර්ගයක් මුහුදින් ගොඩට පැමිණියාහු ද, ඔවුහු යළි කවර දාකවත් මුහුදට ආපසු නොපැමිණියහ. එයට හේතුව ඔවුන් යළිත් ආපසු විකාශනය විය යුතු ව තිබීමයි. එහෙත් යළිදු මුහුදට පැමිණි ඇතැම් භූචර වර්ගයකට වූයේ කිමෙක්ද? ඔවුන්ගේ පා නැවත වරල් බවට පත් විය. නිදසුනකට ගත හැකි තල්මසා ''මත්ස්‍ය ප්‍රතිරූපයකු'' බවට පත් වූයේය. උගේ මෞලික තත්ත්වය නොදන්නෝ ඌ ක්ෂීරපායියකු වුවත් මත්ස්‍යයෙකැ යි හඳුන්වති.

මිනිසා සිය නිදහසට මහ තනා ගනී

දශ ලක්ෂයකට කිට්ටු විවිධ වර්ගයනට අයත් සත්තු ලොවැ වෙසෙත්. ඒ එක් එක් වර්ගයක් තමන් උදෙසා සකස් කොට ගත් පුංචි ලෝකයෙක පිවත් වෙත්.

ධ්‍රැවාසන්න වාසි වලසාට සර්ම කලාපික වනයකට පිවිසෙන්නට සිදු වුණොත් කුමක් සිදු වේ දැ යි මොහොතකට සිතමු. උගේ ඝන ලොම් වැස්ම නිසා දැඩි උණුසුමට ඔරොත්තු දෙනු නොහැකි ව මැරී යනු නිසැකය! එසේ ම සර්ම කලාපිකයකු වූ ඇතා ද උත්තර ධ්‍රැවාසන්නයේ හිම කැටි මත දැඩි සිතල නිසා ලේ කැටි ගැසීමෙන් ම මරණයට පත්

වනු නියතය. ඌ සකස් වී ඇත්තේ දැඩි උණුසුම් පරිසරයකට හෙයින් ඒ සීතල දරා සිටින්නට හමෙන් කිසිදු පිහිටක් නොලැබෙන නිසයි.

මේ මිහි තල මත එක ම තැනෙක දී පමණක් ධ්‍රැව වාසී වලසා සර්ම කලාපික වලසාගේ අසල් වැසියෙක් වන්නේය. එනම් ලෝකයේ හැම රටෙක ම සතුන්, ඔබට දැකිය හැකි තැනයි. මෙහි දී තැනි වැසි සතුනට යාර දෙක තුනක් එපිටින් වන වැසි සත්තු ද ඔවුනට එතරම් ම දුරෙකින් කඳුකර වැසි සත්තු ද දකිනු හැකි වෙත්.

මේ තැන නම් සත්වෝද්‍යානයයි.

තැනි වැසි, වන වැසි කඳු වැසි, කතර වැසි හා මුහුදු වැසි සතුන් රැස් කොට ඔවුන් මිය යා නොදී රැක ගන්නට කෘත්‍රිම පරිසරයක් මවන්නට මිනිසාට සිදුවී තිබේ.

මේ සියල්ලන් අතර මිනිසා කෙබඳු වූ ස්තෙක් ද? හේ තැනි වැසියෙක් ද? වන වැසියෙක් ද? කඳු වැසියෙක් ද?

වන වැසි මිනිසකු ''වන මිනිසා'' හෝ වගුරු වැසි මිනිසකු ''වගුරු මිනිසා'' යනුවෙන් හඳුන්වනු හැකි ද?

සැබැවින් ම නොහැකිය!

වන වැසියකුට ඒ අයුරින් ම තැනි පෙදෙසෙහි ද පිවත් වනු හැකිය. වගුරු බිමෙක පිවත් වන්නකුට වියළි පෙදෙසකට පිවිසීම වඩා සුව දායක වනු හැකිය.

මිනිසාට ඔනෑ ම තැනෙක පිවත් විය හැකිය. ''මිනිසාට ඇතුළුවීම තහනම්'' යන අදිසි දැන්වීම ඇති හෝ මිනිසකුට ළඟා විය නොහැකි හෝ කිසිදු තැනෙක් මිහි තල මත කොහේවත් නැත. උත්තර ධ්‍රැව ගවේෂකයෝ පාවෙන අයිස් කුට්ටි මත දිවි ගෙවති. ඔවුනට ඒ මොහොතේ ම ලොවෙහි වඩා ම උණුසුම් කාන්තාරයට යන්නට සිදු වුණොත් කිසිදු පැකිලීමක් නැති ව එහි ද යනු ඇත.

තැනි තලාවෙකින් වනයකට හෝ වනයෙකින්

තැනි තලාවකට හෝ සංක්‍රමණය වන මිනිසකුට කිසි සේත් ඔහුගේ අත්, පා හෝ දත් මාරු කළ යුතු නැත. මිනිස් සිරුර සහ ලොමින් වැසී නැති හෙයින් ලොවෙහි දකුණේ සිට උතුරට ගමන් කරන කල කිසිදු ගැහැටක් සිදු නොවනු ඇත.

ලොම් කබායත්, සපත්තු කුට්ටමත් ඔහු ඔනෑ ම සීතලෙකින් ආරක්ෂා කරනු ඇත. සහ ලොමින් සතකු ආරක්ෂා කරනු සේය.

මිනිසා අශ්වයකුට වඩා වේගයෙන් දුවන්නට ඉගෙන ගෙන ඇත. එහෙත් ඔහුට ඒ සඳහා එක ඇඟිල්ලක් වත් කැප කරන්නට සිදු වී නැත.

මිනිසා මාළුවකුට වඩා වේගයෙන් පිහින්නට ඉගෙන ගෙන ඇත. එහෙත් ඔහුට සිය අත් පා වරල් බවට මාරු කරන්නට සිදු වී නැත.

උරග ගණයේ කෙටි පා ඇත්තවුනට කුරුල්ලන් බවට විකාශනය වන්නට වසර දශ ලක්ෂ ගණනක් ගත වන්නට ඇත. මෙහි දී ඔවුහු අමිල පරිත්‍යාගයක් කළහ. එනම් පියාපත් යුගළ උදෙසා ඉදිරි පා යුගළ කැප කිරීමයි. සිය වසකට නොවැඩි කාලයක් තුළ මිනිසා පියාඹන්නටත් ඉගෙන ගෙන ඇත. එහෙත් ඔහුට සිය දැත අහිමි වූයේ නැත.

සතුන් සිර කොට තබනු ලැබූ අදිසි බාධකයන් තරණය කරන්නට මිනිසා ඉගෙන ගෙන ඇත්තේය.

තමාට ආශ්වාසය ට සුදුසු වාතයවත් නැති තරම ඉහළට මිනිසාට පියාඹිය හැකිය. එහෙත් හේ යහතින් මහ පොළොව මත යළි දෙපා පිහිටුවයි.

අජටාකාශ ගාමිනු අවකාශ තරණය පිළිබඳ සියලු වාර්තා බිඳ හෙලන ගමන් ම පීවත් විය හැකි පරිසරයේ සීමාවන් ද පුළුල් කළහ.

සියලු සත්වයෝ සොබා දහමේ පාලනය මත යැපෙන්නෝය. අංක ගණිතමය ගැටලු වෙත උත්තරය එහි දැක්වෙන නියමයන් මත රඳයි. සොබා දහම පිළිබඳ සත්‍යතාව ද එබඳුය. හැම සත්වයෙක් ම උගේ සාර්ථක පීවන ක්‍රමය විසින් විසඳන ලද එක්තරා ගැටලුවෙකි. එක් එක් සතකු පිළිබඳයෙන්

අවශ්‍ය පිවන කොන්දේසි ගැටලුවෙත නියමයන් වැන්න. උත්තරය වනාහි අත්, පා, පියාපත්, වර්ල්, හොට, නිය, ගති හා පුරුදු සමූහයයි. මේවායේ ස්වභාව තිරණය වන්නේ සත්වයා පිවත් වන්නේ කොහේ ද? කෙසේ ද? කර දියේ ද? මිරි දියේ ද? ගොඩ ද? වෙරළේ ද? මුහුදේ ද? මුහුදු පත්ලේ ද? මතු පිට ද? උතුරේ ද? දකුණේ ද? කඳු මත ද? මිටියාවත් වල ද? මිහි තල මතු පිට ද? ඇතුළේ ද? තණ බිමෙක ද? වන පෙතෙක ද? යන කරුණු මතයි. අනෙක් පැදගත් කරුණක් නම් උගේ අසල් වැසි වෙනත් සත්තුය.

සතකු එහැම පිටින්ම උගේ පැවැත්මේ පරිසරය මත රදා පවතී.

අශ්වයා එළදෙන හා බැටළුවා වැනි හිලෑ සත්තු වන වැසියන් ව සිටිනු දකින්නට නොලැබෙත්. ඔවුන් ඒ මහේශාක්‍ය තත්වයට ගෙන ආවේත්, ඩෝ කෙළේත් මිනිසාය.

මිනිසා වල් සතුන්ගේ පිවන මාර්ගය පවා වෙනස් කොට ඇත. ඇතැමහු නිවෙස් ඇසඳත්, කුඹුරු වලත් මිනිසාගේ සෙවුම බැලුම යටතේ ගොදුරු පිණිස ඳුදා හරිනු ලැබ සිටිත්. ඇතැමහු මිනිසාගෙන් ගැලවීමට මහත් වෙහෙසක් දරමින් ඇතින් ඇත වන ගැබ තුළට ඇදෙමින් සිටිත්.

මිනිසා සදහට ම, වඩ වඩාත් සොබා දහමේ ස්වාමිත්වයට ළං වෙමින් සිටී.

එහෙත් අපේ ප්‍රාගෛතිහාසික මුතු-මිත්තෝ, මිහි තල මත සිටි අනෙක් සතුන් මෙන් ම සොබා දහම විසින් වහලුන් බවට පත් කරනු ලැබ සිටියහ.

අපේ මුතුන් මිත්තන් හමුව

බලන්න, අතු දිග දුවමින් පාලමෙකින් එතෙර වන අයුරු සිහි ගන්වන වඳුරු මුළෙකි. වැදිරියෝ සිය පැටවුන් බඩ බැඳ සිටිති. ඔවුන්ගේ මුව අඩක් හප බවට ගිය පලතුරින් පිරී ඇත. වඩා මෙරු ඇතැම් පෑටියෙක් මවගේ පය ඩැහැ ගනී. ගන ලොමින් වැසි ගිය මහලු නායකයා ගස් කඳක් මත යුහු

ව ඇදී යයි. මුළු රැල ම ඔහු අනුව ඇදෙති.

මේ වානරයෝ නම් මිනිසාගේ ආදි මුත්තනට අත්‍යන්තයෙන් සමානයෝය. විමපන්සියා, ගොරිල්ලා වැන්නෝ ඔවුන්ගෙන් පැවතෙන්නෝය. දැන් අපට අපේ ප්‍රාගෛතිහාසික මුතු-මිත්තෝ හමු වී සිටිත්.

ඒ සියල්ලෝ ම යෝධ ගන වනාන්තරයේ ඉහළ ම තට්ටුවේ වීසූහ. ඔවුහු පොළෝ තලයෙන් ඉහළ මට්ටමේ සිට අත්තෙන් අත්තටත්, ගසින් ගසටත් යමින් පාලමෙකින් එතෙර වන්නා සේත් බැල්කනි හා ගැලරි ආදියෙන් එකිනෙකට මාරු වන්නා සේත් ගමන් කළහ.

ඔවුන්ගේ ආරක්ෂක බල කොට්ඨව වූයේත් වනයයි. එහි ඉහළ ම තට්ටු වල, ඔවුන්ගේ දරුණු ම සතුරා වන මුවහත් අයි පත් වන් තියුණු දත් ඇති කොටියාගෙන් බේරෙන්නෙට ඔවුහු සැහවුණහ.

ඔවුන්ගේ ගබඩා ගෙවල් වූයේත් වනයයි. එහි ඉහළ අතු වල ඔවුන්ගේ ආහාර වර්ගත්, පලතුරුත්, වෙනත් ගෙඩි වර්ගත් රැස් කොට තැබිණ.

ඒ අතර වන හිස නමැති වහළ යට යහතින් කල් යවනු සඳහා අත්තෙන් අත්තට පැන යන්නටත්, රුස්ස රුක් කඳන් මත හතර ගාතයෙන් ඉහළ පහළ යාමටත්, දැන ගත යුතු විය. පල නෙළා ගන්නට හා ඒවා පලා ගන්නටත් දත යුතු විය. ඔවුනට ක්ෂණ වේගී ඇහිලිත් තියුණු ඇසුත්, ශක්තිමත් දතුත් තිබිය යුතු විය.

අපේ මුතුන් මිත්තෝ නොයෙක් යදම් වලින් වනයට බැඳ තබන ලද්දෝය. එපමණක් නොව එහි ඉහළ තට්ටු වලටත් එසේ ම බඳිනු ලැබුවෝය. මිනිසා මේ යදම් සඳහටම දෙදරවන ලද්දේ කෙසේ ද?



අපේ විරයාගේ ආත්තම්මා සහ මස්සිනා වරු

අතීත එක් වකවානුවෙක කතාවක් ගොතන ලේඛකයකු සිය වීර කතා නායකයාගේ පිවිතය හා විර ක්‍රියා ගැන කියන නිරවුල් කතාව පටන් ගැනීමේ දී මුල් පරිච්ඡේද කිපය විරයා උපත ලැබූ, තම ගිය පවුල හා ඔහුගේ මුතුන් මිත්තන් ගැනත් වූ පැහැදිලි විස්තරයකට කැප කරනු ඇත.

මිනිසාගේ වීරකම් හා පිවිතය ගැන ඔබට කියන්නට අපටත් වුවමනා කර තිබේ. යට ගිය දවස නම් ගිය නව කතා කරුවකුගේ කතාවක් නිදසුනකට පාමින් අපටත් අපේ ආදිතම මිනිස් විරයාගේ මුතුන් මිත්තන් ගැන ඔබට කියන්නට වුවමනායි. ඔහුගේ පවුල, නෑදෑයන් හා ඔහු මිහි තල මත පා තැබීම ගැනත් කියන්නට ඊසිමු. ඔහු ඇවිදින්නට, කතා කරන්නට හා හිතන්නටත් උගත් අයුරු කිය යුතුය. ඔහුගේ සටන්, සොම්නස්, දොම්නස්, ජයග්‍රහණ හා පරාජය ඇ දැක්විය යුතුය. එහෙත් මේ ගැන කියන්නට මුල පිරීමේ දී ඉමහත් දුෂ්කරතාවකට මුහුණ පෑ යුතු බව අපට පෙනිණි.

අපේ වර්ගයා පැවත එන, බෙහෙවින් වානරආත්තම්මාට සමාන, මිනිස් විරයාගේ ආත්තම්මා ගැන අපි කෙසේ විස්තර කරමු ද? වසර දශ ලක්ෂ ගණනක් තුළ ඇය මැරී ගොස් ඇති බැවිනි. අප හැම ම දන්නා පරිදි වානරයනට අඳින්නට බැරි හෙයින් අපට ඇගේ ඕතු සිතුවමක් වත් දකින්නට නැත. කලින් විස්තර කරන ලද පරිදි අපේ ප්‍රාග්ඓතිහාසික මිතු-මුත්තා හමු වීය හැක්කේ කටු ගෙයක් තුළ දිය. එහෙත් හේ කෙවර හැඩ රුවක් ගත්තේ දැයි එහි දින් කිය නොහැකියි. ඔහු සම්බන්ධයෙන් අපට ඉතිරි වී ඇත්තේ අප්‍රිකාව, ආසියාව හා යුරෝපයෙනුත් ලැබුණු ඇට කැබිලි හා දත් කිපයක් පමණක් හෙයිනි.

එහෙත් අපේ මිනිස් වීරයාගේ ''මස්සිනා'' හා ''නැනා'' වරුන් ගැන වැඩි අවබෝධයක් අපට ලබා ගත හැකිය.

මිනිසා දිගු කලෙක සිට, තම ප්‍රාගෛතිහාසික පිවිතයට සම්බන්ධ සර්ම කලාපික වන ගහනයන් අත් හැර වචනයේ නියම අර්ථයෙන් ම මහ පොළොව හිමි කොට ගෙන ඇත. එහෙත් ඔහුගේ කිට්ටු ම නෑයන් වන ගොරිල්ලා, විම්පන්සියා, ගිබන් හා ඔරන්-උටන් ආදිහු තවමත් වනයේ ම රැඳී සිටිත්. මිනිසා කිසි විටෙකත් මේ දුරස්ථ නෑයන් සමඟ නතර වී සිටින්නට නොකැමති වනු නියතයි. ඒ තබා ඇතැමෙක් මෙවන් දුරස්ථ නෑ කමක් නැහැ යි ඔප්පු කරන්නට පවා තැත් කරති. එබන්දෝ නම් මිනිහාගේත්, විම්පන්සියාගේත් ආත්තම්මා එකෙක් ම යැයි ඉඟියක් පෑම පවා ඉමහත් පාපකර ක්‍රියාවෙකි යි සිතන්නෝය.

එහෙත් ඇත්ත කවර දා හෝ එලි වනු ඇත. මිනිසාට වානරයාගේ ඇති නැකම ඔප්පු කළ හැකි තොරතුරු වලින්, අපට මේ පොත පිටු ගණනින් පිරවිය හැකිය. මාතෘකාව ගැන එතරම් දිග නොවූ, පැටලිලි රහිත වූ, සාකච්ඡාවෙකින් තොරව පවා, සත්වෝද්‍යානයක් තුළ විම්පන්සියන් හා ඔරන්-උටන් දෙස පැයක් පමණ කෙටි කලක් වූව පරීක්ෂාවෙන් බලා සිටින ඕනෑ ම කෙනෙකුගේ සිත අප හා වානර වර්ගයාත් අතර ඇති සමානත්වයන්ගෙන් ඇද බැඳ ගනු ඇත.

විම්පන්සියකුට මිනිසකු විය හැකි ද?

තත්වය මෙය නම් විම්පන්සියකුට, මිනිසකුට මෙන් ඇවිදින්නට, කතා කරන්නට, හිතන්නට සහ වැඩ කරන්නටත් ඉගැන්විය නොහැකි ද?

අවුරුදු බොහෝ ගණනකට පෙර වලදිමීර් දුරොව් නම් සුප්‍රසිද්ධ සතුන් පුහුණු කරන්නා එසේ කළ හැකි බවට සිහින දුටුවෙය. ඒ නිසා මිමුස් නම් සිය විම්පන්සි සුරතලා පුහුණු කිරීමට දිගු කලක් ගත කෙළේය. මිමුස් මෙහි ලා හොඳ ම ශිෂ්‍යයෙක්

විය. හේ හැන්දෙකින් කන්නට, අත් පිස්නාවක් පාවිච්චි කරන්නට, පුටුවෙක හිඳ ගන්නට සහ මේස රෙද්ද මත ඉහිරවා නොගෙන සිය සුප් කොටස ගන්නටත් උගත්තේය. එපමණක් නොව ස්ලෙජය (හිම යානය) කඳු ගැටයෙකින් පහළට පදවන්නටත් උගති.

එහෙත් මිලුස්ට කවර දාකවත් මිනිසකු වනු නොහැකි විය.

මෙය පුදුම විය යුත්තෙක් නොවේ. මිනිස් හා වානර හැසිරීම් එකෙකින් එකක් වෙනස් වූයේ වසර දශ ලක්ෂ ගණනකට ඉහත දී නිසයි. මිනිසාගේ ප්‍රාගෛතිහාසික මී මුත්තෝ මහ පොළොව මතට ආවාහු ගස් මුදුන් වල සිටය. ඉක්බිති ඔවුහු දෙපා මත කෙළින් ඇවිදීමට උගත්හ. එහි දී දැත් නිදහස්ව හැසිරවීමට පුරුදු වූහ. එහෙත් විම්පන්සි මී මුත්තෝ සදහට ම ගස් මුදුන්හි නතර ව තුරු දිවියට වඩාත් ගැලපෙන ලෙසට සකස් වූහ.

විම්පන්සියා මිනිසකු ලෙස විකාශනය නොවීමේ හේතුව එයයි. උගේ අත්, පා, මොළය හා දිව ඇසියල්ල ම එකී මිනිස් අහ පසහින් වෙනස්ය.

විම්පන්සියකුගේ අත්ලක පින්තූරයක් සියුම් ව විමසන්න. එය මිනිස් අත්ලකට කොහෙත් ම සමාන නැත. විම්පන්සියාගේ මහපටැහිල්ල, සුළැහිල්ලට වඩා කුඩාය. එය අනෙක් ඇහිලි හා කෝණගත වී ඇත්තේ ද අපේ මහපටැහිල්ලේ ආකාරයෙන් නොවේ. ඒ අතර අපේ ඇහිලි වලින් වඩාත් ම වැදගත් වන්නේ මහපටැහිල්ලයි. අත්ල නමින් හැඳින්වෙන වැඩකරුවන් පස් දෙනෙකුගේ එකමිතියෙහි අවශ්‍යතමයා ද මහපටැහිල්ලයි. අනෙක් සතර ඇහිල්ලෙන් ඔනෑ ම එකක් සමහත්, ඒ හතර ම සමඟ එකටත් වැඩ කිරීමේ හැකියාවක් අපේ මහපටැහිල්ලට ඇත. මිනිස් අතකට එතරම් දක්ෂ ලෙසින් ඔනෑ ම සංකීර්ණ අවියක් වුව හැසිරවීමේ පුළුවන්කම ඇත්තේ මේ නිසයි.

විම්පන්සියකුට ගසෙකින් ගෙඩියක් කඩා ගන්නට වුවමනා වූ විට ඌ නිතරම දැතින් අත්තෙහි

එල්ලි පා ඇහිලි වලින් ගෙඩිය නෙළා ගනී. ඌ පොළොව මත ඇවිදින විට නැමුණු අතැහිලි මත අමාරුවෙන් බාරු වන බව පෙනේ. මෙයින් පෙනෙන්නේ ඌ නිතර ම සිය අත්, පා ලෙසත්, පා අත් ලෙසත් පාවිච්චිකරන බවයි.

සිය විම්පන්සියන්, මිනිසුන් බවට හරවනු රිසි සතුන් පුහුණු කරන්නෝ නිතර ම, අමතක කරන වැදගත් කරුණක් ඇත. එනම් මිනිස් මොළයෙකට වඩා විම්පන්සි මොළයෙක ඇති කුඩා බව හා නොවැඩුණු බව ඔවුහු අමතක කරති.

ඇත්තෙන් ම වානරයන්ගේ විකාර හැසිරීම් වනාහි, කුමානුකූල වූත්, සමාහිත වූත් මිනිස් මනසෙහි ක්‍රියාකාරිත්වයට බෙහෙවින් වෙනස්, අවුල් සහගත මනසෙහි සෙවණැලිය. එතෙකුදු වුවත් විම්පන්සියා මනා හැඟීමකින් යුක්තය. අපමණ අදිසි යදම් වලින් බඳිනු ලැබ පුංචි වන ලොවෙක දිවි ගෙවන ඌ වන දිවියට මනා ලෙස හැඩ ගැසී ඇත.

අප්‍රිකානු විම්පන්සියා පිවත් වන්නේ මහ වනයේ ඉහළ ම මහලෙහිය. ඌ උගේ කුඩුව ගසෙක අතු පතර සාදයි. සතුරන්ගෙන් බේරීමට ගසට නහී. සිය ආහාරය වන, පලා-පල අතු අතර සොයා බලයි.

තැනි තලා බිමෙහි ගමන් කරනුවට වඩා පහසුවෙන් සිරස් ගස් කඳන් දිගේ ඉහළටත් පහළටත් බඩ ගා යාමට තරම් සුව පහසු ලෙස උගේ රුක් දිවිය සැකසී ඇත. ඒ නිසා ඔබට කිසි දාක වන සුන් පෙදෙසක විම්පන්සියෝ දකින්නට නොලැබෙත්.

වරක් විද්‍යාඥයෙක් විම්පන්සියන් ඔවුන්ගේ ස්වාභාවික පරිසරයේ දිවි ගෙවන අයුරු දැක බලා ගැනීමට අප්‍රිකාවේ කැමරූන් රටට ගියේය.

විම්පන්සියන් දුසිමක් පමණ අල්ලා ගත් හේ සිය ගොවිපොළ අසල ඔවුනට රිසි ලෙස විනෝද වන්නට කටයුතු සැලසීය. එහෙත් ඔහු කලින් ම ඔවුනට බේරී යාමට නොහැකි වන ලෙස අදිසි සිර මැදිරියක් නිමවා තිබිණි. එය නිමවා තිබුණේ සරල අවි දෙකක් වන පොරොවක් හා කියතෙක උදවුවෙනි.

පළමු ව ගස් කපන්නෝ වනයේ පෙදෙසක් තෝරා ගෙන එහි මැද කුඩා රුක් දිවයිනක් ඉතිරි වන සේ වටා ඇති ගස් කපා හෙළූහ. අනතුරු ව විද්‍යාඥයා ඔහුගේ වානරයන් මේ රුක් කොදෙවෙහි මුදා හළේය. වානරයන්, වනජීවීන් නිසා ඔහුගේ සැලැස්ම හොඳ එකක් බවට ඔප්පු විය. ඉන් ඔප්පු වන්නේ ඔවුන් කවර දාකවත් සිය කැමැත්තෙන් වන දිවිය අත් නොහරින බවයි.

ධ්‍රැව වාසි හිම වලසාට කාන්තාරය සිය නිවහන කර ගනු නොහැකි සේ ම, වානරයාටත් අවකාශ සහිත පිටටනියක් සිය නිවහන කර ගනු නොහැකිය.

මෙසේ විමිපන්සියකුට සිය නිවහන වූ වනය අත හරින්නට බැරි නම් උගේ දුරස්ථ නෑයා වන මිනිසා වනය අත් හළේ කෙසේ ද?

අපේ වීරයා ඇවිදින්නට උගනී

අපේ ප්‍රාගෛතිහාසික වන වැසි මී මුත්තාට, ඔහුගේ සිර මැදිරිය සුණු විසුණු කොට, නිදහස ලබා වනයෙන් පිඬට අවුත් තැනි තලාවෙහි සිය නිවහන ගොඩ නඟා ගන්නට අවුරුදු දහස් ගණනක් ගත විය.

මහ වනයට තමා බැඳතැබූ යදම් පුපුරුවන්නට නම් අපේ රුක්වැසි මී මුත්තනට රුක් මුදුන් වලින් බිමට බැස මිහි මත ඇවිදින්නේ කෙසේ දැයි උගත යුතු විය.

අපේ යුගය වන විත්මනෙහි පවා මිනිස් ළදරුවකුට ඇවිදින්නට උගැන්ම පහසු කටයුත්තෙක් නොවේ. ක්‍රමානුකූල ළදරු පාසලක් දැක ඇති ඕනෑ ම කෙනෙක්, එහි ඇති විශේෂ ශ්‍රේණියක් වන දනි-පනි ගාන්නන් ගැන දනිති. මේ ළදරුවෝ තව දුරටත් දාපු තැන ඔහේ ඉන්නට නොකැමැත්තෝය. එතෙකුදු වුවත් තවම ඇවිදින්නට ද නොදත්තෝය. මේ දණ ගාන්නනට, ඇවිදින්නන් වන්නට ඉමහත් ප්‍රයත්නකාරී තවත් මාස කිපයක් ගත විය හැකිය. යථා ස්ථිරතාව පිණිස නම් අහම්බෙන් හෝ බංකු පුටු ආදි කිසිවක් නොඅල්ලා, සියතින් බිමවත් ස්පර්ශ නොකර, කිසිවකුගේ පිහිටක් නැති ව ඇවිදින්නට ඔවුන් උගත යුතු නොවේ ද? මෙය බයිසි-

කලයක් පදින්නට පුරුදු වීමටත් වඩා ඉමහත් අමාරු කටයුත්තකි.

දෙරුවකුට ඇවිදින්නට ඉගෙනීමට මාස කිපයක් ගත වන්නේ නම්, ඒ හා සසඳන කල, අපේ ප්‍රාග්ඓතිහාසික මී මුත්තනට එම කුසලතා ප්‍රාගුණ්‍යය සඳහා වසර දහස් ගණනක් ගත වන්නට ඇත.

ඉහත කී ඇත එපිට යුගයන්හි දී, ඔවුන් ඉඳ හිට රුක් මතින් මිහි මතද බැස ටික වේලාවක් ගත කරන්නට ඇත. ඇතැම් විට සිය අතුල්-පතුල් වලට වාරු වී නිසල ව ගත නොකළහ. ඒ වෙනුවට විම්-පන්සියන් නිතර ම කරන්නා සේ පසු පස පාදයන්-ගෙන් පියවර දෙක තුනක් පැන්නා විය හැකිය.

කෙසේ වෙතත් එදා පියවර දෙක තුනක් යනු අද මෙන් පියවර සිය ගණනෙක් නොවේ.

මිනිසා ගේ දෙපා, ඔහුගේ අත් වැඩ කිරීමට මුදා හැරියේ කෙසේ ද?

සිය තුරු දිවිය ගෙවද්දී, අපේ ප්‍රාග්ඓතිහාසික මී මුත්තෝ විවිධාකාර කාර්යයන්හි සිය පාදයන් යොදනුවට වඩා හොඳින් දැන් යොදන්නට කෙමෙන් උගත්හ. මෙසේ ඔවුහු සිය දැත් ගඩා ගෙඩි කුඩා ගැනීමටත්, රුක් දෙබල්හි නිවහන් තනා ගැනීමටත් යෙදුහ.

ඒ අතර ගෙඩියක් ඩැහැ ගන්නට පමණක් හැකි වූ අතට, ගලක් හෝ ලී කෝටුවක් අල්ලා ගැනීමටත් හුරු විය. මෙසේ ගන්නා ලද කෝටුවක් හෝ ගලක් නිසා ඔහුගේ අත වඩා දික් වීමක් හෝ ශක්තිමත් වීමක් බඳු දෙයක් සිදු විය.

එබඳු ගලෙකින් අතින් පලන්නට අපහසු ගෙඩියක් පලා ගත හැකි විය. කෝටුවෙකින් මිහිරි රුක් මුලක් හාරා ගත හැකි විය.

මෙලෙසින් ප්‍රාග්ඓතිහාසික මානවයා ගලක් හෝ කෝටුවක් යන අවි වඩ වඩාත්, නිරතුරුවත් සිය ආහාරය සපයා ගැනීමේ දී යොදන්නට පටන් ගත්තේය. කෝටුවෙකින් හාරමින් ගස් මුලුත්, අලත් ඇද ගත හැකි විය. දිරා ගිය පස් කඳකට, බර ගල් කුට්ටියෙකින් පහර දී පොඩි කර එතුළ වූ පිළුවන්

ලබා ගත හැකි විය. තව ද නොයෙක් කටයුතු පිණිස සිය අත් නිදහස් කර ගැනීමට ඔහුට ඇති එක ම මහ වූයේ, ඒවාට නියමිත වූ තවත් කටයුත්තක් වන ඇවිදීමට යෙදෑවීමෙන් මුදා ගැනීමයි.

මේ අයුරින් ඔහුගේ අත් ඇවිදීමේ කාර්ය පාවලට පැවරිය; පා, නොයෙක් කාර්යයන්හි යෙදීමට අත් වලට නිදහස දුන්නේය.

මේ අයුරින් මිහි තල මත අලුත් සතෙක් බිහි විය. මේ සතා උගේ පස්සා ගාත් ඇවිදින්නටත්, ඉදිරි ඒවා වැඩ කරන්නටත් යෙදිය.

පෙනුමින් මේ සතා තවමත් සෑම ආකාරයෙකින් ම සිවුපාවකු වැන්න. එහෙත් ඔහු පොල්ලක් හෝ ගලක් පරිහරණය කරන අයුරු ඔබට දැක ගත හැකි වූයේ නම්, මානව සංහතියේ ආදිතමයා මොහු ම යැයි එක සැණින් ඔබ කියනු ඇත. සැබැවින් ම අවි පරිහරණය දත් එක ම මානවයා ඔහු විය. සිවු පා සතුනට ආයුධ නැති නිසයි.

අපේ ප්‍රාග්ඓතිහාසික මී මුත්තනට නියනක් බඳු හොටක්, ඉස්කෝප්පයක් බඳු නිය පඳුරක් හෝ දැලි පිහියක් බඳු දතක් වැනි දේ නොවිය.

එහෙත් තියුණු දත් සහ ශක්තිමත් හොට ආදියට වඩා හොඳ යමක් ඔවුනට තිබිණ. එනම් ඔවුන්ගේ අත්ය. ඔවුනට සිය අත්, යමක් කපා ගැනීමට ගල් පතුරුත්, කෙළවර අත්ලක් බඳු දිග පොලුත් ඇහිඳ ගැනීමට යොදනු හැකි විය.

අපේ විරයා මිහි තලයට බසී

මේ සියල්ල සිදු වෙමින් තිබිය දී දේශ ගුණය ද කෙමෙන් මාරු වෙමින් තිබිණ. ප්‍රාග්ඓතිහාසික අපේ මී මුත්තන්ගෙන් ආවාසික වූ වනයන්හි රාත්‍රිභූ වඩාත් සිසිල් බවට පත් වෙමින් තිබුණාහ. සිසිර සමය වඩාත් සිසිල් වෙමින් තිබිණ. දේශ ගුණය උණුසුම් බවට හැරෙමින් තිබුණත් එයට දැඩි උණුසුමෙකැ යි කිය නොහැකිය.

උතුරු කඳු බෑවුම්හි වූ සදා හරිත මැග්නෝලිස්

හා ලෝරල් ආදි රුක් ගණයෝ, ඔක් හා ලින්ඩන් ආදි රුක් ගණයනට කෙමෙන් ඉඩ දුන්හ.

වසර දශ ලක්ෂ ගණනකට පෙර වේගවත් ජල පහරින් ගසා ගෙන අවුත් ගංගාවන්හි පහළ ඉවුරු වල තැන්පත් වූ පස් තට්ටු අතර, පාෂාණීභූත ඔක් හා ලින්ඩන් කොළ ඇතැම් විට සොයා ගෙන ඇත.

දකුණු දිග කඳු බෑවුම් හා නිම්නයන් කරා ඇදිගිය අත්තික්කා රුක් ද, මිදි වැල් ද සිසිල් සුළඟින් බෙරී රැකිණ. නිවර්තන කලාපික වන සීමාන්තය වඩ වඩාත් දකුණට පසු බට අතර වන වැසි ඇතාත් මේ වන විට දුලබ සිටි වක් කඩු වැනි දළ යුත් කොටියාත් එසේ ම දකුණු දෙසට පසු බටහ.

කලෙක අතරක් නැති ව එක දිගට ගැට ගැසී වැඩුණු වන පන්තියේ ගස්, අතරත යෝද මුවන් හා රයිනෝසිරසුන් විසින් තණ කනු ලැබූ බබළනේ එලි මහන් වලට ඉඩ සලසමින් සැකසෙන්නට විය. ඇතැම් වානර ගණයෝ පසු බසින වනයත් සමඟ පසු බටහ. අනෙක් වර්ගයෝ මැරී ගියහ.

වනතුරෙහි මිදි වැල් අඩු වී ගියේය. අත්තික්කා ගස් සොයා ගැනීම වඩාත් අපහසු විය. මේ අනුව වන මැදින් ගමන ද වඩාත් අමාරු වෙමින් තිබිණ. එයට හේතුව වනය තුනී වීම නිසා වන වැසියනට එක් ගස් රොදෙකින් තවත් එකකට යන්නට සිදු වී නම් පොළොවට බැස ගමන් කළ යුතු වූ හෙයින්. රුක් වැසියකුට මෙය පහසු කාරියෙක් නොවේ. නිසැකයෙන් ම වඩාත් දක්ෂ, මස් බුදින වන මෘගයකුට ගොදුරක් විය හැකි හෙයිනි.

එහෙත් ඔවුනට කළ හැකි වෙනත් යමක් නොවිය. සාගින්න, ගස් වලින් බසින්නට ඔවුනට බල කෙළේය.

අපේ ප්‍රාග්ඓතිහාසික මී මුත්තෝ වඩ වඩාත්, නිරතුරුවත් සිය ආහාරය සොයා ගැනීමේ පරමාර්ථයෙන් සැරි සරනු වස් බිමට බසින්නට බල කරනු ලැබූහ.

තමන් හදා වඩා ගනු ලැබූ වන ලොවේ හුරු

පුරුදු වන මැදිරි හැර දැමූ විට ඔවුනට වූයේ කිමෙක් ද?

ඔවුහු වන නීතිය කැඩූහ. සොබා දහමින් හැම සතකුට ම තැනක් උරුම කොට බැඳ තැබුණු බැඳුම නමැති යදම බිඳ ගූහ.

සිවු පාවුන් සහ සියොතුන් වෙනස් වන බව අපි දනිමු. සොබා දහමෙහි නිත්‍යතාව නම් අනිත්‍යතාවයි. එහෙත් එය නිකම් ම සරල කාරියෙක් නොවේ.

අප දැන් දන්නා පරිදි, තිසුණු නිය පඳුරින් යුත් කුඩා වූ සිවු පාවකුට අශ්වයකු වීමට වසර දශ ලක්ෂ ගණනක් ගත වූයේය. හැම සිවු පා පැටියෙක් ම සෑම ආකාරයෙන් ම උගේ මවු පියනට සමානය. කිසියම් වෙනසෙක් කොහෙත් ම නැත. කිසියම් වර්ගයෙකින් පැවත අවුත්, එයින් ඉඳුරා වෙනස් අලුත් වංශයක් ප්‍රාදුර්භූත වීමට පරම්පරා දහස් ගණනක් ගැනිණ.

දැන් ඉතින් අපේ ප්‍රාගෛතිහාසික මී මුත්තන්ගේ තත්ත්වය කෙසේ ද?

ඔවුනට සිය පුරුදු හා ක්‍රියා මාර්ගයන් වෙනස් කරන්නට නොහැකි වී නම්, වානරයන් සමඟ දකුණු දෙසට පසු බසින්නට සිදු විය හැකි ව තිබිණි. එහෙත් ඔවුහු වානරයනට වෙනස් වූහ. ඒ ඔවුන් මේ වන විට ගලින් හා ලීයෙන් තනා ගත් අවි වල උපකාරයෙන් ගොදුරු සොයා ගන්නා අයුරු දැන සිටි හෙයිනි. මේ වන විට වන ගහනයන්හි දුලබ බවට යමින් තිබුණු දකුණේ ප්‍රණීත පලතුරු වලින් තොර ව පිවත් වීමට ඔවුනට උගත හැකි විය. මහ ටනය කෙමෙන් තුනී වීමේ හේතුවෙන් ඔවුහු කිසිත් විමිතියකට පත් නොවූහ. ඒ, බිම ඇවිදීමට ඔවුන් සපුරා ඉගෙන ගෙන සිටි නිසයි. ඔවුහු තුරු සුන් එලි මහන් අවකාශයනට කිසි සේත් බිය නුවූහ. කිසියම් සතුරෙක් ඔවුන්ගේ මහ හරස් කෙළේනම්, මුළු වානරවානවයෝ රැළ ම ගල් හා මුගුරු වල උදවුවෙන් තුවූම රැකවරණය සලසා ගත්හ.

උදා වුණු අමිහිරි කල දසාවන් විසින් වානර-

මානවයෝ දඬුවම් දීමට තින්දු කරනු නොලැබූහ. නැතහොත් දකුණු දිග වනයන් සමඟ පසු බැසීමට ද නොසලස්වනු ලැබූහ. ඔවුහු හුදෙක් තමා මානවයකු බවට පරිවර්තනය වීම වේගවත් කළේය.

ඉතින් අපේ දුරස්ථ නැයන් වූ වානරයනට කිමෙක් වී ද?

ඔවුහු දකුණු දිග වනයන් සමඟ පසු බැස ගොස් සදා වන වැසියන් බවට පත් වූහ. සැබැවින් ම මේ කටයුත්තේ දී ඔවුනට තෝරා ගන්නට දෙයක් නොවිය. ඔවුහු වේගවත් සංවර්ධනාත්මක විකාශකට යොමු වුණු මානව-වානරයන් පසු පස දණ ගාන්නන් බවට පත් වූහ. ඔවුහු නව මෙවලම් පරිහරණය නුගත්හ. ඒ වෙනුවට ඔවුන්ගේ දක්ෂතාමයෝ පෙරටත් වඩා හොඳින් ගස් නහින්නටත් අත්තෙන් අත්තට පනිමින් එල්ලෙන්නටත් උගත්හ.

ගස් නැහීමේ අඩු දක්ෂතාවක් ඇත්තා වූත්, තුරු මත දිවියට පහසුවෙන් සකස් විය නොහැක්කා වූත්, ශක්තිතම හා විශාලතම වානරයෝ පමණක් ඉතිරි වූහ. තුරු මත දිවිය වඩාත් අපහසු වූයේ වැඩියෙන් ම බර වූත් විශාල වූත් වානරයාටයි. මෙසේ ඒ යෝදු වානරයෝ තුරු මතින් මිහි මතට බසින්නට බල කරනු ලැබූහ. ඔවුන්ගෙන් ගොරිල්ලා තවමත් වනයේ බිම ඇසුරු කොට දිවි ගෙවයි. ඔවුන්ගේ ශක්තිමත් හකු පාඩා වලින් පිටට නෙරා ගිය දළයෝ වෙති.

මෙසේ පාෂාණීභූත මානවයාත්, ඔහුගේ දුරස්ථ නැයාත් පිළිවෙත් මහ විසින් සදහට ම බෙදනු ලැබීය.

ගිලිහුණු පුරුක

මිනිසා දෙපා මත ඇවිදින්නට උගත්තේ ක්ෂණයෙකින් නොවේ. පළමුවෙන් ඔහු දෙපා මත වැටී නොවැටී යමතම් ඔබට මොබට මාරු වුණා පමණි.

පළමු වන වානර-මානවයා කවර හැඩයක් ගත්තේ ද?

මිහි මත කිසිදු තැනෙක වානර-මානවයා ඉතිරි

වී නොමැත. එහෙත් ලොව කිසියම් තැනෙකින් ඔහුගේ ඇට කටු සොයා ගත නොහැකි ද?

මේ ඇට කටු සොයා ගනු ලැබුවහොත් එය, මිනිසා වානරයාගෙන් පැවත එන බවට අන්තිම සාධකය වනු ඇත. වානර-මානවයා පැරණිතම මානවයා වන නිසා එය ප්‍රාග්තම වානරයාගෙන් පටන් ගෙන නූතන තම මිනිසාගෙන් අවසන් වන දම්වැලෙහි වැදගත් පුරුකක් වන හෙයිනි. කෙසේ හෝ ගං ඉවුරු වල තැන්පත් මැටි හා වැලි තට්ටු අතර කිසිදු සලකුණක් නොතබා ඒ පිළිබඳ වැදගත් තම පුරුක විනෂ්ට වී ඇත.

දහ නව වැනි සිය වස අග දී, ජර්මන් පිව විද්‍යාඥයකු වූ අර්නස්ට හෙකල් තමා විසින් විද්‍යාඥයනට පිතෙකැන්ත්‍රෝපස් නමින් හඳුන්වා දෙනු ලැබූ මානව-වානරයාගේ ඇට කටු දකණු ආසියාවේ කිසියම් තැනෙක තිබිය හැකි බව මුල් වරට පළ කෙළේය. ඒවා ආරක්ෂා වී ඇතැ යි ඔහු සිතූ නියත ඉලක්කයක් සිතියමේ සටහන් ද කෙළේය. එනම් සුන්ඩා ද්වීපස්ථය.

මේ මතයෙහි ලා ඔහු සමඟ එකඟ නොවූ බොහෝ දෙනෙක් වූහ. එහෙත් ඔහුගේ මතය අමතක ව ගියේ නැත. විශේෂ උනන්දුවෙකින් මෙය විශ්වාස කළ එක් පුද්ගලයෙක් සිය රැකියාව ද කැප කොට කල්පිත පිතෙකැන්ත්‍රෝපස්ගේ, කල්පිත නටබුන් සොයන්නට සුන්ඩා දිවයින් බලා පිටත් විය.

මේ පුද්ගලයා නම් ඇම්ස්ටර්ඩෑම් සරසවියේ කායවිච්ඡේද විද්‍යා කථිකාචාර්ය වරයකු වූ ආචාර්ය ඉයුජින් ඩියුබොයිස්ය.

ආචාර්ය ඩියුබොයිස් සිය නිර්ණිත සැලැස්ම දියත් කරනු පිණිස සරසවියේ ඔහුට හිමි තත්ත්වය ද අත් හළේය. ඉක්බිති නේවාසික වෛද්‍ය වරයෙකු ලෙස හමුදාවට බැඳී සුමාත්‍රාව බලා යාත්‍රා කෙළේය.

හේ දිවයිනේ පදිංචි වීමෙන් පසු සිය මුළු විවේක කාලය ම පිරියෙසුම් පිණිස කැප කෙළේය. කම්කරුවෝ ඔහුගේ උපදෙස් යටතේ කණිමින් මහ පොළොව නොමැත. එහෙත් ලොව කිසියම් තැනෙකින් ඔහුගේ ඇට කටු සොයා ගත නොහැකි ද?

මේ ඇට කටු සොයා ගනු ලැබුවහොත් එය, මිනිසා වානරයාගෙන් පැවත එන බවට අන්තිම සාධකය වනු ඇත. වානර-මානවයා පැරණිතම මානවයා වන නිසා එය ප්‍රාග්තම වානරයාගෙන් පටන් ගෙන නූතන තම මිනිසාගෙන් අවසන් වන දම්වැලෙහි වැදගත් පුරුකක් වන හෙයිනි. කෙසේ හෝ ගං ඉවුරු වල තැන්පත් මැටි හා වැලි තට්ටු අතර කිසිදු සලකුණක් නොතබා ඒ පිළිබඳ වැදගත් තම පුරුක විනෂ්ට වී ඇත.

දහ නව වැනි සිය වස අග දී, ජර්මන් පිව විද්‍යාඥයකු වූ අර්නස්ට හෙකල් තමා විසින් විද්‍යාඥයනට පිතෙකැන්ත්‍රෝපස් නමින් හඳුන්වා දෙනු ලැබූ මානව-වානරයාගේ ඇට කටු දකණු ආසියාවේ කිසියම් තැනෙක තිබිය හැකි බව මුල් වරට පළ කෙළේය. ඒවා ආරක්ෂා වී ඇතැ යි ඔහු සිතූ නියත ඉලක්කයක් සිතියමේ සටහන් ද කෙළේය. එනම් සුන්ඩා ද්වීපස්ථය.

මේ මතයෙහි ලා ඔහු සමඟ එකඟ නොවූ බොහෝ දෙනෙක් වූහ. එහෙත් ඔහුගේ මතය අමතක ව ගියේ නැත. විශේෂ උනන්දුවෙකින් මෙය විශ්වාස කළ එක් පුද්ගලයෙක් සිය රැකියාව ද කැප කොට කල්පිත පිතෙකැන්ත්‍රෝපස්ගේ, කල්පිත නටබුන් සොයන්නට සුන්ඩා දිවයින් බලා පිටත් විය.

මේ පුද්ගලයා නම් ඇම්ස්ටර්ඩෑම් සරසවියේ කායවිච්ඡේද විද්‍යා කථිකාචාර්ය වරයකු වූ ආචාර්ය ඉයුජින් ඩියුබොයිස්ය.

ආචාර්ය ඩියුබොයිස් සිය නිර්ණිත සැලැස්ම දියත් කරනු පිණිස සරසවියේ ඔහුට හිමි තත්ත්වය ද අත් හළේය. ඉක්බිති නේවාසික වෛද්‍ය වරයෙකු ලෙස හමුදාවට බැඳී සුමාත්‍රාව බලා යාත්‍රා කෙළේය.

හේ දිවයිනේ පදිංචි වීමෙන් පසු සිය මුළු විවේක කාලය ම පිරියෙසුම් පිණිස කැප කෙළේය. කම්කරුවෝ ඔහුගේ උපදෙස් යටතේ කණිමින් මහ පොළොව

මොවෙහි විශාල පස් කොටසක් පෙරළා දැමූහ. මසක් ගත විය; දෙකක් ගත විය; තුනක් ගත විය. එහෙත් පිතෙකැන්ත්‍රෝපස්ගේ ඇට කටු වලට සමාන කිසිවක් සොයා නොගැනිණ.

මානව-වානරයාගේ ඉතුරු-බිතුරු සුමාත්‍රාහි නොලද හැකි බව නිසැක වූ කල හේ සිය පිරියෙසුම් ජාවාහි කරගෙන යාමට තීරණය කෙළේය.

අවසානයේ දී ජයග්‍රහණයක් සමඟ ම ඔහුට එම සුන් බුන් ජාවාහි හමු විය.

ඩියුබොයිස් ජාවාහි ට්‍රිනිල් අසල සෝලෝ ගංඉවුරෙහි දී පාෂාණීභූත මිනිසකු සොයා ගත්තේය. එම සුන් බුන් වලට කලවා ඇටයක්, දත් දෙකක් හා හිස් කබලෙක ඉහළ කොටසක් ද අයත් විය. පසු ව අහල පහලින් වෙනත් කලවා ඇට වල සුන් බුන් කීපයක් ද සොයා ගන්නා ලදී.

ප්‍රාග්ඓතිහාසික මී මුත්තාගේ හිස් කබල තුළට එබී බැලූ ඩියුබොයිස් හේ කෙබඳු වී දැ යි මවා ගැනීමට උත්සාහ කෙළේය. ඔහු දුටු අයුරින් මානව-වානරයාට ඇස් වලට උඩින් සහ අස්ථිමය ගැටටක් සමඟ පහත් පැතලි නළල් තලයක් ද තිබිණ. මුහුණ මානවාකාරයට වඩා වානරාකාර විය. මොළය පිළිබඳ සාවධාන අධ්‍යයනයේ දී කිසිදු නරාකෘතික වානරයකුට වඩා පිතෙකැන්ත්‍රෝපස් බුද්ධිමත් වූ බව ඩියුබොයිස්ට ඒත්තු ගියේය. ඔහුගේ මොළය අනෙක් උන්ගේ මොළයට වඩා විශාල විය.

එහෙත් හිස් කබලෙක ඉහළ කොටසත්, දත් දෙකක් හා කලවා ඇටයක් සැබැවින් ම තවත් ඉදිරියට යාමට සැහෙන්නත් නොවිය. එසේ ද වුව තියුණු හැඳැරීම් මඟින් මානව-වානරයාගේ ජීවිතය පිළිබඳ බොහෝ තොරතුරු ගොඩ නඟා ගැනීමට ඩියුබොයිස්ට හැකි විය. මේ අනුව ඔහුට වක් වූ දෙපා මත අමාරුවෙන් ඇවිදින්නට හැකි වූ බව කලවා ඇටය එලිදරවු කෙළේය. කැලෑ එලි මහනක් මැදින්, දෙකට නැමී දණිස් නමා ගෙන දිගු අත් බිම දිගට අද්දමින් හතර ගාතෙන් ඉදිරියට ගාටන

මානව – වානරයා ඩියුබොයිස්ට මවා ගත හැකි විය. විශාල ඇහි බැම නෙරුම තුළ ගිලුණු දැස්, තියුණු විමංශනයෙන් බිමට යොමුව තිබිණ. ගොදුරට නිසි කිසිවක් හේ අත් නැරිය.

හේ තව දුරටත් වානරයෙක් නොවීය. එහෙත් තව ම මානවයෙක් ද නොවීය. ඩියුබොයිස් ඔහුගේ පාෂාණිභූත මානව – වානරයාට ''පිතෙකැන්ත්‍රෝපස් ඉරෙක්ටස්'' යැ යි නම් තැබිය. වානරයා සමඟ සසඳන කල ඔහු නියතයෙන් ම ඍජු වූ හෙයිනි.

ඉයුජින් ඩියුබොයිස්ගේ පිරිසෙසුම් හැම පැත්තෙන් ම ද්වේෂයෙන් හා හෙළා දැකීම් වලින් යුතු ව පිළිගනු ලැබිණ. ඒ බොහෝ දෙනෙකු මානවයාගේත්, වානරයාගේත් ප්‍රාගෛතිහාසික මී මුත්තා එකෙක් ම යැ යි ඒත්තු ගන්නට නොකැමැති වූ හෙයිනි. කතෝලික පල්ලියත් එහි අනුගාමිකයෝත් ඩියුබොයිස්ට හමු වූ හිස් කබල ගිබන්ගේ වූ අතං කලවා ඇටය මිනිසකුගේ යැ යි කීහ. ඩියුබොයිස්ගේ සතුරෝ ජාවා වානර-මානවයා, වානර මානව මිශ්‍රණයෙකැ යි පිළි ගන්නට, හුදෙක් සිද්ධාන්තයෙක පිහිටියන් තරමට ම නොසතුටු වූහ. ඩියුබොයිස් සොයා ගත් අස්ථි කඤ්ඵර ඉතුරුබිතුරු ඔහු දැක්වූ පරිදි වසර සිය දහස් ගණනක් මීහි තුළ වූ ඒවා නොව, වසර කිපයක් පමණක් පැරණි. ඉතා නුතන ඒවා බව ඔප්පු කිරීමට ඔහුගේ සතුරෝ උත්සාහ කළහ. මුල් ස්ථානයේ දී කවර දාකවත් හමු නොවුණු බව විශ්වාස කරවීමට, පිතෙකැන්ත්‍රෝපස් ඉරෙක්ටස් යළිත් වළලා දැමීම පිණිස, ඔවුනට කළ හැකි හැම දෙයක් ම කළහ.

වීසි වැනි සිය වසේ ඉතා මුල් හරියේ දී පිකින් නගරයේ විද්‍යාභූයකුට අහම්බෙන් මෙන් බෙහෙත් හලකට යන්නට සිදු විය. එහි වූ අපූර්ව ප්‍රදර්ශන භාණ්ඩ වලට මිනිස් රුවෙක හැඩ ගත් පින්සෙං නම් බෙහෙත් මුලක් ද, නොයෙක් වර්ගයේ බෙහෙත් මඩි ද, සිවු පා ඇට හා දත් ද ඇතුළත් විය.

සිවු පා දත් එකතුව අතර, දන්නා වර්ගයේ සිවු පාවකුට අයිති නැති, සපුරා නොගැලපෙන දතක්

ඔහුට හමු විය. තව ද එය අනුමාන ලෙස මානව දතකට සමාන වූවකි.

විද්‍යාඥයා එම දත මිලට ගෙන යුරෝපයේ කටු ගෙයකට යැවීය. එය ''චීන දත'' නමින් ගවේෂණ නාමාවලියෙහි ලේඛන ගත කැරිණ.

වසර විසි පහකට වැඩි කලක් ගත වූයේය. ඒ අතර පීකිං අසල චෞ-කෝ-ටියන්හි, එයට සමරූපී දත් දෙකක් සොයා ගනු ලැබිණ. මේ දත් හිමියා ''සිනැන්ත්‍රෝපස්'' යනුයෙන් කැරිණ.

කිසි දාක සම්පූර්ණ ඇට සැකිල්ලක් ලැබී නැත. අලුත් සොයා ගැනීම් වලට දත් පනහක් පමණ ද, හිස් කබල් තුනක් ද, හකු පාඩා එකොළොසක, පතුලක, හා උකුලු පෙදෙසක සුන්බුන් ද, කොඳු ඇට පුරුකක් ද, ගෙල ඇටයක් ද, මැණික් කටුවක් ද අයත් විය.

මෙයින් පෙනෙන්නේ නියතයෙන් ම ගල් ලෙන් වැසියා ඔලු තුනක් හා එක කකුලක් ඇත්තකු වූ බව නොවේ.

ඒ ගැන පුදුම වන්නට දෙයක් කොහේත් ම නැත. සාමාන්‍යයෙන් වානර මානවයන් විශාල රංචු-වක් චෞ-කෝ-ටියන් ගුහාවේ ජීවත් වී ඇත. ඒ ප්‍රාග්ෛතිහාසික සමයේ සිට කාලය වසර සිය දහස් ගණනින් ගෙවී ගොස් ඇති හෙයින් එම කාලය තුළ යට කී ඇට කටු වලින් බොහොමයක් විනාශ ව ගොස් ඇත. එහෙත් හමු වූ සුන් බුන්, පාෂාණීභූත ගල් ලෙන් වැසියන්ගේ රූපාකාරය මවා පාන්නට හොඳටම ප්‍රමාණවත් විය. විද්‍යාඥයෙක් ඇහිල්ලක් පමණක් අල්ලා ගෙන සිටී නම් නිසැකයෙන් ම මුලු සිරුර ම ඇඳ ගැනීමට ඔහුට පුළුවන.

පාෂාණීභූතයන්ගේ සුන් බුන් ලබා දුන් අවසාදිත තුළ දෙදහසකට වැඩි ගල් අවි රැසකුත් අඩි විසි තුනක් ගැඹුරු, පස් හා මිශ්‍ර අළු තට්ටුවකුත් ඇතුළත් විය.

මෙයින් පැහැදිලි වන්නේ මානව-වානරයන් මෙම ලෙන තුළ බොහෝ වසර ගණනක් ජීවත් වුණු බව

හා ඔවුන්ගේ ගින්දර දිවා රෑ දැල්වෙමින් තිබුණු බවත්ය. කොටින් කියතොත් ඔවුහු ගිනි දල්වා ගන්නා අයුරු නොදත්හ. එහෙත් කෑමට නිසි අල-මුලුත්, අවි පිණිස ගලුත් එකතු කර ගත් පරිදි ගිනි ද එකතු කර ගන්නා අයුරු දත්හ.

ලැව් ගින්නකට අනතුරුව ගින්දර ලබා ගත හැකි විය. ප්‍රාග්ඓතිහාසිකයා ඇඟිඳ ගත්, දැල්වෙන ගිනි අඟුරක් ඉමහත් පරිස්සමින් සිය නිවහන වෙත ගෙනාවේය. එය ගල් ලෙනක් තුළ වැස්සේන් හා සුළඟින් රැක ගත්තේය. ඔහු එය රැක බලා ගෙන සිය අමිල ධනය ලෙස ආරක්ෂා කර ගන්නට ඇත.



අපේ වීරයා තුරු හිසින් මිහි මතට බැස, ඔබ මොබ සරන්නට විය. හේ දෙපා මත සරන්නට එඩිතර ලෙස සෘජු වූයේය. එය ද ප්‍රමාණවත් නොවිණි නම් ඔහු උදෙසා සොඳා දහම අදහස් නොකළ දේ පවා කෑමට පටන් ගැනිණ. එය ද සොඳා දහම පවා නොදත් උපායෙකින් සකස් කොට ගෙනය.

ලොවෙහි සතුන් හා ගස් කොළන් අතරත් අන්‍යෝන්‍ය යැපීම් රටාවෙක් ඇත. ඔවුහු "පෝෂණ චක්‍ර" වලින් එකට බැඳී ඇත්තෝය. බැදී වල ලේන්නු "පයින්" ගෙඩි කති. ඒ අතර මුගටියෝ ලේනුන් කති. මේ අනුව අපට දාමයක් ලැබේ. පයින් ගෙඩි — ලේන්නු — මුගටියෝ යනුවෙනි. එහෙත් ලේනුන්ගේ ගොදුර පයින් ගෙඩි පමණක් නොවේ. ඔවුහු හතු හා වෙනත් ගෙඩි වර්ග ද කති. ලේනුන් දඩයම් කරන සිවු පාවෝ, මුගටියෝ පමණක් නොවෙති. වෙනත් සිවු පාවුන් මෙන් ම, උකුස්සන් වැනි කුරුල්ලෝ ද ඔවුන් දඩයම් කරති. මේ අනුව අපට තවත් දාමයක් ලැබෙයි. හතු සහ ගෙඩි ජාති — ලේන්නු — උකුස්සෝ යනුවෙනි. සියලු වන වැසියෝ මෙවන් දාමයන්හි පුරුක් වෙති.

අපේ වීරයා ද ඔහුගේ වන ලොවේ "පෝෂණ චක්‍රයේ" පුරුකෙකි. ගඩා-ගෙඩි ඔහුගේ ගොදුර විය. හේ එක්-කඩු-දළ කොටියාගේ ගොදුර විය.

එකල්හි අපේ වීරයා මේ දාමයන් සිඳින්නට සුහුසුලු විය. හේ, මීන් පෙර නොකෑ වීරු දේ කන්නට පටන් ගති. වසර සිය දහස් ගණන් තුළ සිය මුතුන් මිත්තන් වක්-කඩු-දළ කොටියාටත්, වෙනත් රෞද්‍ර වන මෘගයනටත් ගොදුරු වූ පරිදි තමාත් ගොදුරක් වීම හේ පිළිකෙව් කෙළේය.

ඔහු එතරම් නිර්භීත වූයේ කෙසේ ද? ලේ පිපාසයෙන් ගොදුරට තමා පතා සිටි තියුණු දළ සහිත වන මෘගයන්ගෙන් ගහන මිහි මතට බසින්නට ඔහු

දිරියක් උපදවා ගත්තේ කෙසේ ද? එය ද බළලෙකු යටට වී කට අයා සිටිද්දී ගසක් උඩ සිට කුරුල්ලකු උගේ කටට ම පැනීමට සමානය.

මිනිසාගේ නව දිරිය උපන්නේ ඔහුගේ දැතිනි. අතින් තරයේ ගත් ගලත්, අල හා මුල් හාරා ගැනීමට යොදා ගත් කෝටුවත් ඔහුගේ ආයුධ විය. මිනිසාගේ මුල්ම උපකරණ ඔහුගේ මුල්ම අවිද විය. ටැඹිදු මිනිසා කෙදිනෙකවත් වනයෙහි හුදෙකලාව නොසැරිය.

තමනට පහර දුන් ඕනෑම සතුරකු තැන්ගේ අලුත් අවි වලින් පලවා හරිමින් මුළු මානව රොත්ත ම සතුරා පිට එක හුස්මට කඩා පැන්නෝය.

ගින්දර ගැන ද අප අමතක නොකළ යුතුය. ඔහුගේ මිතුරා ලෙස සිටි ලින්දරෙන් සිය භයානකතම සතුරා වූව තැති ගන්වා පලවා හරින්නට මිනිසාට හැකි විය.

මිනිස් අතින් සටහන් වුණු
සලකුණු ඔස්සේ

තමන් ගස් වලට අල්ලා බැඳ දමනු ලැබූ යදම් සිඳ දමන්නට සලසා ගන්නා අතර, ප්‍රාගෛතිහාසික මානවයා තුරු හිසින් මිහි මතටත්, වන ගැබින් ගහ බඩටත් සංක්‍රමණය කෙළේය.

ඔහු ගංගා නිමින වෙතට පෙරමුණ ගත් අයුරු අප දන්නේ කෙසේ ද?

අප එදෙසට මෙහෙයවනු ලබන මං සලකුණු ඇත.

එහෙත් ඒවා සුරැකී ඇත්තේ කෙසේ ද?

මේවා සාමාන්‍යයෙන් පිය සටහන් නමින් හඳුන්වනු ලබන මං සලකුණු නොවේ. මේවා මිනිස් අතින් සටහන් කැරුණු ඒවාය.

වසර සියයකට පමණ පෙර කමිකරු පිරිසක් වැලි සහ බොරලු පිණිස, ප්‍රංශයේ සෝම් නදී මිටියාවත හාරමින් සිටියහ.

එහි හමු වූ අමුතු ගල් පුරා වස්තු කෙරෙහි උනන්දුවක් දක්වන්නකු වන ඒ අසල පිවත් වූ බුෂෙ ද පර්ත් ගේ අවධානයට ලක් විණ. සෝම් නදී මිටියාවතේ බොරලු අතරින් ලැබුණු චිත්තාකර්ශණීය ද්‍රව්‍ය සම්භාරයක් බුෂෙ ද පර්ත් වෙත විය. මැමත් දළයක් රයිනෝසිරස් අහක් හා ලෙන් වලස් හිස් කබලක් ද ඒ අතර විය. මේ අපූර්වයෝ අදත් ගවයන් හා බැටලුවන් කරන සේ කලෙක සෝම් නදියට දිය බීමට ආවෝ වූහ.

එහෙත් ප්‍රාගෛතිහාසික මානවයා කොහි වී ද? බුෂෙට ඔහුගේ ඇට කටු ගැණ සලකුණක් සොයා ගත නොහැකි විය.

ඉක්බිති වැල්ලෙහි තිබී ලැබුණු අපූරු ගිනි ලෙක් ඔහුට දක්නට ලැබිණ. ඒවා දෙපසින් පතුරු ගසන්නට හැකිව තිබුණේ කාට ද? මෙය මිනිස් අතකට පමණක් කළ හැක්කක් බව හේ තීරණය කෙළේය.

තත් කාලීන මහාත්මතම පුරා විද්‍යාඥයෝ මෙය මිනිසාගේ මැවීම ගැන, පල්ලියේ ඉගැන්වීම් වලට අභියෝගයක් වන හෙයින්, මේ ප්‍රාදේශීය පුරා

විද්‍යාඥයා තත් විද්‍යාව පිළිබඳ කොහෙත් ම අවබෝධයක් නැත්තකු ද, ඔහුගේ ගිනි ගල් "පොරොව" මායාවක් බව ද ඔප්පු කරන්නට උත්සාහ දැරූහ.

සටන පසළොස් වසරක් ම ඇවිලෙමින් තිබිණ.

බුෂෙගේ කෙස් සුදු විය. හේ මහලු බවට ගියේය. එහෙත් මානව වර්ගයාගේ අති පෞරාණිකත්වය ඔප්පු කරමින් තම අදහස් පිළිබඳ සටන දිගට ම කරගෙන ගියේය. හේ තම මූල් පොත පළවූ සැණින් දෙවැනි හා තුන් වැනි පොත් ද ලිව්වේය. බුෂෙ විරෝධී බල තුලනය අසමාන විය. හේ එතෙකුත් ජයග්‍රාහී විය. විශාරදතම බ්‍රිතාන්‍ය භූවිද්‍යාඥයන් දෙදෙනකු වූ චාල්ස් ලයිල් හා ජෝසප් ප්‍රෙස්ට්විච් ද බවුවර්ගේ මතය ප්‍රසිද්ධියේ ම ආරක්ෂා කළහ. දෙදෙනා ම සෝම් මිටියාවතත්, කැණූ බිමත් නැරඹූහ. බුෂෙගේ ද්‍රව්‍ය සම්භාරයන් පිරික්සමින් ඔවුහු හුහ කලක් ගෙවූහ. දීර්ඝ අධ්‍යයනයෙකින් පසු බුෂෙ විසින් සොයා ගනු ලැබූ උපකරණ සැබෑවින් ම දැනට ප්‍රංශයෙන් හා යුරෝපයෙන් ද නෂ්ටප්‍රාය ව ඇති දැවැන්ත ඇතුනට හා රයිනෝසිරසුනට සම කාලීන ප්‍රාග්ඓතිහාසික මානවයාගේ උපකරණ බව ඔවුන් විසින් ප්‍රකාශ කැරිණ.

චාල්ස් ලයිල් 1863 දී පළ කළ "The Antiquity of man" නම් කෘතිය බුෂෙගේ සතුරන්ගේ සියලු ම තර්ක නිෂ්ප්‍රභ කෙළේය. එවිට ඔහුගේ සියලු සතුරෝ ලෝකයේ නොයෙක් තන්හි ප්‍රාග්ඓතිහාසික උපකරණ සොයා ගනු ලැබීමෙන් පසු, ඔහු විසින් කිසිවකුත් සොයා ගනු නොලද බව කියන්නට පටන් ගත්හ.

මේ අලුත් තර්කයට ලයිල්ගේ උපහාසාත්මක විමතුර වූයේ, විද්‍යාව විසින් වැදගත් සොයා ගැනීමක් කළ හැම විට ම, පසු ව ඔවුන්ගේ කටවල් වලින් ම "මෙය බොහෝ කලෙක සිට හැම දෙනා විසින් ම දන්නා ලද්දෙකි" යි එකතු කරනු ලැබුවත් මුලින් ම "එය ආගම් විරෝධී යැ" යි කියන බවයි.

බුෂෙට සෝම් නදී මිටියාවතේ හමු වූ ගිනි ගල් වලට සමාන ඒවා දැන් ලෝකයේ නොයෙක් තැන්

වලින් ලැබී ඇත. මේවා සොයා ගෙන ඇති සාමාන්‍ය තැන් නම් පැරණි ගංගා නිම්න වල ගල් හා බොරලු පිණිස භාරනු ලැබූ ගල් වලවල්ය.

මේ අයුරින් ආදිතම මානවයා, වැඩ කරන්නේ කෙසේ දැයි යමතමින් උගනිමින් සිටිය දී පාවිච්චි කරනු ලැබූ උපකරණ ප්‍රාග්ඓතිහාසික යුගයේ පොළොව යට තබී නූතන මානවයාගේ ඉස්කෝපය විසින් සොයා ගනු ලැබෙයි.

ගල් මෙවලමෙක පැරණිතම ආකෘතිය නම් එක් ගිනි ගලෙකින් දෙපැත්ත කපා දැමූ වෙනත් ගිනි ගලෙකි. ඒ අසල සාමාන්‍යයෙන්, කපා දැමූ ගල් පතුරු ඇත.

ගංගා නිම්න හා වැලි වැටි වෙතටත් අප මෙහෙවන මිනිස් අත් පිළිබඳ පිය සටහන් නම් මේ ගල් මෙවලමය. ආදිතම මානවයා ඔහුගේ ගල් මෙවලම් සඳහා සොයා ගනු ලැබූ දේවල් එම අවසාදිත තට්ටු තුළත් නොගැඹුරු වළ සහිත තැන් වලත් ඇත.

මෙය මිනිස් කාරියෙකි. සිවු පාවකුට හෝ කුරුල්ලකුට උගේ ආහාරයත්, කැදැල්ල තැනීමට අවශ්‍ය දේත් සොයා ගත හැකිය. එහෙත් අමතර උපකරණ තැනීමට අවශ්‍ය වැඩිමනත් දැ සොයන්නට නම් ඔවුන් කවර දාකවත් නොයනු ඇත.

පණ ඇති ඉස්කෝප්පය සහ බැරලය

කුරුල්ලන්, සිවු පාවුන් සහ කුරුමිණි සතුන් ගේත්, වඩුකම හැකියාව ගැන ඔබ කියවා හෝ අසා තිබෙනු විය හැකිය. ඔවුන් අතර නිත්‍ය ලී වඩුවන්, ගල් වඩුවන් හා වියන්නන් පමණක් නොව සන්නාලියන් ගැන පවා අපි දනිමු. ගස් කපන්නකු සේ ගස් පෙරළා දමන්නට බීවරයකුගේ තියුණු දත් වලට පුළුවන. ඒ අතර බීවරයෝ ඇද වැටුණු ගස් කඳන් හා අතු පාවිච්චි කොට ඇත්ත ම වේලි බඳිති. ගහ පිටාර ගැලීමට සලස්වා බීවරයන් ප්‍රිය කරන නිසල පොකුණු නිමවන්නට මේ වේලි වලට පුළුවන.

දැන්, වියළි පයින් කටු වලින් සිය නිවහන් ගොඩැලි නිමවන දුඹුරුවන් සාමාන්‍ය වන කුහුඹුවන්

ගැන තොරතුරු මොනවා ද? අප එම කුහුඹු තුඹස කෝටුවෙකින් ඇද දැමුවහොත් එය කොතරම් සූක්ෂ්ම තට්ටු රැසක් ඇති ගොඩ නැහිල්ලෙක් ද යනු දැක ගත හැකිය.

දැන් ප්‍රශ්නයෙක් පැන නඟී. යම් ලෙසෙකින් මිනිසා කුහුඹුවන් හා බ්වරයන්ගේ, නිවහන් හා බැමි කඩා දමීම නතර කළහොත් ඔවුන් කවර දාක හෝ මිනිසා හා කරට කර එන දිනයක් උදා වේ ද? යන්නයි. මෙතැන් සිට වසර දශ ලක්ෂයක් තුළ දී කුහුඹුවනට ඔවුන්ගේ ම පුවත් පත් තිබිය හැකි ද? කුහුඹු කර්මාන්ත ශාලා විය හැකි ද? ඔවුන් කුහුඹු අහස් යානා වලින් පියාඹනු ඇද් ද? කුහුඹු ගුවන් විදුලි සංගීතයට කන් දෙනු ඇද්ද? සැබැවින් ම නැත. එයට එක ම මූලික හේතුව මිනිසාත්, කුහුඹුවාත් අතර ඇති ඉමහත් වැදගත් වෙනසයි.

මේ වෙනස කිමෙක් ද?

මිනිසා කුහුඹුවාට වඩා විශාල වීම ද?

නැත.

එසේ නම් මිනිසාට කකුල් දෙකක් පමණක් ඇති අතර කුහුඹුවාට හයක් තිබීම ද?

ඒත් නැත. අප කතා කරමින් සිටින්නේ සපුරා වෙනස් දෙයක් ගැනයි.

මිනිසා වැඩ කරන සැටි සිතා බලන්න.

මිනිසා කෙළින් ම ඔහුගේ හිස් අත් හෝ දත් වැඩට නොයොදයි. හේපොරොවක්, ඉස්කෝප්පයක් හෝ මිටියක් උදවු කර ගනී. කුහුඹු ගුලක් තුළ ඔබ කොපමණ කල් බලා සිටියත් කාරියෙක් නැත. එහෙත් ඒ තුළ කවර දාකවත් කුහුඹු පොරොවක් හෝ මිටියක් ඔබ නොදකිනු ඇත.

කුහුඹුවකුට කිසිවක් දෙකට කපන්නට තිබේ නම් ඌ උගේ හිසේ ම කොටසක් වන පණ ඇති කතුරක් යොදා ගනී. අගලක් කපන්නට ඇති කල පණ ඇති ඉස්කෝප්ප හතරක් යොදා ගනී. මේ ඉස්කෝප්ප හතර නම් ඌ නිතර ම ඔබ මොබ ඔසොවා ගෙන යනු ලබන කකුල් හයෙන් හතරකි. ඉදිරි දෙපා විසින් භාරනු ලැබේ. පසු දෙපා මඟින්, හැරෙන පස් ඉවත් කෑරේ. ඒ අතර, මැදි දෙපා විසින් සිය කාරියේ දී ඌ සම බර කොට තබනු ලැබේ.

කුහුඹුවනට පණ ඇති ගුදම් ද ඇත. ඇතැම් කුහුඹු ගණයක් ඔවුන්ගේ නිවහනේ තට්ටු, පණ ඇති ගුදම් වලින් පුරවති. එම නිවහන්හි අඳුරු කුටි තුළ වූ තට්ටු වල මුදුන තෙක් පෙළක් මත පෙළක් සිටින සේ මේ පණ ඇති ගුදම් කිට් කිට්යේ ගොඩ ගසා ඇත. එහෙත් මේවා නිසසලය. ඉක්බිති කම්කරු කුහුඹුවෙක් කඩිනමින් මේ කුටියක් තුළට එයි.

ඌ සිය ස්පර්ශ ඉන්ද්‍රියයන්ගෙන් කිප වරක් පිරිමැද ප්‍රාණවත් කොට සසල බවට පත් කරයි.

එවිට ඌට හිසක්, බඩක් හා කකුලුත් ඇති බව අපට පෙනේ. සැබැවින් ම

ගුදමක් ලෙස පෙනුනේ පිම්බුණු යෝද යටි බඩ ගෙඩිය බවත් පෙනේ. යට කී ලෙස පණ ගැන්වීමෙන් පසු උගේ කට ඇරෙයි. පැනි බිඳක් මුවගට එයි. අතුරු පසක් පිණිස විගස පිවිසි කම්කරු කුහුඹුවා පැනි බිඳ රස විඳ යළි සිය කිසට පිටත් වෙයි.

පණ ඇති ගුදම යළින් සුපුරුදු නින්දට වැටෙයි.

කුහුඹුවාගේ පණ ඇති උපකරණ නම් මේවාය. මේවා අපේ මෙන් කෘතිම උපකරණ නොවේ. කවර දාකවත් ඔහුගෙන් වෙන් නොකළ හැකි ස්වාභාවිකයෝය.

එසේ ම බිවරයාගේ උපකරණයෝ ද උගේ ශරීරාංගයෝ ම වෙති. උෆට ගසක් බිම හෙලන්නට පොරොවක් නැත. මෙහි දී උෆ දත් යොදා ගනී.

කුහුඹුවෝත්, බිවරයෝත් සිය උපකරණ නොසාදති. ඔවුහු ඒවා සමඟ ම උපදිත්.

අතක් වෙනුවට ඉස්කෝප්පයක්

සහිත මානවයා

අනෙක් සියලු සතුනට මෙන් මිනිසාටත්, ලි, යකඩ හෝ වානේ මෙවලම් නොව නුදෙක් පණ ඇති මෙවලම් පමණක් තිබිණැ යි සිතමු.

එසේ වී නම් කිසි දාක ඔහුට අලුත් මෙවලමක් නිපදවනු තබා, තමා උපතින් ම ලද එකක් මාරු කරන්නට වත් නොහැකි වනු සිකුරුය.

ඒ අතර ඔහුට ඉස්කෝප්පයක් තිබිය යුතු වීනම් ඉස්කෝප්පාකෘතික අතක් සමඟ ඉපදිය හැකි ව තිබිණි. සහතික ව ම එවැන්නක් කිසි දාක නොසිදු වන හෙයින් මේ සියලු සිතිවිලි අපේ මති භ්‍රමයක් පමණි. එහෙත් එවන් අපූරු සතෙක් ඉපදිණැයි මොහොතකට සිතමු. නියතයෙන් ම ඔහු පුදුමාකාර දක්ෂ කණින්නකු විය හැකිය. එහෙත් ඔහු තරම් දක්ෂ ලෙස කණින්නට වෙනත් කිසිවකුට උගන්වන්නට ඔහුට නොහැකිය. පැහැදිලි ඇස් පෙනීමක් ඇති යමකුට ඔහුගේ එම පෙනුම අනෙකකුට නයට නොදිය හැකි ලෙසිනි.

එවන් සතකු තම මුළු ජීවිත කාලය තුළ ම සිය ඉස්කෝප්පාකෘතික අතින් වැඩ ගනිති යි සිතමු. එහෙත් එය එයට උරුම කාර්යට මිස වෙන මොන ම කාර්යකට වත් හොඳ නොවනු ඇත. එම සත්ත්වයා මළ කල ඉස්කෝප්පාකෘතික අතෙහි අවසානයත් එය ම වෙයි.

මේ ''උපන් කණින්නාගේ'' අර අත ඔහුගේ මුණුබුරන් හෝ මී මුණුබුරන් උරුම කොට ගතහොත් පමණක් එය අනාගත පරම්පරා මහින් ඉදිරියට යවන්නට ඔහුට හැකිය.

කෙසේ වෙතත් මෙය පමණක් නොසැහේ. පණ ඇති මෙවලමක් හිරිහැර දායක නොවන අතර, ප්‍රයෝජනවත් ද වේ නම් පමණක් අනාගත පරපුර වල ජීවමාන අංගයක් බවට පත් වෙයි.

ඉදින් මිනිස්සු මිහි මත වැලි මියන් ලෙස පිවත් වුවාහු නම් නියතයෙන් ඉස්කෝප්පාකෘතික අත් අවශ්‍ය වෙයි.

එහෙත් මහ පොළොවෙන් උඩ පිවත් වන සතකුට එවන් අතක්, අනවශ්‍ය සුදු ඇතෙක් වෙයි.

කාර්යශිල්පි මිනිසා සහ ගහ

මානවයා සුනඟුවෙන් මිනිස් සත්ත්වයකු බවට පත් වෙමින් සිටිය දී ගලින් නිමි නිය පඳුරු හෝ දත් නිෂ්පාදනය නොකෙළේය. අප හතු වර්ග හෝ බෙරි වර්ග එකතු කරන පරිදි හේ ඒවා එක් රැස් කෙළේය. ගං ඉවුරෙක නොගැඹුරු තැන් ඔස්සේ සරන විට සොබා දහම විසින් තමා පිණිස මැද සිනිඳු කොට රැස් කර තැබූ මුවහත් ගල් හේ විමසිල්ලෙන් සොයා බැලීය.

ඉබේට ම ලත් මේ මුවහත් පාෂාණ, එක් කලෙක තැන්පත් ව තිබුණු ගල් කුට්ටි වටා දිය සුළි වෙගයෙන් කරකැවෙද්දී, යෝද ගැටුමක අංගයක් ලෙස එම ගල් එකකට එකක් ප්‍රතිවිරුද්ධ ව ගැටෙමින් තිබුණු ගංගා පතුල්හි සාමාන්‍යයෙන් හමු වෙයි. දිය සුළි කාරියෙහි දැඩි ව යෙදුණු ගහ එම පරිශ්‍රම ප්‍රතිඵලය කෙරෙහි දැක්වූයේ මඳ සැලකිල්ලෙකි. සොබා දහම විසින් නිපදවනු ලැබූ මෙබඳු සිය ගණන් පාෂාණයන්ගෙන් එතරම් විකෙකින් පමණක් මිනිසාට ප්‍රයෝජනයක් වූයේ ඒ නිසයි.

යථා කාලයේ දී මිනිසා පාෂාණයන් තමාට වුවමනා වූ හැඩයනට සකසන්නට පටන් ගත්තේය. මේ අයුරින් හේ තම මුල් ම ගල් මෙවලම් නිමවන්නට ඇරඹීය.

එකල්හි සිදු වූ මේ දේ, පසුව මිනිස් ඉතිහාසය පුරා බොහෝ වාර ගණනක් සිදු විය. මිනිසා, ස්වභාවයෙන් සැකසුනු දේ කෘතිම ව නිපදවා ගන්නා ලද්දක් බවට පත් කළේය. සොබා දහමහුගේ මහ කම්හලෙහි මුළු වලින් එකෙක සිය කම්හල අටවා ගත් මිනිසා, එහි සොබා දහමින් සොයා ගත නොහැකි වූ නවතම දෑ නිමැවීය.

පොළොවේ ගැඹුරු තට්ටුවෙන් ලැබුණු, බොහෝ දුරට ස්වාභාවිකයනට සමාන අති පැරණි ප්‍රාග්ඓතිහාසික උපකරණ කවුරුන් විසින් නිෂ්පාදිත දැයි නිරන්තරයෙන් ම කිම අපහසුය., හෙවත් මිනිසකු, ගහක්, සරල ශීතෝෂ්ණ පරිවර්තනයක්, වැස්ස හා ජලය හෝ පිපිරීමක් හා කුඩු වීමක් විසින් ද යනුවෙනි.

කෙසේ හෝ එවන් සැකයක් පැන නොනගින අවි ද ඇත. පැරණි, නොගැඹුරු ගංගා කොටස් හා ඒවායේ ඉවුරු වලත් දැනට ගැඹුරු මැටි හා වැලි තට්ටු යට තැන්පත් වී ඇති ප්‍රාග්ඓතිහාසික මානවයාගේ සැබෑ කම්හල් විද්‍යාඥයන් විසින් මතු කොට ඇත. නිම කරන ලද අත් පොරෝ හා ඒවා නිමැවීමට ගන්නට ඇතැ යි සිතිය හැකි ගල් කුට්ටිත් එම කැණීම් විසින් සපයා ඇත.

අප ගිනි ගල් අත් පොරොවක් පරීක්ෂා කළොත්, උල් වූ කෙළවරක් සහස් කිරීමේ දී පතුරු ගැලවී යාමට පහර දුන් ගිනි ගල සමඟ ගැටුණු තැන් පැහැදිලි ව ම දැක ගන්නට පුළුවන. එසේ ම එය සුමුදු කොට හා ඔප ගන්වා තිබුණු බවටත් ලකුණු ඇත. සොබා දහමට කවර දාකවත් මෙවන් කාරියක් නොකළ හැකිය. එවැන්නක් කළ හැකි ව තිබුණේ මිනිසාට ම පමණි.

මෙය තේරුම් ගැනීම අපහසු නොවේ. සොබා දහමෙහි ඇති සියලු දේ සැලැස්මෙකින් හෝ ඉලක්කයෙකින් තොර ව ආවට ගියාට කර ඇත. ගහක දිය සුළියක් කිසි තේරුමක් නැති ව ගල් සමූහයක් එකට හප්පා තබයි. මිනිසා එය ම කිසියම් තේරුමක් ඇති ව කරයි. ඔහු කරන සෑම දෙයකට ම වැදගත්, හොඳ හේතුවක් ද ඇත. පාෂාණයක් වෙනස් කිරීමේ ලා ඉතා සුළු පටන් ගැනීමෙකින් ම සිය අවශ්‍යතාවකට ගලපා ගත හැකි බව ඔහුට පෙනිණ. මිනිසා සොබා දහම වෙනස් කරන්නට හා ගොඩ නහන්නටත්, ඊට සරිලන ලෙස සිය අවශ්‍යතා ගලපා ගන්නටත්, කෙමෙන් ඇරඹිය.

මේ හැකියාව අනෙක් සතුන්ගෙන් මිනිසා තවත් පියවරක් ඔසොවා තැබීය. එම හැකියාව ඔහුට වැඩිමනක් නිදහසක් ද ලබා දුන්නේය. හේ තව දුරටත් සොබා දහම විසින් තමාට මුවහත් පාෂාණයක් සපයන තෙක් පමා නොවීය.

ඔහුගේ අවි ඔහුට ම තනා ගත හැකි විය.

මිනිසාගේ පිවන චරිතය පටන් ගැනීම

පිවන චරිතයක් සාමාන්‍යයෙන් පුද්ගලයකුගේ උපන් දිනය හා උපන් තැනින් පටන් ගනු ලැබේ.

එහෙත් මේ පොතේ තුන් වැනි පරිච්ඡේදයේ මැද හරියේ දී එත් අපේ කතා නායකයා කවර දා කොතැනෙක උපන්නේ ද යන්න සඳහන් කර නැත. සැබැවින් ඔබට ඔහුගේ නමවත් කියා නැත. එක් තැනෙක මානව-වානරයා කියාත් තවත් තැනෙක වානර-මානවයා කියාත් හැඳින්වීමු. එසේ ම හේ ප්‍රාගෛතිහාසික මානවයා, පාෂාණීභූත මානවයා පමණක් නොව අපේ කැලෑ මුත්තා නමින් ද හැඳින්විණ.

අපි අති පුරාණ සියලු ම ප්‍රාගෛතිහාසික මානවයන් ගැන කතා කරමු නම් එතෙක්දු සෑම ආකාරයෙන් වානරයකු සේ පෙනෙන ඔහුගේ නම පිතෙකැන්ත්‍රෝපස්, සිනැන්ත්‍රෝපස් හා හිඩල්බර්ග් මානවයා යන අයුරින් වෙයි.

හිඩල්බර්ග් මානවයා ගැන අපට ඇති එක ම හෝඩුවාව නම් ජර්මනියේ හිඩල්බර්ග් නුවර හමු වුණු ඔහුගේ හක්කයි.

කෙසේ හෝ එය, එහි හිමි කරු මානවයකු බව ඔප්පු කරයි. එහි දත් මිනිස් දත්ය. එහි බලු දත් වානරයකුගේ මෙන් යටි දත් වලට උඩින් නෙරා ඇවිත් නැත.

එහෙත් හිඩල්බර්ග් මානවයා මේ වන විටත් නියම මිනිසෙක් නොවේ. ඔහුගේ, පස්සට එබී ගිය වානරාකාර නිකට අපට ඒ බව කියා පායි.

පිතෙකැන්ත්‍රෝපස්! සිනැන්ත්‍රෝපස්! හිඩල්බර්ග් මානවය!

මේ අපේ කතා නායකයාගේ පිවිතයේ එක ම

යුගයකත්, විකාශනය පිළිබඳ එක ම පියවරකත් යෙදුණු දිග නම් තුනකි.

එහෙත් අපේ කතා නායකයා වෙනස් නොවී නොසිටී බව මතක තබා ගත යුතුය. හේ වඩා වඩාත් නූතන මානවාකාරයට පැමිණෙමින් සිටියේය. යම් සේ ළදරුවෙක් ළමයෙක් වේ ද? ළමයෙක් තරුණයෙක් වේ ද? එසේ ම ප්‍රාගෛතිහාසික මානවයා නියැන්ඩතාල් මානවයා විය. නියැන්ඩතාල් මානවයා ක්‍රෝමැග්නන් මානවයා විය.

අපේ කතා නායකයාට වැඩිමනත් නම් කිපයක් ඇති බව දැන් ඔබට පෙනෙයි.

එහෙත් අපි අපේ හිතු මතයට ඉදිරියට නොයමු. මේ පරිච්ඡේදයේ දී හේ පිතෙකැන්ත්‍රෝපස්, සිනැන්ත්‍රෝපස්, හා හීඩල්බර්ග් මානවයා යන නම් වලින් හැඳින්විණ.

ගං ඉවුරු දිගේ සැරි සරමින් හා අවි තනා ගැනීමට හැකි දේ සොයමින් ඔහුගේ දවස් ගත වී ගියේය. හේ දැනටත් පැරණි ගංගා මිටියාවත් වල තැන්පත් අතර විද්‍යාඥයන් විසින් සොයා ගනු ලබන, දළ, හැඩ වැඩ නැති අත් පොරෝ සැකසීමට ඉමහත් ඉවසිල්ලෙන් යුතු ව ගිනි ගල් අසල ගල්, පතුරු අරිමින් සිටියේය.

ඔහුගේ නම ඔබට කීමට එතරම් අපහසු වන්නේ ඒ නිසයි. ඔහු උපන්නේ කවර දා දැ යි කීමට තවමත් ඉතා ම අපහසුය.

කොටින් කියතොත් එසේ කීමට අපහසු වන්නේ මිනිසා මිනිසකු වුයේ එක් අවුරුද්දක් තුළ නොවන නිසයි. හේ ඇවිදින්නටත්, සිය දළ අවි තනා ගන්නටත් ඉගෙන ගන්නට වසර සිය ගණනින්, දහස් ගණනින් වැය කෙළේය. ඉදින් කිසිවකු මිනිසකුගේ වයස කොපමණ දැ යි ඇසුවොත් අපට දිය හැකි එක ම පිළිතුර නම් ''වසර දශ ලක්ෂයක් පමණ ඇත.'' යනුයි.

මිනිසා උපන්නේ කොතැනෙක දැ යි කීම වඩාත් අමාරු වෙයි.

මිනිසා ඇතුළු ව්මපන්සියා හා ගොරිල්ලාත් පැ-

වත ආ එක ම ආත්තම්මා-වානරිය වුත්, එසේ ම අපේ කතා නායකයාගේ ද ආත්තම්මා පිවත් වූයේ කොතැනෙක දැ යි සොයන්නට අපි උත්සාහ කෙළෙමු. විද්‍යාඥයෝ මේ වානරයා ඩ්‍රයෝපිතෙකස් නමින් හඳුන්වත්. අප ඔහුගේ ලිපිනය සොයා ගන්නට උත්සාහ ගත් කල ඩ්‍රයෝපිතෙකස්ලා ඉතා බොහෝ ගණනක් පිවත්ව සිටි බව දැන ගන්නට ලැබිණ. ඇතැම් හෝඩුවාවක් අප මධ්‍යම යුරෝපයට මෙහෙයැවිය. අනෙකක් බටහිර අප්‍රිකාවට මෙහෙයැවිය. ඉතිරිවා ඉහි කෙළේ දකුණු ආසියාව දෙසටය.

අපි ලෝකයේ සිතියමක් ගෙන ගිනි ගල් අත් පොරෝ හමු වුණු එක එක තැනක් ලකුණු කෙළෙමු. මොහොතෙකින් සිතියම තිත් වලින් වැසී ගියේය. ඒවායින් වැඩියක්තම ඒවා යුරෝපයේ විය. එහෙත් ඇතැම්වා අප්‍රිකාවෙත්, ආසියාවෙත් විය.

දැන් පිළිතුර පැහැදිලිය. මිනිසා පළමුවෙන් ම පුරාතන ලෝකයේ නොයෙක් තන්හි සම කාලීන වශයෙන් පහළ වූයේය. ඒ විනා කිසිදු එක ම තැනක් පෙන්විය නොහැකිය.

වානරයා මිනිසකු බවට පත් වීමේ විපරිණාමය එක ම පෙදෙසක එක ම වානර රැහැනක් මුල් කොට සිදු වූවෙක් නොවේ. ලෝකයේ නොයෙක් පෙදෙස්හි දෙපයින් ගමන් කරන්නට හා සිය දැත් වැඩට යෙදීමටත් ඉගෙන සිටි වානරයන් පිවත් වූ සැම තැනෙක ම එය සම කාලීන ව ම සිදු විය. තව ද ඔවුන් වැඩ කරන්නට පටන් ගත් කඩිනමින් ම අවසානයේ දී ඔවුන් මිනිසුන් බවට පත් කරනු ලැබූ නව බල වේගයක් ක්‍රියාත්මක වන්නට පටන් ගැනිණ. මේ බල වේගය වූයේ මානව ශ්‍රමයයි.

මිනිසා කාලය නිපදවයි

යපස් හා ගල් අහුරු හාරා ගන්නා සැටිත්, ගින්දර උපදින සැටිත් කවුරුත් දනිති.

එහෙත් කාලය නිපදවූයේ කෙසේ ද?

බොහෝ දිගු කලකට ඉහත සිට කාලය නිපදවීමට මිනිසා දැන සිටියත් අර ප්‍රශ්නයට පිළිතුර

දන්නා මිනිස්සු නුවූහ. පළමුවෙන් ම ඔහු අවි තනන්නට පටන් ගත් කල ඔහුගේ පීවිතය කිසියම අලුත් දෙයක යෙදවීමේ තත්ත්වයට පත් විය. මෙය නියම මිනිස් හැකියාවෙක් වූයේය. එනම් වැඩ කිරීමයි. එහෙත් වැඩ කිරීම කාලය කා දැමීමෙක් විය. ගලක් අවියක් බවට හැඩ ගන්වන්නට පළමු, එයට සුදුසු පාෂාණයක් සොයා ගත යුතු විය. එසේ සොයා ගත්තත් ඒ හැම එකක් ම පොරොවකට සුදුසු නොවිය.

අවියකට සුදුසුතම ගල් වර්ගය වූයේ තද වුත් බර වුත් ගිනි ගල්ය. එහෙත් ගිනි ගල් කුට්ටි පාමුල විසිර නොතිබිණ. ඒවා අහම්බෙන් හමු වන්නට තිබුණා පමණි. මිනිසා ගිනි ගලක් සොයමින් බොහෝ වේලාවක් ගත කෙළේය. නිරතුරු ව ම වාගේ ඔහුගේ ගවේෂණය නිෂ්ඵල එකක් විය. එසේ වූ කල ඔහුට කළ හැකි වූ හොඳ ම දේ නම් ඒ වෙනුවට බරින් අඩු ගිනි ගල් වර්ගයක් හෝ අතිශයින් මෘදු වූ වැලි ගලක් හෝ හුණු ගලක් වත් යොදා ගැනීමයි.

මේ අතර ඔහුගේ කාරියට සුදුසු ගිනි ගල් පාෂාණයක් ලැබී ඇතැයි සිතමු. කෙසේ වෙතත් එයද තවමත් ගල් කුට්ටියක් පමණි. එය "ප්‍රහාරකයා" නමින් හැඳින්වෙන වෙනත් ගල් අවියෙකින් ගසා කඩා දමා හැඩ ගැස්විය යුතුය. මෙයට ද සැහෙන කාලයෙක් ගත විය. මිනිසාගේ ඇඟිලි දැන් මෙන් යුහුසුලු ද, කාර්යක්ෂම ද නොවිය. ඔහු වැඩ කිරීමට ඉගෙන ගනිමින් සිටියා පමණි. ඔහුට දළ අත් පොරොවක් සාදා ගැනීමට එතරම් කාලයෙක් ගත කිරීමට සිදු වූයේ ඒ නිසයි.

මේ අතර හේ වැඩ වල එක්තරා පුදුමාකාර ස්වභාවක් ඇති බව සොයා ගත්තේය. එනම් වැඩ ඔහුගෙන් කාලය පැහැර ගත්තා පමණක් නොව, ඔහුට කාලය උපයා දුන් බව ද වෙයි!

සැබැවින් ම කෙනකුට පැය අටකින් කළ හැකි වැඩක් ඔබට පැය හතරකින් කළ හැකි නම් ඔබ පැය හතරක් ඉතිරි කර ගෙන ඇති බව පැහැදිලිය. ඔබ වියින් උපකරණයක් නිපදවනු ලැබී නම්, එයින්,

කලින් ඔබ වැඩ කළ වේගය මෙන් දෙගුණයෙකින් වැඩ කරන්නටත් හැකි වී නම් දැන් ඔබ ඔබේ කාර්ය සඳහා සාමාන්‍යයෙන් ගත කරන කාලයෙන් අඩක් ඉතිරි කරගෙන ඇත.

ගිනි ගලෙකින් කෝටුවක් උල් කර ගැනීමට හුඟ වෙලාවක් ගෙවිණ. එහෙත් එය වඩාත් පහසුවෙන්, රසවත් ගස් මූලක් හාරා ගැනීමට හෝ පුංචි සතකු මරා ගැනීමට යොදනු හැකි විය.

මෙය තමා හා තම දරුවන් සඳහා ආහාර එක් රැස් කිරීමේ ලා ප්‍රාග්ඓතිහාසික මානවයාගේ කාර්ය පහසු හා ඉක්මන් ද කෙළෙන් වැඩ කිරීම සඳහා වැඩි පුර කාලයක් ඔහුට ඉතිරි විය. ඔහුගේ විවේක කාලයේ දී හේ සිය අවි නිරතුරු ව මුවහත් හා වඩාත් ව්‍යක්ත ලෙසත් හැඩ වැඩ ගැන්විය. එක් එක් අලුත් අවියෙක පරම අර්ථය වූයේ වඩ වඩාත් ආහාර යනුයි. ඒ අතර අවසානයේ දී වැඩි වැඩියෙන් විවේකය යන්න ද අදහස් කැරිණ.

මේ වන විට මිනිසා දක්ෂ දඩයක් කාරයෙක් නොවිය.

මිනිස් නම දැරූ එක් රැස් කරන්නා

අපේ මේ යුගයේ එක් රැස් කරන්නකු වීම පහසුය. ඔබගෙන් බොහෝ දෙනකු ටනයෙන් බෙරී හා බිම් මල් එකතු කරන්නට ඇත.

ප්‍රාග්ඓතිහාසික යුගයේ ''මිනිසා'' නම් ලත් මේ රැස් කරන්නාගේ ජීවිතය ඉතා කටුක එකක් විය. ඉදින් ඔහු සාගින්නෙන් නොමළහොත් ඒ කුමක් නිසා ද? ආහාරය පිණිස සොයා ගනු ලැබූ ඕනෑ ම යමක් කෑවේ නම් පමණි. එහෙයින් ඔහුගේ මුළු ජීවිත කාලය ම කෑම සෙවීමට ගත කැරිණ. රුක් මුදුන්හි දිවි ගෙවූ සිය මුතුන් මිත්තනට වඩා ඔහු කොතරම් ශක්තිමත් සහ ස්වෛරී තත්ත්වයට පත් ව සිටියත්, හේ අත්‍යන්තයෙන් දුක් මුසු පෙනුමෙන් යුක්ත විය. සැබවින් ම හේ අඩ හාමතින් පෙළෙනකුට වඩා අමුතු සතෙක් නොවිය.

මේ අතර පෘථිවි පෘෂ්ඨය විකාර කරන භයානක ව්‍යසනයක් ඔන්න මෙන්න කියා තිබිණ.



ව්‍යසනය සහ වෙයි

කිසි දාක හෙළි නොවිය හැකි හේතු නිසා සිය ගමන් ඇරඹූ අයිස් කඳු දකුණු දිගට පාවන්නට පටන් ගති. මහා හිම ගංගාවෝ කඳු හා මිටියාවත් යට කර ගෙන, බෑවුම් කාදනය කර ගෙන, කඳු මුදුන් පෙත්තට කපා ගෙන, උස් මුදුන් කඩා සුණු විසුණු කර ගෙන, කඳු පර්වත කුට්ටි ඉවත දමා ගසා ගෙන ගලා බසින්නට වන්හ. ග්ලැසියරයන්ගේ පෙරමුණේ වූ අයිස් දිය වෙමින්, මිහි මත ගැඹුරු අගල් හාරා, ගංගා පත්ලවල් නිමවා, වේගවත් ගංගා පැන නැහීමට ඉඩ සලසා දුනි.

උතුරේ ග්ලැසියරයන් දකුණු දෙසට චලනය වූණු බව සැබවි. එහෙත් ඒවා කිසි දාක එතරම් ඈත දකුණු දිගට කා ගෙන නොගියේය. රුසියාවේ දී නම් මේ ග්ලැසියරයෝ වොල්ගග්‍රාඩ හා ද්නිප්‍රොපෙත්‍රොව්ස්ක් යන නගර දක්වා ළඟා වූහ. බටහිර යුරෝපයේ දී ජර්මනියේ කඳුකර ප්‍රදේශ තෙක් ළඟා වූහ. තව ද බ්‍රිතාන්‍ය දූපත් වලින් වැඩි හරියකුත් යට කර දමනු ලැබිණ. මොවුහු උතුරු ඇමෙරිකාවේ දී මහා විල් දෙසට තල්ලු වූහ.

තවමත් මුහුදු වෙරළවල් දිගේ උණුසුම් විය. වන ගහනයෝ ලෝරල් හා මැග්නෝලියා වලින් පිරී තිබුණාහ. දකුණු දිග දැවැන්ත ඇත්තු ද, රයිනෝසිරස්හු ද තැනි තලාවන්හි උස තණ කොළ අතර සැරි සැරීහ. එහෙත් මුහුදු ජලය කෙමෙන්, වඩාත් සිසිල් වෙමින් තිබිණ. මුහුදු මැදින් මහා ගංගාවන් ගලා යන්නා සේ වූ, වේගවත් දිය වැල්, උතුරේ සිට පා වන ග්ලැසියරයන්ගේ හා ඇතැම් විට පා වී එන හිම පර්වත වල සිසිලත් ගෙන ආයේය.

උණුසුම් මුහුදු, සිසිල් මුහුදු බවට පත් වීමේ වෘත්තාන්තය, තටටු වෙරළවල් අපට කියා පායි. උණුසුම කැමති සිවු පාවුන් හා පැළෑටි තවමත් ගොඩ බිමෙහි පිවත් වන සමයෙක දි මුහුදු සත්තු

වෙනස් වන්නට පටන් ගෙන සිටියෝය. මේ යුගයට අයත් භූවිද්‍යාත්මක තැන්පතු ගැන අධ්‍යයනයක් කළහොත්, එසමයයන්හි සිසිල් දියෙහි පිවත් විය හැකි එක ම පීවීන් වූ ගොළු බෙලි සතුන්ගේ පිට කටු අපට සොයා ගත හැකිය.

වන යුද

ග්ලැසියරයන් දකුණු දිගට ආක්‍රමණය කිරීම ගොඩ බිම් වලට ද දැනෙන්නට පටන් ගැනිණ.

උත්තර ධ්‍රැව පෙදෙස සිය පිහිටීම වෙනස් කොට සෙමින් දකුණු දෙසට එමින් සිටියෙන් මෙහි පුදුම-යෙක් නැත! ග්ලැසියරයෝ, උතුරු දිග තුන්ද්‍රා හා පයින් වනාන්තරයන් යට කර දමන අතර ඒවා දකුණු දෙසට තල්ලු කර ද දැමූහ.

තුන්ද්‍රා වනයෝ, තයිගා වනයනට ප්‍රසිද්ධියේ ම යුද්ධ ප්‍රකාශ කළහ. තයිගා වනයනට පසු බසින්නට සිදු විය. ඒ අතර කොළ බහුල කැලෑ ඇති වන්නට පටන් ගැනිණ.

මේ අයුරින් වනාන්තරයන්ගේ මහා යුද්ධය ඇරඹී තිබිණ.

සීතලය විසින් උණුසුම කැමති ගස් විනාශ කැරිණ. ඉක්බිති සිසිල රිසි උතුරු වනයනට මං සලසන ලදී. පයින්, පර් හා බර්ච වර්ගයෝ ඕක් හා ලින්ඩන් වර්ගයනට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කළහ. ඕක් හා ලින්ඩන් ආදිනට පසු බසින්නට සිදු විය. එසේ පසු බසිමින් ඒවා මෙතෙක් ඉතිරි ව තිබුණු සදා හරිතයන් වන ලෝරල්, මැග්නෝලියා හා අත්තික්කා වැනි ගස් වසා ගෙන පැතිර ගියේය.

සැපට හැදුණු, උණුසුම කැමති ගස් වලට සුළඟට හා සීතලටත් හැම අතින් විවෘත වූ ආවරණ රහිත තැන් වල පවතින්නට නොහැකි විය. එහෙයින් ජයග්‍රාහකයනට ඉඩ සලසා දෙමින් ඒවා මරණයට පත් විය.

ඒවා සෙවණ ලද එක ම ස්ථානය වූයේ කඳු මිටියාවත්ය. උණුසුම රිසි ගස් තමනට ආරක්ෂාව සැලසූ මිටියාවත් වල සැහවී ගත්තේය. ඉක්බිති

වෙනත් ග්ලැසියර කඳු මුදුන් වල සිට පහළට එන්නට පටන් ගැනිණ. එම ගමනේ දී ඒවා විසින් කඳුකර තුන්ද්‍රා වර්ග පර් හා බර්ච් ආදිය පහළට ගෙනෙන ලදී.

මේ වන සටන වසර දහස් ගණනක් තුළ පැවතිණ. වැළිදු පරාජිත බලකායේ අවසන් පුරුක වූ උණුසුම රිසි ගස් වර්ග වඩ වඩාත් දකුණින් දකුණට පසු බැය.

එහෙත් සිය ආක්‍රමණිකයනට විරුද්ධ ව සටන් වැද විනාශයට පත් වනයන්ගි පිවත් වුණු සතුනට කිමෙක් වී ද?

අද වුවත් කැලෑවක් ගින්නකින් හෝ කපා හෙළීමෙන් විනාශ කරනු ලැබූ කල්හි වනවාසින්ගෙන් ඇතැමෙක් ඒ සමඟ ම මැරී යෙත්. ඉතිරියෝ ගැලවී ගනිති. පර් වනයක් කපා දැමූ කල එහි වාසින් වූ හරස් හොටා ආදිහු අතුරු දහන් වෙත්.

අලුත් ඇස්පන් වනයක් එහි පැරණි මාතෘ ගෘහය වූ සෙවණ සහිත පර් වනයක් තුළ යළිත් උපත උබයි. දැන් වෙනත් කුරුල්ලෝත් සිවු පාවෝත් මේ අලුත් නිවහනට ඇදෙති.

බොහෝ වසර ගණනකට පසු ව පර් වනය ඇස්පන් වනය පරදවයි. එහෙත් අලුත පර් වනය හිස් නොවේ. එය යළිත් හරස් හොටා හා උගේ මිතුරන්ගෙන් පිරී යයි.

කිසියම් වනයක් අභාවයට යන්නේත්, යළි ඇති වන්නේත් නියමයක් නැති පැළැටි හෝ සත්ව ගණයා මෙන් නොවේ. ඒකබද්ධ වූ, අන්‍යොන්‍ය ලෙස බැඳී ගිය ලෝකයක් ලෙසය.

ඒ හිම යුගයේ දී සිදු වූ දෙයයි. සර්ම කලාපික වන ගහනයන් අතුරුදන් වන විට ඒවායේ සත්ව ගහනය ද අතුරුදන් විය.

දැවැන්ත ඇත්තු අතුරු දන් වූහ. රයිනෝසිරස්හු ද, හිපපොටේමස්හු ද දකුණු දෙසට ගියහ. ප්‍රාගෛතිහාසික මානවයන්ගේ දරුණුතම සතුරා වන වක්–කඩු-දළ කොටියා ද අවසානයේ දී වඳ වී ගියේය.

මහා පරිමාණික වූ කුඩා සිවු පා සමූහයක් හා එතරම් ම වූ කුරුල්ලෝ ද මැරී ගියහ. නැතහොත් දකුණු දිගට සංක්‍රමණය වූහ.

එය වෙනත් හැටියෙකින් සිදු වී නැත. සෑම සත්වයෙක් ම උගේ කුඩා ලෝකය වූ, වනයට වැදී සිටී. මේ වන ලෝකය විනාශ වන්නට පටන් ගත් කල්හි එය එහි අන්තේවාසිකයන්ගෙන් විශාල කොටසක් ද විනාශ කර දමයි.

නොයෙක් ගස්, පඳුරු හා උස් තණකොළ ද වඳ වී ගිය කල, එතුළ සැහැවී සිටී සහ ඉන් පෝෂණය ලද සත්තු දැන් තමනට ගොදුරක් හෝ සෙවණක් නොමැති බව තුමූ ම අවබෝධ කළහ. මේ නයින් සාමා කාමී තෘණ භක්ෂකයන් වඳ වී ගිය විට, ඔවුන් ගොදුරු කොට පිවත් වූ මාංශ භක්ෂක වන මෘගයෝ ද සාගින්නෙන් මරු වැළඳ ගත්හ.

සිය වනය නැති වූ කල, ''පෝෂණ චක්‍රයෙන්'' එකට ඇඳුණු සත්වයෝත්, පැළෑටිත් නැති වී ගියෝය.

එය යට ගිය දවස, දැත් හබලට අල්ලා යදමින් බැඳ තැබූ හෙයින්, නැව පහළට ඇදෙද්දී ගැලියේ වහලුන් ද ඒ සමඟ ම පහළට ඇදෙන්නා සේය.

කෙසේ හෝ සතකු තව දුරටත් පැවතීමට නම්, ඌ බැඳ තබනු ලැබූ යදම බිඳ දැමිය යුතු විය. එය පටන් ගත යුතු වූයේ ඌ කලින් ගොදුරු කොට ගත් දේට වඩා වෙනස් දේ ගොදුරු කොට ගැනීමෙනි. ඌට උගේ නිය පඳුරුන්, දතුත් මාරු කළ යුතු විය. සිතලයෙන් ආරක්ෂා වීමට දිග කෙස් රොද හෝ ලොම් කැටිය වටා ගත යුතු විය. වෙනත් වටන වලින් කියතොත් සත්වයා තමා ම මාරු විය යුතු ව තිබිණ.

අශ්වයාගේ පරිණාමයේ ඉතිහාසය මතක් කරන්න. කුරයෙක ආකෘතිය ඇති එක ම පා ඇඟිල්ලක් සහිත වූ අප හඳුනා ගෙන ඇති සිවු පාවකුගේ තත්ත්වයට එන්නට අශ්වයා වසර දස ලක්ෂ කීයක් ගත්තේ ද?

දකුණු දිග වැසි සිවු පාවකුට උතුරු දිග වනයෙක පීවත් වීම ඉතා අපහසු කාරියෙක් විය.

ඉදින් සිසිල් උතුරු දිග වනයට ගිය, උණුසුම දකුණු දිග වනයන්හි විසූ සත්තු වූවෝ නම් ඔවුන් සමඟ උතුරු දිග වන වැසි ගන ලොමින් පිරී වන සත්තු දකුණු දෙසට සේන්දු වූහ. මොහු නම් උතුරු වන ගහනයන් සිය නිවහන කොට ගත් එදා දළ ලොමින් වැසි ගිය රයිනෝසිරස්, මැමත්, ලෙන් වැසි සිංහයා හා ලෙන් වැසි වලසා ද වෙති.

ගන ලොම් වැස්ම ඔවුන්ගේ මහත්තම ධනය විය. මැමත් ද, ලොමින් ගහන රයිනෝසිරස් ද සිතලට බිය නොවූහ. දකණු දිග වැසි නග්න සිරුරින් යුත් ඇතා, රයිනෝසිරස් හා හිපපොටේමස් ආදිනට කොහෙත් ම නැති, උණුසුම ලොම සහිත වැස්මක් ඔවුනට තිබිණ. ඇතැම් උතුරු දිග සිවු පාවුනට සිතලෙන් බේරීමට වෙනස් මහක් හමු විය. ඔවුහු ගල් ලෙන් වලට රිංගා ගත්හ.

පරාපිත වනයන්හි වූ සිවු පාවුනට, දැන් උතුරු

එනයන්හි නව පාලකයන් සමඟ සටනට බසින්නට සිදු වී තිබිණ.

එහෙත් දැන් ඔවුන්ගෙන් ඉතිරි වී ඇත්තේ ඉතා ටිකක් බව කියන විට ඔබ පුදුම වනු ඇත.

දැන් ප්‍රාග්ඓතිහාසික මානවයා ගැන තත්වය කිමෙක්ද? ඔහුට කිමෙක් වී ද?

නියතයෙන් ම හේ වඳ නොවී ඉතිරි වන්නන්ගේ ගොඩේ විය. එද විනාශ වූයේ නම් ඔබ මේ පොත නොකියවනු ඇත.

දේශ ගුණය සිසිල් බවට ගියත් උණුසුම් රට වල ජීවත් වුණු මානවයනට, සිය වර්ගයාගේ පැවැත්ම සඳහා සීතලයට විරුද්ධ ව සටන් කරන්නට සිදු නොවිය.

ඉදිරියට එමින් තිබුණු ග්ලැසියරයන්ගේ මහත්තම භයංකර ව්‍යසනය අත් දුටු මානවයනට මුහුණ දෙන්නට සිදු වුණු තත්ත්වය චඩාත් නරක විය.

වසරක් පාසා අලුත් සිසිර සමයක් උදා වනු ඔවුනට පෙනිණ. එය ඉමහත් ලෙස බිහිසුණු විය. ඔවුහු සීතලෙන් මිරිකුණහ. ගල් ගැසුණහ. තමන් හා තම දරුවන් උණුසුම් ව තබනු පිණිස එකට තෙරපී මිරිකී සිටියහ.

ඝාගින්න, බිහිසුණු හිම හා බියකරු වන සතුන් ද විසින් සපුරා මරා දමනු පිණිස තර්ජනය කරනු ලැබුහ.

ඉදින් මේ ආදිතම මානවයනට තමන් වටා සිදු වෙමින් තිබුණේ කිමෙක් දැ යි තේරුම් ගන්නට හැකි වීණි නම් සත්තකින් ම ලෝකාවසානය පැමිණ ඇතැයි ඔවුන් විසින් තීරණය කරන්නට තිබිණ.

ලෝකාවසානය

මධ්‍ය කාලීන යුගයේ දී ධූම කේතුවක් සිය කාන්තිමත් වල්පත විහිදුවමින්, දීප්තිමත් ආලෝකයක් අහස් කුස පුරා විහිදුවන විට "ඔන්න ලෝකාවසානය ළං වෙලා!" යි මිනිසුන් එකෙකා පරයා කිවා විය හැකිය.

"කළු මරණය" නම් ලත් මහාමාරී වසංගතය

ගම් නගර පාළු කොට සොහොන් බිම් මළ මිනි වලින් පුරවනු ලැබූ කල ''ඔන්න ලෝකාවසානය ඇවිත්!'' යයි කියන්නට ඇත.

යුද්ධ ගිනි දැලින් හෝ දුර්භික්ෂයෙන් ලොව ඇළේ ගිය කල මිථ්‍යා විශ්වාසයන්ගෙන් පිරුණු මිනිසුන් ''ඔන්න ලෝකාවසානය අත ළඟ!'' යැයි තැති ගැන්මෙන් කොදුරන්නට ඇත.

එහෙත් මේ එක එකෙකින් වෙන වෙන ම තබා, ඒ සියල්ල ම අනේක වරක් බැගින් සිදු වූ පසුත් ලෝකය අවසන් වූයේ නැත.

අහසෙහි ධූම කේතුවක් දර්ශනය වීම කොහෙත් ම අසිරිමත් දෙයක් නොවන බව අද අපි දනිමු. ධූම කේතුව හිරු වටා සිය ගමන යමින් සිටී. මීහි මත සිටින මිථ්‍යා විශ්වාසීන් එහි ලා විය හැකියි සිතන දේ ගැන ධූම කේතුව මඳ වුත් සැලකිල්ලක් නොදක්වයි.

එසේ ම සාගින්න වසංගත පමණක් නොව යුද්ධ වලින් පවා ලෝකාවසානය ළං වී ඇතැ යි නොහඟින බව අපි දනිමු.

කෙසේ වෙතත් ලෝක විනාශය ගැන අනාවැකි කියන්නෝ නුගත් මොට්ටයෝ පමණක් නොවෙති.

ලෝක විනාශය හා මානව සංහතියේ අවසානය ගැන අනාවැකි කියන විද්‍යාඥයෝ පවා සිටිති. ඔවුන්ගෙන් ඇතැමෙක් අවසානයට, මානව සංහතිය ඉන්ධන නැති වීමෙන් විනාශ වී යති යි කියති.

මූලික පර්යේෂණාත්මක හිලියෝ විදුලුත් බල මධ්‍යස්ථාන හා හිලියෝ විදුලුත් පවනාගාර දැනටමත් ක්‍රියාත්මක ව ඇත.

කලින් දැක්වූ පරිදි ලෝකය වළ ලා දැමීට ඉක්මන් වන මිනිසුන් දැන් මෙසේ කියනු ඇත.

''නවතින්න, මොහොතකට නවතින්න, කොයි හැටියට කිවත් හිරුත් අන්තිමට සිසිල්වෙයි. එය ඇතැම් අලුත් තරු තරම් උණුසුම් හෝ දීප්තිමත් නොවෙයි.

දහස් ගණන් දස ලක්ෂ ගණන් අවුරුදු ගෙවී යන කල හිරුගේ උෂ්ණත්වය පහත බැස පොළොව සිසිල් බවට යනු නියතයි.

අලුත් හිම යුගයක් යළිත් උදා වුණොත් පිවතය අත්‍යන්තයෙන් දුෂ්කර වනු හැකිය. එහෙත් ප්‍රාග්ෛතිහාසික මානවයා පවා ඒ සියලු ග්ලැසියර ස්කන්ධයන් මැද වූ පරිසරයත් දිවි රඳවා ගැනීමට නිසි පරිදි පාලනය කර ගත්තේය. විද්‍යාව අද පවත්නා තත්ත්වයටත් වඩා ඉමහත් සේ දියුණු විය හැකි ව තිබිය දී අනාගත මිනිස් සංහතිය අයිස් කඳන් මැද විනාශ වී යති යි අප මොහොතකට එත් සිතිය යුත්තේ ඇයි?

ඉදින් එසේ වුවහොත් සිතලය ජය ගැනීමට "ඔවුන් කුමක් කරත් දැ" යි අපට අනාවැකි පවා කිය හැකිය. ඔවුහු නියතයෙන් ම හින වූ සූර්ය ශක්ති අනුපූරකයක් ලෙස පරමාණු බලය යොදත් ඇයි!

ලෝකාරම්භය

ඉදින් මානවයා තමන් උපන් වනයට, තමා බැඳ තබන ලද යදම් නොබිඳ දැමී නම්, වන ලොව අතුරුදන් වීම ම ඔහුගේත් අවසානය වන්නට ඉඩ තිබිණ.

එහෙත් ලෝකය විනාශ වෙමින් නොතිබිණ. එය වෙනස් වෙමින් තිබුණා පමණි. පැරණි ලොව කෙළවර වමින් ද, නව ලොවක් ජනිත වෙමින් ද තිබිණ.

මේ අලුත්, වෙනස් වන ලොව පවත්වා ගන්නට නම් මිනිසා ද වෙනස් විය යුතු විය. ඔහු විසින් පරිහරණය කරනු ලැබූ ආහාර වර්ග නැති ව ගියේය. ඔහු විසින් අලුත් හා වෙනස් අහාර ද්‍රව්‍ය සොයා ගන්නට උගත යුතු වූයේය. පයින් හා දේවදාරු රුක් පල ඔහුගේ දත් වලට තද වැඩි වූ අතර ඒවා කොහෙත් ම දකුණු දිග වනයන්හි වූ මෘදු වූත්, මිහිරි යුෂ මිශ්‍ර වූත් පලතුරු වලට සමාන නොවිය.

කල් යද්දි උණුසුම සිසිලට හැරිණ. හිරු පොළොව ඇන අමතක කළ අයුරක් පෑය. මිනිසුනට හිරුගේ දිප්තිමත් උණුසුම් ආලෝකයෙන් තොර ව පිවත් වන හැටියක් උගන්නට සිදු විය.

ඔවුහු හැකි ඉක්මනින් වෙනස් විය යුතු ව සිටියෝය!

සියලු ම ප්‍රාණීන්ගෙන්, මානවයා පමණක් ඉක්මනින් වෙනස් වීමට හැකියාව ඇත්තෙක් විය. හේ අන් කිසිදු සතකුට කවර දාකවත් වෙනස් වන්නට බැරි වූ පරිදි වෙනස් වන්නට තමා ම උගෙන ගෙන තිබිණ.

වක්-කඩු-දළ කොටියාට ගිනි නිපදවා ගත නොහැකි විය. එහෙත් මිනිසාට එය හැකි විය. ඒ සඳහා හේ ගිනි පරිහරණය සපුරා දැන සිටියේය.

මානවයා තමා ම වෙනස් වීමටත්, සොබා දහම එක්තරා ප්‍රමාණයකට වෙනස් කිරීමටත් හැකි වන සේ ඇති තරම් දියුණුවක් ලබා සිටියේය.

එතැන් පටන් බොහෝ වසර දහස් ගණන් ගෙවී ඇතත් ප්‍රාග්ඓතිහාසික මානවයා සොබා දහමේ කුමක් වෙනස් කෙළේ ද? යනුත්, ඔහු තමා ම වෙනස් වුයේ කෙසේ ද? යනුත් අපට තවමත් දැක බලා ගත හැකිය.

ගල් පිටු පොත

දැවැන්ත පොතක් මෙන් මහ පොළොව අපේ පාමුල වැතිර සිටී. භූ පටලයේ හැම තට්ටුවක් ම මේ පොතේ පිටුවෙකි.

අපි මේ පිටු වලින් මුදුන් ම වූත්, අන්තිම වූත් පිටුවේ පිළිත් දෙමු. මුල්තම පිටු සාගර පත්ලේ, පෙළ ගැසී ඇත. ඒවා සාගර පත්ලේ, පොලෝ තලය යට ගැඹුරෙහි හා මහාද්වීපයන්ගේ බිම් පත්ලේත් දිග හැරී ඇත්තේය.

මේ පොතේ මුල් පරිච්ඡේදයන්ගේ අඩංගු මුල් පිටු වෙත නූතනයෝ තවමත් ළඟා වී නැත. අපට තවමත් හැකි වී තිබෙන්නේ එහි ලියා ඇති දේ අනුමාන කිරීම පමණයි.

පොත කියවීමට අපට උදව් වන්නේ, මතු පිට ළඟින් ම ඇති වඩා සරල පිටු කිපයයි.

උණුසුම් ලාවා ගැලීම් වලින් දැවී, විකෘති බවට ගිය ඇතැම් පිටු, මිහි තල මතු පිට ආරුක්කු නැමූ සේ කඳු පන්ති පිහිටා ඇති අයුරු අපට කියා දෙයි. අනෙක් පිටු මුහුදු වලින් ගොඩ බිම් මතු කරමිනුත්, යළි මුහුදු වලින් ගොඩ බිම් යට කරමිනුත් භූ තලය උන්නත වූ හා අවනත වූ අයුරු පෙන්වයි.

එසේ ම පිටුවෙකින් ඊළඟ පිටුවට යන කළ මහ පොළොවේ ඉතිහාසය අපට කියවන්නට හැකි වෙයි. තව ද පොතේ මතු පිටතම පිටු වල අන්තිමට අපේ අලුත් වීරයකු වෙත පැමිණෙමු. මේ වීරයා නම් මිනිසාය.

ඉක්බිති අපේ වීරයා මේ මහා ග්‍රන්ථයේ ප්‍රධාන චරිතය පමණක් නොව කර්තෘ වරයා වන අවස්ථාවෙක් ද එලඹෙයි.

මෙහි දී, ගංගා පත්ලෙක හරස් කඩෙක්හි, හිම යුගයේ තැන්පතු අතර පැහැදිලි ලෙස සටහන් වූ කාළ වර්ණ රේඛාවෙක් අපට හමු වෙයි.

මේ කළුවන් රේඛාව අහුරු නිසා ඇති වුවෙකි. ඉදින් වැලි හා මැටි අතර හදිසියෙන් අහුරු තට්ටුවක් දකින්නට ලැබෙන්නේ කෙසේ ද? ඇතැම් විට එය ලැව් ගින්නකි.

එහෙත් ලැව් ගින්නක් දැව් ගිය විශාල වන ප්‍රදේශයක් සලකුණු කරන අතර මේ අහුරු රේඛාව ඉතා කෙටි එකක් වෙයි. මෙවැනි සුළු අහුරු තට්ටුවක් ඉතිරි කළ හැක්කේ කඳවුරු ගින්නකට පමණි.

කඳවුරු ගින්නක් දැල්විය හැකි ව තිබුණේ මානව සත්ත්වයකුට පමණි.

ගිනි දැල්වූ අසල පසෙකින් මිනිස් අත් වලින් වැඩ කළ බවට සලකුණු අපට ලැබී ඇත. ඒ අතර ගිනි ගල් අවි සහ දඬයම් කරද්දී මරණ ලද සතකුගේ කැඩුණු ඇට ද වෙයි.

ගින්න හා දඬයම හිම යුගය පටන් ගනිද්දී ප්‍රාගෛතිහාසික මානවයාගේ සුරක්ෂිත බව සහතික කළ ප්‍රධාන දෙකකි.

මිනිසා වනය අත් හරී

ප්‍රාගෛතිහාසික මානවයාට උතුරු දිග කර්කශ වන ගහනයන්හි ගොදුරු සොයා ගැනීම ඉතා අපහසු විය. එහෙයින් කිසිවකුගේ කටට පනින්නට බලාගෙන නියමිත තැනෙක රැඳී නොසිට එක්කෝ පැන ගිය, නැතහොත් සැහවුණු හෝ සටනට එළැඹී, ආහාරයක් සොයනු ඊසින් ලඳු මැදින් සැරි සරන්නට වන්නේය.

එකල වනයන්හි ලොකු සිවු පාවෝ බහුල ලෙස වූහ. මූවෝ එලිමහන් වල තණ කෑහ. වල් ඌරෝ වන තුළ බිම හැරූහ.

ඊටත් විශාල සත්තු තැනි තලා වල සිටියෝය.

මේ සියලු ඇවිදින හා පැන යන ගොදුරු කෙරෙහි දැක්වූ සැලකිල්ලේ පරමට ඒ පසු පස ලුහු බැඳීමට ප්‍රාගෛතිහාසික මානවයා පොළොඹවනු ලැබීය.

තව ද මෙවන් ගොදුරු සොයා යන ඔහුට තමා උපත ලද වනය පවා අත හැර යන්නට සිදු විය.

කුඩා මානව රංචු මෙලෙසින් ඇතින් ඇත තැනි තලා වෙත ගියහ. ඉන් පෙර කිසි දාක ද්‍රව්‍ය එක් රැස් කරන මානවයකු පිවත් නොවූත්, එවැන්නකුට පිවත් විය නොහැකි වූත්, ඇතින් ඇත වන මැද අර මානව රංචු වල කඳවුරු ගිනි පොළවල් හා කඳවුරු දඬබිම් වල ද පිය සටහන් අපට හමු වෙයි.

ඕනෑ ම දෙයක් ගැන අවබෝධය පිරිපුන් හා නිවරද විය යුතුයි

ප්‍රාගෛතිහාසික මානවයාගේ අස්ථිර වාසස්ථාන භූමි වල, දඩයමේ දී මරන ලද සතුන්ගේ ඇට කටු සොයා ගත හැකිය. ඒවා අතර කහ පැහැති අස් ඉල ඇට, ඈ සහිත ගොන් ඔළු හා වක් වූ වල් ඌරු දළ ද වෙයි. ඇතැම් විට එතන්හි විශාල ඇට කටු ගොඩවල් ද වෙයි. එහි එක ම අදහස නම් එවැනි තැනෙක, මිනිසා දිගු කලක් නතර ව සිටි බවයි.

බයිසන්, වල් ඌරු හා අස් ඇට කටු ගොඩවල්හි, ඇතැම් විට විද්‍යාඥයන් විසින් දැවැන්ත මැමත් ඇට කටු සොයා ගැනීම සිත් ඇද ගන්නා සුලු දෙයක් වෙයි. මේ මැමත් ඇට කටු වල විශාල හිස් කබල්, දිග හා වක් වූ දළ, තලප්පත්තක් සේ වූ දත් සහ සිරුරින් වෙන් කර ගත් යෝද අත් හා පා ද වෙයි.

නියතයෙන් ම එවන් දැවැන්තයකු මරා ගැනීමට විශාල ශ්‍රමයක් හා ධෛර්යයක් ද අවශ්‍ය විය! එසේ ම උගේ සිරුර කැලි වලට කපා ගැනීමටත්, ඒවා නිවහන වෙත ඇදගෙන යමටත් තවත් අමතර ශ්‍රමයක් වුවමනා විය. එක කකුලක් ටොන් එකක් තරම් බර වූයේය. හිස් කබල තුළ මිනිසකුට පහසුවෙන් හිට ගන්නට තරම් හැකි විය.

විශේෂ රයිපල් වලින් සන්නද්ධ ව ඇතුන් දඩයමේ යන වර්තමාන දඩයක් කරුවනට පවා මැමතකු මරා ගැනීම පහසු නොවනු ඇත. එහෙත් ප්‍රාගෛතිහාසිකයාට රයිපල් නොවිණ. ඔහුට තිබුණු සියලු ම අවි ගත් කල ගිනි ගල් පිහියක් හෝ ගිනි ගල් මුණත සහිත වල් ඌරු හෙල්ලක් පමණක් විය.

අවියකට සුදුසු නොවන, වුවමනා ලෙස හැඩ වැඩ ගැන්වීමට අපහසු ගිනි ගලක් වැන්නෙකින් පිහියක් නිමැවීමට ඉමහත් නිපුණතාවක් වුවමනා විය. ප්‍රාගෛතිහාසිකයා තමා නිමවා ගත් අවියක් පාවිච්චි කිරීමෙන් පසුවත් ඉවත නොදැමුවේ ඒ නිසයි.

හේ එය මහත් සේ අගය කෙළේය. මොටට වූ හැම වරෙක ම මුවහත් කෙළේය. ඔහු සිය අවි එතරම්

අගේ කොට සැලකුවේ තම ශ්‍රමයත් කාලයත් ගරුත්වයෙන් සැලකූ හෙයිනි.

මුළු සංහතියේම ශ්‍රමය තුළින් වන මෘගයා මානව සත්ත්වයකු බවට විකාශනය විය.

ප්‍රාග්ෛතිහාසික දඩයම් කරුවා අවසානයේ දී විජයග්‍රහණය ලබන තෙක් තමාම දැඩි උද්යෝගයෙන් පරිශ්‍රමයක් දැරූ රොබින්සන් කෲසෝ ලෙස නිරූපිත පොත්ද ලියවී ඇත.

එහෙත් සැබැවින් ම ප්‍රාග්ෛතිහාසික මානවයා කෲසෝ වැනි අතර මං වූවෙක් වී නම්, නැතහොත් ඔවුහු විශාල රංචු ලෙස නොව පවුල් වශයෙන් පිවත් වූවෝ නම්, ඔවුන් කවර දාකවත් මිනිසුන් වීම හෝ සංස්කෘතියක් ගොඩ නැගුවන් වීම හෝ නොවන්නට තිබිණි.

වැළිදු රොබින්සන් කෲසෝගේ ඉරණම ඩැනියල් ඩෙපෝ නිරූපනය කරන ආකාරයේ එකක්ම නොවිය. ඩෙපෝ ඔහුගේ කෘතියට නැවක් තුළ කැරිල්ලකට පොලොඹවනු ලැබූ නැවියකුගේ සැබෑ පිවත පුවත පදනම් කොට ගත්තේය. හේ සාගරයක් මැද කුඩා පාළු දිවයිනෙක මැරෙනු පිණිස අත් හැර දමන ලද්දෙක් විය. බොහෝ වසර ගණනකට පසු එම දිවයිනට පැමිණි යාත්‍රිකයන් පිරිසකට ඔහු සපුරා කැලැ සතකු වී ඇති හැටි දකින්නට ලැබිණ. කතා කරන හැටි පවා ඔහුට අමතක ව තිබිණ. හේ මිනිස් සත්වයකුට වඩා, බෙහෙවින් වල් සතකුට සමාන විය.

නූතන යුගයේ මිනිසකු පවා මිනිසකු ලෙස හුදෙකලා පිවිතයක් ගත කිරීමට හැකි වීම ගැන සාධකයක් සොයා ගැනීම පහසු නොවේ.

එසේ නම් ප්‍රාග්ෛතිහාසික මානවයන් ගැන කියනු කිම!

ඔවුන් මානවත්වයට පත් කරනු ලැබූ එක ම සිද්ධාන්තය නම් එක් ව විසීම, එක් ව දඩයම් කිරීම හා එක් ව සිය අවි තැනීම ද යන මෙයයි.

මැමතකු ලුහු බැඳ ගොස් පහර දීමේ ලා මුළු මානව රැළ ම හවුල් වූහ. එකක් නොව දුසිම් ගණනින්

වූ වල් ඌරු හෙල්ල උගේ ලොමින් පිටි ඇලපත වෙත වේගයෙන් දමා ගසනු ලැබිණ. මුළු මිනිස් රැළ ම වන මෘගයා පසු පස, බුහු–බා හා බුහු–පා, සතකු මෙන් ලුහු බැඳ ගියහ.

මෙවැන්නෙක දී දුසිම් ගණනින් වූ අත් පමණක් නොව, දුසිම් ගණනින් වූ හිස් ද එකට වැඩ කළ යුතු විය.

මැමත්, මිනිස් රැළකට වඩා කිප ගුණයෙකින් විශාල හා ශක්තිමත් ද වුවත්, සැබෑවින් ම මිනිස්සු ඊට වඩා දක්ෂතර වූහ.

මිනිසකු පහසුවෙන් සුනුවිසුනු වනු පිණිස පොඩි කර දමන්නට තරම් මැමත් දැවැන්තයෙක් විය. එහෙත් ප්‍රාගෛතිහාසික මානවයා මැමත්ගේ විශාල බර ඌට ම විරුද්ධ ව යෙදෑවීය. එසේ කිරීමෙන්, ගමන් කරන කල මීහි තල දෙදරවන දැවැන්තයා පරදවාලී.

මැමතකු වට කර ගත් කල දඩයම් කරුවෝ වියළි පැළැටි බිස්සට ගිනි තබති. මැමත් ගිනි දලු වලින් තැති ගනී. ඉන් උගේ ලොම් වැස්ම ගිනි ගන්නට පුළුවන. මෙසේ ගින්නෙන් පොළොඹවනු ලැබූ හේ දඩයම් කරුවන් විසින් කපටි ලෙස සැලසුම් කරන ලද පරිදි කෙළින් ම දිය වගුරක් දෙසට ඉක්මන් කරයි. එහි දී හේ මඩ හා සෙවෙල් තුළ ගිලී යනු ඇත. හේ වරින් වර පාදයෙන් පාදය මඩ ගොහොරුවෙන් ගොඩ ගන්නට මෙන් මහ හඬින් කුඤ්ව නාද කරයි. එහෙත් මේ ප්‍රයත්නයෙන් වඩාත් ගැඹුරට ම ගිලියනු නියතය.

දඩයම් කරුවන් ගොදුර වට කර ගන්නේ එවිටය.

මැමතකු උගුලෙහි අසු කොට මරා ගැනීම පහසු කාරියෙක් නොවීය. එහෙත් සාමාන්‍යයෙන් උස, වියළි ගං ඉවුරෙක පිහිටි නිවහන් බිම වෙත ඌ ඇද ගෙන යාම වඩා ම දුෂ්කර කාරිය විය. ගහ මිනිසුනට බිමට ජලය සැපයීය. නොගැඹුරු තැන් හා ඉවුරුත් ඔවුන්ගේ සියලු ම වර්ගයෙක අවි වලට අවශ්‍ය ප්‍රධාන අමු ද්‍රව්‍යය වූ ගිනි ගල් සැපයීය.

දැන් ඔවුන් මැමත් මඩ ගොහොරුවෙන් ගොඩට

ගෙන උස් ගං ඉවුර වෙත ඇද ගෙන යා යුතුය.

මෙහි දී යළි දැනක් නොව දුසිම් ගණනක් අත් එකට වැඩ කෙළේය.

තරහ නිමාව

අනෙකුත් සතුන් සමඟ මානවයාගේ තරහය කෙළවරට පැමිණ තිබිණ. මානවයා, සිවු පාවුන්ගෙන් මහත්තමයා පවා පරදවා දිනුම් කනුව වෙත පළමුවෙන් ළඟා වී සිටී තැනැත්තේ විය.

මිහි මත මිනිසුන්ගේ ගණන වේගයෙන් වැඩෙන්නට විය. අවසානයේ දී ලොව පුරා සෑම තැනෙක ම මානවයන් පිරිමාන වන තෙක් ම, ගෙවෙන දහස්, සිය, දස හා එක් වසරක් පාසා මිහි මත මානවයෝ ජනිත වන්නට වූහ. සත්ත්ව වර්ගයාගෙන් අන් මොන ම එකකු ට වත් මානව වර්ගයාට සිදු වූ දේ කවර දාක වත් සිදු විය නොහැකි ව ඇත.

නිදසුනක් ලෙස හාවුනට, මිනිසුනට මෙන් අසංඛ්‍ය ප්‍රමාණයෙන් වැඩී විය හැකි ව තිබේ ද?

සැබැවින් ම නැත. හාවුන්ගේ ඉමහත් වැඩී වීමක් ඇති වූ කල, එයට සමානුගාමී ලෙස වෘකයන්ගේ වැඩී වීමක් ද සිදු විය හැකිය. එවිට පමණ ඉක්මවූ හාවුන් සංඛ්‍යාවක් අතන මෙතැන ඇති නොවීමට නියතයෙන්ම වෘකයන් වග බලාගනු ඇත.

එනම් ඉමක් කොනක් නැති ලෙස වන මෘගයන්ගේ වැඩී වීමක් සිදු වීමට ඉඩෙක් නැත. ඔවුනට ජය ගත නොහැකි ඉතා අමාරු එක්තරා නියතසීමා බාධකයෙක් තිබේ.

මිනිසා, මිනිස් සත්ත්වයාට සොබා දහම විසින් බැඳුණු වැට කොටු හා සීමාවන් දිගු කලෙක සිට ඉවතට තල්ලුකොට දමා ඇත. ඔහු අවි තනන්නට උගත්තේ යම් කලෙක ද, එවක් පටන් තමා කිසි දාක ආහාර කොට නොගත් දෑ කන්නට ද පටන් ගත්තේය. මෙලෙසින් තමාට වඩාත් කාරුණික වන ලෙස සොබා දහමට අභියෝග කෙළේය. මුල දී එක් මිනිස් රැළකට පමණක් සැහෙන ගොදුරු තිබූ

තැන් වල, කල් නොයා දී එවැනි රංචු දෙකක් හෝ තුනක් දකින්නට ලැබිණ.

තව ද මිනිසා විශාල සතුන් දඩයම් කරන්නට පටන් ගත් කල සීමාවන්, සීමා රහිත ලෙස ඇතින් ඇතට තල්ලු කර දැමීය.

දැන් මිනිසාට කෑමට සුදුසු යමක් සොයා මුළු දවස පුරා ඇවිදීමට වුවමනා නොවීය. බයිසන් කුළු මීමා, අශ්වයා සහ මැමත් ද ඔහු වෙනුවෙන් තණ කැහ. මේ සිවු පා රංචු ඉමහත් තණ කොළ සම්භාරයන් ගිල දමමින් තණ පිටිටනි වල සැරි සැරූහ. දිනෙන් දින වසරින් වසර මේ සත්තු තණ කොළ ටොන් ගණන්, මස් රාත්තල් බවට හරවමින් බර වැඩි කර ගත්හ. ඉදින් මානවයා බයිසන් ගවයකු හෝ මැමතකු මරා ගත් කල, වසර ගණනක් තිස්සේ රැස් කරන ලද ශක්ති ගබඩාවකට හිමි කාරයෙක් වුයේය.

තද වැසි, හිම වැසි හා දැඩි සීතලය පවතිද්දි දඩයමේ යා නොහැකි වූයෙන් මෙවන් ශක්ති ගබඩා ඔහුට අධික වශයෙන් වුවමනා විය. සරදය හා ගිම්හානයේ දිත් සුට එලවන උණුසුම පවතින සමය ඉක්ම ගොස් තිබිණ.

කෙසේ හෝ එක් පරිවර්තනයක් ඊට සමානුගාමී ප්‍රතිඵලයක් කැඳවීය.

ඉදින් මිනිසාට ගබඩා ගෙවල් තනන්නට සිදු වූයේ නම් එක ම තැන දිගු කලක් නතර වන්නට සිදු වූ බව අදහස් කෙරෙයි. එසේ වූ කල නිවහනක් කඩා දැමීම ඔහුට ප්‍රශ්නයෙක් වෙයි. මේ අතර ඔහුට අලුත් සතුරෙක් විය. එනම් සීතලයයි. සීතලයෙන් හා හිම වැසි වලින් ආරක්ෂා වීමට විශ්වාස දායක නිවහනක් සොයා ගැනීමට ඔහුට අවශ්‍ය විය.

මිනිසා තමාගේ ම ලොවක් බිහි කර ගනී

අන්තිමේ දී මිනිසා, තමා වටා වූ අති විශාල සීතල ලෝකය මැද පුංචි උණුසුම් ලොවක් මවා ගන්නා සමය එලැබිණ. හේ කිසියම් ගල් ලෙන් දොරටුවෙක හෝ පර්වත නෙරුමක් අද්දරෙක හෝ වැස්සෙන්, හිමෙන් සහ සුළඟින් ටෙරෙනු පිණිස,

නම් වලින් සහ කොළ අතු වලින් ද, හිසට වැස්මක් හා කඳට ආවරණයක් ද සලසා ගත්තේය. ඉක්බිති සිය පුංචි ලොව මැද රාත්‍රිය ආලෝකවත් කරනු පිණිසත්, සිසිර සමය උණුසුම් කරනු පිණිසත් සූර්යයකු දල්වා තැබීය.

ඇතැම් ප්‍රාග්ඓතිහාසික දඬයම් කරුවන්ගේ කඳවුරු බිම් වල කුඩාරම් කණු පිණිස හැරූ වලවල් සලකුණු තවමත් ඇත. එම කණු රවුම් මැද, එක් සමයෙක ප්‍රාග්ඓතිහාසික මානවයාගේ කෘතිම හිරු වන, උදුන වට කරනු ලැබූ දැලි ගැසී ගිය ගල් දකින්නට ඇත.

ඔහුගේ කුඩාරම් බිත්ති බොහෝ කලකට පෙර දුවිල්ලට හැරුණේය. එහෙත් ඒවා හරියට ම කොතැනෙක විදැ යි අපි දනිමු. එම පුංචි ලොවට සීමා වූ මුළු බිම මතු පිට, එය නිමවන ලද මානව සත්වයා පිළිබඳ කතා පුවත අපට කියා පායි.

ගිනිගල් පිහි, පතුරු හා කුටිටිත්, ඉරිතලා ගිය සිවු පා ඇට, උදුන් අහුරු හා අළුත් යන සියල්ල සොඳා දහමෙහි මිශ්‍රණයෙක නම් කිසි දාක ඔබට සොයා ගත නොහිකි සේ වැලි හා මැටිත් සමඟ මුසුවී ඇත.

බොහෝ කලකට පෙර අතුරුදන් වී ගිය කුඩාරමේ අදිසි සීමාවන් ඉක්මවා පියවර කිපයක් ඔබ්බට ගිය කල මෙතෙක් අපේ මතකයට ආ මිනිස් කාර්යයන් පිළිබඳ සියලුම සලකුණු නොපෙනීයයි. එහි තව දුරටත් මිහි කුස වැළලුණු අවී දක්නට නොලැබේ. උදුනෙක අහුරු, අළු හෝ ඉරී තැළුණු සිවු පා ඇට ද නැත.

මෙපිටිදි මිනිසා විසින් වෙනු ලැබූ වෙනස් ලොවක්, අදිසි සීමාන්ත රේඛාවෙකින්, ඒ වටා වූ සියලු දෙයින් වෙන් කරනු ලැබ ඇත.



අනිතයට යන මුල් ගමන

මැමත් හා කුළු මී දඩයම් කරුවන්ගේ නිවහන් නටබුන් වලින් හමු වන උපකරණ අතර අත්‍යන්තයෙන් පොදු ගිනි ගල් මෙවලම් දෙකක් ඇත. එකක් නම් දෙපැත්තක් මුවහත් තුන් හුලස් අවියෙකි. අනෙක වට මුණත මුවහත් වූ, අර්ධ කවාකාර පැතලි අවියෙකි.

මේ එක් එක් අවියක් පැහැදිලි ලෙස ම විශේෂ කාරියක් අරබයා නිර්මිත විය. එසේ නොවන්නට ඒවා පෙනුමෙන් එතරම් වෙනස් නොවිය හැකි ව තිබිණ.

ඉදින් ඒ එක එකෙකින් කුමක් අදහස් කරන ලද දැ යි අපට සොයා ගත හැක්කේ කෙසේ ද?

මෙකී මෙවලම් වල එකී හැඩය ම අපට ඇතැම් හෝඬුවාවල් සපයයි.

කෙසේ හෝ අපි පාෂාණ යුගයට ගොස් ප්‍රාගෛතිහාසිකයන් ඔවුන්ගේ අවි වලින් වැඩ කෙළේ කෙසේ දැ යි බලමු.

ඔබට මෙය කරන්නට වුවමනා නම් එවන් දිග ගමනකට අවශ්‍ය සියලු ම බඩු බාහිරාදිය තැබිය යතුව ඇත.

ඔබේ බල පතෙහි ''ශිලා සමයට ආපසු ගමනක්'' යයි සඳහන් වී නැත. එය ඔබේ ගමන් කෙළවර ලෙස ''මෙල්බෝන්'' යන්න සඳහන් සාමාන්‍ය බල පතක් විය හැකිය.

බල පත ලබා ගත් වහා ම ඔබට ඕස්ට්‍රේලියාව බලා යාත්‍රා කරන නැවකට නැගීමට පුළුවන.

සති කීපයෙකින් ඔබ මෙල්බෝන් වෙත ළඟා වනු ඇත.

මිනිසුන් ගල් අවි වලින් වැඩ කරන පෙදෙස් මීහි මත තවමත් ඇති බව ඔබට එහි දී සොයා ගන්නට ලැබීම ඉමහත් ලෙස සිත් ගන්නක් වෙයි. එහි අදහස නම් කාලය තුළ සංචාර අවකාශය සංචාරයට මාරු කළ හැකි බවය. ඇත එපිට යුග වල දී මිනිසුන් දිවි ගෙවූ අයුරු දැන ගන්නට වුවමනා වූ විට විද්‍යාඥයන් කරන්නේ මෙයයි.

සෝවියට් රුසියාවේ වඩාත් දියුණු ජාතිහු ඔවුන්ගේ නූතන දියුණු සමාජයන්හි කාලීන සාංස්කෘතිකාංගයන්ගෙන් යුක්ත ව සියලු වරප්‍රසාද හිමි සාමාජිකයන් බවට පත් වීමට නොදියුණු ගෝත්‍රිකයනට උදවු කළහ.

එහෙත් මහල් සිය ගණනින් යුත් නූතන උස ගොඩ නැඟිලි සහිත විශාල නගර වලට නුවුරින්, මිනිස් නිවහන් ලෙස කුඩාරම් හෝ තාවකාලික බිම් ගෙවල් වැනි ආදි කාලීන අංගයන්ගෙන් සමන්විත ජනාවාස ඔබට හමු වන රටවල ඇත.

තවමත් ගල් මෙවලම් පාවිච්චි කරන මුල් වැසියෝ ඕස්ට්‍රේලියාවේ සිටිත්. මේ අව් පාවිච්චි කරන්නේ කෙසේ දැ යි උගනු පිණිස අප දකින්නට යනු ලබන්නාහු මේ මිනිස්සුය.

අපි ඔස්ට්‍රේලියානු දඩයම් කරුවන්ගේ කුඩාරම් පෙදෙසට කටු පදුරු ගහන වන ලැහැබින් පිරුණු වියළි හා පාළු තැනි තලා මැදින් අපේ ගමන යමු. එසේ යන අපට ගං ඉවුරෙහි රුක් ගොමු සෙවණේ ගස් අතු හා පටිටා වලින් නිමැවුණු, ඔවුන්ගේ කුඩාරම් හමු වෙයි.

දරුවෝ කුඩාරම් අසල වටා දුව පනිමින් සෙල්ලම් කරත්. ඒ අතර අසල ඇණ බා හිඳ ගත් ගැහැනු හා මිනිස්සු යුහුසුලු ව වැඩෙහි යෙදෙති. වැඩුණු කෙසින් පිරුණු හිසින් හා දිගු රැවුළින් යුත් මහලු දඩයම් කරුවෙක් කැන්ගරුවකු හරි ගසමින් සිටී. හේ මේ කාරියේ දී තුන් හුලස් ගිනි ගල් කපනයක් උදවු කර ගනී. මේ අව්‍ය කිරෙක් ද? අප හදාරන්නට පිටත් වූයේත් එම වර්ගයේ අව් ගැනමයි.

අනෙක් ආදි කාලීන අව්‍යක් වූ අඩ කව පෙති කපනය පරිහරණය කරන අයුරු දැක බලා ගැනීමට ඔස්ට්‍රේලියාවට දකුණින් පිහිටි වඩාත් දුරින් වූ තස්මේනියා දූපතට අප තව දුරටත් යා යුතුව ඇත. අත්‍යන්ත නූතනයේ පවා එහි ගැහැනු තවමත් රෙදි කැපීමට, හම්, පට් වලට ඉරීමට හා හම් සිරීමට ත් මේ ගල් අව් පාවිච්චි කරති.

කල්යත්ම ශ්‍රම ක්‍රියාවලිය වඩාත් සංකීර්ණ විය. මේ සියලු කටයුතු පාලනය කර ගැනීමේ පහසුව තකා එක එක කොටසකට වෙන වෙන ම කාර්යකට ඇප කැප වන්නට සිදු විය. මිනිසුන් දඩයමට පිටත් ව ගිය අතර, ගැහැනු ද කම්මැලි ලෙස ලිඹබොක්කේ නොලැග්ගහ. ඔවුහු අලුත් කුඩාරම් සැදූහ. හම් වලින් ඇඳුම් කපා සැකසූහ. කෑමට සුදුසු අල මුල් රැස් කළහ. ආහාර ගබඩා කළහ.

එහෙත් තව ද අංශයෙකින් තරුණයන් හා වැඩිහිටියන් අතර ද වෙනත් ශ්‍රම විභජන ක්‍රියාවලියෙක් ක්‍රියාත්මක විය.

දහස් වස් සිප් හල

ඕනෑ ම දෙයක් කළ යුතු හරි ක්‍රමය පිළිබඳ දැනුමක් ඇත. දැනුම අහසින් පහත් වන්නෙක් නොවේ. එය අනෙක් අයගෙන් ලබා ගන්නෙකි.

වෙන් වෙන් වශයෙන් පොරොවෙක, කියතෙක හෝ යත්තෙක නිර්මාතෘවරයා වන්නට එක එක වඩුවකුට සිදු වූයේ නම් හා ඒ සියලු අවි වලින් වැඩ කරන අයුරු සොයා ගනු ලැබීමත් එසේ ම සිදු විය යුතු ව තිබිණි නම් මීහි මත එක ම වඩුවෙක් වත් බිහි නොවන්නට තිබිණි.

එකකුට පළමුවෙන්ම ලෝකය වටේ යන්නටත්, යළිත් ඇමෙරිකාව සොයා ගන්නටත්, අප්‍රිකාව ගවේෂණය කරන්නටත්, හිම ගිර තරණය කිරීමටත්, සියලු ම තුඩු හා වරායවල් ගණින්නටත් සිදු වන්නේ නම්, අප දහස් වසරක් පිවත් වුවත් එවැන්නක් කිරීමට තරම් කාලයක් නොලැබෙනු නියතය.

දෙසිය වසරකට පෙර සොළොස් වියැති තරුණ ගැටයනට මහාචාර්ය වරුන් විය හැකි ව තිබිණි. එහෙත් ඔබ අද සොළොස් වියේ මහාචාර්ය වරයකු සොයා ගතහොත් ආශ්චර්යයෙකි!

ස්වාභාවික ව විය යුතු හැටියට ම, ශිලා සමයේ අද අප කියන මොන ම විද්‍යාවක් වත් නොවිය. මානව සංහතියේ අත් දැකීම්, පළ පුරුද්ද ඈ එක් රැස් වන්නට යම්තම් පටන් ගනිමින් තිබුණා පමණි.

මානව ශ්‍රමය අද මෙන් සංකීර්ණ නොවිණ. කෙනකුගේ අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට දිගු කලක් ගත නොවුණේ ඒ නිසයි. එසේ ව තිබිය දී පවා කෙනෙකුට උගත යුතු තවත් දේ තිබිණ.

පිය සටහන් ඔස්සේ ගොස් සතකු අල්ලා ගැනීමට, ඌ හම ගසා ගැනීමට, කුඩාරමක් තනා ගැනීමට, ගිනි ගල් අවියක් නිමැවීමට යන මේ ආදියේ දැනුමක් එදා මානවයාට අවශ්‍ය විය.

ඉදින් මේ දැනුමේ උපත කොහේ ද? එය කොතැනින් ඒ ද?

මිනිසා කිසි ම දක්ෂතාවක් මිටු කොට ගෙන නුපදී. හේ දක්ෂතා තෙමේ ම කෙමෙන් අත පත් කොට ගනී.

මිනිසා සිය අවි උපතින් උරුම කොට නොගන්නා අතර ඒවා තෙමේ ම නිපදවා ගනී. ඉන් අදහස් කෙරෙන්නේ ඔහු මෙම අවි භාවිතය හෝ දක්ෂතා හෝ සිය මාපියන්ගෙන් උරුම කොට නොගන්නා බවයි. එහෙත් හේ ඒවා සිය වැඩිමහල්ලන්ගෙන් හෝ ගුරුවරුන්ගෙන් උගනී.

සෑම අලස ශිෂ්‍යයෙක් ම, මිනිසුන් ව්‍යාකරණ හා අංක ගණිතය පිළිබඳ දැනුම උපතින් ම ලබා උපදිතොත් සතුටු වනු ඇත. එවිට පාසල් අවශ්‍ය නොවනු ඇත. එහෙත් සැබවින් ම මෙය ඔහුට එතරම් හොඳ නොවනු නියතය. පාසල් නොතිබෙන්නට මිනිසුනට අලුත් කිසිවක් උගන්නට නොහැකි වනු සිකුරුය. නිදසුනක් වශයෙන් සියලු මානව දක්ෂතා හා දැනුම් ලේනකුගේ දක්ෂතා මෙන් එක ම මට්ටමෙන් එසේ ම තිබෙනු ඇත.

මානව සංහතියේ වාසනාවකට මෙන්, මිනිස්සු පල පදියම් වූ දක්ෂතාත් සමඟ ඉපදී නැත. ඔවුහු පරීක්ෂා කරත්; උගනිත්. මේ නයින් හැම පරම්පරාවක් ම තමන්ගේ ම වූ නවතම යමක් මානව අත්දැකීම් ගබඩාවට එකතු කරත්. මේ අත් දැකීම් සම්භාරය නිරන්තරයෙන් වැඩෙමින් පවතී.

දස දහස් වස් සිප් හල හෙවත් මානව ප්‍රයත්නය

නමැති පාඨශාලාව, මානවයා අද සිටින තත්ත්වයට පත් කොට ඇත. එය ඔහුට නවීන විද්‍යාව, යන්ත්‍ර නිර්මාණ ශිල්පය, කලාව හා එමඟින් සාංස්කෘතික උරුමය ද ප්‍රදානය කොට ඇත.

මිනිසා පළමුවෙන් දස දහස් වස් සිප් හලට ඇතුළු වූයේ ශිලා යුගයේය. එහි දී ආදිතම පළ පුරුදු දඬයම් කරුවෝ සිය පිරිමි දරුවනට දඬයම් කිරීම නම් අමාරු කලාව ඉගැන්වූහ. එහි දී පිය සථහන් අනුව සතකු අඳුනා ගන්නා සැටිත්, ඔය නොගන්වා ඌ වෙත ළංවන සැටිත් ඉගැන්විණ.

ස්ත්‍රීන්ගේ වැඩ කටයුතු කෙරෙහි ලා ඉන් වෙනස් දක්ෂතාවෙක් අවශ්‍ය විය. ස්ත්‍රිය ගෘහිනියක, ගෘහ නිර්මාණ ශිල්පියකු, දර කපන්නකු හා ඇඳුම් මසන්නකුගේත් එකමිතියක් වූවාය.

හැම මානව ගෝත්‍රයක ම, සිය චිරරාත්‍රිඥත්වයෙන් ලැබූ දැනුම හා අත් දැකීම් ගෝත්‍රයේ වැඩි මහලු වූ දරුවනට ඉදිරියෙන් ඉදිරියට උරුම කොට දුන් වෘද්ධතම වූත්, අත් දැකීම් බහුල වූත් ස්ත්‍රී පුරුෂයෝ වූහ.

එහෙත් සැබැවින් ම දක්ෂතා හා පළ පුරුද්දත් ඉදිරියට යවනු ලැබුවේ කෙසේ ද?

ඒ ඔබ දන්නා පරිදි ම පෙන්වමින් හා විස්තර කරමින් ද වෙයි. මේ කාරිය සඳහා මානව සංහතියට භාෂාවක් අවශ්‍ය වෙයි.

සතකුට උගේ දරුවනට අත් පසුර හෝ දත් වැනි පණ ඇති අවි පරිහරණය ඉගැන්වීමට අවශ්‍ය නොවෙයි. කතා කරන්නේ කෙසේ දැ යි සතුන් විසින් දැන නොගත යුත්තේ ඒනිසයි.

සතුනට එසේ වුවත් ප්‍රාග්ඓතිහාසික මානවයා කතා කෙළේය.

අනුන් හා එක් ව කරන්නට සිදු වූ කටයුතු වල දී ඔහුට පොදු බසක් අවශ්‍ය විය. වැඩිහිටි පරපුරේ පළ පුරුද්ද හා දක්ෂතාත් බාල පරපුරට උරුම කොට දෙනු පිණිස මිනිසුනට වචන අවශ්‍ය වූයේය.

ශිලා සමයේ ප්‍රාග්ඓතිහාසික මානවයන් එකෙකාට කතා කෙළේ කෙසේ ද?

අතීතයට දෙවැනි ගමනක්

අපි යළිත් අතීතයට එබී බලමු. එහෙත් මෙවර අප පෙරට වඩා පහසුවෙන් ඒ කාර්ය කළ යුතුය.

ඔබ ඇත දිවයින් වෙතට ගමන් අරඹන කල අත්‍යවශ්‍යයෙන් නැවෙකින් ම යා යුතු නොවේ. අඩු තරමින් ඔබේ නිවහනින් එත් බැහැර නොවී, ඔබට ඒ කාර්ය කළ හැකිය.

ඔබේ කුටියෙන් එත් බැහැර නොවී, රේඩියෝව දෙසට හැරී බොත්තමක් කරකැවූ පමණින් ඕනෑ ම රටෙක ඕනෑ ම තැනෙකට ඔබට සැපැත් විය හැකිය. ඔබ වෙත ටෙලිවිෂනයක් තිබේ නම් ඔබට ඇසීමට පමණක් නොව සැතපුම් ගණන් ඈත සිටින මිනිසුන් දැකීමට පවා පුළුවන. රේඩියෝව හා ටෙලිවිෂනයත් අවකාශය ජය ගැනීමට අපට උදව් කොට ඇත.

එහෙත් වසර සිය දහස් ගණනකට පෙර ජීවත් වූ මිනිසුන් අප දකින්නේ හෝ ඔවුනට කතා කරන්නේ කෙසේ ද?

රේඩියෝවක් හෝ ටෙලිවිෂනයක් අප, අවකාශය මැදින් ගෙන යන්නා සේ කාලය මැදින් අප අතීතයට ගෙන යා හැකි කිසියම් උපකරණයෙක් තිබේද?

ඔව්! සැබැවින් ම තිබේ. එනම් සිනමාවයි.

අපට මුළු ලෝකයම තිර පටක් මත දර්ශනය කළ හැකිය. අද තිබෙන ලෝකය පමණක් නොව එසේම පසු ගිය කාලයේ ලෝකයත් අපට ඒ මත දැකිය හැකිය.

දැන් අපි නිශ්ශබ්ද සිනමාව දෙසට හැරෙමු. එමඟින් අපට යට ගියාව දැකිය හැකිය. එහෙත් යට ගියාවේ හඬට සවන් දිය නොහැකිය.

ඉක්බිති ග්‍රැමපෝනය වෙත යමු. දැන් අපට කට හඬ ඇසෙයි. එහෙත් කතා කරන්නේ කවරෙක් දැ යි අපි නොදනිමු. එසේ ද වුවත් හේ පැහැදිලි ව කතා කරයි.

1895 ට පෙර කුමක් සිදු වී දැ යි අපට පෙන්වන්නට චිත්‍ර පටයකට නොපිළිවන.

ග්‍රැමපෝනය නිපදවන ලද්දේ 1877 දී නිසා ඉන් පෙර කතා කරන ලද වචන යළිත් කියන්නට එයට බැරිය.

කතා කරනු ලැබූ හඬවල් මැරී යයි. ඒ ඉතිරි වතොත් මුද්‍රිත පොත් වල නීරස ඒකාකාර පේළි වල අකුරු ලෙසින් පමණි.

පැරණි මෝස්තරයේ සේයා රූ වල ඇඹුල් සිනා හා වපර බැලුම් ද වෙයි.

පරණ, පවුල් ඇල්බමයක් දෙස බලමු. කොළ පැහැති විල්ලුද පිට කවරයක් තුළ ලෝකඩ තහඩු මැද, පරම් පරා කිපයෙක පිවන තොරතුරු ඔබට සොයා ගත හැකිය.

මේ පැරණි සේයා රූ වලින් අංග ස්වරූප හා ඉරියව් ග්‍රහණය කළ හැක්කේ මද වශයෙනි. අද අපට පිම්මෙ දුවන අශ්වයකුගේ හෝ දිය තුළ කිමිදෙන්නෙකුගේ හෝ මහහු ඡායා රූපයක් පහසුවෙන් ගත හැකිය. එදා ඡායා රූප ශිල්පියා වෙත විශේෂ අත් පුටුවක් විය. එය ඡායා රූපයට පෙනී සිටින්නහු ඇබිත්තක් හෝ නොසෙලවෙනු පිණිස ඔහුගේ හිසත්, උර හිසත් තරයේ තබනු වස් ගැසූ කලමප වලින් සැදිණ. මේ ඡායා රූප පිටපත් වල මිනිසුන්ගේ මුහුණු ගල් ගැසී විකෘත වූ ඒවා මිස කොහෙත් ම ස්වාභාවික ඒවා නුවූ බවට නම් පුදුමයක් නැත.

කෙසේ වෙතත් 1838 ට පෙර ඡායා රූප ගැනුණේ නැත. යට ගියාව වෙත අපේ ගමන තව දුරටත් දිගු කරන විට කැමරා ඇසක් මෙන් විෂය මූලික හෝ නියත නැතත් අතීතය හා බැඳුණු වෙනත් සාධක කෙරෙහි සපුරා විශ්වාසය තබන්නට අපට සිදු වෙයි.

අප විසින් යළිත් අතීතය ගොඩ නගා ගන්නට නම් කලා භවනයන්, රාජ්‍ය ලේඛනාගාරයන් හා පුස්තකාලයයන්හිත් සුරැකුණු විෂය මූලක සාධකයන් සසඳා බැලිය යුතුය.

එවිට මහ මහෙක සැතපුම් කනු වල නොමේරා මෙන් වසර සියයක් මත සියයක් බැගින් මෙන් අතීතය ඇතින් ඇතට පියාඹනු දකින්නට ලැබේ.

අපි යළිත් ක්‍රි. ව. 1440 දෙසට හැරෙමු. ඉන් පෙරාතු ව මුද්‍රිත පොත් නොවීය. අකුරු අමුනන්නගේ ගල් අච්චුව, කුරුටු අකුරු ලියන්නාගේ තැන ගත්තේය.

ඔහුගේ පිහාටු පෑන පාර්මන්ට් කඩදාසිය මත ඇදෙද්දී අපි ඔහු පසු පස පියවරින් පියවර අකුරින් අකුර අතීතයට ඇදී ගෙන යනු ලබමු.

පාර්මන්ට් ලියවිලි වලින්, පැපිරස් පතුරු වලටත්, ඉන් දේවස්ථාන ගල් බිත්ති මත වූ ලේඛන වලටත් වඟයෙන් අපේ චාරිකාව, ඇතින් ඇතට යට ගියාව වෙත අප ගෙන යයි.

අතීත පුද්ගලයන් විසින් අපට උරුම කොට දෙන ලද ලේඛන ක්‍රමය සඳහට ම විස්මය ජනක වූත් අබිරහස්මය වූත් එකක් වෙයි.

අන්තිමේ දී ලේඛන ක්‍රමය අතුරුදන් වෙයි. ඒ එක්ක ම යට ගියාවේ මිනිස් හඬ ද නොඇසී යයි.

එහෙත් ඊට පසු!

එවිට අපි මිහි ගබ තුළ මිනිස් තොරතුරු සොයමු. අපි, අමතක කර දමන ලද සොහොන් බිම් වල පස් ගොඩවල් හාරමු. පැරණි අවි පිරික්සමු. ආදිතම නිවහන් වල ගල් විමසමු. බොහෝ කලෙකට පෙර නිවී ගිය ලිප් අතුරු නිරික්සමු.

මේ සියලු අතීත සුන් බුන්, මිනිසා දිවි ගෙවූයේත්, වැඩ කටයුතු කෙළේත් කෙසේදැයි අපට කියා පායි.

එහෙත් ඒ මිනිසා කතා කෙළේත්, සිතුවේත් කෙසේ දැ යි ඒවාට කිය හැකි ද?

ඉහි බස

අඳුරු ගල් ලෙනක් තුළ හෝ ප්‍රාග්ඓතිහාසික දඩයම් කරුවන්ගේ කඳවුරු අසල ප්‍රාග්ඓතිහාසික මානවයෝත් නැතහොත් සත්තෙකින් ම ඔවුන්ගේ ඉතුරු බිතුරුත් විද්‍යාඥයනට නිරතුරු ව හමු වී ඇත.

එබඳු මුල් ගණයේ සොයා ගැනීමක් නම් රයින් ප්‍රදේශයේ මිටියාවතක් වූ නියැන්ඩතාල්හි පුරා විදු දරුවන් විසින් නම් කරනු ලැබූ නටබුන් වන "නියැන්ඩතාල් මානවයායි."

නියැන්ඩතාල් මානවයාගේ හිස් කබල පිළිබඳ මනා අධ්‍යයනයෙකින් පසු, ඔහුගේ මොළය පිතෙකැන්ත්‍රෝපස්ගේ මොළයට වඩා විශාල බව අපට කිය හැකිය.

නියැන්ඩතාල් මානවයා වානරයකු නොවන බව එක් බැලුම් මතෙකින් ම බඹට පෙනෙනු ඇත.

එහෙත් තවමත් හේ කොතෙක් දුරට වානරයකුට සමාන වන්නේ ද!

ඔහුගේ නළලේ පහළ කොටස දැසට ඉහළින් නෙරා ගොස් ඇත. බලු දත් අනෙක් ඒවා හා එක පෙළට නොසිට කටින් පිටට නෙරා ගියේය.

නියැන්ඩතාල් මානවයාගේ නලලත්, නිකටත් ඔහු අපෙන් වෙන් කොට දක්වන ලක්ෂණ දෙකෙකි. ඔහුගේ නළල් තලය පස්සට නෙරා ගියේය. විස්තර කරන්නට තරම් නිකටක් ඔහුට නැත.

නූතනයකුගේ යම්තම් නළල් තලයක් ඇති හිස් කබලෙක පිහිටි මොළයෙහි කිසියම් අඩු පාඩුවක් දැකිය හැකිය. එසේ ම නිසි පමණ නොවැඩුණු නිකට සහිත යටි හක්ක තවමත් මානවයකු ලෙස උච්චාරණයට සකස් වූවෙක් නොවේ. එවන් නළල් තලයක් හෝ නිකටක් ඇත්තකුට අපට මෙන් සිතන්නට හෝ කතා කරන්නට නොහැකි විය.

එහෙත් ප්‍රාග්ඓතිහාසික මානවයාට කතා කරන්නට සිදු ව තිබිණි. පොදු කාරියෙක දී බිණීම අවශ්‍ය විය.

මිනිසුන් එක් ව කටයුතු කරන විට ඔවුන් කරන්නට යන කාරිය පිළිබඳ සම්මුතියකට එළඹිය යුතුය. ඔහුට එහි ලා සිය නළල් තලය වැඩි දියුණු වන තෙක් ද, යටි හක්ක උන්නත ව නෙරා යන තෙක් ද බලා සිටිනු නොහැකි විය. ඒ සඳහා ඔහුට ''දහස් වසර'' වලින් තවමත් බලා සිටින්නට සිදු විය හැකි ව තිබිණි.

මෙසේ තිබිය දී ඔහු අන්‍යයන් හා අදහස් හුවමාරු කර ගත්තේ කෙසේ ද?

හේ තමාට කියන්නට වුවමනා වූදේ මුළු සිරුර ම උදවු කර ගනිමින් තමාට කිය හැකි හොඳ ම විධියෙන් කියේය. මේ වන විටත් බිණීම සඳහා වෙන ම අවයවයක් නොලත් හේ සිය අත්, මුහුණේ මස් පිඬු උර හිස් හා පා ආදිය ඒ සඳහා යොදා ගත්තේය.

ඔබ කවර දාක හෝ බල්ලකු සමඟ කතා කර තිබේ ද? බල්ලකුට, සිය ස්වාමියාට යමක් කියන්නට වුවමනා වූ විට ඌ ස්වාමියාගේ මුහුණ දෙස බලා සිටී. එහෙන් මෙහෙන් ඉව කරයි. ස්වාමියාගේ උකුල මත අත්ල රඳවයි. වලඟ වනයි. කලබලයෙන් පහුරු ගායි. ඇනුම් අරී. ඔහුට වචන පාවිච්චි කළ නොහැකිය. එහෙයින් සිය පණිවිඩය කීමට මුළු සිරුර ම නාස් තුඩහ සිට වල්පත් තුඩඟ තෙක් යෙදීමට සිදු වී තිබේ.

ප්‍රාගෛතිහාසික මානවයා වචනවත්, වචන හඬවන්නේ කෙසේ දැ යි එත් නොදත්තේය. එහෙත් ඔහුට අත් තිබිණ. අනෙකකුගේ උදවුවෙන් තොර ව යමක් තේරුම් ගැනීමට ඒවා ඔහුට උපකාර විය. හේ සිය දැත් වැඩෙහි යෙදීය. එහෙත් වැඩ කිරීමේ දී බසක් ද වුවමනා විය.

''එය කපන්න'' කියනු වෙනුවට ප්‍රාගෛතිහාසිකයා සිය අතින් අවකාශය කැපීය. ''එය මට දෙන්න'' කියනු වෙනුවට සිය අත දික් කෙළේය. ''මෙහි එන්න'' කියනු වෙනුවට අත තමා වෙත නමාලීය. ඒ අතර අතට උදවුවක් සේ කට හඬ ද යොදා ගත්තේය. විටෙක හේ බෙරිහන් දුන්නේය. විටෙක ගෙරවීය. විටෙක කෑ ගැසීය. මෙසේ හඬ නැංවූයේ අනෙකකුගේ අවධානය තමා කෙරේ යොමු කරවා ගෙන සිය හස්තාභිනයන් වෙත මෙහෙයවා ගනු පිණිසය.

එහෙත් මේ සියල්ල අප දන්නේ කෙසේ ද?

මීහි ගැබින් අපට ලැබෙන හැම ගිනි ගල් අවි කඩක් ම අතීතයෙන් ඇබිත්තෙකි. එහෙත් අප සිදී ගිය අතීත ඉංගිත බිඳු ලබා ගන්නේ කෙසේ ද? බොහෝ කලක් තුළ දුවිල්ලට හැරුණු හස්තාභිනයන් අපට යළිත් නිර්මාණය කළ හැක්කේ කෙලෙසින් ද?

ප්‍රාගෛතිහාසික මානවයන් අපේ මී මුත්තන් වූයෙන් ඔවුන්ගේ උරුමයන් අපට හිමිකොට ඇති නිසා ම මිස එය දැන ගනු නොහැකි වන්නට තිබිණි.

කතා කරන අත්

නොබෝ කලකට පෙර රතු ඉන්දියානුවෙක් ලෙනින්ග්‍රාඩයට පැමිණියේය.

මේ ඇමෙරිකන් අමුත්තා මුව සම් පාවහන් හෝ පිහාටු හිස් වැස්ම පැළඳ නොසිටියේය. හේ අප මෙන් ඇඳ පැළඳ සිටියේය. ඉංගිරිසි හා සිය ගෝත්‍රික බසත් ව්‍යක්ත ලෙස හැසිරවිය.

මේ අතර හේ තුන් වැනි බසක් ද දත්තේය. එය රතු ඉන්දියානුන් වසර දහස් ගණනක් තිස්සේ රැක ගත්තෙකි.

එය මුළු ලොව පුරා ඇති සරලතම බසයි. ඔබ එය උගන්නට තීරණය කළහොත් අප බොහෝ දෙනකුට ඊනියා හිස රදයක් වන ක්‍රියා හා නාම වරනැගීම ඔබට උගන්නට නොසිදු වනු ඇත. එහි අසම්භාව්‍ය ක්‍රියා නැත. කෘදන්ත නැත. ක්‍රියා විශේෂණ නැත. උච්චාරණය කරන්නට කොහෙත් ම යමක් නැති හෙයින් නිවැරදි උච්චාරණයේ ලා කෙළ පැමිණීමට තරම් සරලතම වනු ඇත.

සැබැවින් අමුත්තාගේ බස ශාබ්දික බසෙක් නොවිය. එය ඉහි බසෙකි. මේ බසෙහි ශබ්ද කෝෂයක් බැලු බැල්මට මෙසේ විය හැකිය.

ඉහි බසේ වදන් කොස්සෙන් පිටුවක්

දුන්න – එක් අතක් දුනු වක දක්වයි. අනෙක් අත කල්පිත දුනු දිය දක්වයි.

කුඩාරම – එකට කිටටු කැරුණු ඇහිලි කුඩාරම් හැඩය දක්වයි.

සුදු මිනිසා – තොප්පියේ ගැටට දක්වනු පිණිස නළල හරහා තබන ලද අත.

වෘකයා – දෙකන් දැක්වෙන්නට දික් කැරුණු දැහිලි සහිත අත.

හාවා – හාවාගේ දිග දෙකන් හා රවුම් පිට දක්වන්නට දික් කැරුණු දැහිලි සහිත ව වක ගැසූ අත්ල.

මාලුවා – වලග දෙපසට වනමින් මාලුවා පිනන අයුරු අනුකරණයට, අත්ල පිට අත්ල තබා වංගු ගසමින් වලනය කිරීම.

මැඩියා – මැඩි පිම්ම දක්වන්නට ඇහිලි තුඩු පස

එක් කරමින් මාරුවෙන් මාරුවට විහිදුවීම.

වලාකුළ – දැත් මිටු කොට හිසට උඩින් ඇල්ලීම.

හිම – දැත් මිටු කොට හිසට උඩින් අල්ලා හිම කැරලි පහතට පා වී එන අසුරු දැක්වීමට ඇඟිලි ටිකින් ටික දිග අරිමින් සෙමින් පහතට ගෙන ඒම.

වැස්ස – දැත් මිටු කොට, හිසට උඩින් අල්ලා, ඇඟිලි දිග අරිමින් වේගයෙන් පහතට ගෙන ඒම.

තරුව – තරුවක දිදුලෙන බව නිරූපණයට හිසට උඩින් ඇඟිලි දෙකක් ඉං කිරීම හා ඇත් කිරීම.

මේ බසෙහි හැම වචනයක් ම අවකාශයෙහි අඳින ලද පින්තූරයෙකි.

මෙපරිදි බෙහෙවින් ම ප්‍රාග්තම ලේඛනය වචන වලින් නොව පින්තූර වලින් යුක්ත විය. එසේ ම ඇතැම් විට බොහෝවක් පැරණිතම ඉංගිතයෝ පින්තූර වාග් මාලාවෝය.

විය හැකි පරිදි රතු ඉන්දියන් ගෝත්‍රිකයන්ගේ ඉහි බස ප්‍රාගෛතිහාසික මානවයාගේ බස ම නොවේ. නූතන රතු ඉන්දියන් ගෝත්‍රිකයන්ගේ ඉහි බසෙහි, කිසිදු ප්‍රාගෛතිහාසික බසෙක, කිසි දාක නොදැකිය හැකි වචන රැසෙක් ඇතුළත් වෙයි. නූතනතම පින්තූර වචන කිපයෙක් පහත එයි.

මොටෝ රිය – රෝද දෙක දැක්වීමට දැත රවුම් කොට සකසා, කල්පිත සුක්කානම දැක්වීමට කරකැවීම.

ට්‍රම්රිය – රෝද සඳහා දැත රවුම් දැක්වීම හා පසු ව, ඇන්පිමෙන් ට්‍රම් නගින බව දැක්වීමට බාහුව තරංගාකාර ලෙස චලනය කරමින් ඉහළට ගෙන යාම.

මේවා නවතම ඉංගිතයෝය. එහෙත් අත්‍යන්තයෙන් විය හැකි පරිදි ප්‍රාගෛතිහාසික සමයෙන් අපට ලැබී ඇති ඉහි බස් වදන් කොස්සෙකින් ලද හැකි ඉංගිතයෝ වෙත්.

ගින්න – කුඩාරමෙකින් නගින ධූම දැක්වීමට අත්ල හා බාහුව තරංගාකාරයෙන් ඉහළට චලනය කිරීම.

වැඩ කිරීම – අතින් අවකාශය කැපීම.

අපේ ම ඉහි බස

අපි අපේ ම ඉහි බසක් රැක ගෙන සිටිමු.

අපට ''ඔව්'' යයි කියන්නට වුවමනා වූ කල අපි හැම විට ම එම වචනය නොකියමු. බොහෝ විට හිස වනමු.

''එහි'' යයි කියන්නට වුවමනා වූ කල ඇහිල්ල දික් කරමු. අපට දබරැහිල්ල නමින් හැඳින්වෙන විශේෂ ''කථනාංගුලියක්'' පවා ඇත.

අපි කිසිවකුට ආචාර කරන විට හිස නමමු. නොයෙක් විට අපි අපේ හිස සොලවමු. උර හිස් හකුලා උස්සමින් දැත් දෙපසට විහිදුවමු. රවමු. තොල හපමු. කිසිවකුට අපේ තර්ජනාංගුලිය ලෙළවමු. මෙසයට ගසමු. අඩි හප්පමු. අත් පදවමු. දැත මිරිකමු. ඒවා පපුවට තද කර ගනිමු. දැත් එකට බඳිමු. අතට අත දෙමු. සිප වැලඳ ගනිමු.

හුදෙක් එක් වචනයකුදු කතා නොකළත්, මෙහි දී සපුරා අදහස් හුවමාරුවක් සිදු වන්නේය.

තව ද ''කථනයෙන් තොර වූ මේ බස'' හෙවත් මේ ඉහි බස මරා දැමීය යුතු නොවේ. සැබැවින් ම එසේ නසා නොදැමීමට තරම් සාධාරණ හේතු ඇත. ඇතැම් විට හුදෙක් එක් ඉහියෙකින්, දිග දෙසුමෙකින් ඉදිරිපත් කරන්නකට වැඩි යමක් කිය හැකිය.

කෙසේ වෙතත් කථනයේ දී ඉහි බසක් යෙදීම හොඳ පුරුද්දෙක් නොවේ.

ඔබට අදහසක් පහසුවෙන් වචන වලින් විස්තර කළ හැකි ව තිබිය දී අත පය යොදමින් කියන්නට සිදු වී ඇත්තේ කවර හෙයින් ද? කෙසේ වෙතත් අපි ප්‍රාග්ඓතිහාසික මානවයෝ නොවෙමු. අඩි හැප්පීම, දිව පෙන්වීම හා දබරැහිල්ල දිගු කොට පෙන්වීම අපි අමතක කර දැමීය යුතු පුරුදුය. තව දුරටත් අපට කියන්නට ඇති යමක් විස්තර කළ හැකි එකම මහ නිහඬබස පමණක් වන අවස්ථා ඇත.

නැව් දෙකක් ''ධ්වජ සංඥා'' මගින් කතා කරනු ඔබ කවර දා හෝ දැක තිබේ ද? ඇතැම් විට අපේ කන අපට මෙහෙ කිරීම පිළිකෙව් කරන හෙයින්,

අපේ සම්පූර්ණ විශ්වාසය දෙනෙත් වෙත තැබිය යුතු ව තිබේ.

අපමණ වසර දහස් ගණන් වල සිට පැවත එන නිසාත්, ඉහි බසෙහි වැදගත් කමට සාධාරණ හේතුව අපට පැහැදිලිය. එය තවමත් මිනිසුන්ට අවශ්‍යය.

දොඩන බස, ඉහි බස කෙරෙහි සිය ආධිපත්‍යය පිහිටුවා ඇත. එහෙත් සපුරා නොවේ. දැන් පරාජිතයා, ජයග්‍රාහකයාගේ වහලෙක් වී සිටී. ඉහි බස තවමත් ඇතැම් ජාතින් අතර මෙහෙකරුවන්ගේත් යටත් වැසියන්ගේත්, ''වසලයන්'' ලෙස සලකනු ලබන්නන්ගේත් බස ලෙස සැලකීමේ හේතුව එයයි.

සිරියාව, ඉරානය සහ ලෝකයේ වෙනත් බොහෝ කොටස්වල ඉහි බස් තිබිණි.

මේ අයුරින් වත්මන්හිදු, දිගු වියැකුණු අතීතයේ පිය සටහන් අපට හමු වෙයි.

මිනිසා සිය මනස සරි කර ගනී

හැම වන සතෙක් ම හැම පැත්තෙකින් ම එන දහස් ගණන් සංඥා වලට සිය කන් යොමයි. ඒවා නිරීක්සයි.

හදිසියේ අත්තක් බිඳෙයි. ඒ සතුරෙක් විය හැකියි. එවිට සතා පලා යන්නට හෝ ආරක්ෂා වන්නට සූදානම් වෙයි.

ගිගුරුම් හඬෙක් එයි. අතු ඉති වල පත් සිඳ ගෙන, වන ගල හිස පිසගෙන නල රැළි එයි. වන සත්තු හමන කුණාටුවෙන් ආරක්ෂා වන්නට සිය කැදලි වල සැහවෙත්. නැතහොත් බෙන තුළට රිංගත්.

ගොදුරු ගඳෙක්, පල් වන පරණ ලා පත් හා බිම මල් ගඳත් සමග මුසු වෙමින් තෙත් මිහි මත විහිද යද්දී, කිසියම් සතෙක් ඉව ඔස්සේ සිය ගොදුර ලුහු බඳිමින් යයි.

ඕනෑ ම සර සර හඬක්, ගඳක්, තණ පත් අතර අඩි පාරක්, මුර ගැමක් හෝ පිඹීමක් යන හැමෙකෙක ම කිසියම් තේරුමෙක් ඇත. එහෙයින් එහි ලා ක්ෂණික අවධානයෙක් අවශ්‍යය.

ප්‍රාග්ඓතිහාසික මානවයා ද අවට ලෝකයේ

හැම සංඥාවකට ම ඇහුම් කන් දුන්නේය. ඒ දෙනට කවර හැටියෙකින් හෝ වෙනස් ආකාරයෙක සංඥාවක් ද තේරුම් ගැනීමට හේ ඉක්මනින් උගත්තේය. මේ සංඥා ඔහුට සිය ගෝත්‍රිකයන් විසින් එවන ලද ඒවාය.

සිවු පාවකුගේ අඩි පාරක් කිසියම් සංඥාවෙකි.

සිය සගයනට සත්ව පිය සටහනක් ගැන දැන්වීමට දඩයම් කරුවකු අතින් වැනීම සංඥාවක් පිළිබඳ සංඥාවෙකි.

දඩයම් කරුවන්ගෙන් එකකුට අහම්බෙන් සතකුගේ පිය සටහනක් දක්නට හෝ අකුලක් අතරින් රිංගන එකකුගේ සර සර හඬ අසන්නට හෝ ලැබුණොත් එම සංඥාව ගැන සංඥාවක් සිය සගයනට යවනු ඇත.

මේ අයුරින් සොබා දහමින් මිනිසාට සංඥා ලැබීම එක් මහක් වන අතර ගෝත්‍රයේ සාමාජිකයන් විසින් එකෙකාට සංඥා යැවීමේ මහක් වශයෙන් බස තවත් සංඥා මාර්ගයක් බවට පත් විය.

මෙබඳු ඉමක් කොනක් නැති අංග චලන සංඥා හා ශබ්ද තිබිණ. සංඥාවක් පිළිබඳ මේ සංඥා නිරතුරුව මොළයට ලභා විය. මේ නිසා මිනිස් හිස් කබලෙහි පිහිටි විශේෂ මධ්‍යම ආයතනයට වඩ වඩාත් කටයුතු පැවරිණ. මෙයින් අදහස් කැරුණේ ''මධ්‍යම ආයතනය'' විශාල විය යුතු බවයි. මොළය ඉසලයන්ගෙන් ගහන වන්නට විය. එසේ ම සෛලයන් අතර නිරන්තරයෙන් පැවති අන්‍යොන්‍ය සම්බන්ධය සංකීර්ණත්වයෙකින් යුක්ත වන්නට විය. මේ හේතුවින් මොළය වඩාත් විශාල වූයේය.

මිනිසා සිය බුද්ධිය ලබා ගත්තේ සොබා දහමේ දායාදයක් ලෙස නිරායාසයෙන් ම නොවේ. ඔහු එය ආයාසයෙන් ලබා ගත්තේ සිය දැතේ වීරියෙනි!

දිව හා අත් නැන් මාරු කෙළේ කෙසේ ද?

තවමත් ප්‍රාගෛතිහාසික මානවයා සතු ව තිබුණු අවි ඉතා ටිකක් වූ අතර, ඔහුගේ අන් දැකීම් ද ඉතා සීමිත ව තිබිය දී, එකකුගේ හැකියාවන් තවෙකකුට

කියා දීමට සරලතම සංඥා කිපයක් පමණක් හොඳට ම ප්‍රමාණවත් විය.

එහෙත් ශ්‍රමය වඩාත් සංකීර්ණ වත් ම සංඥා ද වැඩි වෙමින් සංකීර්ණ වන්නට විය. එක් එක් දෙයක් සඳහා විශේෂ සංඥාවක් බැගින් තිබිය යුතු වූ අතර, එම සංඥාවට ඊට හිමි වස්තුව නියත වශයෙන් ම විස්තර කිරීමට හැකි විය යුතු ව තිබිණි. පින්තූර සංඥා ක්‍රමය ඇති වූයේ මෙලෙසිනි. ප්‍රාග්ඓතිහාසික මානවයා සතුන්, අව්, ගස් හා වෙනත් ද්‍රව්‍යයන්ගේ පින්තූර අවකාශයේ ඇන්දේය.

නිදසුනක් ලෙස, ඔහුට ඉත්තෑවකු ගැන විස්තර කරන්නට වුවමනා වූයේ නම් හේ හුදෙක් ඉත්තෑවකුගේ රූපය අවකාශයේ ඇඳීම පමණක් නොකෙළේය. හේ තෙමේ ම මොහොතකට ඉත්තෑවෙක් විය. හේ ඉත්තෑවා බිම හාරන, පා පසුරින් පස් පැත්තකට දමන හා කැරු සැණින් විහිදුවන ඉරියවු දැක්විය. මෙවන් පුවතක් ඉඟියෙන් දැක්වීමට වර්තමානයේදී නිපුණ සිත්තරකු තුළ පමණක් දැකිය හැකි බෙහෙවින් සුපරීක්ෂාකාරී භාවයක් තිබිය යුතුය.

''මම වතුර බීවෙමි'' යි ඔබ කියන විට ඒ කියමන අසන්නකුට ඔබ වතුර බීවේ විදුරුවෙකින් ද, බෝතලයෙකින් ද, බොකු ගැසූ අත්ලින් ද යනු නොඇහෙයි.

ඉහි බසින් මෙය කියන්නට කලින්, ඉගෙන, මතක ඇත්තකුට එක් වර ම අවස්ථා වෙනස පළ වන සේ දැක්විය හැකිය.

ඔහු බොකු ගැසූ අත්ල මුවට ළං කොට සිතින් මවා ගත් ජලය හඬ නහමින් බොනු ඇත.

ඔහු දෙස බලා සිටින්නකු ඒ ජලය කොතරම් මිහිරි ද, සිසිල් ද, සුව දායක ද යනු හඟිනු නියතය.

අපි ''අල්ලන්න'' හෝ ''විදින්න'' යයි කියමුයි සිතමු. එහෙත් ප්‍රාග්ඓතිහාසික මානවයා එම සිද්ධිය සපුරා රහ පැවේය. ඉහි බස ඇතැම් විට බෙහෙවින් විස්තරාත්මක විය. ඇතැම් විට දුබල විය.

කිසියම් සිදු වීමක් හෝ වස්තුවක් පැහැදිලි ලෙස නිරූපණය කළ හැකි බැවින් ඉහි බස විස්-

තරාත්මක විය.

ඉහි බසින් වම් ඇස හා දකුණු ඇස පෙන්විය හැකිය. එහෙත් ''ඇස'' කීමට නොහැකිය.

කිසියම් වාස්ත්විකයක් නියත ලෙස විස්තර කිරීමට ඔබට ඉහි බස යොදා ගත හැකි වුවත් අවාස්ත්විකයක් හෙවත් භාව නාමිකයක් විස්තර කිරීමට එය යොදා ගත හැකි නොවේ.

ඉහි බසෙහි තවත් දුබලතා ද විය. ඔබට රාත්‍රියෙහි ඉහි බසින් කිසිවක් කිය නොහැකිය. ඔබ කුමක් කරත් ද යි කිසිවකුට නොපෙනිය හැකි හෙයින්, අඳුරෙහි කොතරම් හස්ත සංඥාවන් පෑවත් අර්ථ විරහිත හෙයිනි. මහ දවාලේ වුව ද මිනිසුනට එකෙකාගේ ඉහි බස තේරුම් නොගත හැකි බාධක ඇත.

තැනි තණ බිම් වැසියනට ඉහි බසින් එකෙකාට කතා කරනු හැකි විය. එකෙක් මහ වන මැද දී වන ලැහැබ වලින් දඩයම් කරුවන් එකෙකා වෙන් කරනු ලැබූ කල මෙය අපහසු වූවෙකි.

මේ නිසා සිය අදහස් අන්‍යොන්‍ය වශයෙන් තේරුම් ගැනීමට සැලැස්වීමට නම් ශබ්ද අවශ්‍ය බව මිනිසුනට වැටහිණ.

මුල් අවස්ථාවේ දී ප්‍රාගෛතිහාසික මානවයාගේ දිවත්, උගුරත් ශබ්දෝත්පාදනයේ ලා මොන ම නීතියක් හෝ රීතියකට ''නහට අහන්නක්'' නොවිය. එක් හඬක් තවත් හඬෙකින් කිසි සේත් වෙනස් නොවිය. ඉන් පසු වෙනස් හඬවල් ලෙස අසන්නට ලැබුණේ, ගෙරවීම, මූර ගැම හෝ කෙඳිරීම වැනි අවස්ථා කිපයෙක් පමණි. මිනිසා නිරවුල් කථනය පිණිස ශබ්දෝත්පාදනය සඳහා සිය දිව හැසිරවීමේ නිපුණයකු වීමට පෙර එයට සුදානම් වීමේ ලා අනාදිමත් කාලයක් ගත කෙළේය.

සියලු අංග චලනයන්ගෙන් වඩාත් අනවධානය වූවෝ දිවෙහි චලනයෝය. එහෙත් මිනිසා ලද මහභූතම ජය නම් එම අදිසි චලනයන්ගෙන් නිසන් හඬ අසන්නට හැකි වීමයි.

ඊවී ගෝත්‍රිකයෝ සාමාන්‍ය ව්‍යවහාරයේ දක්

වෙන සේ ''ගමන් කරනවා'' යයි නොකියත්. එහි ලා ඔවුන්ගේ වහර කිපයෙකි මේ. ''ස්සෝ ඩස්සේ ඩස්සේ''–ස්ථිර ලෙස පා තබා ගමන් කරනවා. ''ස්සෝ බොහෝ බොහෝ''–තරබාරු කෙනකු සේ බරට පා තබා ගමන් කරනවා. ''ස්සෝ බුලා බුලා''–කඩා පැන ගෙන මහත් වේගයෙන් පා තබා ගමන් කරනවා. ''ස්සෝ පියා පියා''–අහංකාර ලෙස පා තබා ගමන් කරනවා. ''ස්සෝ ගෝවු ගෝවු''–යම්තම් නොණ්ඩියක් සමඟ හිස ඉදිරියට නමා ගෙන පා තබා ගමන් කරනවා.

මේ ප්‍රකාශන එක එකක් යමකුගේ ගමන් ලීලාව පිළිබඳ හැම අංගෝපාංගයක් ම විස්තර කෙරෙන ශබ්ද චිත්‍රයෙකි. මෙයට යමකුගේ ස්ථිර ලෙස පා තබා ඇවිදීම, හින් දැරී කෙනකුගේ ස්ථිර ලෙස පා තබා ඇවිදීම, දණිස් නොනමා දරදඬු ලෙස ස්ථිර ව පා තබන්නකුගේ ඇවිදීම ආදි ගමන් විලාස ඇතුළත්ය. විවිධ ගමන් ලීලාවන් ඇත්තා සේ ම ඒ එක එකක් විස්තර කෙරෙන ප්‍රකාශන විධි ද ඇත.

මේ අයුරින් අන්තිමේ දී දෘශ්‍ය නිරූපණ සංඥාව, ශ්‍රව්‍ය නිරූපණ සංඥාව විසින් ජයග්‍රහණය කරන ලදී.

ප්‍රා ගෛතිහාසික මානවයා ඉහි හා වචන මඟින් කතා කරන්නට උගත්තේ එලෙසිනි.

නදිය හා එහි උල්පත්

අතීතයට පිය නැඟීමෙන් අප සොයා ගෙන ඇත්තේ කිමෙක් ද?

යම් සේ දේශ ගවේෂකයෙක් නදියක් ඉස්මත්තට ගමන් කරමින් එහි උපත සොයා ගන්නේ ද? එපරිදි මානව අත් දැකීම් සම්භාරය නමැති මහ නදියේ උපතට මුල් වූ සිහිති දිය කඳුර වෙත අපි පැමිණ සිටිමු. මේ ගං ඉස්මතේ දී මානව සමාජයේ, බසේ හා බුද්ධියේ උපත ද අපට හමු විය.

යම් සේ එක් එක් නදිත්තක් අනූ පිළිවෙළින් එක් වීමෙන් ගහක් පුළුල් හා ගැඹුරු වන්නේ ද? එසේ ම එක් එක් අනුපූර්ව පරම්පරාවක් තමන් එක් රැස් කර ගත් අත් දැකීම් සමූහයක් එක් කරන

හෙයින් මානව අත් දැකීම් සම්භාරය නමැති මහ නදිය සඳහට ම වඩ වඩාත් ගැඹුරු හා පුළුල් ද වෙමින් වැඩෙයි.

පරම්පරාවකට පසු පරම්පරාවක් අතීතයේ සැහවී ඇතින් ඇතට ගියේය. මිනිසුන් හා ගෝත්‍රයෝ ද යම්තම් හෝඩුවාවක් හෝ නොතබා නෂ්ටප්‍රාය වූහ. මහා නගරයෝ ද ගම් නියම් ගම්හු ද සඳහට ම අභාවයට යමින් සුණු විසුණු ව සුන්නද්දුලි බවට ගියහ. කාලයාගේ විනාශකාරී බල වේගයට විරුද්ධ වන්නට කිසිවෙක් නැතැ යි යන්න අපට කාලය විසින් ම පෙන්වා දී ඇත. එහෙත් මානව සංහතියේ ඒකරාශීකෘත අත් දැකීම් සම්භාරය නොනැසී පවතී. එම අත් දැකීම් සම්භාරය, කාලය ජය ගනිමින් අපේ භාෂාව, කුසලතා හා විද්‍යාවන් සමඟ පීවත් වෙයි. බසෙහි හැම වචනයක් ම, අපේ කාර්යයන්හි හැම අංග චලනයක් ම හා විද්‍යාවේ හැම සංකල්පයක් ම අතීත පරම්පරාවන් විසින් රැස් කර ගන්නා ලද අත් දැකීම් සම්භාරයයි.

මේ පරම්පරාවන්ගේ ප්‍රයත්නයෝ කිසි සේත් අපතේ නොගියෝය. කෙසේ ද යත් මහ නදිය පෝෂණය කළ එක් නදිත්තකුදු සඳහට ම නෂ්ට ව නොගියා සේය. මෙතෙක් අපට පෙර පීවත් ව සිටියා වූත්, දැනුදු අප සමඟ පීවත් ව සිටින්නා වූත් සකල මිනිස් සංහතියේ ශ්‍රම ධාරාව· මානව අත් දැකීම් සම්භාරය නමැති මහ නදියට එක් ව ඇත.

අපි දැන් ගං ඉස්මත්තට පැමිණ සිටිමු. මානව සංහතියේ සියලු ම ආරම්භයන්ගේ ආරම්භය මෙතැනයි. මේ මානවයා, වැඩ කරන, කතා කරන හා සිතන සතා ජනිත විය.

අප වානරයාගෙන් වෙන් කරනු ලැබූ, ඉමහත් සිය දහස් වසර ගණන් දෙස ආපසු බැලුවොත් ''මිනිසා ජනිත කරනු ලැබුවේ ඔහුගේ දැතේ වීරියෙනි'' යන ප්‍රෙඩ්රික් එංගල්ස්ගේ බුද්ධිමත් වචන ඉවත දැමීමට අපට කිසිදු පිහිටෙක් නොලැබෙයි.



අත් හළ නිවස තුළ

කිසිවකු සිය යහපත පිණිස කුලී නිවසක් අත හැර යන අතර එහි හැර දමා ගිය දේ දකින්නට ලැබේ. කඩදාසි ගුටි, පිහන් මැටි බඳුන් කැබලි හා හිස් කාමර තුළ අතන මෙතන විසුරුණු හිස් ටින් කබල් ද එබඳු තැනෙක දකිනු හැකිය.

පුරවන ලද කොහු පිටතට එමින් තිබෙන පරණ අත් පුටුවක් ඇත කොනෙක නිදි කිරමින් සිටී. එය කුලී නිවැසියන් විසින් අමතක කර දමන ලද්දේ කකුලක් කැඩී තිබුණු හෙයිනි.

මේ සුන් බුන් වලින් එහි සිටියවුන් පීවත් වුණු ආකාරය සිතා ගන්නට අපහසු වීය හැකිය. එහෙත් නියතයෙන් ම පුරාවිදු දරුවකු මුහුණ දෙන ගැටලුවද මෙයයි. හැම විට ම එවැනි නටබුන් තැනෙකට අන්තිමට පිවිසෙන්නා ඔහුය. ඇත්තෙන්ම සම්පූර්ණ ගෙයක් ඔහුට ඉතිරි වුවහොත් හේ වාසනාවන්තයෙකි. සාමාන්‍යයෙන් ඔහු පැමිණෙන්නේ අවසාන කුලී නිවැසියාත් එය අත් හැර ගොස් අවුරුදු දහස් ගණනක් ගත වීමෙන් පසුය. ඇතැම් විට ඔහුට ලැබෙන මුළු හරුබස්ස කැඩී බිඳී ගිය බිත්ති හා පදනම් කොටස් පමණෙකි. මෙහි හැම මැටි බඳුන් කබලක් ම කිසියම් අනාවරණයෙකි. හැම කැබිලිත්තක් ම සාර්ථකත්වයේ සංකේතයෙකි.

නටබුන් ගෙයකට සිය ගොළු බසින්, එම බස තේරෙන්නකුට කිය හැකි දේ අපමණය!

දැනට ගණ වැටී ගොස් ඇති, පැරණි ගල් කැටයම් නමැති ඇඳුම්වලින් සැරසුණු කොත් මුදුන් හා පාසි බැඳී වැසී ගිය බිත්තිද නොයෙක් බොහෝ මිනිසුන්, සිද්ධීන් දැක ඇත.

එහෙත් ප්‍රාග්ඓතිහාසික මානවයන්ගේ නිවහන් වූ ගල් ගුහා හෙවත් ලොවෙහි පැරණිතම ගෙවල් වීට වඩා බොහෝ දේ දැක තිබේ.

ඒ ඇයි? වසර පනස් දහසකට ඉහත මානවයන්

පිවත් වූ ගල් ගෙවල් ඇත! වාසනාවකට මෙන් පර්වත නිමැවී ඇත්තේ ස්ථිර ද්‍රව්‍යයන්ගෙනි. මිනිස් නිවහන් වල බිත්ති මෙන් ගුහා බිත්ති ඉරී තැලී, පතුරු ගැලවී, කැඩී බිඳී නොයයි.

මේ එවැනි ගල් ලෙනක් ගැන තොරතුරෙකි. මිනිස්සු එහි පදිංචියට ආහ. එහි මැටි තුළින් හමු වූ රළු ගිනි ගල් කපනයෝ ඔවුන් ගැන කිසියම් තොරතුරක් අපට කියත්. ප්‍රාග්ඓතිහාසික මානවයෝ මේ කපනයන් මළ සතුන්ගේ හම ඉරා විවෘත කරන්නටත්, ඇට හා බැඳුණු මස් කපා වෙන් කර ගන්නටත්, මිදුළු ලබා ගන්නට ඇට පළන්නටත් යොදා ගත්හ. මෙහි අදහස නම් ඔවුන් දඩයම් කරුවන් වූ බවයි.

ඊළඟට තැන්පත් වී ඇති ද්‍රව්‍ය තට්ටුවෙහි මානව නිවහනක් බවට වැඩි දුරටත් සලකුණු අපට හමු වෙයි. මෙවා නම් ගිනි මැල අහුරු හා අළු ද, පළෙල ඇට ද, ගිනි ගලින් හා ඇට වලින් තැනූ අවි ද, වෙයි. යළිත් වරක් මිනිස්සු එහි පදිංචියට ආහ. අපට ඔවුහු දැකිය නොහැකි වෙත්. එහෙත් ඔවුන් ගැන බොහෝ දේ අපට සොයා ගත හැකි ව තිබේ. අප කළ යුතු එක ම දෙය ඔවුන් අපට ඉතිරි කළ සුන්-බුන් පිරික්සීමයි.

මේවා අපේ නූතන ආයුධයන්ගේ මුතු-මිත්තෝය. මේ සියල්ලෙන් පැරණිතමයා අපේ තළන මිටියේ ආදිතමයාය. එය රවුම් ගිනි ගල් අත් පොරොවෙකි.

අප ලෙන් පත්ලේ කුණු කන්දල් හාරා ගත හොත් තළන මිටියට නුදුරෙකින් කිනිරයක් සොයා ගත හැකි වනු ඇත.

මිටිය සාදා ඇත්තේ ගිනි ගලිනි. කිනිරය ඇට වලිනි.

එය සිය කාරිය සපුරා ඉටු කර ඇතත්, කොහෙත් ම අප දැක ඇති කිනිරයන් බඳු වගක් නොදක්වයි. අවියක් හැඩ ගැන්වීමේ දී තැළුම් හා කැපුම් පාර වලින් කිනිරය පිඬාවට පත් වන හෙයින් එය සපුරා කැපී හා කඩොතොලු වී ඇත.

මේ අවි වලින් අපට කුමක් උගත හැකි ද? ලෙනෙහි අලුත් මානව පදිංචි කරුවන්, මුල් පදිංචි කරුවනට වැඩියෙන් දියුණු වූවන් බව ඒවා අපට කියයි. ගෙවී ගොස් ඇති දහස් වසරවල් තුළ මානව කාර්මිකත්වය වඩාත් විවිධ ද, සංකීර්ණ ද බවට පත් ව ඇත.

පළමු වන පදිංචි කරුවෝ එක ම මුවහත් ගලක් හැම කාරියක් පිණිස ම යොදා ගත්හ. එහෙත් පසු ව කැපීමට, කෙටීමට, සිරීමට හා විදීමට වශයෙන් වෙන වෙන ම අවියක් බැගින් විය. තියුණු සිහින් තුඩ සහිත අවිය ඇඳුම සකස් කිරීමට හම් කැපීමේ දී හිල් විද ගැනීම පිණිස විය. කෙටි තියුණු දාරය සහිත අවිය මස් කැපීමටත්, හම් සිරීමටත් හිරමන තලයක් සේ විය. තියුණු ඊතල හිස, ඌරු හෙලි තුඩෙකි.

මේ වන විට බොහෝ කාර්යයෝ ද, දක්ෂතාවෝ ද මිනිසා සතු ව පැවැත්තාහ. ඍතු විපර්යාසයට භාජන වෙමින් තිබිණ. කාල ගුණය සීතල ද කර්කශ ද විය. වලස් හමින් නිම් ඇඳුම්, සිසිර ආහාර ගබඩා හා සිසිරයට උණුසුම් නිවහන් යන ප්‍රශ්න නිසා මිනිසාට මේ වන විට හිරිහැර විඳින්නට සිදු වී තිබිණ. විවිධාකාර කාර්යයන් පිණිස විවිධාකාර අවි අවශ්‍ය විය.

මේ අයුරින්, අපේ අනාදිමත් මුතුන්-මිත්තන්ගේ නිවහන් තුළ අපේ නූතන ආයුධයන්ගේ හා අන් දැහි ද මුතු-මිත්තෝ අපට හමු වෙත්.

කෙසේ වෙතත් කාලය විසින් අප උදෙසා ආරක්ෂිත නිසා පමණක් ම අපි මේ දේවල් ලබමු. තව ද කාලය දුබල ආරක්ෂකයෙකි. එය ආරක්ෂා කරන්නේ හුදෙක් විරස්ථිතික ද්‍රව්‍යයන්ගෙන් නිර්මිත දෑ පමණි. මේ හේතුව නිසා එය ගලින් හා ඇට වලින් නිමැවුණු දේ පමණක් ආරක්ෂා කොට තැබීය. කාලය තෙමේ ලියෙන් හා හමින් නිමැවුණු හැම දෙයක් ම විනාශ කර දැමීය. අපට විඳින කටුව ලැබුණත්, එයින් සැකසුණු ඇඳුම නොලැබෙන්නේත් ගිනි ගල් ඊ හිස ලැබුණත්, ලී මිට නොලැබෙන්නේත් එහෙයිනි.

ආරක්ෂා වීමෙන් අපට ලැබී ඇති ද්‍රව්‍යයන්ගේ හෝඩුවාවල් ඔස්සේ, විනාශ වී ගිය ද්‍රව්‍යයන් ගැන අනුමාන කළ හැකිය. අපට ලැබී ඇති දුබල සලකුණු හා ඉතුරු-බිතුරු වල උදවුවෙන් අනාදිමත් කලකට පෙර දුවිලි බවට පත් ද්‍රව්‍යයන් යළි නිර්මාණය කර ගත හැකි ව තිබේ. කෙසේ වෙතත් අපි අපේ ගවේෂණය ඉදිරියට ගෙන යමු.

පුරාවිදු දරුවකු නටබුන් හාරද්දී හේ පළමුවෙන් පොළොව මතින් පටන් ගෙන යටට යයි. පළමුවෙන් ඉහළ ම තට්ටු පිරික්සනු ලැබේ. ඉක්බිති හේ දුරින් දුරට යටට හාරයි. පොළොවේ ගැඹුරින් ගැඹුරට යමින් ඉතිහාසයේ ගැඹුරට කිමිදී. පුරාවිදුදරුවා පොතේ අන්තිම පරිච්ඡේදයෙන් පටන් ගෙන ආපසු කියවා ගෙන යමින් පළමු වන පරිච්ඡේදයෙන් නිම කරයි. අප අපේ කතාව වෙනස් ලෙස පටන් ගෙන ඇත. අප පටන් ගෙන ඇත්තේ යට ම තට්ටුවෙනි. හෙවත් ගල් ලෙනේ ඉතිහාසය පිළිබඳ පළමු වන පරිච්ඡේදයෙනි. දැන් අපි නූතනතම යුගය තෙක් ළඟින් ළඟට එමින් උඩින් උඩට යමු.

ඊළඟට ගල් ලෙන තුළ සිදු වන්නේ කිමෙක් ද?

තැන්පත් ද්‍රව්‍ය තට්ටු අධ්‍යයනය කිරීමෙන්, මිනිසුන් බොහෝ වාර ගණනක් ලෙන අත් හැර ගිය බවත්, යළිත් බොහෝ වාර ගණනක් පදිංචියට පැමිණි බවත් අපට පෙනේ. මිනිසුන් නිවහන් කොට නොගත් විට දී එය කරබාන්නා වලස්සුත්, ගුහා වලස්සුන් නිවහන් කොට ගත්හ. ඒ අතර, ඇතුළත, තට්ටු පිට තට්ටු සදමින් මැටිත්, දුවිලිත් තැන්පත් විය. ඇතැම් විට ලෙන් බිමට, ඇතුළු පියස්සෙන් කුටිටි කඩා වැටෙන්නට ඇත. තව ද බොහෝ කලකට පසු අලුත් මානව වංශයක් එය යළිත් සොයා ගනු ඇත. කලින් පදිංචි කරුවන් ගැන කියන්නට කිසි ම දෙයක් ඔවුනට නැති වනු හැකිය.

ඉක්බිති ගල් ලෙන් පිළිබඳ ඉතිහාසයේ අවසන්තම පරිච්ඡේදය ඇරඹිණ. මිනිස්සු යළිත් වරක් ගල් ලෙන් වලට පිවිසියෝය. එහෙත් ඒ ලෙන් තුළ සෙවණ

දිග අත

ඒසායන්නට නොවේ. ඊට කලින්, ඒවායේ පිවත් ව සිටියවුන් ගැන ඔවුනට සොයා ගත හැකි හැම දෙයක් ම සොයා ගැනීමටයි.

ඔවුන් ආවේ පැරණි ගල් අවි භාරා ගන්නට, නවතම වානේ අවි අතැතිවය.

එක් තට්ටුවකට අනතුරු ව තවත් තට්ටුවක් බැගින් ගොඩ දැමූ, මේ අතීතය භාරා අවුස්සන්නෝ අනාදිමත් ආරම්භයේ සිට නූතන අන්තය තෙක් ලෙන් යට ගියාව මැනවින් කියවා ගත්හ.

ඔවුනට ලැබුණු අවි සැසඳී මෙන් එක් පරපුරෙක සිට අනෙක් පරපුරක් තෙක් විවිධ මානව කුසලතා හා අත් දැකීම් වැඩි දියුණු වූයේ කෙසේ දැයි දැක ගත හැකි විය. ප්‍රාග්ඓතිහාසික සමයාගේ ඇවැ-මෙන් දියුණුවෙන් කදිමතර හා විවිධතර වූත් අවි, නොසකස් රළු අවි වල තැන ගත් බව ඔවුහු දුටහ.

මෙසේ පළමුවෙන් තුන් කොන් කපනයෝ ද, අඩ කව සූරනයෝ ද රළු අත් පොරොවේ තැන ගත්හ. ඉක්බිති මනා හැඩයෙන් යුතු ගිනි ගලින් තැනූ ඊ හිසුත්, හාරන හා විදින කටුත් වල වෙන-සෙක් දකින්නට ලැබිණ.

ප්‍රාග්ඓතිහාසික මානවයා උෆරු හෙල්ලක් සාදා ගැනීමේ දී ගිනි ගල් ඊ හිසක් පොල්ලකට බැඳි මෙන් සිය අත දික් කර ගත්තේය. මෙය ඔහු ශක්-තිමත් ද නිර්ඝිත ද කිරීමට හේතු විය.

උෆරු හෙල්ල, ඔහු වඩාත් නිර්ඝිතබවට පත්-කෙළේය. දැන් හේ වලසකු දුටු විට තව දුරටත් බියෙන් පලා යන්නෙක් නොවේ. ඔබ මෙහිදී එකක් මතක තබා ගතයුතුය. ප්‍රාග්ඓතිහාසික මානවයා කිසි විටෙකත් දඩයම් පිණිස එකලා ව නොගිය බවයි. මෙවන් මොහොතෙක මුල් අනතුරු ඇඟවුම් හඬින් ම ඒ මිනිස් රැළ එහෙම පිටින් ම දිව එනු ඇත. ඉක්බිති මිනිස් රොත්ත ම වලසා වට කර ගත්තාහු සිය ගල් පිහියා වලින් ඇන මරා දමත්.

තැනි තලා වන්හි සැරි සරන කල, දඩයක්ක-රුවනට අහම්බෙන් වල් අස් හා බයිසන් ගව මුළු

දකින්නට ලැබිණි. එවන් මොහොතෙක ඔවුන් හිමින් සිරුර හොරෙන් ම තණ කන සතුන් වෙත ටිංගා යන්නට ඇත. එහෙත් වැරදීමෙකින්වත් නැහෙන මුල් සර සරයේ දී ම මුළු රැළ විදිලි වෙගයෙන් ඇතින් ඇතට නොපෙනී යනු ඇත.

මේ වන විටත් ප්‍රාගෛතිහාසික මානවයාගේ අවි එවන් සතුන් දඩයමට නොසැහෙන තරම් කෙටි විය. එහෙත් ඒ අතර දඩයම විසින් ම නවතම වූත්, ශක්තිමත් වූත් අවි නිශ්පාදන ද්‍රව්‍යයක් වන ඇට ඔහුට සපයනු ලැබිණ.

හේ සිය ගිනි ගල් කපනය, අනතුරුව කෙටි ලී මිටකට සවි කරන ලදු ව, ඇට වලින් තැනුණු සැහැල්ලු හා තියුණු වූත් ඊ හිසක් සාදා ගන්නට යොදා ගත්තේය. මේ නයින් හේ අලුත් අවියක් තනා ගති. එනම් දමා ගැසිය හැකි සැහැල්ලු අඩයටියෙකි. දඩයක්කරුවකුට කිසි දාක ඔහුගේ, බර උරු හෙල්ල පිම්මේ දුවන අසකුට දමා ගැසිය නොහැකි විය. එහෙත් ඉතා ඇතට ඉගිලවිය හැකි හෙයින් සැහැල්ලු අඩයටිය එසේ දමා ගැසිය හැකි විය.

දැන් මිනිසාගේ අත නවත් දිග බවට ගියේය. ඉගිලෙන අවියක් වූ සැහැල්ලු අඩයටිය යොදා ගනිමින් පිම්මේ දුවන අසකු නොපෙනී යන්නට ඉඩක් ලබන්නට පළමු ඇන මරා ගන්නට දඩයක්කරු සමත් විය.

සිය වස් හා දස දහස් අවුරුදු ගෙවී ගියේය. වල් අස් හා බයිසන් ගව රළු දුලබ වෙමින් තිබිණ. ඔවුන්ගේ උන්මූලනයට ප්‍රාගෛතිහාසික මානවයා බෙහෙවින් වග කිය යුතු විය. දැන් වඩ වඩාත් නිරන්තරයෙන් දඩයක්කරුවනට හිස් අතින් නිවහනට ආපසු එන්නට සිදු වූයේය. තව ද ඔවුනට වැඩිමනත් දුර ඉලක්කයකට හොඳ විය හැකි අලුත් අවියක් අවශ්‍ය ව තිබිණ. ප්‍රාගෛතිහාසික මානවයාට තම බාහුව නවත් දිගු කර ගත හැකි වන සේ, මෙතෙක් නිපදවා තිබුණු ඒවාට අමතර අවියක් නිපදවා ගත යුතු ව තිබිණි. හේ අලුත් අවියක් නිපදවීය.

හෙතෙම නැමීය හැකි ශක්තිමත් ලීයක් කපා ගනී. ඉක්බිති එය ආරුක්කු හැඩයට නමා දෙකෙළවර, වර පටෙකින් වෙළීය. දැන් දඩයම් කරුට දුන්නක් ඇත.

ඔහු වර පට කෙමෙන් ඇදි කල, ඇඹරී ඉල්පෙන මස් පිඬු වල මුළු ශක්තිය දුන්නට රැස් විය.

ඉක්බිති වර පට අත හැරී කල අර ශක්තිය සැණෙකින් හියට ආරෝපණය විය. හිය, බිම සිටින ගොදුරකට ලෙ ගන්නා උකුස්සකු සේ වෙගයෙන් ඉදිරියට ඇදී ගියේය.

හීය, දමාගසන ලද හෙල්ලට වඩා දුර ඉගිල ගියේය.

හෙල්ලක් දමා ගසන්නට හා දුනු දියක් අදින්නටත් හුරුවක් ලත් අත තව දුරටත් සාමාන්‍ය අතෙක් නොවිණ. එය බලසම්පන්න යෝධ අතෙක් විය.

දුන්න නිපදවා ගනු ලැබුවේ ග්ලැසියරයන් පසු බැසීමෙන් පසුවය. අපේ වීරයා තවමත් හිම යුගයෙන් ඔබ්බට නොගියේය.

නව මානවයෝ

අප ඔර්ලෝසුවෙක පෑ කටුව දෙස බැලූ විට පෙනෙන්නේ එය නිසල ව තිබෙන්නා සේය. එහෙත් පැයක් හෝ දෙකක් ගත වූ විට එය ගමන් කර ඇති බව අපට පෙනේ.

මෙය පිවිතයටත් පොදු වන සත්‍යයෙකි. පරිසරයෙහි පමණක් නොව අප කෙරෙහි ඇති වන වෙනස් වීම් ගැන පවා ක්ෂණික වැටහීමෙක් අපට නොලැබේ. ''ඉතිහාසය නමැති ඔරලෝසුවේ වෙනස් වීම් නමැති පැය කටුව නිසල ව සිටිති'' යි අපට සිතේ. තව ද වසර කිපයක් ගත වීමෙන් පසු පමණක් වෙනස් වීම් නමැති පෑ කටුව ගමන් කර ඇති බවත්, අප ද වෙනස් වී ඇති බවත්, අප වටා වූ හැම දෙයක ම වෙනසක් ඇති වී තිබෙන බවත් අහම්බෙන් මෙන් අපට හැඟෙන්නට පටන් ගනී.

අපේ දින පොත්, සේයා රූ, පුවත් පත් හා පොත් ද මහින් පැරණි දේ අලුත් දේ හා සසඳා බලන්නට අපට පුළුවන. මේ සැසඳීමේ දී උදවු කර ගත හැකි කොතෙකුත් දේ ඇත. එහෙත් අපේ ප්‍රාග්ඓතිහාසික මී මුත්තනට, අලුත් දේ හා සසඳා බලන්නට, පැරණි යයි කිය හැකි කිසිවක් නොවිය. පීවිතය වෙනසට ගොදුරු නොවන අක්‍රිය දෙයක් ලෙස ඔවුහු සැලකුහ.

ගල් අවියක් සකස් කරන අතර, හැම ශිල්පියෙක් ම, ඔහුට එම කුසලතාව ප්‍රගුණ කළහුගේ හැම ක්‍රියා-ගයක් හා ක්‍රමයක්ම අනුගමනය කිරීමට යත්න දැරීය.

නව නිවහනක් නිමැවීමේ දී ගෘහිනිය හරියට ම, ගෙහි උදුන ඊට පෙර ඇගේ මී මිත්තනියන් සකස් කළ අයුරින් ම නිමැවුවාය.

දඩයම් කරුවෝ ඔවුන්ගේ ගොදුරු පැරණි සම්මත චාරිත්‍රානුකූලව ම ලුහු බැන්දෝය.

තව ද, සපුරා කිසිවකු විසිනුත් නොදැනුවත් ව ම, මානවයෝ ඔවුන්ගේ අවි, නිවහන් හා ශිල්ප ක්‍රම ද කෙමෙන් වෙනස් කළෝය.

විකාශයට යමින් තිබුණේ මානවයාගේ උපකරණ හා අවි පමණක් නොවේ. හේ තෙමේ ම ද එයට භාජනය වෙමින් සිටියේය. නොයෙක් පුරාවිදු කැණීම් වල දී ලැබී ඇති ඇට සැකිලි වලින් මෙය දැක බලා ගත හැකිය. පළමුවෙන් ම ගල් ලෙන් වාසයට පැමිණි මානවයා සමහ, හිම යුගාවසානයේ එය අත් හැර දමා ගිය මානවයා සැසඳුවොත් ඔවුන් වෙනස් කම් සහිත මානව දෙගණයක් බව අපට පෙනිය හැකිය. පළමුවෙන් ලෙන් වාසයට පිවිසියේ නියැන්ඩතාල් මානවයාය. ඔහුගේ පිට වක් වූයේය. ඔහු කඳ කෙළින් කර ගමන් කරනුවට වඩා කෙළේ වැටී-වැටී ඇවිදීමය. ඔහුට වූයේ යම්තම් නළලතක් පමණි. නිකටක් නොවිය. එහෙත් මනාව වැඩුණු ආරොහ පරිණාහ දේහ සම්පතියෙන් හෙබි, අවසන් වරට ලෙන් වාසය අත් හළ ක්‍රෝ-මැග්ගනන් මානවයා පෙනුමෙන් අපට වෙනස් වූයේ යම්තමක් පමණි.

නිවහන් යට ගියාවේ පළමු වැනි පරිච්ඡේදය

මිනිසාගේ දිවි මහ වෙනස් වෙද්දි, ඔහුගේ නිවහන ද එසේ ම විකාශනයට ගොදුරු විය. අපි මිනිස් නිවහනේ යට ගියාව ගැන ලියමු නම් එම කාර්ය ගල් ලෙනෙන් පටන් ගත යුතු ව ඇත. සොබා දහම විසින් නිමැවුණු මේ නිවහන ප්‍රාග්ඓතිහාසික මානවයාට අහම්බෙන් හමු වූවක් මිස ඔහු විසින් නිමවන ලද්දෙක් නොවිය.

එහෙත් සොබා දහම හින කුසලතා ඇති නිර්මාපකයෙකි. සොබා දහම කඳු හා ගල් ලෙන් නිමවද්දි යම් දිනක ඒවායේ කවරකු හෝ, පිවත් වෙති යි හෝ නොවෙති යි මඳකුදු ගණනකට ගත් බවෙක් නොපෙනේ.

මෙවන් ලෙනක්, නිවහනක් සේ සකසන්නට මුළු මානව රැළ ම ගියහ. ඔවුහු ලෙන් බිත්තිත්, බිමත් ගිනි ගල් සුරනයන් හා පොලු වලින්, සුරමින් හා තළමින් මටටම් කළහ.

මේ ප්‍රාග්ඓතිහාසික මානවයන් සොබා දහමින් නිමැවුණු ගල් ලෙනක් සිය ශ්‍රමයෙන් වෙනස් කරමින් මානව නිවහන් ලෙස දියුණු කළ ආකාරයයි. කාලයාගේ ඇවෑමෙන් ඔවුහු සිය නිවහන් සංස්කරණයේ ලා වඩ වඩාත් යත්න දැරූහ.

උඩින් ඉදිරියට නෙරා ගිය ස්වාභාවික පියස්සක් ලෙස නිමැවුණු ගල් බෑවුමක් හමු වුණු විට ඔවුහු ඒ වටා බිත්ති ගොඩ නැඟූහ. බිත්ති හතරක් ලෙස යොදා ගත හැකි අවස්ථාවක් දුටු විට පියස්සෙකින් ආවරණය කළහ.

දකුණු ප්‍රංශයේ කඳු අතර ප්‍රාග්ඓතිහාසික මානව නිවහනෙක නටබුන් තවමත් යමකුට සොයා ගත හැකිය. ඒ පෙදෙස් වැසියන් එයට අරුම නමක් දී ඇත. ඔවුහු එයට ''යකාගෙ උදුන'' යයි කියති. යෝධ ගල් කුළින් නිමී මේ නිවහන් උදුනින් උණුසුම් විය හැක්කේ යකකුට ම පමණෙකි යි ඔවුහු කියති. තමන්ගේ ප්‍රාග්ඓතිහාසික මී මුත්තන් ගැන මනා දැනුමෙක් ඔවුනට තිබිණි නම් ''යකාගෙ උදුන'' මිනිස් අතින් නිමැවුණක් බව හඳුනා ගනු නියතය.

මෙහි දී ප්‍රාගෛතිහාසික දඩයම් කරුවනට ගල් පියස්සෙකින් සෙවණ ලද ගල් බිත්ති දෙකක් අහම්බෙන් හමු වී ඇත. බිත්ති දෙක නිමැවී තිබුණේ කඳු බෑවුමින් පෙරළී පැමිණි ගල් වලිනි. ඔවුහු තවත් බිත්ති දෙකක් තනා මුල් බිත්ති දෙකට යා කළහ. එකක් තැනුණේ ගල් ලැලි වලිනි. අනෙක ගල් කනු සිටුවා ගස් අතු, වියමනක් සේ තබා බැඳ හම් වලින් වැසීමෙනි.

. කාලය විසින් දුවිල්ලට හරවන ලද බැවින් මේ හතර වැනි බිත්තිය ගැන අපට කළ හැක්කේ ''ඒ මෙසේ විය'' යි අනුමාන කිරීම පමණෙකි.

බිත්ති හතරින් වට කරනු ලැබූ කොටසේ බිම් ගෙයක් නොහොත් විශාල වළක් විය. මේ වළ පත්ලෙහි ගිනි ගල් පතුරුත්, ඇට වලින් හා මුව අහින් තැනූ මෙවලමුත් පුරාවිදු දරුවන් විසින් සොයා ගෙන ඇත. ''යකාගෙ උදුන'' වනාහි ගෙයකුත් නොවන, ගල් ලෙනකුත් නොවන ඒ දෙකට ම අතර වූවෙකි. මේ නිමැවුමේ සිට නියම මිනිස් නිවහනට එතරම් දුර නොවිය. බිත්ති දෙකක් ගොඩ නහන්නට උගත් ප්‍රාගෛතිහාසික මානවයා ඉක්මනින් ම බිත්ති හතරක් තනා ගන්නට ද උගත් හෙයිනි.

ඉදින් මේ අයුරින් කල් නොයා දී ගල් ලෙන් තුළ හෝ උඩින් නෙරා ගිය ගල් පියසි යට හෝ නොව එලිමහනේ ම පළමු වන මිනිස් නිවහන් නිමැවෙන්නට විය.

ප්‍රාගෛතිහාසික දඩයම් කරුවන්ගේ නිවහන

1925 හේ සරත් සමයේ දිනෙක, ඩොන් නදී බඩ ගැගරිනෝ නම් ගමෙහි, අන්තොනෝව් නම් ගොවියෙක් මැටි ගැනීමට සිය ගෙමිදුලෙහි වළක් කණිමින් සිටියේය. ඔහුට මැටි වුවමනා වූයේ අලුත් මඩුවකට බදාම සඳහාය. එහෙත් ඔහුගේ ඉස්කෝප්පය පොළොව යට වූ ඇට කටු වගයෙක ඇනී නතර විය.

ඒ මොහොතේ ගමේ පාසල් ගුරුවරයා වූ විල-

දිම්රෝව් එතැනින් යමින් සිටියේය. අන්තොනෝව් විසින් හේ කැඳවිණ. "මේ ඇට කටු කොහෙන් පාත් වුණා ද මා දන්නේ නෑ. මට මැටි ටික භාර ගන්නවත් නෑ. මගේ ඉස්කෝප්පෙ නොකැඩී බෙරුණා ඇති."

යම් හෙයකින් අන්තොනෝව් වෙනත් අයකුට කතා කෙළේ නම් ඔහු මොහොතක් නතර වී සිට තම ගමන යනු නිසැකය.

එහෙත් වලදිම්රෝව් විද්‍යාව කෙරෙහි සියුම් සැලකිල්ලක් දක්වන්නෙකි. හේ ගෙම්දුලට පැමිණ කදිම ඔපයෙකින් මැද්දාක් සේ වූ, කහ පැහැති ගනකම් ඇත් දළ කැබැල්ලක් ගෙන පිරික්සීය.

එවන් යෝධ දළයක්, දැවැන්ත මැමතකුට පමණක් ම මුත් නොවිය හැකි බව ඉන් සපුරා පැහැදිලි විය. ඩොන් නදී බඩ මැමත්තු! සැබැවින් ම පුදුමයට හේතුව මෙයයි!

පාසල් ගුරුවරයා මේ ඇට කටු වලින් කොටසක් වාහනයෙක පටවා ගෙන අසල්තම නගරයේ ප්‍රාදේශීය කෞතුකාගාරය වෙත ගෙන ගියේය.

ඔබ කවර දාක හෝ එවන් කටු ගෙයක් දැක තිබේ නම්, බොහෝ විට කුතුහලය දනවන නොයෙක් දේ පෙට්ටි වල එකට දමා ඇති බව ඔබ දන්නවා ඇත. කිසියම් කාමරයෙක කිරි ගරුඬ අනහ රුවක් සහ තෙල් සායමින් නිමැවුණු දහ හත් වැනි සිය වසේ වංශාධිපතියකුගේ සේයා රුවක් ඔබට දකින්නට පුළුවන් විය හැකිය.

වෙනත් කාමරයෙක ප්‍රාදේශීය ඛනිජ හා පැළැටි එකතුවකට ඉක්බිති ව ලොම් පිරි අතින් මුගුරක් දැරූ, කඩදාසි පල්පයෙන් තැනුණු පිතෙකැන්තෝපස් පිළිරුවක් දකිනු හැකිය.

හරියටම කියනොත් වලදිම්රෝව් ඇට කටු තොගය ගෙනාවේ එබඳු කටු ගෙයක් වෙතයි. ඉක්බිති කෞතුකාගාර පාලකයා සාමාන්‍ය පරිදි මැමත් දළ කැබැල්ල සහ අනෙක් ඇට කටු ද සිය නාමාවලියෙහි ඇතුළු කොට, ප්‍රදර්ශනය පිණිස ඛනිජ ද්‍රව්‍ය සහ

පිතෙකැන්ත්‍රෝපස්ටත් අනතුරු ව තැබීය.

ඉක්බිති වහා ම ගැමී පාසල් ගුරුවරයාගේ සහ-යෝගය ඇති ව කැණීම් කටයුතු කර ගෙන යාමට ලෙනින්ග්‍රාඩයේ සිට, පුරා විද්‍යාඥයකු වන සමී-යාතින්, ගැගරීනෝ ගමට එවන ලදී.

ඔවුනට ගැගරීනෝහි දී ලැබුණේ මොනවා ද?

මුල් දින කිපයේ කැණීම් වල දී සුරන හා කපන ගිනි ගල් අවි ද, ඇටමුවා විදින කටුවක් ද, ශ්‍රැව වාසි සිහාලයකුගේ මැදින් විද සිදුරු කරන ලද දතක් ද, උදුනෙක ගල් අඟුරු හා මුසු වී තිබුණු මැමතුන් හා වෙනත් සිවු පාවුන්ගේ ඇට ද ඔවුනට හමු විණ.

අන්තොනොවිගේ මඩුවේ බිත්ති කපලා රුවට යොදා ගත් මැටි වල තිබී යට කී ඒවාට සමාන ගිනි ගල් මෙවලම් සහ මැමත් දළ කැබලි ද හමු වී තිබිණ. කාලය නාස්ති කර දැමීමට ඇති නොකැමැත්තෙන් අර ගොවි පවුල විසින් බදාම වලින් අහුලා නොදමීමට තිරණය කළ එවන් දෑ රැසක් මැටි හා මුසුව තිබිණ.

මේ අතර පුරා විද්‍යාඥයෝ කණ්ඩායමක් පුරා විදු කැණීම් පිළිබඳ සියලු නීති-රීති අනුගමනය කරමින් දිගට ම කැණීම් කර ගෙන ගියහ. ඉක්බිති ඉක්මනින්ම මේ ප්‍රාගෛතිහාසික දඩයම් කරුවන්ගේ නිවහන් පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ලබා ගැනීමට ඔවුහු සමත් වූහ.

මේ නිවහන හැඩයෙන් රවුම් බිම් ගෙයක් විය. බිත්ති පිට පැත්තෙන් ගල් පුවරු ද, මැමත් දළ හා හකු පාඩා වලින් ද ආරක්ෂා කරනු ලැබිණ. පෙනෙන හැටියට බිත්ති ලී කනු වලින් නිමවා හම් වලින් වසන ලදී. කනු, වහලයක් නිමවමින් මුදුනේ දී එකට හමු විය. සවිමත් ව තබනු පිණිස බිත්ති වල පිට පැත්තෙන් බර ගල් පුවරුත්, මැමත් ඇටත් කෙළින් හේත්තු කොට තැබිණ.

ඔවුනට බිත්ති සහ තිබී කැටයම් කළ ඇටමුවා මාගම් පිළි රූ දෙකක් ලැබිණ. එකක් බොහෝ තරබාරු වූ අතර අනෙක කෘෂ විය. පෙනෙන අයුරින්, කැටයම් කරු මෙවා නිමවා තිබුණේ සැබෑ පිවිතය ඇසුරිනි. මාගමුන්ගේ සියුම් කොණ්ඩ මෝස්තර ඉතා හත් මට සිලුටු බැවින් නිමවා තිබිණ.

නිවහන තුළ ගෙබිම මැද භාරන ලද රවුම වගේ විය. ඒ තුළින් ලැබුණු දෑ බෙහෙවින් මහඟු වස්තු විය යුතු ඒවාය. එනම් ඇටමුවා ඉදි කටුවක්, ධ්‍රැව වාසී සිහාල දතින් නිමි ඇට පබළු හා මැමත් වලිගයකුත්ය.

උදුන අසල වඩාත් ම එලිය ඇති තැනෙක පට්ටලය සවි කොට තිබිණ. එය ඔප මට්ටම් වූ සෙල් පුවරුයෙන් නිමියේය. ඒ මත නොයෙක් මෙවලම් ද ගිනි ගල් පතුරු සහ කිරි ද, ඇට සහ නොනිමි උපකරණ ද විය. මෙසය මත විසිර ගිය ඇට පබළු ද අහුරක් පමණ තිබිණ. ඇතැම් ඇට පබළු මැදිමෙන් ඔප ගන්වා තිබුණු අතර සිදුරු කර තිබිණ. අනෙක්වා එතෙකුත් නොනිමි ව වූයේය. ශිල්පියා ඇට පතුරු තිරුවක් දිගේ බොහෝ තැන් වලින් සිදුරු කර තිබුණේය. එහෙත් එය ඇට පබළු වලට වෙන් කරන්නට ඔහුට කාලයක් නොතිබුණු සේ පෙනේ. තමන් කර ගෙන ගිය කටයුතු අත් හිටුවා, සිය නිවහන අත් හැර දමන්නට හේතු වන යමක් සිදු වන්නට ඇත. සැබැවින් ම ඒ ව්‍යසනය බලවත් එකක් විය යුතුය. එසේ නොවිනි නම් ඔවුන් කවර දාක වත් එතරම් විශිෂ්ට රිතල, මල සඟිත ඇටමුවා ඉදිකටු හෝ විවිධ කාර්යයන් සඳහා වූ ගිනි ගල් කපනයන් ද මෙසේ දමා යන්නේ නැත.

මේ සියලු මෙවලම් නිමැවීම සුළු පටු කාරියෙක් නොවිය. නිවහන වෙතින් ලද සියලු දෑ නිමවන්නට ඉමහත් ශ්‍රම භෝරා සම්භාරයෙක් ගත වන්නට ඇත. මෙහි දී නිදසුනක් ලෙස ඇටමුවා ඉදිකටුව ගනිමු. එය මානව ඉතිහාසයේ මූලිකතම ගණයේ වූවෙකි. සැබැවින් ම ඉදි කටුව ඉතා සුළු දෙයෙකි. එහෙත් ඉන් එකක් නිමවන්නට විශිෂ්ට දක්ෂතාවක් මිඩංගු කළ යුතු විය.

සපුරා ඇට ඉදි කටු පමණක් නිෂ්පාදිත කම්හලෙක් වෙනත් කඳවුරෙක සොයා ගෙන ඇත. එහි එයට අවශ්‍ය සියලු උපකරණත් සමඟ ඇට තිරු ද අඩක් නිමි ඉදි කටු ද ඇත. ඒ සියල්ලක් දමා ගිය හැටියෙන් ම ඉතිරි ව තිබිණ.

අපේ වත්මන් ලෝකයෙහි ඇටමුවා ඉදි කටු පාවිච්චියක් ඇති වුවහොත් සැබැවින් ම එම නිෂ්පාදනය හෙට වුවත් ඉදිරියට ගෙන යා හැකිය.

එහෙත් අපට ගැටලුවකට මුහුණ පාන්නට සිදු වනු ඇත. ඒ එම කාරිය නිම කිරීමට එක ම ශිල්පියකු පමණක් සොයා ගැනීමට බැරි වීම නිසයි.

දැන් අපි ප්‍රාග්ඓතිහාසික දඩයම් කරුවන්ගේ කඳවුරක් වීමසා බලමු.

හිමෙන් වැසී ගිය තැනි තලා බිම් මැද අපට කුඩා ගොඩැලි දැකිය හැකිය. ඒහැම එකෙක ම උඩින් දුම් රොටු දකින්නට ලැබේ. අපි එම ගොඩැල්ලක් වෙත ගොස් අපේ නෙත් වලට කඳුළු ගන්වන දුම් රොටු ගැන අවධානය යොමු නොකරන්නට යත්න දරමින්, දුම් කවුළුව මැදින් ඇතුළට පිව්සෙමු. වෙස් වලා ගැනීමට මැපික් තොප්පියක් දමා ගැනීමෙන් අපි අදිසි තත්ත්වයකට පත් වී සිටිමු. කිසිවකුටත් අප දකිනු නොහැකිය. නිවහන දුමින් ගහනය, අඳුරුය, හඬ සහිතය. අඩු තරමින් එහි වැඩිහිටියෝ දහයක් වත් වෙති. ළමයි බොහෝ දෙනෙකි.

කඳුලින් පිරී ගිය අපේ ඇස් දුමට හුරු පුරුදු වූ කල, අපට මානවයන්ගේ මුහුණුත්, සිරුරුත් පෙනෙන්නට පටන් ගනී. ඔවුන් කෙරෙහි වානර සාම්‍යයෙක් කොහෙත් ම නැත. ඔවුහු උසය, මනාව වැඩුණෝය, ශක්ති සම්පන්නයෝය. ඔවුනට උස් වූ කොපුල් ඇට ඇත. පියවුණු ඇස්ය. ඔවුන්ගේ අඳුරු පැහැති සිරුරු මත රත් පැහැයෙන් මෝස්තර ඇඳ ඇත. ගැහැනු රවුමට බිම වාඩි වී සිටිත්. ඔවුහු ඇටමුවා ඉදි කටු ගෙන සත්ව හමින් ඇඳුම් මසති. දරුවනට කෙළි බඩු නැත. ඔවුහු අස් කකුලක් හා මුව අං තට්ටුවෙකින් සෙල්ලම් කරති. උදුන අසල පසෙකින් ශිල්පියෙක් සිය සෙල්මුවා වැඩ පට්ටලය මත බද්ධ පර්යංකයෙන් හිඳ ගෙන සිටී.

හේ හෙල්ලක් නිමවනු පිණිස ඇටමුවා රිහිසක් ලී මිටකට සවි කරමින් සිටී. ඔහු එක්ක ම තවත්

ශිල්පියෙක් ගිනි ගල් පිහියෙකින් මෝස්තරයක් කැටයම් කරමින් සිටී.

අපි වඩාත් ළං ව ඒ මෝස්තරය කිමෙක් දැයි විමසා බලමු. නිපුණ ඉරී පහර කීපයෙකින් ඇටමුවා පුවරු තලයක් මත, ඔහු තණ කමින් සිටින අසකු සටහන් කොට ඇත. ඔහු ඉමහත් ඉවැසිල්ලෙකින් හා නිපුණ බවෙකින් අසුගේ සවිමත් පා, ආරුක්කු හැඩ බෙල්ල, ගෙල-කෙසුරු-වැටිය සහ විසල් හිසත් නිරූපණය කර තිබේ. ශිල්පියාගේ මනසින් අසුගේ හැම ඉරියවුවක් හා අහ පසහත් සියුම් ව දැක ඇති හෙයින් අසු පීවමානාකාරයෙන් හා දුවන්නට ඔන්න මෙන්න සේ ද පෙනේ.

දැන් සිත්තම නිමිය. එහෙත් ශිල්පියා මෙතෙකින් නතර නො වී සිය කාරිය ඉදිරියට ගෙන යයි. දිගට හරහට ගසන පහර කීපයෙකින් අසු හරහා ඉරක් අඳී, දෙකක් අඳී, තුනක් අඳී. අස් සිරුර මත අරුම පෙනුමක් ඇති සටහනෙක් දකින්නට ලැබේ. මේ ප්‍රාගෛතිහාසික සිත්තරා කුමක් කරයි ද? අද ඔනෑ ම සිත්තරකු අභිමානයට පත් කරවන එවන් සිත්තමක් ඔහු නරක් කර දමන්නේ ඇයි?

අස් සිරුර මත සටහන වඩ වඩාත් අවුල් බවට යෙයි. ඉක්බිති අපේ පුදුමයට මෙන් අස් සිත්තම මත මුදුනේ කුඩාරම් සිත්තමෙන් දකින්නට ලැබේ. අනතුරු ව සිත්තරා තවත් කුඩාරමක් අඳී. යළිදු වෙනත් එකක් අඳී. මේ ඇයි? එය කඳවුරෙකි. මේ අරුම සිත්තමින් බලාපොරොත්තු වූයේ කිමෙක් ද? මේ විකාරකරණය හුදෙක් සිත්තරාගේ ඔල්මාදයෙක් ද?

නැත! නැත! මෙවන් අරුම සිත්තම් කොතෙකුත් ප්‍රාගෛතිහාසික දඩයම් කරුවන්ගේ ගල් ලෙන් වලින් සොයා ගෙන ඇත. ඒ අතර එකක් නම් මතු පිට කුඩාරම් දෙකක් සිත්තම් වී ඇති මැමත් රුවෙකි. තවත් බයිසන් ගව සිත්තමක් මත කුඩාරම් තුනක් වෙයි. තවත් සිත්තමෙක, මැදින් බාගෙට කා දැමූ බයිසන් මළ සිරුරෙක් වෙයි. එහි හිස,

කොඳු ඇට පෙළ, සහ පා වලටත් අත ගසා නැත. ගන බහුල රැවුළ, ඉදිරි පා අතරින් පහළට වැටෙයි. මළ සිරුර දෙපස මිනිස් දෙපෙළක් සිටිති.

ඇටමුවා සමතල තහඩුවල, සෙල් පුවරුවල සහ පර්වත ප්‍රාන්තයන්හි කුඩාරම්, මිනිසුන් සහ සතුන්ගේත් මෙවන් අරුම සිත්තම බෙහෙවින් ලැබී තිබේ. එහෙත් මෙවායින් බහුලතම ප්‍රමාණය ලැබී ඇත්තේ ලෙන් බිත්ති වලය. ලෙන් තුළ කණිමින් සිටින විට අපට බිත්ති මත සිතුවම් හමු නොවිණ.

එසේ වුයේ කැණීම් කළේ මානවයන් කෑ, නිදා ගත් හා වැඩ කළ ලෙන් මුව දොර අසල පමණක් නිසාය. දැන් අපි වඩාත් ඈත ඇතුළට යමින් යාර සිය ගණන් ඈත එහාට මෙහාට වක් වෙමින් පැතිර දැති බිම් ගෙවල් ඔස්සේ හැම අස්සක් මුල්ලක් ම පිරික්සමු.

මිහි ගබ කලා හවන

අපි අපේ විදිලි පන්දම ගෙන ගල් ලෙන තුළ විපරම් කරමින් යමු. මෙහි දී පහසුවෙන් ම මහ වැරදිය හැකි හෙයින් අප හැම හැරීමක් හා හරස් පැනීමක් ද මතක තබා ගත යුතුය. ඒ තුළ ගෛලමය කොරිඩෝව වඩ වඩාත් පටු වෙමින් යයි. පියස්සෙන් දිය බිඳු කාන්දු වෙයි. අපි අපේ විදිලි පන්දම ඉහළට අල්ලා බිත්ති පිරික්සමු.

අපි ලෙන තුළ වඩාත් ඉදිරියට යමු.

හදිසියෙන් එකෙක් "අන්න" යයි කෑ ගසයි.

එහි බිත්තියේ බයිසන් ගවයකුගේ ලොකු සිතුවමෙකි. එය රතින් හා කළුවෙන් පාට කර ඇත. සිවු පාවා ඉදිරි ගාත් මත වැටී ඇත. උගේ උඩට නෙරා ගිය පිටු තලයෙන්, ඇනුණු හෙල්ලවල් විහිදී තිබේ.

ඉන් මදක් දුරින් අපි තවත් සිත්තමක් සොයා ගනිමු. එහි අස්වාභාවික සතෙක් රැහුම් විලාසයක් දක්වයි. ඒ එක් අතෙකින් සතකු සේ පෙනෙන මිනිසෙකි; නැතහොත් මිනිසකු සේ පෙනෙන සතෙකි. මේ අද්භූත සත්වයාට රැවුළක්, ඇඹරී ගිය දිග දෑ, මොල්ලි පිටක් හා ලොම් සහිත වලිගයෙක්

ද ඇත. උගේ අත් සහ කකුල් මිනිසකුගේ වැන්න. ඌ දුන්නක් දරා සිටී.

වඩාත් ළං ව පිරික්සා බැලුවොත් මේ අද්භූත සත්වයා බඹිසන් හමක් ඇඳ ගත් මිනිසකු සේ පෙනේ.

වඩාත් ඇතින් තවත් සිත්තමෙකි. ඉක්බිති තුන් වැන්නෙක් ද, අනතුරු ව හතර වැන්නෙක් ද වෙයි.

මේ කොතරම් චමත්කාර ජනක කලා භවන ද?

චිත්මන් සිත්තරු මනා ආලෝකයෙන් යුත් කලාගාර වල කටයුතු වල යෙදෙති. කදිමට එලිය ඇති කලා භවනයන්හි අපි සිත්තම් එල්ලමු.

මිනිස් ඇසින් එතරම් ඈත, අඳුරු ලෙනක් තුළ මේ ප්‍රාග්ඓතිහාසික මානවයන් කලා භවනක් පිහිටුවන ලද්දේ කුමක් සඳහා විය හැකි ද?

සිත්තරා මේ සිත්තම් අනුන් සඳහා නොනිමි බව නම් සපුරා පැහැදිලිය.

එහෙත් ඒ එසේ නම් ඔහු ඒවා ඇන්දේ ඇයි?

අබිරහස සහ එහි විසඳුම

''දඩයම් කරුවෝ කිප දෙනෙක් නැටුමට හවුල් වෙති. එක එකකුගේ හිසෙහි බයිසන් ගව හමක් අතුරා ඇත. නැතහොත් අං සහිත හරක් වෙස් මුහුණක් වෙයි. හැම එකකුගේ ම අතෙහි දුන්නක් හෝ හෙල්ලක් ඇත. මේ රැහුම බයිසන් ගව දඩයමක් සංකේත කරයි. නළුවන්ගෙන් එකෙක්, වෙහෙසට පත් වී වැටෙන්නට යන බවක් අහවයි. එවිට වෙනත් නළුවෙක් ඔහු වෙතට මොට්ට රියක් විදී. බයිසන් ගවයා තුවාල ලද සේය. හේ කකුල් කෙටියෙන්, රවුමෙන් පිටතට ඇද දමනු ලැබේ. අනෙක් අය තමන්ගේ පිහි ඔහු මත ඔබ මොබ වනත්. ඉක්බිති ඔහුට යන්නට ඉඩ ලැබෙන අතර, ඔහු සේ ම බයිසන් හරක් වෙස් මුහුණක් පැළඳ ගත්තෙක් රවුම තුළ ඒ තැන ගනී. ඇතැම් විට මේ රැහුම්, මොහොතකුත් නොනවතා සති දෙකක් හෝ තුනක් පැවැත්වෙයි.''

මේ ප්‍රාග්තම දඩයම් කරුවන්ගේ රැහුමක්, දුටුවකු විස්තර කළ අයුරුයි. එහෙත් ඔහුට එය දකින්නු හැකි වූයේ කොහේ දී ද?

ආදිතම දඩයම් කරුවන්ගේ ව්‍යවහාරයන් අත් නැර පවත්වා ගෙන යනු ලබන, උතුරු ඇමෙරිකාවේ තැනි තලා වැසි ඇනැමි රතු ඉන්දියන් ගෝත්‍රිකයන් අතර මේ රැහුම් ඔහු දැක ඇත.

මෙසේ ම ප්‍රාගෛතිහාසික සිත්තරකු ගල් ලෙන් බිතෙක සිතුවම් කළ, ඊට හැම අතින් සමාන දඩයම් රැහුමෙක විස්තරයෙක් දේශ සංචාරකයකුගේ දින පොතෙක අපට අහම්බෙන් හමු වෙයි. දැන් අබිරහස් සිත්තමෙහි අදහස අපි දනිමු. එහෙත් එය විසඳන විට අපි තවත් අබිරහසකට එළඹෙමු. සති කිපයක් තිස්සේ රහන මේ රැහුම් කිමෙක් ද? අලුත් අබිරහස එයයි.

අපි රැහුමක්, විනෝදාංගයක් හෝ කිසියම් කලා විශේෂයක් ලෙස සලකමු. සැබැවින් ම රතු ඉන්දියානුවෝ හුදෙක් විනෝදය තකා සති දෙක තුනක් තිස්සේ, ශ්‍රාන්තියෙන් ඇද වැටෙන තෙක් නැටුවෝ ද? නැතහොත් ඔවුහු එසේ නටන්නට තරම් මහා කලා ළැදියෝ ද? තව ද ඔවුන්ගේ රැහුම්, හුදු රැහුම්කට වඩා උත්සවයක් වැන්න.

එහෙත්, ඉදින් නැටුම් මෙහෙයවන්නා කට්ටඩියා නම් එහි එක ම අදහස එය නැටුමක් නොව ශාන්ති කර්ම පිළිවෙතක් බවයි.

රතු ඉන්දියානුවෝ ඔවුන්ගේ අමුතු අංග චලනයන් මහින්, බයිසන් ගවයින් මත වශීකරණයක් ආරෝපණය කරමින්, එහි අරුම පුදුම බලයෙන් ඔවුන් තණ බිම්න් ඉවත් කර ගන්නට පැතූහ. මේ අසුරින් ලෙන් බිතෙහි සිත්තමෙන් නිරූපිත රැහුමෙන් කියන්නේ එයයි. හේ හුදෙක් නළුවෙක් නොවේ. ශාන්ති කර්ම වාරිත්‍රයක් ඉටු කරන්නෙකි. තව ද ලෙන තුළ ගිනි එලියෙන් සිත්තම් කිරීමට හුදෙකලා අබිරහස් මුල්ලකට පියමං කළ හේ හුදු සිත්තරෙක් පමණක් නොව මන්තර කාරයෙක් ද වෙයි.

අලුත් නිවසක් ගොඩ නහන්නට පටන් ගත් කල අපේ වඩුවන්ගේ හා පෙදරේරුවන්ගේත් ඉරියව් අනුකරණය කරමින් අත්තිවාරම් මත ඔබ මොබ

උඩ පැන පැන නොයමු. දඩයමේ යන්නට පෙර තුවක්කුව වටා රැහුම් නොපාමු. එහෙත් අප වියරුවක් සේ සලකන දේ, අපේ ප්‍රාග්ඓතිහාසික මුතු-මිත්තෝ ඉතා බැරෑරුම් කටයුතු සේ සැලකූහ.

ඇන් අප, අබිරහස් සිත්තම් වලින් එකක් පිළිබඳ ගැටලුවට විසඳුමක් ලබා ඇත. එහෙයින් බිත්තියෙක නළු මිනිස් රූවක් ඇඳ ඇත්තේ කුමක් නිසා දැ යි අපට තේරුම් ගත හැකිය.

එහෙත් සපුරා ගැටලු සහිත තවත් සිත්තම් එහි විය.

තව ද ගල් ලෙන තුළ සම්පූර්ණ කතාවක් කැටයම් කැරුණු ඇටමුවා පැතලි තලයක් අපට ලැබුණු බව මතක තබා ගන්න. එය දෙපසින් දඩයම් කරුවන් දෙපෙළක් සමඟ වූ බයිසන් ගවයකුගේ මළ සිරුරෙක සිත්තමෙකි. එහි බයිසන්ගේ ඉදිරි දෙගාත් හා හිසත් පමණක් ඉතිරි ව ඇත. මේ සිත්තමෙන් අදහස් කරන ලද්දේ කුමක් විය හැකි ද?

මෙහිලා පිළිතුරක් සපයන්නට අපට වුවමනා නම් අප උතුරු ඇමෙරිකාව වෙනුවට රුසියාවේ. ඇත උතුරු දෙසට යා යුතුය.

අවුරුදු තිහ හතළිහකට පෙරත්, වලසකු මැරූ දඩයම් කරුවන් ''වලස් ජේස්ත'' උත්සව පැවැත් වූ තැන් සයිබීරියාවේ ඇත. මළ සිරුර මඩුවක් තුළට ගෙනවුත් ගෞරවය සඳහා තැන්පත් කරනු ලැබේ. මෙහි දී ඔවුහු වලසාගේ හිස, ඉදිරි ගාත් අතර තබති. හිස ළඟින් පාන් වලින් හෝ බර්ච් පොත්තෙන් තනන ලද මුවන් කිප දෙනෙකුගේ පිළිරූ තබනු ලැබේ. මේවා වලසාට පිදැවිලි වූයේය. වලස් හිස බර්ච් පොත්තෙන් කැරුණු බොකුටු කෙස් කලඹින් සරසනු ලැබේ. උගේ ඇස් මත රිදී කාසි තැබෙයි. ඉක්බිති එක් එක් දඩයම් කරු වලසා වෙත ගොස් පිළිවෙළින් උගේ හොමඹ සිඹී.

මේ වනාහි දින කිපයක් හෝ වැඩි වශයෙන් රාත්‍රීන් කිපයක් තුළ පැවැත්වුණු ජේස්තයෙක ආරම්භය පමණක් වෙයි. හැම රාත්‍රියෙක ම දඩයම් කරුවෝ මළ සිරුර වටා රැස් ව ගී ගයති; නටති. ඔවුහු බර්ච් පොත්තෙන් හෝ ලීයෙන් කළ වෙස් මුහුණු පැළඳ ගනිති. ඉක්බිති වලසා වෙත එති. ඌ ඉදිරිපිට නැමී වැඳ, උගේ අලස ගමන් විලාසය අනුයමින් නටති.

ගී ගැයුමත් නැටුමත් නිම වූ පසු ඔවුහු මස් කෑමට වාඩි වෙති. එහෙත් කිසි විටෙකත් හිසටත්, ඉදිරි ගාත් වලටත් අත නොතබනු ලැබේ.

දැන් අපි ඇටමුවා පැතලි තලයෙහි වූ සිත්තමෙහි අදහස දනිමු. එය බයිසන් ජේස්තයක් නිරූපණය කරයි. බයිසන් වට කොට ගෙන සිත්තමේ සිටින මිනිස්සු තමනට සිය මස් දිම ගැන බයිසන්ට ස්තුති කරමින් සිටිත්. ඊළඟ වතාවේ ද මෙසේ ම තමනට කරුණාවන්ත වන ලෙස ඔවුහු ඉල්ලා සිටිත්. ඊළඟට අපි ආපසු ඇමෙරිකානු ඉන්දියානුන් වෙත ගොස් සිටිමු නම්, ඔවුන් වෙතද දඩයම් කරුවන්ගේ එවන් ජේස්තවූ බව සොයාගත හැකිවනු නියතය.

හැම රුසියන් ළමයෙක් ම ඉවාන් කුමාරයා, ලස්සන වසිලිස්සා, ගිනි කුරුල්ලා, මොල්ලි අශ්වයා, මිනිසුන් බවට පෙරැළිය හැකි සතුන් හා සතුන් බවට පෙරැළිය හැකි මිනිසුන් ගැන වූ සුරාංගනා කතා දනිති.

කැත ඉස් ගෙඩියකු මොහොතින් රූමත් තරුණියක බවට පත් වන අතර, රූමත් කුමරකු බියකරු සර්පයකු බවට ද පත් වුවහොත් ඔබට කෙසේ වත් ඇස් අදහා ගත නොහැකිය. මෙවන් විට දී හැම දෙයක් ම එයට පමණක් විශේෂ නීති රීති මාලාවක් අනුගමනය කරයි. මළ තැනැත්තහුට පණ එයි. කපා දමනු ලැබූ හිස් වලට කතා කළ හැකිය. දියේ ගිලුණු මිනිස්සු මස් මරන්නන් දිය තුළට ඇද ගනිති.

සුරාංගනා කතාවක් කියවා ගෙන යද්දී අපි මෙය ඇදගීමට සූදානම්ය. එහෙත් පොත වසා දමනවාත් සමග ම අපි සැබෑ ලොවට පිවිසෙමු. එහි මන්තර කරුවෝවත්, මන්තර කාරියෝවත් නැත. සැබෑ ලෝකයේ හැම දෙයක් ම පැහැදිලිය. නිරවුල්ය. ඔප්පු කළ හැකිය. පීවත් වන්නට නම් ඉවාන් කුමාරයා මෙන්, ඔහුගේ පළමු වැනි සටන නරවෘකයකු සමග හෝ මන්තර කාරියක සමග කළ යුතු වුත්, ව්‍යාජ කල්පිතයන්ගෙන් පිරී ලොවෙක පීවත් වීමට සිදු වී තිබේ නම් සුරාංගනා කතාවක් කොතරම් මනහර වුවත් එවැනි ලොවක අපට පීවත් විය හැකිද?

එහෙත් ලෝක ස්වභාව ගැන අපේ ප්‍රාග්ඓතිහාසික මුතුන් මිත්තන් නම් නියතයෙන් ම සිතුවේ ඒ ආකාරයෙනි. ඔවුහු තමන් පීවත් වුණු ව්‍යාජ වූ කල්පිත හා සැබෑ ලෝකයත් අතර වෙනස නොදුටහ. ලොව සිදු වන සියල්ල මීහි තලය පාලනය කරන රුදුරු හෝ සොඳුරු භූතාත්මයන් නිසා සිදු වෙති යි ඔවුහු සිතූහ.

අප ගලක් මත ඉක්මනින් අඩිය තබා යන විට ඇද ගෙන වැටුණොත් අපේ නුහුරු කම ගැන අපට

මෙවන් අරුමයෝය: පිසාචයෙක් තැනින් තැන සැරි සරයි

ම දොස් තබා ගනු මිස අනෙකකුට වරද පවරමු ද?

එහෙත් ප්‍රාගෛතිහාසික මානවයා තම වරද භාර නොගත්තේය. හේ තමා යන මගෙහි ගල දමාලූ රුදුරු භූතයා මත වරද පැටවීය.

යම් කිසිවකු පිහියෙකින් අනිනු ලැබ මළ කල "ඔහු මැරෙන්නට ම අනිනු ලැබුවා" යි අපි කියමු.

එහෙත් ප්‍රාගෛතිහාසික මානවයා කියනු ඇත්තේ "ඇනීම කළ පිහියට මතුරා තිබුණු හෙයින් හේ මළේය" යනුයි.

කෙසේ වෙතත් හුනියම් කාරයන් හා රුදුරු භූතාත්මයන් ගැන විශ්වාසය තැබූ අපේ ප්‍රාගෛතිහාසික මුතුන් මිත්තනට අපි සමව්වල් නොකරමු. කවර ප්‍රශ්නයකට හෝ හරි පිළිතුර ලබා ගැනීමට ඔවුනට තිබුණේ ඉතා සුළු දැනුමක් හෙයින් සොබා දහමේ නියමයන් විස්තර කිරීමට යත්න දැරූ ඔවුන් යොදා ගත් මහ එයයි.

ඔවුන් ඉන් පෙර කිසි විටෙක නුදුටු දෙයක් දැකීමෙන් මොකක් හෝ හුනියමක් වෙති යි සිතත්.

හැම දෙයක් අතර ම කොයි හැටියෙන් හෝ සම්බන්ධයක් පැති බව අත් දැකීමෙන් ඔවුන් අවබෝධ කර ගෙන සැත. එහෙත් ඒ සම්බන්ධය කුමක් නිසා කෙසේ පැති වී දැ යි නොදත් හෙයින් අනෙක් අය වෙත කිසියම් පද්ධුන බලයක් ඇතැ යි සිතා අණ විත, හදි හුනියම් සැ ගැන දිගින් දිගට ම විශ්වාස කරත්.

"ඇස් වහ" පිස හැරීමට ඇති එක ම මහ යන්තරයක් හෝ සූරයක් පැළඳීම යයි ඔවුහු අදහත්. මේ පළඳනාව කිරුල් දනින් නිමැවුණු මාලයක් හෝ ඇත් වලග කොනෙක කෙසින් නිමි වළල්ලක් විය හැකිය. සූරය වනාහි එය පළඳන්නහු ආපදාවන්ගෙන් මුදා ගන්නා පාරක්ෂකයෙකි.

අපේ මුතු-මිත්තෝ ලෝකය ගැන කුමක් සිතුවෝ ද?

නුගත් කම බිය ජනිත කරවයි, තව ද මිනිසා දැනුමින් අසරණයකු වූ හෙයින්, තැති ගත් දුක්ඛිත යාවකයකු සේ මිස ලෝකය පාලනය කරන්නකු ලෙස කටයුතු කළ නොහැක්කෙක් විය.

කෙසේ වුව මේ වන විටත් මිනිසාට තමා සොබා

දහමේ ස්වාමියා ලෙස සිතීම බොහෝ ඉක්මන් වැඩි දෙයක් ව තිබිණි. මේ වන විට හේ ලොවෙහි අන් කිසිදු සතකුට වඩා බලවත් ව සිටියේය. ඔහු විසින් මැමත් පරාජය කොට තිබිණ. එහෙත් හේ තවමත්, පාලනය කර ගන්නේ කෙසේ දැ යි තමා නොදැන සිටි සොබා දහමේ මහා බල වේගයන් හා සසඳන කල ඉතා දුබල සත්ත්වයෙක් ව සිටියේය.

එක් අසාර්ථක දඩයමෙක ප්‍රතිඵලය නම් සති ගණනෙක බඩගින්නයි. එක් ගන හිම පතන කුණාටුවකට මුළු කඳවුර සපුරා යට කර දමනු හැකි විය.

එසේ නම් මිනිසාට කෙමෙන් පියවරින් පියවර සොබා දහමේ බල වේගයන් කෙරෙහි ස්වාමිත්වය වෙත ඉදිරියට යනු පිණිස සටන් කිරීමට ශක්තිය ලබා දුන්නේ කිමෙක් ද?

හේ සිය ශක්තිය, තමා සිටින්නේ තනියම නොවෙතියි යන හැඟීමෙන් තහවුරු කර ගති.

මුළු සමාජ කණ්ඩායම හෙවත් මුළු ගෝත්‍රය ම එකමිති ව සිට සොබා දහම විසින් මෙහෙයැවුණු සතුරු බල වේගයන් සමඟ සටන් කළහ. ඔවුහු එකට වැඩ කළහ. එහි දී පොදු ප්‍රයත්නය මඟින් ඔවුහු දැනුමත්, අත් දැකීමත් ලදහ.

ඔවුන් සත්‍යය හඳුනා ගත්තේ යන්තමිනි. වැඩියෙන් ම ඔවුන් සත්‍යය හඳුනා ගත්තේ හුදෙක් ඔවුනට ම හිතුණු හැටියෙනි.

මානව සමාජය කිමෙක් දැ යි ඔවුහු නොදැත්තෝය. එහෙත් අන්‍යොන්‍ය වශයෙන් තමන් එකෙකා බැඳි සිටින බව ඔවුනට දැනිණ. එක් ගෝත්‍රයෙක මුළු මිනිස් කණ්ඩායම සැබැවින් ම බහු බාහුධර තනි මහා පුරුෂයකු වැනි විය.

දඩයම් කරු ජීවත් වුණු, එක ම මී මුත්තකුගෙන් පැවත ආ, වංශයක් වූ ප්‍රාගෛතිහාසික සමාජ කණ්ඩායමක්, සපුරා ඔහුගේ පවුල ද විය. තමන් සත්තක වූ හැම දෙයක් සම්බන්ධයෙන් ම තමන්ගේ මුතුන්-මිත්තනට ණය ගැති වෙති යි ඔවුහු විශ්වාස කළහ. ඔවුන්ගේ මුතුන්-මිත්තන්, දඩයම් කරන හා අවි

තනන හැටි ඔවුනට උගන්වා තිබිණ. ඔවුන්ගේ නිවහන් ද, ගිනි පරිහරණය ද මුතුන්-මිත්තන් විසින් තිළිණ කොට දී තිබිණ.

වැඩ කිරීමෙන් හා දඩයම් කිරීමෙන් සිය මුතුන්-මිත්තන්ගේ අදිටන් සපිරීම අදහස් කැරිණ. සිය මුතුන්-මිත්තන්ගේ කැමැත්තට නතුව කටයුතු කළාහු කරදර වලින් හා අනතුරු වලින් ද මුදවන ලද්දෝය. සිය මුතු-මිත්තෝ ඔවුන්ගේ දෛනික පිවිතයේ අදිසි අංගයෙක් වූහ. මුතුන්-මිත්තන්ගේ ප්‍රේතාත්මයෝ හැම දඩයමක දී ම ඔවුන් කැටුව ගියහ. මේ ප්‍රේතාත්මයෝ හැම විට ම ඔවුන්ගේ නිවහන් අරක් ගෙන සිටියෝය. මේ ආත්මයෝ සියල්ල දන්නෝය. සියල්ල දකින්නෝය. යමකුගේ නරකට දඬුවම් කරන්නටත්, හොඳට තිළිණ දෙන්නටත් ඔවුනට හැකි විය.

මෙසේ පොදු යහපත පිණිස වූ පොදු ප්‍රයත්නය ප්‍රාගෛතිහාසික මානවයාගේ හැඟීමට අනුව සිය පොදු මී මුත්තාගේ කැමැත්ත සපිරීමක් හා ඔහුට කීකරු වීමටත් වැඩි යමෙක් නොවිය.

කෙසේ වෙතත් ප්‍රාගෛතිහාසික මානවයා අද අප තේරුම් ගෙන ඇත්තාක් මෙන් පැහැදිලි ලෙස, සිය ශ්‍රමයේ වැදගත් කම නම් තේරුම් නොගත්තේය.

ප්‍රාගෛතිහාසික දඩයම් කරු පීවත් වූයේත්, සිය පවුල පෝෂණය කෙළේත් ඔහු මරා ගත් බයිසන් ගවයාගෙන් බව අපි සලකමු. එහෙත් ''බයිසන්-ගෙන් තමන් පෝෂණය වූවා නොව,'' ''බයිසන් තමන් පෝෂණය කළ බව'' හේ විශ්වාස කෙළේය. අද පවා ආදි සමයයන්ගෙන් උපුටා ගෙන එළදෙන අපේ උපයන්නා ලෙසත්, මහ පොළව ''මහී මාතාව'' ලෙසත් අපි හඳුන්වමු. අපි එළදෙනගෙන් කිරි ගැනීමට ඇගේ අවසරයක් නොපතමු. එසේ වෙතත් ''එළදෙන අපට කිරි දෙති'' යි අපි කියමු.

ප්‍රාගෛතිහාසික මානවයාගේ ''උපයන්නා'' වූයේ සිවු පාවෙකි. ඒ බයිසන්, මැමත් හෝ මුවෙකි. දඩයම් කරු ''තමා සිවු පාවා මැරූහ'' යි නො-

සිතිය. ''සිවු පාවා සිය කැමැත්තෙන් උගේ මසුත්, හමත් තමාට ප්‍රදානය කළහ'' යි දඩයම් කරු විශ්වාස කෙළේය. සිවු පාවාගේ කැමැත්තෙන් තොර ව ඌ ඝාතනය නොකළ හැකි යයි ඇමෙරිකන් ඉන්දියානුවෝ සිතූහ. ඉදින් බයිසන් ගවයෙක් මරනු ලැබී නම් ඒ හුදෙක් මිනිස් යහපත පිණිස සිය කැමැත්තෙන් කැප වීමටත්, තමා මරනු ලැබීසටත් ඌට වුවමනා වී තිබුණු නිසාය

බයිසන් ගවයා ගෝත්‍රයේ උපයන්නාත්, ආරක්ෂකයාත් විය. ඒ එක්කම පොදු මී මුත්තා සිය ගෝත්‍ර ආරක්ෂකයා වෙති යි සැලකූහ.

තව ද ප්‍රාගෛතිහාසික මානවයාගේ සිත් තුළ, ගෝත්‍රය පෝෂණය කළ සත්ව ප්‍රේතාත්ම ආරක්ෂකයාත්, මී මුතු ප්‍රේතාත්ම ආරක්ෂකයාත් එකට මුසුව කිදා බැස සිටියහ. කෙසේ වෙතත් ඔවුන් පිවත් වුණු ලෝකය ගැන අපට තවමත් ඇත්තේ නොපැහැදුලි අදහසෙකි.

මිනිසා මෙ වන විටත් තමාට ''මේ'' යන වහර ඉගෙන නොසිටියේය. මේ වන විටත් ඔහුට හැහුණේ තමා සිය ගෝත්‍රයේ උපාංගයක් ද, උපකරණයක් ද බවයි. එක් එක් ගෝත්‍රයට එයට ම විශේෂ නමක් ද, ගෝත්‍ර චිහ්නයෙක් ද විය. මේ නම ඔවුන්ගේ පොදු මී මුත්තා වූත්, මුර දේවතාවා වූත් සිවු පාවකුගේ නම විය. මෙසේ එක් එක් ගෝත්‍රයෙක් ගවර, වලස්, මුව ඇ නම නලින් හැඳින්විණ. ගෝත්‍ර සාමාජිකයෝ සිය පිවිත එකෙකා වෙනුවෙන් පුදන්නට සුදානමින් සිටියහ. ගෝත්‍රයේ චාරිත්‍ර පද්ධතිය චිහ්නයේ කැමැත්ත වෙති යි ද, සැලකිණ.

අපේ මුතු-මිත්තන් සමඟ සංවාදයක්

අපි ප්‍රාගෛතිහාසික මානවයාගේ ලෙන තුළට යළිත් පිවිස ඔහුගේ උදුන ළඟ ඔහු සමග වාඩිවී ඔහුගේ ඇඳගිම් හා අභිචාර ගැන කතා කරමු.

අපේ අනුමානයන් නිවැරදි නම් ද, ඔහු විශේෂයෙන් අපට ඉතිරි කොට ගියා සේ පෙනෙන, ලෙන් සිත්තම් හා අලංකෘත ඇටමුවා සුර අපි නිවැරදි ව තේරුම් ගතිමු නම් ද ඒ බව කියන්නට ඔහුට ඉඩ සලසමු. එහෙත් අප ලෙන් බස ගැන විශාරදයන් වන්නේ කෙසේ ද?

දහස් වසර ගණනකට පෙර සුළඟ උදුන් අළු අවකාශයට පිඹ හළේය. යට ගිය දිනෙක උදුන් අබියෙස උණුසුම් ලේදවුන්ගේ ඇට ද, ඔවුන් ගිනි ගල්මුවා සහ ඇටමුවා අවි තනා ගත් සහ සත්ව හමින් ඇඳුම් සකසා ගනිද්දී මසා ගත් ඇට ද, දිගු කලක් වූ එදා මෙදා තෙක් දුවිල්ලට

හැරුණේය. ඉදින් මිහි කුසින්, වියළි, කහ පැහැති, පාෂාණිභූත හිස් කබලක් පුරාවිදු දරුවකුට අභිමඛෙන් හෝ හමු වන්නේ කලාතුරෙකිනි.

ප්‍රාගෛතිහාසික මානවයා වැඩෙහි යෙදී ඇත්තේ කෙසේ දැ යි ඔහුගේ අවි මහින් දැන ගැනීමට අවි පතුරුත්, කිරිත් සොයනු පිණිස අපි ගල් ලෙන කණිමු. එහෙත් ප්‍රාගෛතිහාසික මානවයාගේ කතාවේ ''පතුරු'' හා ''කිරි'' අප සොයා ගන්නේ කොහෙන් ද? ඒ පිණිස අප අපේම නූතන භාෂාවන් විමසා බැලිය යුතුය.

අප මහ පොළොවෙහි නොව, ශබ්ද කෝෂයක් තුළ විමසීම කළ යුතු හෙයින් මෙබඳු කැණීමෙක දී ඉස්කෝප්පයක් අවශ්‍ය නොවේ. හැම භාෂාවෙක හෝ හැම වාග් කොෂයෙකත් මහහු අතීත වදන් හා වහර මිණි රුවන් ද ආරක්ෂා වී ඇත. එය මෙසේ සිදු විය යුතු මය. විය යුතු සියල්ල සිදු වීමෙන් පසු සිය හා දහස් පරම්පරාවන්ගේ අත් දැකීම් සම්භාරය අපේ භාෂාවන් මහින් අපට උරුම වී ඇත.

ඔබ මෙසේ කියනු ඇත. බසක් ඉගෙනීම හා ඒ ගැන සොයා බැලීමටත් වඩා සරල වූ තවත් දෙයක් තිබේ ද! ඔබට කරන්නට ඇති එක ම දෙය ඔබේ ඩෙස්කුවට වාඩි වී ශබ්ද කෝෂයෙක පිටු පෙරළීම පමණි!

එහෙත් එය, කී ටික තරම් නම් පහසු නොවේ.

පර්යේෂකයෝ පැරණි වදන් පිළිබඳ ඔවුන්ගේ පිරියෙසුම් වල දී මිහි තලය පුරා සැරි සරත්. ඔවුහු ශීඝ්‍ර ප්‍රපාතාකාර කඳු නහිත්. මහා සාගර තරණය කරත්. ඇතැම් විට උස් කඳු බිත්තියෙකින් ඇත එපිට්න් සිය කුඩා ගෝත්‍රික ජන සමාජයක් ගොඩ නහා ගත් ජනකායක්, අනෙක් භාෂා වලින් දිගු කලකට පෙර ගිලිහී ගිය පැරණි වදන් තවමත් රැක ගෙන සිටිත්.

පුරා විදු දරුවන් ප්‍රාගෛතිහාසික කඳවුරු බිමහි, එහි විසුවන්ගේ නිවහන් හා මෙවලම් වල ඉතුරු බිතුරු කණින්නාක් මෙන් පැරණි කතා වහරෙහි

ඉතුරු බිතුරු සොයා ගන්නට අපට වුවමනා නම් අප විසින් නිරීක්ෂණය කළ යුත්තේ යට කී ගණයේ භාෂා වලය.

වසර දහස් ගණන් ගත වීමේ හේතුවෙන් වෙනස් වූයේ වදන් වල ස්වරූපය පමණක් නොවේ. ඒ අයුරින් ම තේරුම ද වෙනස් විය. වදනකට අලුත් තේරුමක් දෙනු ලැබූ හැම විටෙක ම එය කලින් වූ තේරුමට ඉඳුරා වෙනස් අරුතක් නැහිය.

මේ නිරතුරු ව ම සිදු වන්නෙකි.

මේ නයින් ''අත් පිටපත'' තවමත් අතින් ම පමණක් නොලියන්නකි. වෙඩි බෙහෙත් බෙහෙතක්ම නොවේ. ''මෝල් ගහ'' ද ගහක් ම නොවේ. වංගෙඩිය ද ගෙඩියක් නොවන බව පැහැදිලිය. ''කැත්ත'' දැකැත්ත විය. මේ අපේ භාෂා වල ඉතා මෑත මට්ටමේ දී සිදු වී ඇති වර්තමානයට අදාළ වෙනස් වීමය.

එහෙත් අප වඩ වඩාත් ඇතට යන විට, කාරිය වඩාත් බර පතල වෙයි. වදනෙක ප්‍රාග්තම වූ නැති ව ගොස් ඇති අරුත සොයා ගැනීමට නම් යමෙක් මහා විද්වතකු විය යුතුය.

පැරණි බස් වහරේ අස් කොන්

ඉදින් අප මානව කතා ව්‍යවහාර ඉතිහාසයේ වත්මන් පෙත්තෙන් පටන් ගෙන, ඇතින් ඇත මුල් පෙත්තට යතොත්, තමා අබිරහස් බල වේගයන් අත උපකරණයෙකියි මිනිසා සිතූ බව සිතන්නට අප මෙහෙයවන කතා ව්‍යවහාරයන්හි ඉතුරු බිතුරු හමු වන අවස්ථාවනට අපි නිරන්තරයෙන් පැමිණෙමු.

''මම ගොතමී.'' යන්න වෙනුවට ඇකෝටා ඉන්දියානුවෝ ''මච්සින් ගෙතෙයි'' යනු යොදත්. මින් හැඟෙන්නේ ගොතන කටුව ක්‍රියා කරන්නා ගොතන බව නොව කටුව නුදෙක් තෙමේ ම ගොතන බවයි.

සියලු ම යුරෝපීය භාෂා වල, පැරණි වාග් රටාවන්ගේ ඉතුරු බිතුරු තවමත් ලැබිය හැකිය. මෙසේ ප්‍රංශ බසෙහි '' Il fait froid '' යන්න යෙදෙන්නේ ''සිතලයි'' යන්න වෙනුවටය. එහෙත් පදා-

නුගත ව ගත් විට සැබැවින් ම ''ඔහු සීතල කරයි'' යන අරුත දෙයි. තව දුරටත් මෙහි කියැවෙන අබිරහස් ''ඔහු'' යනු අනෙකක් නොව ලොව පාලනය කරන්නාය.

එහෙත් මෙසේ නිදසුන් සඳහා විදේශීය භාෂාවන් පමණක් ම විමැසීමට අපට සිදු වී නැත. පැරණි වාග් රටාව හා ඒ නිසා ම, පැරණි චින්තන රටාවන් පිළිබඳ වුවමනාවටත් වඩා නිදසුන් රුසියන් බසෙහි ලද හැකිය.

නිදසුනක් ලෙස ''හේ සීතල කරනු ලැබිය'' හෝ ''මුහ් දෙකට නමනු ලැබිය'' යන අපේ ව්‍යවහාරයන් ගනිමු. යමකු සීතල කෙළේ හෝ දෙකට නැමුවේ කවර බල වේගයක් ද? එසේ ම '' It was hot '' ,"It was getting dark", "It is raining" යනාදි යෙදුම් වල නොදන්නා අබිරහස් තැනැත්තෙක් අපට නොපෙනී '' It '' යනුවෙන් ඉඳිරිපත් වී ඇත. අපි කිසි ම ආකාරයෙක අබිරහස් බල වේගයන් ගැන විශ්වාස නොකරමු එහෙත් අපේ චත්මන් බස් වහර, ඒ ගණයේ සියලු ම බල වේගයන් කෙරෙහි දැඩි ලෙස විශ්වාසය තැබූ, අපේ ප්‍රාගෛති භාෂික මුතුන් මිත්තන්ගේ වාග් ව්‍යවහාරයන්ගේ අස් කොන් තවමත් රැක ගෙන සිටී.

මෙසේ කිසියම් බසෙක ඓතිහාසික අවස්ථාවන් හාරා අවුස්සා බලන කල ප්‍රාගෛතිහාසික මානවයන්ගේ බස් වහර පමණක් නොව චින්තන රටාව ද අපට හමු වෙයි. ප්‍රාගෛතිහාසික මානවයා, තමා වැඩ නොකළ හා දඩයම් නොකළ නමුත්, යම් කිසිවකු විසින් ඔහු වැඩ කරන්නටත්, දඩයම් කරන්නටත් යොදනු ලැබූ, සිදු වූ සියලු දේ නොදන්නා කිසියම් බල වේගයෙක කැමැත්ත අනුව කෙරුණු අරුම, අබිරහස් ලොවෙක පිවත් වූයේය.

එහෙත් කාලය ගෙවී ගියේය. වඩාත් ශක්ති සම්පන්න මිනිසෙක් පෙරට ආයේය. ඔහු වටා වූ ලොවක්, එහි ඔහුට හිමි තැනත් වඩා හොඳින් අවබෝධ කර ගන්නට හේ පටන් ගති. ඔහුගේ බසෙහි

''මම'' යන වදන පහළ විය. ඒ සමඟ ම නිර්මාපක, පරිශ්‍රාමික හා ක්‍රියාකාරී පුද්ගලයෙක් ද, ඔහුගේ ම කැමැත්ත ඉටු කරන සොබා දහමෙක් ද පෙනෙන්නට විය.

අපි තව දුරටත් ''මිනිස්මුවමැරුම'' නමැති අවුලක් නොවහරමු. ඒ වෙනුවට අපි පැහැදිලි ව ම ''මිනිසා මුවා මැරීය'' යි කියමු. එහෙත් තවමත් ඉඳ හිට අතීතාභාස ඡායා මාත්‍රයෙක් ඕනෑ ම බසෙක දකින්නට ලැබෙයි. අපි තවමත් ''එය අදහස් නොකෙරෙයි'', ''එය අදහස් කෙරෙයි'', ''එය අභාග්‍යයෙකි'' යි ආදිය යොදමු. මෙහිදී අදහස් කරන්නේ හෝ නොකරන්නේ කවරෙක් ද? අභාග්‍ය සම්පන්න බව ඇති කරන්නේ කවරෙක් ද?

''ඉරණම! ඉරණම!'' යි අපට කිය හැකිය. එහෙත් ප්‍රාගෛතිහාසික මානවයා එතරම් ත්‍රාසයට පත් නොදන්නා කිසියම් බල වේගය ද ඒ ''ඉරණම'' මැ යි. ඉරණම හෝ දෛවය යන වචනය අපේ බස් වහර වල තවමත් පවතී. එහෙත් යම් කිසිවකුට අනාගතයේ දී එම වහර සපුරා, නියත වශයෙන් ම දකින්නට නොලැබෙති යි කිය හැකිය.

ගොවියා අධිෂ්ඨාන පරවශ ව කුඹුර ගොවිතැන් කරයි. ඔහුගේ ඒ ක්‍රියාවලිය මත හොඳ හෝ නරක අස්වැන්න රඳා පවතින බව හේ දනී.

''ඒක එයාගෙ ඉරණම!'', ''ඒක ඔළුවෙ කොටල තිබුණ!'' මෙවැනි යෙදුම් දැන් යමකුට ඇසෙන්නේ අඩු අඩුවෙනි.

නුගත් කම් බිය ජනිත කරයි. දැනුම ආත්ම විශ්වාසය ගෙන එයි. එය තව දුරටත් මිනිසා සොබා දහමේ වහලකු නොව ස්වාමියා බවට පත් කරයි.



ග්ලැසියරයෝ පසු බසිත්

වසරක් පාසා හිම දිය වන්නට පටන් ගත් කල්හි වන ගහනයන්හි හා එලි මහන් පෙදෙස් වල ද, ගම්බද පාරවල් දිගේ හා මහ දෙපස කානු දිගේ ද යන හැම තන්හි වේගවත් පෙණ දමන ඇළ දොළ හා දිය ඇලි ද හදිසියෙන් පෙනෙන්නට පටන් ගනී.

සිසිරයේ තට්ටු පිට තට්ටු බැඳුණු හිම වැස්ම දිය වන්නට පටන් ගත් වහා ම, හැම වසන්තයක ම මෙය සිදු වෙයි.

එහෙත් ප්‍රාග්ඓතිහාසික සමයයන්හි දී මීහි තලය වසා පැතිර ගිය යෝධ හිම වැස්ම දිය වන්නට පටන් ගත් කල කිමෙක් වී ද?

එකල්හි ඇළ දොළ වැනි කුඩා දිය පාරවල් වෙනුවට, හිම තට්ටු යටින් යෝධ හා ගාම්භීර ගංගාවෝ වේගයෙන් මතු වෙමින් ගලන්නට පටන් ගත්හ. ඔවුන්ගෙන් බොහෝවක් තවමත් මහ දී හමු වන හැම කුඩා දියත්තක්, ඇළක්, දොළක් හා ඔයෙකින් ද ජලය එක් රැස් කර ගනිමින් සිය සුපුරුදු මහ දිගේ මහ සයුරු වෙත ඇදෙත්.

මීහි මත උතුරුකරයේ හිස් බිම් පෙදෙස් ප්‍රතාපවත් ඝන වනාන්තරයන් ගෙන් සරසා ලූ හේතුවට නිමිත්ත නම් සොබා දහමේ ඉහත කී මහා පිබිදීමයි, ඒ මහා වසන්තයයි.

හැම වන නිවහනකට ම එයට උරුම වූ නිවැසියෝ සිටිත්.

ගන බහුල කොළ රැසින් යුත් වන ගහනයන් උතුරු දෙසට ඇදී යද්දී එහි රැඳී ඉන් යැපුණු සිවු පාවුන් සේ ම, පඳුරු, බිම් මල් හා බෙරි වර්ග ද ඒ සමඟ ම ඇදී ගියේය. ඒ අතර වල් ඌරන්, ගෝනුන්, ගවරුන්, උදාර අං පොකුරින් යුත් රතු මුවන් වූහ. පැනි රස හැඳිනීමේ තියුණු දිවක් ඇති දුඹුරු

පැහැති වලසා, වන මී පැනි ඉව ඔස්සේ පදුරු අසු අස්සෙන් කඩා බිඳ ගෙන ඇදි ගියේය. වෘකයෝ හාවුන්ගේ උණුසුම ඉව පාර ඔස්සේ වියළි කොළ බිස්ස මත සැහැල්ලු ලෙස දිව ගියහ. වට මූණ හා කොට පාද යුත් බීවරයෝ වන දිය පාර හරහා සිය වේලි බැඳ ගත්හ. ඉමහත් කුරුලු මුළු වන පියෙස තුටු ගී රැවින් පුරා ලූහ. හංසයන්ගේත් පාත්තයන්ගේත් කෙකාරවය වන විල් මත විසිර ගියේය.

හිම මැද කොටු වූවෝ

පරිසරයෙහි මෙබඳු බරපතල වෙනස් කම් සිදු වෙමින් පවතිද්දී මිනිසාට පසෙකට වී නරඹන්නකු සේ බලා සිටිනු නොහැකි විය. රහ මඩලක කරලිය මෙන් මිනිසා අවට සියල්ල වෙනස් වෙමින් තිබිණි. එහෙත් රැහුමක දී මෙන් නොව එක් එක් ජවනිකාවට වසර දහස් ගණනක් බැගින් ගෙවුණු අතර වේදිකාව සතරැස් සැතපුම් දශ ලක්ෂ ගණනින් යුත් පෙදෙසක පැතිර ගියේය.

තව ද මේ සාර්ව ගෞමික අපූර්ව දර්ශනයේ දී මිනිසා සිටියේ ප්‍රේක්ෂකාගාරයේ නොවේ. හේ වේදිකාව මත නළුවන්ගෙන් කෙනෙක් විය

හැම විටෙක ම සැකැස්ම වෙනස් වූයේය. නොනැසී පැවැත්ම පිණිස සිය පිවන ක්‍රමය වෙනස් කරන්නට මිනිසාට සිදු වී තිබිණි.

තුන්ද්‍රා වන ගහනයන් දකුණු දෙසට පැතිරෙන්නට වූ කල්හි සිවු පාවුන් එහි අත් අඬංගුවට පත් වූවන් මෙන් හා ඊට බැඳි සිටියවුන් මෙන් ද වූ හෙයින් පිනි මුවා ද ඒ අනුව ම ගෙන එනු ලැබීය. මෙසේ බඳිනු ලැබූ අදිසි දම් වැලෙහි එක් කෙළවරෙක පිනි මුවා ද, අනෙක් කෙළවරෙහි තුන්ද්‍රාහි පෙද හා පාසි ද විය.

පිනි මුවා පෙද හා පාසි මත තණ කමින් තුන්ද්‍රා පෙදෙස ඔබ මොබ සැරි සැරීය. මිනිසා ඌ ලුහු බඳිමින් ඒ අනුව ගියේය.

ස්ටෙප්ස් තලාවන්හි දී මිනිසා අසුන් ද, ගවරුන් ද දඩයම් කර ගත්තේය. එහෙත් තුන්ද්‍රාහි දී ඔහුට පිනි මුවා දඩයම් කර ගන්නට හැකි විණ.

පිනි මුවා හැරෙන්නට හේ තුන්ද්‍රාහි දී කවර සතකු දඩයම් කෙළේ ද?

මේ වන විට සියලු මැමත්හු මරු වසහයට ගොස් සිටියහ. ප්‍රාගෛතිහාසික මානවයා ඔහුගේ නිවහන් අසල මැමත් ඇට කඳු ගොඩ ගසමින් ඔවුන් දහස් ගණනින් සමූලඝාතනය කොට තිබිණ. එසේ ම ආහාරය සඳහා යෝධ අස් රංචු මරා ගෙන තිබිණ. ඉන් බෙරුණාහු ස්ටෙප්ස් තලාවන්හි රසට වැවුණු තණ පත් විසින් වියලි පාසි වලට ඉඩ සලසනු ලැබූ කල්හි ඇතින් ඇත දකුණු දෙසට ඇදී සිටියෝය.

ඇතැම් දඩයම් ගෝත්‍රයෝ පිනි මුව රංචු අනුයමින් උතුරු දිග ආර්ක්ටික් පෙදෙසට ඇදුණහ. මේ වන විට ඔවුන් උතුරු දිග දේශ ගුණයට සපුරා හුරුපුරුදු ව. සිටි හෙයින් කළ හැකි පහසු ම දේ එය විය. වසර දස දහස් ගණනින් යුත් කාලයෙන් තුළ හිම යුගයේ කර්කශ සීතලය නිමාවට පත් ව තිබිණ. මේ දස දහස් වසරවල් තුළ ප්‍රාගෛතිහාසික මානවයා සීතල සමඟ සටන් කරන්නට ඉගෙන සිටියේය. සිවු පාවුන්ගේ උණුසුම් ලොමින් ඔහුගේ ඇඳුම් සකසා ගන්නට ඉගෙන තිබිණ. පරිසරය වඩා සිසිල් වන විට තාවකාලික නිවහන් වූ බිම් ගෙවල් තුළ උදුන්හි වඩාත් දිප්තිමත් ගිනි දැල්විණ.

පුරුදු තැන පසු කා සිටිනුවට වඩා ආර්ක්ටික් පෙදෙස බලා සංක්‍රමණය පහසු විය. කෙසේ වෙතත්, හැම විට ම අඹු ම බාධකයන් ඇති මහ යොදා ගත හැකි හොඳ ම මහ නොවේ. එහෙත් එවන් මහක් ම තෝරා ගෙන උතුරු දෙසට පැතිරෙන තුන්ද්‍රා වනය සමඟ ගිය අර මානව සංහතිය අන්තිමට හිම අතර හිර කරුවෝ වූහ. ඒ, යම්තාක් අදාළ පරිදි හිම යුගය වසර දහස් ගණනින් දික් වූ නිසයි. ග්‍රීන්ලන්තයේ ඇස්කිමෝ වරු රළු වූත්, දරදඬු වූත් සෙබා දහමට එරෙහි ව ඉම නොදකින සටනක් දියත් කරමින් තවමත් හිම සෙල් මැද දිවි ගෙවති.

එහෙත් පුරුදු තැන පසු බා සිටි ගෝත්‍රයෝ ද වූහ. ඔවුන්ගේ ඉරණම සපුරා වෙනස් විය. මූල දී වැඩෙමින් එන වන ගහනයන් මැද ඔවුන්ගේ පිවිතය තව දුරට වඩාත් කරදර සහිත විය. එසේ ද වුවත් අවසන් විසින්, ඉමහත් වසර දහස් ගණන් තුළ සිය මුතුන් මිත්තන් සිර කරුවන් බවට පත් කර ගෙන සිටි හිම හිර මැදිරියෙන් නිදහස් වන්නට ඔවුහු සමත් වූහ.

මිනිසා වනය හා සටන් වදී.

කලින් තුන්ද්‍රා වන පෙදෙස්හි, ඒ වෙනුවට ජනිත වුණු වනාන්තරයෝ නූතන යුගයේ අපේ වනාන්තරයන් සේ නොවෙත්. ඒවා දැවැන්ත වෘක්ෂයන්ගෙන් ගහන වූයේ තරණය නොකළ හැකි ගන බහුල පදුරු බඳු විය. එසේ ම යට අකුල් රොදින් එකට වෙළී බැඳුණේ, එක දිගට අඛණ්ඩ ව සැතපුම් දහස් ගණනින් ගං ඉවුරු තෙක් ද, විල් තෙක් ද, ඇතැම් විටෙක කෙළින් ම මහ සයුරු තෙක් ද විහිදී ගියේය.

මෙවන් අරුම නව ලොව තුළ, ප්‍රාගෛතිහාසික මානවයාගේ පිවිතය පහසු එකක් වූයේ නැත.

වනය සිය ගොරහැඩි අත්ලෙන් මිනිසා මිරිකා ලීය. එය ඔහුට සෙලවෙන්නට හෝ හුස්ම ගන්නට තරම් වත් ඉඩක් තැබුවේ නැත. ගස් කපා හෙලමින් ද, කුඩා බිම් කටට් එලි පෙහෙලි කරමින් ද ඔහුට මහ වනය සමඟ නිරතුරු ව යුද වදින්නට සිදු ව තිබිණ.

තුන්ද්‍රා හෝ ස්ටෙප්ස් පෙදෙස්හි දී ප්‍රාගෛතිහාසික මානවයාට කඳවුරකට ඖදු බිමක් සොයමින් කරදර විඳින්නට සිදු වූයේය. හැම තැන ම ඕනෑ තරම් ඉඩ කඩ තිබිණ. එහෙත් වනය තුළ පළමුවෙන් ම මේ එලි මහන් බිම් ඇබ්බැත්ත සොබා දහමින් බලයෙන් උදුරා ගන්නට ඔහුට සිදු විය.

මෙහි දී හැම බිම් අහලක් ම, ගස් වලින් හා එකට වෙළී බැඳුණු පදුරු සහිත යට වනයෙන් ද වැසී ගියේය. මේ අනුව සතුරු බලකොටුවකට පහර

දෙන්නා සේ මහ වනය ආක්‍රමණය කරන්නට ඔහුට සිදු විය.

එහෙත් කිසිවකට අවි වලින් තොර ව සටන් කළ නොහැකිය.

ගස් කපා හෙලන්නට ඔහුට පොරොවක් අවශ්‍ය ව තිබිණි.

එහෙයින් හේ ත්‍රිකෝණාකාර, බර පැතලි ගිනි ගලක් දිග ලී මිටකට සවි කර ගත්තේය.

කලින් කොටටෝරුවකු ගසකට කොටන විට නැහුණු හඬ පමණක් ඇසුණු වනය පුරා අලුත් හඬක් රැව් දුන්නේය.

එලිමහන් තැනි තලාවේ දී රංචු පිටින් සිටින විට ඔහු විසින් සතුන් දඩයම් කොට ගෙන තිබිණ. එහි දී යමකුට කුඩා පස් ගොඩැල්ලක් මත නැඟීමෙන් සැතැපුම් ගණනක් වටා නරඹමින් ඇත සිටින සිටු පා රංචු දර්ශනය කිරීම පහසු කාරියෙක් විය.

එහෙත් මහ වන මැද දී එය සපුරා වෙනස් කාරියෙකි. වන නිවහන නිවැසියන්ගෙන් පිරුණේ වුව ද එකෙකා දකිනු නොහැකි විය. එහි එක් එක් මහලක් එකාවන් ව සර සරයෙන්, කුජනයෙන්, කීකියාවෙන්, හේෂාරවයෙන් හා කුෂ්ඨ නාදයෙන් ද ගෝෂ්ඨිකර වූවත්, කවර සතකුවත් ලුහු බඳවා ගැනීම නම් බෙහෙවින් ම අමාරු කාරියෙක් විය.

පාමුල සර සරයෙක් නැහුණේය. කිසිවෙක් හිස මතින් පියාඹා ගියේය. එයින්, අතේ දුරින් වූ අත්තෙක කොළ ඔබටත් මොබටත් සැලුණේය.

ප්‍රාග්ඓතිහාසික මානවයා මේ සියලු සර සරයන් සහ ගඳ ද කෙසේ වෙන් කොට හඳුනා ගන්නට ද? ඇතට පැහැදිලි ව දිස් වන ගස් කඳන් අතර සිටින සතුන්ගේ පැහැපත් තිත් කෙසේ වෙන් කොට දකින්නට ද?

හැම වනසර සියොතකුට ම හා සිටු පාවකුටත් උෆෙ ම ආවේණික ආරක්ෂක පැහැයෙක් විය.

කුරුල්ලන්ගේ පියාපත් බැලූ බැල්මට ගෝමර ඉහිරුණු ගස් කඳන් වල පැහැ ගත්තේය. වන අතරේ

අඩ අඳුරේ සතුන්ගේ මඳ රත් දුඹුරු ලොම් පැහැය වියළි කොළ පැහැය හා සැසඳුණේය.

සතකු ලුහු බැඳ දඩයම් කර ගැනීම අමාරු කාරියෙක් විය. එහෙත් වරෙක සැහෙන තරමින් ළං වුවත් අවියෙන් දමා ගසන්නට ලැබුණේ එක් වරක් පමණි. මේ නිසා දඩයම් කරුවකුට නොවරදින ඉලක්කයක් තිබිය යුතු විය. එසේ නොවිණි නම් සිවු පාවා යටි වන ලැහැබ අතරින් ඊංගා යන්නට තිබිණ.

ප්‍රාගෛතිහාසික දඩයක්කරුට සිය හෙල්ලය වෙනුවට, වේගයෙන් ඉගිලෙනු සමඟ ම නියත ඉලක්කයක් ගත හැකි ඊයක් යොදා ගන්නට සිදු වූයේ මේ නිසයි. හේ දුනු දැරූ අතින් හා හියොවුරු දැරූ උර හිසින් යුතු ව, වන ලැහැබ අතරින් මහ සොයා ගෙන වල් ඌරන් ද, වගුරු බිම වල සිටි පිහාටු පොදියෙන් පිම්බුණු තාරාවුන් සහ පාත්තයන් ද ලුහු බැඳ ගියේය.

මිනිසාගේ සතර පා මිතුරා

හැම දඩයක්කරුවකුට ම විශ්වාස දායක මිතුරෙක් සිටියේය. මේ මිතුරාට පා සතරෙක් විය. විශාල හා මෘදු වූ කන්ය. විපරම් ළැදි, කළු වන් නාසයෙකි. දඩයමේ දී මේ සතර පා මිතුරා දඩයමක් පිණිස ඔහුට උදවු කෙළේය. ඔහු කැමි වේල ගන්නා විට හේ තම ස්වාමියාගේ පසෙකින් හිඳ "කෝ මගේ කොටසැ" යි අසන්නාක් සේ ලූහුණ දෙස බැලිය.

මේ සතර පා මිතුරා මිනිසාට වසර දහස් ගණනක් තිස්සේ විශ්වාස දායක ව සේවාව කර ඇත. මේ මිතුරා නම් ඇත යුගයන්හි දී, මිනිසා දුනු හී වලින් දඩයම් කරන කල හිලෑ කර ගනු ලැබූ බල්ලාය.

සෝචියට් පුරා විදු දරුවෝ යැනිසි ගං ඉවුරේ ඇපන්ටෝවා කඳු අසල කණිද්දී, ප්‍රාගෛතිහාසික දඩයම් කඳවුරෙක තිබී බල්ලකුගේ ඇට කටු සොයා ගත්හ. මේ ඇට කටු, විශේෂ ලක්ෂණයක් ලෙස

පෙනෙන, වඩා කෙටි හොම්බක් සහිත වෘකයකුගේ මෙන් විය.

ප්‍රාගෛතිහාසික මානවයාගේ බල්ලා, විය යුතු සේ ම ඔහුගේ නිවහන රැක බලා ගත්තේ ද, දඩයමේ දී ඔහුට උපකාර කෙළේ ද විය. ප්‍රාග්තම වන නිවාසස්ථානයන්හි බල්ලකුගේ බවට සලකුණු සහිත දත් සමඟ සිවු පා ඇට සහිත ව විද්‍යාඥයනට හමු වූ මුළු තැන් ගෙවල කුණු කන්දල් විය. මේ නයින් අපි ඒ මොහොතේ පවා, මිනිසකුගේ කැම විටෙ දී, ඔහුගේ පසෙකින් සිට ඇට කැබැල්ලක් යදින බල්ලකු දකිමු.

තමාට කිසි පලෙක් නොවේ නම් කිසිදු මිනිසෙක් බල්ලකු හදා වඩා ගැනීම නොකරනු ඇත. ප්‍රාගෛතිහාසික මානවයා බල්ලා හීලෑ කර ගෙන, ඔහුගේ උපකාරකයා වන්නටත්, වනයෙහි දී ගොදුරු ලුහු බඳින්නටත් උගන්නන්නට ඇත. සිය උදවු කරු තෝරා ගැනීමේ ලා මිනිසා වරදවා ගෙන නොතිබිණි. පළමුවෙන් ම ඔහු වල් ඌරු පිය සටහනක් විමසන විට හෝ මුවකු පා තබන හඬට සවන් යොමු කළ විට හෝ ඔහුගේ බල්ලා හිස ඔසොවා ගහනත දළ දඬු කොට, ඉව අල්ලා ගන්නට නටවනු ඇත.

''පදුරු වලින් නැහ එන්නේ කවරකුගේ ගඳක් ද? දැන් මෙතැන පසු කර ගොස් ඇත්තේ කවරෙක් ද?''

මෙසේ සතකුගේ අඩි පාර සොයා ගැනීමට දෙතුන් වරක් ඉව කිරීම පමණක් ඌට ප්‍රමාණවත්ය. කිසිදු හඬක් නැසුනත්, කවර දෙයක් නුදුටුවත් ඌ සිය මූලික කාර්යෙහි සපුරා යොමු වූයේය. එනම් ගොදුර ලුහු බැඳීමයි. ඌ වරක් හෙමින් ද, වරක් අඩි ගමනින් ද, තවත් වරක් කඩිනමින් ද වනය විනිවිද ගියේය. උගේ ස්වාමියාට තිබුණේ, සමඟ යමින් උසි ගැන්වීම පමණෙකි.

මිනිසා විසින් බල්ලා හීලෑකර ගනු ලැබූ පසු වඩාත් බලවත් බවට පත් වූයේය. හේ තමාගේ

නාසයට වඩා තියණු වූ බල්ලාගේ නාසය සිය සේවාව සඳහා යොදා ගති.

මිනිසා
ගහ හා
සටන් වදී

හැම ප්‍රාග්ඓතිහාසික මානවයෙක් ම සිය නිවහන ගන වන ලැහැබ මැද නොනිමියේය. ඇතැමෙක් ගන වන ලැහැබ අත හැර ගං තෙර හා විල් තෙරත් සිය නිවහන් පිහිටුවා ගත්හ.

ඔවුන් විසින් ගහත්, වනයත් අතර පටු බිම තිරුවෙහි ලී කොටයෙන් නිමි පැල් පත් නිමවනු ලැබිණ.

වන මැදට වැඩියෙන් වූ, වඩාත් ඉඩෙක් ගං ඉවුරේ තිබිණ. එහෙත් එහි පිවත් වීම නම් හොඳට ම අසීරු විය.

ගහ ඉවක් බවක් නැති අසල් වැසියෙක් වූයේය. වසන්තයේ දී ගහ, උතුරා පිටාර ගැලූ විට නිරතුරු ව ම පාවන හිම කුට්ටි සහ ඇද වැටී තිබුණු ගස් කඳන් සමඟ මිනිසා විසින් ගොඩ නැඟුණු පැල්පත් ද උගුලුවා ගෙන ගියේය.

මුල දී හැම ගං වතුරක් ම, ඔවුන්ගේ නොදැනුවත් කමින් ඔවුන් අනතුරේ දැමීය. එහෙත් පසුව ගඟෙහි යථා තත්ත්වය තේරුම් ගත්තාහු එය රවටන්නට සමත් වූහ.

ඔවුහු ගස් කිපයක් කපා හෙලා පහුරක් මෙන් එකට බැන්දෝය. ඉක්බිති එය ගං ඉවුරේ තබා ඊමත හරස් අතට දෙවැනි ලී කොට තට්ටුවක් තැන්පත් කළහ. මේ අයුරින් තට්ටුවෙන් තට්ටුව තැන්පත් කරමින් උස වේදිකාවක් නිමැවූහ. ඉක්බිති ඊමත සිය පැල්පත් නිමැවිණ. ගඟ කොතරම් දරුණු වුවත්, ඉවුරු දෙවනත් කර ගෙන පිටාර ගියත්, ඔවුන්ගේ එලිපතටවත් ළඟා විය නොහැකි වූයෙන් දැන් ඔවුහු ගං වතුරට බිය නැත්තෝය. ප්‍රාග්ඓතිහාසික මානවයා ගඟ වෙතට අදිනු ලැබූ ප්‍රබලතම ආකර්ෂණ සාධකය නම් මාළුය.

දඩයම් කරු මසුන් මරන්නකු වීමටත් ඉගෙන ගත්තේ කෙසේ ද? දඩයමේ දී යොදා ගත් අවි වලට වඩා වෙනස් අවි මසුන් මැරීමේ දී ඔහුට වුවමනා විය. ඔහුගේ ගොදුර උගුලට අසු කර ගැනීමට වෙනස් උපා මං යෙදීමට ඔහුට සිදු වූයේය.

ඓතිහාසික සිදු වීම් මාලාව නමැති දම්වැල කැඩී ගිය විට අපි එහි හැළී ගිය පුරුක සොයා ගැනීමට උත්සාහ කරමු.

සතුන් දඩයම් කරන්නා මසුන් මරන්නකු වූයේ එක් රැයෙකින් නොවේ. මේ නිසා හේ මසුන් අල්ලා ගැනීමට පළමු, ඔවුන් දඩයම් කෙළේය.

සැබවින් ම සිදු වී ඇත්තේ එයයි. පළමු වැනි මසුන් මරන අවිය වූයේ ද හෙල්ලයි. හෙවත් සෑම ආකාරයෙන් ම දඩයම් හෙල්ලකට සමාන ඇවුලුම් බිලිය හෙවත් මණ්ඩාවයි.

ප්‍රාග්ඓතිහාසික මානවයා ඉහටිය තෙක් වතුරේ බැස ගල් අතර සැහවී සිටී මසුන් හෙල්ලෙන් ඇන මරමින් ගියේය. ඒ අතර වෙනත් උපක්‍රම මහින් ද මසුන් ඇල්ලීමට උගත්තේය. ඔහු දැලින් කුරුල්ලන් අල්ලන්නට හොඳින් ඉගෙන තිබිණි. මේ නිසා හේ සිය දැල් ජල මත විසුරුවන්නට උත්සාහ කෙළේය. මෙලෙසින් යථා කාලයේ දී මානවයෝ මසුන් ඇල්ලීමේ ලා දැල් යොදා ගන්නට පටන් ගත්හ.

සියලු ම නැව් වල
මුත්තා

අවුරුදු හැටකට පමණ පෙර ලැගෝඩා වීලට නුදුරු ව, මිනිස්සු ඇළක් කණිමින් සිටියහ. ඔවුන් දිරාපත් ගස් මුල් හා වැලි ද මැදින් හාරමින් සිටිද්දී මිනිස් හිස් කබල් ද, ගිනි ගල් අවි ද සොයා ගනු ලැබිණ.

පුරා විදු දරුවෝ මේ ගැන සොයා බැලූහ. යම් සේ කටු ගෙයෙක ප්‍රදර්ශන කුඩුවෙකින් ඉවතට ගන්නාක් මෙන් ඔවුහු සියලු දෑ මඩ වගුරින් ඉවතට ගන්නට පටන් ගත්හ. ඔවුන් විසින් ගිනි ගල් අත්

පොරොවක්, ගිනි ගල් මිටියක්, මාළු බිලි කටුවක් සහ ඊතිසක්, කඩතොලු මණ්ඩාවක් සහ මුද්‍රාවක් සේ ගත හැකි කැටයම් කළ ඇටමුවා සූරයක් ද ඉන් ඇඳ ගන්නා ලදී. මේ සියලු ම ඇටමුවා සහ ගිනි ගල් මුවා ද්‍රව්‍යයන් සොයා ගැනීමෙන් පසු ඔවුහු ඔවුන්ගේ මහහුතම සෙවිල්ල සොයා ගත්හ. එනම් විනාශයට නො ගිය හබල් ඔරුවෙකි. මීනි-සකුට පහසුවෙන් නැහ යාත්‍රා කළ හැකි තරම් කදිමට එය ආරක්ෂා වී තිබිණි.

එය කොහෙත් ම වත්මන්හි අපේ ඔරු සේ නො විණ. අපේ සියලු ම බෝට්ටු, ලුම් නැව් සහ ඩිසල් නැව් වලත් මුත්තා ලොකු ඔක් ගසෙක කඳින් හාරා ගෙන තිබිණ.

ඔබ ඔරු කුහරය තුළට එබී බැලුවහොත් ඔක් කඳට ගිනි ගල් පොරෝ පහර දී ඇත්තේ කෙසේ දැ යි දකින්නට පුළුවන.

ලී කඳෙහි ඔරුව දිගේ පොරෝ පහර දෙනු ලැබූ අවස්ථා වල දී කාරිය එතරම් අමාරු නොවිය. එතන්හි ඔරු කඳ සැහෙන්නට සිනිඳු ව සහ මට්ටම් ව ඇත. එහෙත් ඔරු ඉදිරිය හා අවරයෙහි දී පොරොව අවුල් කිරට මුහුණ දුන් විට සැබැවින් ම කාරිය වෙහෙසකර විය. මෙබඳු තන්හි දී කඳට හැම පැත්තෙකින් ම පොරෝ පහර දී ඇත. එහි දී ඔක් කඳ ගිනි ගල් දත් සමූහයෙකින් හපා දැමූ පරිදි, පුරා ම නෙරිමි හා වළවල් ඇත. කඳෙහි ගැට හෝ ඇඹරුම් වැඩීමක් ඇති ඇතම් තන්හි දී පොරොව සිය කාරිය පිළිකෙව් කෙළේය. එවන් විටෙක ලී කඳට එරෙහි ව පොරොව කරන සටනෙහි දී උදව්වට ගින්දර ඉදිරිපත් විය.

අවරය සපුරා කර වී ඇති අතර ඉරි තැළී ගිය කළු පැහැති අඟුරු වැස්මෙකින් යුක්ත වෙයි.

ඔරු කඳ හැරීමට ගන්නා ලද ගිනි ගල් පොරොව ඒ අසල ම ලැබී ඇත. කැපුම් කෙළවර ඔප මට්ටම් ව, මුවහත් ව තිබිණ. ඊට නුදුරු ව දිරා පත් ගස් මුල් අතර ගිලී තිබුණු හණ ගලක් ද හමු වී තිබේ.

ඉන් අදහස් කෙරෙන්නේ ගිනි ගල් අවි පෙර සේ යමතම හැඩයකට පෙති ගසා නොගත් අතර පසු ව හැඩ වැඩ ඇති ව ඔප මට්ටමට හා තියුණුවට සකසා ගත් බවයි.

ඉදින් කිසි විටෙකත් මොට්ට පොරොවකට ශක්තිමත් ඔක් කඳක් තුළට කපා ගෙන යන්නට හැකි වී ද?

මිනිසකුට ඔක් කඳක් ඔරුවක් බවට පත් කිරීමට දිගු කලකුත්, විශාල ශ්‍රමයකුත් වැය විය.

කොයි ලෙසින් හෝ අවසන්හි දී කාර්ය නිමවන ලදී. කුඩා බෝට්ටුවක් දියත් කැරිණ. මසුන් මරන සමාජයේ මිනිස්සු, සිය මණ්ඩාවල්, මාළු බිලි කටු, මස් මරන හෙල්ල සහ හැම වගයෙක ම දැල් ද ගෙන විල් දිය මතු පිට ගමන් ඇරඹූහ.

මුල් ම ශිල්පියෝ

මේ සටනේ දී එකකට පසු ව එකක් බැගින් අවි පෙරමුණට එයි. ඉදින් පිහියකට කාර්ය සපුරාලිය නොහැකි නම් පොරොවකට හැකි වෙයි. පොරොව ද ශක්තිමත් නොවන්නේ නම්, කියත සිය දුසිම් ගණන් තියුණු දත් වලින් සටන ඉදිරියට ගෙන යයි. යථා කාලයේ දී ඔබට වුවමනා කළ හැඩය වසා, සහවා ගෙන සිටි අතිරික්ත දැව කොටස් යතු කුඩු, පතුරු හා කියත් කුඩු බවට පත් ව ඉවතට විසි වී යනු ඇත.

දැන් ඔබ දිනුමය. එහෙත් එය හුදෙක් ඔබේ තනි ජයග්‍රහණයෙක් නොවේ. ඔබට ජයග්‍රහණය කරන්නට හැකි වූයේ කුමක් හෙයින් ද යත්, ඔබ පරිහරණය කරණ උපකරණ වසර සිය ගණන් තිස්සේ නිපදවූ සහ දියුණු කළා වූත්, ඒවා නිපදවීමට නවතම අමු ද්‍රව්‍ය සඳහා පිරියෙසුම් කළ සහ ඒවා පරිහරණයෙහි ලා නව මං සෙවිවා වූත්, හැම වගයෙක ම කාර්මික ශිල්පින්ගේ හපන් කමේ මහිමයෙනි.

මෙහිදී, මේ පොතේ පිටු වලින් හාපුරා පිහි, පොරෝ සහ මිටි ද නිමැවූ මුල් ම ශිල්පින් ගැන ඔබ සපුරා ඉගෙන ඇත.

ඔවුන් වැඩ කළ හැටි ඔබ දුටහ. ඔබගේ කාර්යයන් දුෂ්කර වන්නා සේ ම ඔවුන්ගේ කාර්යයෝ ද දුෂ්කර වූහ. එහෙත් අවසන්හි දී ඔවුනට එමඟින් ඉමහත් ආස්වාදයෙක් ද ගෙන එනු ලැබිණ.

මේ මුල් වඩුවන්, ගොවියන් සහ පෙදරේරුවෝ ද ඇතුම් පිණිස සතුන්ගේ හම් ඇන්දෝය. ඔවුන්ගේ උපකරණ ගොරහැඩි ද බර ද විය. ඔවුනට අහර පිසින මැටි වලඳක් තැනීම, අපට පිළිරුවක් නෙළීමටත් වඩා අමාරු කාරියෙක් විය.

එහෙත් මේ වඩුවෝ ද, ගොවියෝ ද, කුඹල්ලු ද, තමන්ගේ දෛනික ශ්‍රමයෙන් දැනුදු මහ පොළොවේ මුහුණුවර විකෘති කරමින් සිටින ගොඩ නැඟිලි කරුවන්, රසායනඥයන් සහ වානේ වාත්තු කරුවන් ද යන මහා හමුදාවේ ආදිතමයෝ වූහ.

නිදසුනක් ලෙස ආදි කුඹල් කරුවන් ගැන සිතන්න. සොබා දහමෙහි දකින්නට නොලැබුණු අලුත් ගණයේ උපකරණයක් මුලින් ම නිමැවුවෝ ඔවුහුය. ප්‍රාගෛතිහාසික මානවයා ගිනි ගල් පොරොවක් හෝ ඇටමුවා මණ්ඩාවක් හෝ සාදන විට ඔහු යොදා ගත් අමු ද්‍රව්‍යය නිර්මාණය කෙළේ නැත. සැබැවින් ම ඔහු කෙළේ තිබුණු ද්‍රව්‍යයෙක ස්වරූපය වෙනස් කළා පමණි. එහෙත් කුඹල් කරුවාගේ කාරියේ දී සිදු කරන ලද්දේ ඉන් පෙර කිසි දාක නොසිදු වී තිබුණෙකි. හේ මැටි බඳුනක් නිමවා එය ගින්නෙන් පිළිස්සිය. මෙහි දී ගින්න හඳුනා ගන්නට බැරි ලෙස සලස්වමින් මැටි වලට හිමි වූ ස්වාභාවික ගුණය වෙනස් කෙළේය.

මෙසේ කරන්නට කලින් මැටි, වතුර දැමූ හැම විට ම තලපයක් බවට හැරුණේය. එහෙත් පසු ව එය ගින්නෙන් පිළිස්සූ කල වතුරට බිය නොවිය.

ගින්න සතු විස්මය ජනක ගුණයන් සොයා ගනු ලැබූ කල මිනිසා එය මැටි පුලුස්සා ගන්නට, අහර පිස ගන්නට, පාන් පුලුස්සා ගන්නට සහ තඹ උණු කර ගන්නටත් යොදා ගත්තේය.

ඇතැම් ද්‍රව්‍ය වෙනත් ද්‍රව්‍ය බවට පත් කිරීමට

ගින්න යොදා නොගන්නා එක ද කම්හලෙක් වත් වත්මන් ලොවෙහි සොයා ගැනීම ඔබට අපහසු වනු ඇත.

යපසින් යකඩ මිරිකා ගන්නට, වැල්ලෙන් විදුරු සාදා ගන්නට සහ ලියෙන් කඩදාසි සාදා ගන්නටත් ගින්න අපට උදවු කරයි. ලොව පුරා මුළු මහත් වානේ නිපදවන්නෝ ද, රසායනඥයෝ ද වානේ කම්හල් වල දිවා රෑ දැල්වෙන ගින්න පාලනය කරත්. මේ සියලු ම යෝධ උඳුන් වල මූලාරම්භය වූයේ ප්‍රාගෛතිහාසික කුඹල් කරුවා ඔහුගේ හැඩ වැඩ නැති, පටු පතුලක් ඇති බඳුන පලහා ගත් ලිප තුළය.

ධාන්‍ය බීජය සාක්කි කරුවෙකි

ප්‍රාගෛතිහාසික මානව දඩයම් කඳවුරු බිම් වලින් එකෙක අනෙකුත් බොහෝ දේ අතර නොයෙක් වගයේ මැටි බඳුන් පුරා විදු දරුවනට ලැබී ඇත.

ඒ මැටි බඳුන් වල පිට පැත්ත ඉතා සරල ලිය වැල් මෝස්තර වලින් අලංකාර කර තිබිණි. ඇතැම් විද්‍යාඥයෝ මේ මෝස්තර ප්‍රාගෛතිහාසික කුඹල් කරුවන් ඔවුන්ගේ බඳුන් වට මට කර ගත් හා පුලුස්සා ගත් ආකාරයත් දැන ගැනීමට හෝඩුවාවක් වෙතියි විශ්වාස කරති.

වියන ලද බට පතුරු පැසෙක ඇතුළු පැත්තෙහි මැටි තට්ටුවක් ගල්වනු ලැබේ. ඉක්බිති පැස ගින්නට දැමෙයි. අනතුරු ව බට පතුරු පිළිස්සී ගොස් මැටි බඳුනක් ඉතිරි වෙයි. මැටි බඳුන මතු පිට මෝස්තරයක් මතු කෙරෙමින්, පතුරු තද වීමෙන් මැවුණු මෝස්තර ලක්ෂණය දකින්නට ලැබෙයි.

වියන ලද බට පතුරු පැසින් තොර ව මැටි බඳුන් පලහා ගන්නට කුඹල් කරුවන් උගත් කල්හි ඔවුහු නොපලහන ලද මැටි බඳුන් අඛණ්ඩ හරස් කැපුම් ඉරි වලින් අලංකාර කර ගෙන ගියහ. තමන්ගේ නිමැවුම් සිය මිත්තනියන් හා මී මිත්තනියන්ගේ බඳුන් වලට සමාන නොවිණි නම් ඒවායේ නිසි පරිදි ආහාර නොඉදෙති යි ඔවුහු සිතූහ.

හරස් ඉටි කැපුම් වලින්, අලංකාර කැරුණු මැටි බඳුන් බොහෝ තැන් වල දී ලැබී ඇත. ප්‍රංශයේ කැමපිග්නි නගරය අසලින් ලැබුණු එවැනි එක් බඳුනක් බෙහෙවින් ප්‍රසිද්ධියට පත් විය. පුරා විදු දරුවන් එය පිරික්සද්දී ඒ මත බාර්ලි ඇට වලින් කරන ලද ලාඤ්ඡනයක් දකින්නට ලැබිණි.

ඔවුහු සිය සොයා ගැනීම දෙස විමතියෙන් බැලූහ. මේ හුදෙක් ධාන්‍ය බීජයක් ම නොවේ. එහෙත් සාක්කියකි. ප්‍රාගෛතිහාසික මානව පිවිතයේ සිදු වූ බරපතල වෙනස් කම් පිළිබඳ ඉතා සුළු සාක්කියෙකි.

යම් තැනෙක ධාන්‍ය වී ද, එහි කෘෂි කර්මය විය යුතුය. එම පෙදෙසෙහි ම ධාන්‍ය ඇඹරුම් ගල් හා ගිනි ගල් උදලුත් ඔවුනට හමු වී තිබුණේ ඒ නිසයි.

දඩයම් කරුවෝ ද, මසුන් අල්ලන්නෝ ද පැහැදිලි ලෙස ම ගොවියන් බවට ද පත් වී සිටියහ. මෙය සිදු වී තිබුණේ කෙසේ ද?

ආරම්භයේ දී ම ගෝත්‍රයෙක සියලු ම සාමාජිකයෝ දඩයම් කිරීම හෝ මසුන් ඇල්ලීම නොකළහ. මිනිසුන් දඩයම් පිණිස ගිය කල ස්ත්‍රීහු ද, මෙයි ද මැටි බඳුන් හා කුඩ ද අතැති ව කැමට සුදුසු ඕනෑ ම දෙයක් එකතු කර ගන්නට නොයෙක් දේ ඇහිදිමින් ඇවිද්දෝය. ඔවුහු මූහුදු වෙරළේ ද මටටියන් එකතු කළහ. වන පියසේ දී හතුත්, බෙරි වර්ගත්, ගෙඩි ජාතිත් එක් රැස් කළහ. ඔක් ගෙඩි වුවත් කැමට පසු බට නුවූහ. ඔක් ගෙඩි අඹරා පිටි වලින් පෙති පූ පලහා ගත්හ. බොහෝ භාෂා වල දිගු කලක් පාන් යන වචනයට ඔක් ගෙඩිය යන වචනය වහරන ලද්දේ මේ නිසයි.

යම් හෙයකින් ප්‍රාගෛතිහාසික මානව ගෝත්‍රයකට මී වදයක් සොයා ගන්නට ලැබිණි නම් එය ඉමහත් ප්‍රමෝදයකට හේතුවෙක් විය.

බැවුමෙක සොයා ගනු ලැබූ සිත්තමක් ගැහැනියක මී පැනි රැස් කරනු නිරූපණය කරයි. ඇය දැක්වෙන්නේ ගසක් උඩය. එක් අතක් ගස් බෙනයේ වන අතර, අනෙක් අත කළයක් දරයි. කෝපයට

පත් මී මැස්සෝ ඇය වටා බමමින් සිටිත්. එහෙත් පැනි වද ඉවත් කරමින් සිටින හෙයින් ඕ ඔවුන් ගැන සැලකිල්ලක් නොදක්වයි.

ගැහැනුදැ, මෙයිද සිය එක රැස් කිරීම් නිම කොට බෙරිවර්ග, මීපැනි, වල්ඇපල් හා පෙයාර්ස් වලින් බඳුන් පුරවා ගත්තාහු, සුපුරුදු පරිදි ආපසු පැමිණෙත්.

දැන් පේස්තයකට සුදුසු මොහොතයි! එහෙත් ගෘහිනිහු සිය ආහාර තොග එක හුස්මට කා දැමීමට යුහුසුලු නොවෙත්. ඔවුහු මෙයින් එලවා දමා තමනට හැකිතාක් සියලු දේ මුට්ටි, පාත්තර හා බරනි වල ගබඩා කරත්. දඩයම් ගොදුර කවර දාකවත් සහතික කළ හැක්කක් නොවූ හෙයින් මේ ආහාර ගබඩා සඳහට ම අත මෙහ විචෘත ව තිබිණි. උණුසුම් දේශ ගුණය මිනිසා යළිත් එක් රැස් කරන්නකු බවට පත් කෙළේය. මෙය ආපසු පියවරක් ලෙස පෙනේ. සැබැවින් ම එය එසේ නොව ඉදිරි පිම්මෙකි. එයට හේතුව ගොවිතැන් කරන්නා, ඔබ මොබ ඇවිද යමක් ඇහිඳ එක් රැස් කරන්නාගෙන් වෙන් කෙරෙන ඉම තරණය කොට ධාන්‍ය වැපිරීමේ අවස්ථාවට පැමිණීමයි.

ස්ත්‍රීහු පලතුරු සහ බෙරි වර්ගත්, බාර්ලි සහ තිරිඟු වැනි එවක, වන තෘණ ගණයේ ධාන්‍ය වර්ගත් ගෙන ආහ. ඒවා ඔවුහු මුට්ටි, කළ ගෙඩි හෝ පැස් වලත් දමා තැන්පත් කළහ. එහෙත් ධාන්‍ය පහසුවෙන් විසිරී යන හෙයින් ඇතැම් ධාන්‍ය ඇට නිසැකයෙන් ම පැළ වී වැඩෙන්නට ඇත.

මුල් වරට මිනිසුන් තමන් එක් රැස් කර ගත් ධාන්‍ය වලින් බීඳක් ඔබ මොබ ඉහිරවා දැමීමෙන් වැපිරීමක් කරන ලද නම් ඒ අහම්බෙනි. එහෙත් ඉන් අත් දැකීමක් ලද ඔවුහු හිතා මතා වැපිරීමේ පරමාර්ථයෙන් ධාන්‍ය ඉසීමට පටන් ගත්හ.

බොහෝ මිනිස්සු අදත් වළ ලන ලද හා පුනර්පිළිය ලද ධාන්‍ය ගැන වූ මිථ්‍යා ප්‍රබන්ධ හා පුරාවෘත්ත රැක ගෙන සිටිත්.

පුරාතන සමයයන්හි දී ස්ත්‍රීහු උදලු වලින් පො-



ලොව කොටා ධාන්‍ය පස් යට කළහ. එසේ කරමින් ඔවුන් විශ්වාස කෙළේ තමන් ගුප්ත වූ දෙවියකු පස් යට නිදන් කළ බවත්, රන් වන් ධාන්‍ය කරල් මහින් එම දෙවියන් යළිත් තමන් වෙත සැපත් වන බවත්ය. වසත් සමයේ දී අස්වනු නෙළා ගන්නා විට ඔවුහු මිහි ගබ තුළ වූ ලොව සිට දෙවියන්ගේ සැපත් විම ගැන උත්සව පැවැත්වූහ.

කරලින් බර වූ අන්තිම ධාන්‍ය ගස් මිටිය බැඳ පොළොව මත දමා ඒ වටා ඔවුන් ගී ගයන්නටත්, නැටුම් නටන්නටත් ඇත. සැබැවින් ම හුදෙක් මෙය නැටුමෙක් ම නොවිණ. එය පූජෝපහාරයෙක් වූ-යේය. ස්ත්‍රීහු ධාන්‍ය දෙවියා මළවුන්ගෙන් නැඟිට තමන් වෙත ආපසු ඒම නිසා තුති ගී ගැයූහ. ඔවුහු තමනට දැන් මෙන් සදහට ම පරිත්‍යාගශීලි වන ලෙස මහි මාතාවට ආයාචනය කළහ.

වර්තමානය තුළ අතීතය

ඉමක් කොනක් නැති අන්ධ විශ්වාස හා අවි-චාරවත් මතිමතාන්තර අනාදිමත් කාලයෙක සිට අප අතට පත් ව ඇත.

යම් හෙයකින් අශ්ව ලාඩමක් අහම්බෙන් හමු වුණොත් සුබ නිමිත්තක් ලෙසත්, වම් උර හිසට උඩින් නව සඳ දකින්නට ලැබුණොත් අසුබ නිමිත්-තක් ලෙසත් විශ්වාස කරන අපමණ මිනිස් සංහ-තියක් තවමත් සිටිත්.

ඔක්තෝබර් විප්ලවයට පෙර කල්හි සිය ගමේ ගැහැනුන් කුකුළු කුඩු වලට උඩින් ''කුකුළු දෙවියකු'' එල්ලා තැබීමට පුරුදු ව සිටි බව, උග්ලිච්හි සමූහ ගොවි පොළෙක ස්ත්‍රියක් කිවාය.

මේ කුකුළු දෙවියා වූයේ මැදින් සිදුරක් සහිත සෙල්ලුවා වූවෙකි. කිකිළියන් ලවා වඩාත් හොඳින් බිපු දම්මනු පිණිස මේ දෙවියා එසේ එල්ලන ලදී.

අන්ධ විශ්වාසයන් වසර සිය දහස් ගණන් තුළ පැවතුණු ආකාරයට මේ එක් නිදසුනෙකි. සෙල්-ලුවා කුකුළු දෙවියා ගල් යුගයෙන් ඇබිත්තකි. එහෙත් එය විසි වැනි සිය වස පටන් ගනිද්දීත් රුසියාවේ පිවමාන විය.

අරුම පුදුම සුරැකුම්
පොළ

මුල දී මිනිස්සු මස් හා හම් පිණිස ගව පට්ටි තබා ගත්හ. ඔවුන් මුල දී ගවයන් බෝ කිරීමෙන් ලද හැකි ඉමහත් වාසිය දැන සිටියේ නැත. දඩයම් කරුවන් මේ කුර සහිත සතුන් දෙස බැලුවේ සිය ගොදුර ලෙසය. එහෙයින් සිය ගොදුර මරා ගැනීමට පුරුදු වූහ. එළදෙනක් හෝ බැටළු දෙනක් තබා ගැනීම, මරනුවට වඩා වාසි දායක බව තේරුම් ගැනීම, ඔවුනට එතරම් පහසු නොවීය.

එළදෙනකගේ මස් ඔබට කෑ හැකි වන්නේ එක් වරක් පමණි. එහෙත් එළදෙනකගෙන් අවුරුදු කීපයක් කිරි බොන්නට පුළුවන. ඉදින් ඔවුහු එළදෙන නොමැරුවෝ නම්, ඇය වසරක් පාසා පැටවුන් වදන හෙයින්, ඇගෙන් වැඩි පුර මස් ලබා ගත හැකි විය.

මිනිසා එළදෙනුන්, බැටළුවන් සහ අසුන් හිලෑ කර ගැනීමෙන් පසු, තමා රිසි පරිදි ඔවුන් වැඩි කර ගැනීමට පටන් ගති. ඒ සඳහා ඔවුන් පෝෂණය කළ යුතු බවත්, සිතලයෙන් රැක ගත යුතු බවත් දුටුවේය. එහෙත් එයට වන්දි වශයෙන් පෙරට වඩා කිරි සපයන්නට එළදෙනට සිදු විය. එයට හේතුව දැන් ඇයට සිය පැටවා පමණක් නොව, ස්වාමියා ද පෝෂණය කරන්නට සිදු වීමයි. යථා කාලයේ දී අශ්වයා සිය ස්වාමියා වෙනුවෙන් බර උසුලන්නට උගත්තේය. මේ වන විට බැටළුවාට ද, තමාටත් තම ස්වාමි වරුනටත් ප්‍රමාණවත් සේ ලොම් සපයන්නට හැකි වී තිබිණ.

හොඳ ම කිරි දෙන්නු ද, ශක්ති සම්පන්නතම අශ්වයෝ ද, දිර්ඝතම ලොම් ඇති බැටළුවෝ ද පමණක් රංචු වල ඉතිරි කරනු ලැබූහ. මේ නයින් ගෘහ වාසී සිවු පාවුන්ගේ නවතම වර්ගයන්ගේ බෝ වීමට කටයුතු යෙදිණ.

මිනිසා මේ සියලු තත්ත්වයනට එක් වර ම

වහා පිව්සියේ නැත. දඩයම් කරුට ගොවියකු වීමට සිය වස් බොහෝ ගණනක් ගෙවන්නට සිදු විය.

ඉදින් අන්තිමට කිමෙක් සිදු වී ද?

මිනිස්සු අරුම පුදුම සුරැකුම් පොළක් සොයා ගත්හ. ඔවුහු තමන් රැස් කර ධාන්‍ය මිහිදන් කළහ. ඉක්බිති මහ පොළොව ඔවුන් මිහිදන් කළ එක එක ධාන්‍ය ඇටයක් වෙනුවට විශාල ධාන්‍ය ඇට ප්‍රමාණයක් බැගින් ආපසු දුන්නේය.

මිනිස්සු තමන් අල්ලා ගත් සියලු ම සතුන් නොමැරුහ. නොමරන ලද්දවුන් පෝෂණය කොට බෝ කළහ.

මිනිසා වඩාත් නිදහස් බවට පත් වන විට තමා හුදෙක් සොබා දහමින් පමණක් යැපෙන්නකු නොවන බව වටහා ගත්තේය. මීට පෙර කිසි දාක තමාට සතකු උගුලට අසු කොට මරා ගත හැකි වේ ද? නොවේ දැ? යි ඔහු දැන සිටියේ නැත. තමාගේ පැස පිරෙන්නට තරම් ධාන්‍ය ටිකක් සොයා ගත හැකි වේ ද? නොවේ දැ? යි යන්නවත් ඔහු දැන සිටියේ නැත. ඔහු දන්නා තරමින් සොබා දහමේ අබිරහස් බල වේගයනට ඔහුගේ කැමැත්ත වේල දෙන්නට හෝ නොදෙන්නට හැකි විය. මේ වන විට සොබා දහමට උපකාර කරන්නට මිනිසා ඉගෙන තිබිණි. තමාගේ ධාන්‍ය තමා ම වගා කර ගන්නටත්, තමාට අවශ්‍ය බැටළුවන් හා දෙනුන් තමා ම බෝ කර ගන්නටත් හේ ඉගෙන සිටියේය. ස්ත්‍රීනට තව දුරටත් වනයෙහි ධාන්‍ය තෘණ වර්ග සොයන්නට වුවමනා නොවිය. දඩයම් කරුවනට තම කල දවස වල් සතුන් සොයමින් සහ උගුල් අටවමින් වනයට ගෙවා දමන්නට සිදු වූයේ නැත.

මේ වන විට ධාන්‍ය කරල් නිවහන් අසල, සුළඟින් ලෙළ දුන්නේය. ඒ අතර එළදෙන්නු ද බැටළුවෝ ද නුදුරේ තණ උලා කෑහ.

මිනිසා අරුම පුදුම සුරැකුම් පොළක් සොයා ගෙන තිබිණ. තව ද ඔහු එය එක් සැණෙකින් සොයා ගත්හ යි කියතොත් නිවැරදි නොවේ. ඔහු එය

නිර්මාණය කර ගත්තේ කාලයාගේ ඇවැමත් සමහ සිය පරිශ්‍රමයෙනි.

සිය ගොවි බිම් සහ තණ පිටි සඳහා ඔහුට ඉඩ කඩ වුවමනා විය. එම ඉඩ කඩ වනය හා සටන් කොට දිනා ගත යුතු වූයේය. වැපිරීමට පෙර පොළොව සකසා ගත යුතු විය. සැබැවින් ම මෙය කොතරම් වෙහෙසකර කාරියෙක් වී ද!

මිනිසා සොබා දහම ජය ගනිමින් සිය ස්වාධීනත්වය සහ ස්වෛරීත්වය කරා, සැඳෑ සවාරියකට පියමන් කරන්නා සේ ගමන් කෙළේ නැත. දහස් ගණන් බාධක මඩිමින් සිය ගමන් මහෙහි නොයෙක් සුණු විසුණු කිරීම් කරන්නට ඔහුට සිදු විය. ඔහුගේ නව උද්යෝගයෙහි එයට ම උරුම වූ දුක් දොම්නස් හා සුව සොම්නස් ද තිබිණ. ඔහුගේ අස්වනු දවා ලන්නට හිරුට හැකි වූයේය. තණ පිටි වල නිල් තණ ඇතිරිය වියළ වන්නට ද එයට හැකි වූයේය. අධික වර්ෂා පතනයට ඔහුගේ ධාන්‍ය කුණු කර දමන්නට හැකි විය.

ප්‍රාග්ඓතිහාසික දඩයම් කරුවා බයිසන් ගවයාට හෝ වලසාට සිය මස් කොටස පිණිස යැද්දේය. ප්‍රාග්ඓතිහාසික ගොවියා මහ පොළොවට, අහසට, හිරුට හා වැස්සටත් තමාට හොඳ අස්වැන්නක් දෙන ලෙසට අයැදියේය.



කාලය නමැති ඔරලෝසුවේ කටු ඉදිරියට කැරකෙයි

අපි දැන් කාලය නමැති ඔරලෝසුවේ කටු දහස් වසර කිපයෙකින් ඉදිරියට කරකවමු. එවිට අපි නූතන අවදියෙන් සිය වස් පනහකින් පමණ ආපසු ව සිටිමු.

පුදුමයෙකි! සිය වස් පනහක්! පුද්ගලයකුගේ ජීවිතය හෝ ජාතියෙක ඉතිහාසය ගැන කතා කරන විට මේ ඉතා දිගු කලෙකි. එහෙත් අප මෙහි දී කතා කරන්නේ කිසිදු එක මිනිසකු ගැන නොවේ. මුළු මානව සංහතිය ම ගැනයි.

මානව සංහතියට වසර දස ලක්ෂයකට කිට්ටු වයසක් ඇත්තේය. සිය වස් පනහක් යනු එතරම් දිගු කාල පරිච්ඡේදයක් නොවන්නේ ඒ නිසාය.

මහ පොළොවේ සුදු පැහැති හිම වැස්ම වටා සපුරා, කැරැලි ගැසී ගිය හරිත වනාන්තර වැඩුණු සමයයෙක් විය. ඉක්බිති වනයන් තුනී බවට යද්දී, ඒ අතරින් පුළුල් තෘණ ප්‍රදේශයෝ ඇතුළට පැතිර ගියෝය. ඒ අතර අතන මෙතන වන ලැහැබහු එලි මහන් පෙදෙස් විසින් මඩිනු ලද්දාහ. ගංගා හා විල් අසල වනයෝ බට වර්ග හා පඳුරු වලටත් ඉඩ දෙමින් පසු බැස්සාහ.

එහෙත් ගංගා වංගුව අසල කඳු මතු පිට ගැන කුමක් කිය හැකි ද? එය කඳු බැටුම මත විසුරුවා ලූ කසාවන් රෙදි කඩක් සේ දිස් විය.

ඒ මිනිස් අත් වලින්, වෙනස් මුහුණුවරක් ගත් බිම කඩෙකි. අපි එහි රන් වන් ධාන්‍ය කරල් මැද නැමී අස්වනු නෙළන ගෙවිලියන්ගේ වක් කොඳු පිටු දකිමු. අස්වනු නෙළෙද්දි ඔවුන්ගේ දෑකැති සෙදින් ලෙළෙයි.

මෙසේ අපට අහම්බෙන් හමු වුණු කෙත ලෝකයේ මුල් ම කෙත් වලින් එකෙකි. ලෝකය නමැති මහා වනාන්තරය තුළ තවමත් එවැනි කසාවන් රෙදි කඩ ඉතා සුළු ගණනක් ඇත.

ඉදින් යම් තැනෙක කෙත් ද, ගව, එළු හා බැටළු පට්ටි ද වෙත් නම් ඒ අසල ගම්මානයෙක් ද විය

යුතුය. මෙහි දී එම මිනිස් ගම්මානය උස් ගං ඉවුරේ වෙයි. අනෙක් තන්හි දී මෙන් මෙය දඩයම් කරුවන්ගේ කුඩාරම් කඳවුරෙක් නොවේ. කනු හා ගස් අතු වලින් තනන ලද පැල්පත් මෙහි නැත. ඒ වෙනුවට කුළු ගේ සහිත එහලින් යුත් දැවමුවා ගෙවල් ඇත. බිත්ති මැටියෙන් කපලාරු කැරුණේය. නිවහනට පිවිසෙන තැනට උඩින්, එහලේ පරාලයක් ඉදිරියට නෙරා ඇත. එය කැටයම් කළ ගව හිසක් දරයි. ඒ මේ නිවහන අරක් ගත් දෙවියාය. මුළු මිනිස් ගම්මානය උස් වැටෙකින් හා මැටි පවුරෙකින් ද වට කොට ඇත.

අපි ගම්මානයෙන් පිටත් ව ගහ දෙසට යමු. ගං ඉවුර බද නොගැඹුරු දියෙහි දිය පිරුණු ඔරුවක් පැද්දෙයි. අප ගහ පටන් ගන්නා විල වෙත ඉස්මත්තට පිය නැහුවොත් අපට වෙනත් ගම්මානයෙක් හමු වනු ඇත. එහෙත් එය පළමුවැන්නෙන් සපුරා වෙනසි. මේ දෙවැනි ගම්මානය දූපතක් හා සමාන වෙයි.

පළමුවෙන් විල් පත්ලේ කනු සිටුවන ලදි. ලී කොට කනු මුදුන් වලට වැද්දුණේය. කොට වලින් සැදුණු තට්ටුව මත කෙළින් අතට ලෑලි සවි කොට තිබේ. විල් ඉවුරේ සිට දැවමුවා දූවට පැද්දෙන පාලම දමා ඇත. අසල මාළු දැල් හා ධීවර ආම්පන්න වේලෙමින් තිබේ. විල මසුන්ගෙන් ගහන වූවා විය හැකිය. එහෙත් මේ ගම් වැසියෝ හුදෙක් ධීවරයෝ පමණක් නොවෙත්. ගෙවල් අතර අතන මෙතැන, උල් වූ වහල සහිත වෘත්තාකාර ධාන්‍ය බිසි අපට හමු වෙයි.

හුදෙක් කල්පිත ලෙස, මේ පුරාතන ගම්මානය සපුරා සැබෑ සේ පෙනෙනත් එය දිගු කලක් තුළ දූවිල්ලට හැරී ගියේය. ඉහත කී ගෙවල පියසි මුදුන් ද වසා ගෙන දිය කඳ පැතිර ඇත. ඉදින් අපි මේ නිවහන් වල නටබුන් විල් පත්ලේ කෙසේ සොයමු ද? එය කෙසේ වත් නොකළ හැක්කක් සේ පෙනේ. එහෙත් විලක් සිය වස් ගණනක් තුළ රැකි රහස් අප ඉදිරී පිට හෙලි කොට හුවා දැක්වීම ඇතැම් විට සිදු වන්නෙකි.

පුරා විදු දරුවෝ මැත දී ස්විට්සර්ලන්තයේ නිව් චාටල් විල අධ්‍යයනය කළහ. ඔවුහු විල් පත්ලේ සාම්පල ගෙන එමහින් එය තට්ටු කීපයෙකින් නිමැවී ඇති බව සොයා ගත්හ.

ඉදින් මේ සියලු තට්ටු තැන්පත් වූයේ කෙසේ ද? වැලි තැන්පත් වූයේ කෙසේ ද? වැලි තැන්පත් කිරීම පමණක් නම් චතුරට කල හැකිය. එසේ නම් අහුරු කොහෙන් ද? එය ආ හැකි ව තිබුණේ ගින්නෙකින් පමණි.

පුරා විදු දරුවෝ තැන්පත් ද්‍රව්‍ය තට්ටු පිළිබඳ සියුම් අධ්‍යයනයෙකින් පසු විලේ යට ගියාව එටහා ගත්හ. මිනිස්සු ඇත අතීතයේ වරෙක විල වෙත අවුත් ඉවුර දිගේ ගම්මානයක් ගොඩ නහා ගත්හ. ඉක්බිති බොහෝ වසර ගණනකට පසු විල පිටාර ගොස් ඉවුර ගං චතුරට යට විය.

මිනිස්සු ගං වතුරින් යට වූ සිය ගම්මානය අත් හැර දැමූහ. ගොඩ නැඟිලි දිරා ගොස් දිය තුළ පතිත විය. වරෙක දිය ලිහිණියන් සිය කැදලි තනා ගනු ලැබූ පරාල වල අහු මුලු, සිය පාසල් බවට පත් කර ගත්තා සේ, කුඩා මස්සු හනික ඔබ මොබ විනිවිද ගියහ. තියුණු දත් ඇති පයික් මාළුවෝ, එදා මිනිස් නිවහනෙක දොරින් හෙමිහිට පිනා ඉවතට ගියහ. පොකිරිස්සෝ එදා උදුන පසෙකින් වූ බංකුව යට සිය අඬු බඬු වැනුහ. කල් නොයා දී නටබුන් රැස මඩ තට්ටුව විසින් වැලලී ගියේ වැල්ලෙන් ද යට විය.

යථා කාලයේ දී විලේ තත්ත්වය වෙනස් විය. පතුල අනාවරණය කරමින් ඉවුරු වලින් දිය කඳ බැස ගියේය. වැලි කණ්ඩිය යළිත් මතු වී පෙනිණ. වැල්ල විසින් නටබුන් වළලා ගනු ලැබුයෙන් ගම්මානයක් කොහෙත් ම දැක ගනු නොහැකි විය.

මිනිස්සු යළිත් විල් ඉවුරසට ආහ. පොරෝ පහර පතිත වන හඬින් අවට පරිසරය පිරී ගියේය. කසාවන් වැලි තලාව මත කැපුම් පෙති අනන මෙතන පතිත විය. එකකට පසු එකක් බැගින් සවිමත් නව නිවෙස් පෙර සේ විල් ඉවුරේ ඉදි වන්නට විය.

වරින් වර එක් පසෙකින් අනෙක් පසට ජයග්‍රහණය මාරු වෙමින් මිනිසුන් හා විලත් අතර සටන නොකඩවා පැවතිණ. මිනිස්සු විල් ඉවුරේ සිය නිවෙස් ඉදි කළහ. විල ඒවා විනාශ කර දැමීය.

අවසන්හි මිනිස්සු සටනින් වෙහෙසට පත් වූහ. ඔවුහු පෙර සේ විල් ඉවුරේ නොව ජල තලය මත සිය නිවෙස් ඉදි කරන්නට තීරණය කළහ. ඉක්බිති උස යෝද කනු විල් පත්ලට බැස්සෙමින් සිටුවිණ. ඒ මත පුවරු වැස්මෙකින් ගෙබිම සැකසිණ. පුවරු වැස්මේ හිදැස් අතරින්, යටින් ඇත දිය කැලතෙනු ඔවුනට දකිනු හැකි විය. එහෙත් දැන් ඔවුනට කනස්සලු වන්නට හේතුවෙක් නැත. වුවමනා තරම් ඉහළට නැහිය හැකි වුවත් ජලය කිසි දාක පුවරු වැස්මට කිට්ටු නොකෙළේය.

කෙසේ වෙතත් විල් ගම් වැසියනට වෙනත් සතුරෙක් සිටියේය. එනම් ගින්දරයි.

ප්‍රාග්ඓතිහාසික ලෙන් වැසි මානවයෝ ගින්නෙන් බිය නුවූහ. ඔවුන්ගේ ලෙන්හි ගල් බිත්ති කිසි දාක නොදැවෙන නිසයි.

එහෙත් පළමු වන දැවමුවා නිවෙස් නිමැවූ විගසින් ම පළමු වන ගින්න ද කඩා වැටුණේය. එතරම් බොහෝ දහස් වසර ගණනාවක් කිකරු ව මිනිසාට මෙහෙ කර සිටි රක්ත වර්ණ අග්නි මාරයා දැන් සිය තියුණු දළ පහර ස්වාමියාට එල්ල කෙළේය.

නිව් එාටල් විල් පත්ලේ හමු වුණු ගන අඟුරු තට්ටුව එවන් පුරාතන ගින්නෙක ප්‍රතිඵලයෙකි.

සැබැවින් ම ගින්න මහ විපතෙක් විය.

එහෙත් ගැමියන්ගේ නිවෙස් දවා ලූ එම ගින්න ම අපේ කටු ගෙවල් සඳහා අමිල වූ ද්‍රව්‍ය ආරක්ෂා කොට තැබිය. මේවා නම් දැවමුවා ගෙදර දොර උපකරණ, මාළු දැල්, ධාන්‍ය ඇට හා පැළැටි දඬු ද වෙයි.

සෙදින් ගිනි ගෙන දැවෙන එවන් දෑ රැකුණේ කවර නම් පෙළහරෙකින් ද!

සිදු වූයේ මෙයයි. නොයෙක් දෑ ගිනි ගනිද්දි

ඒවා දියට වැටිණ. එවිට නිවී ගියෙන් ජලය විසින් ඒවා රැකිණ. වෙනත් කරදරයෙකින් තොර ව ඒවා පතුලේ ගිලී ගියේය. ඒවාට අලුත් අනතුරක් සිදු වන්නට තිබිණ. ඒ දිය තුළ දිරාපත් වීමයි. මේ දෙවැනි අනතුරේ දී ඒවා රැකුණු සාධකය නම් ඒවා යන්තම් දැවී අඟුරු බවට පත් ව තිබීමයි. තුනී අඟුරු තට්ටුව ඒවා දිරා යාම වැලකීය.

ගින්දරත් ජලයත් වෙන වෙන ම ක්‍රියා කෙළේ නම් සැබැවින් ම මේ සියලු දෑ විනාශ වන්නට තිබිණි. එහෙත් සහයෝගයෙන් ක්‍රියා කිරීමෙන් ගින්න හා ජලය යන දෙක, වසර දහස් ගණනකට පෙර වියන ලද ලිනන් රෙදි කඩක් මෙන්, පහසුවෙන් දැවෙන සුලු යට කි දෑ අද තෙක් රැක ගත්තේය.

ලෝකයේ මුලින් ම විසූ රෙද්ද

ලෝකයේ මුල් ම රෙද්ද අතින් වියන ලද්දෙකි. එස්කිමෝ වරු අදත් රෙදි වියමනේ ලා මැසිමක් නොගනිති. ඔවුන් සිය රෙදි විසා ගන්නේ අතිනි. ඔවුහු දික් අත නුල් රාමුවක ඇද ගනිති. ඉක්බිති හරස් නුල් ඉත්තකු යොදා නොගෙන අතින් පන්නා ගැනේ. වියා ගෙන යන රෙද්ද සමඟ වූ මේ කුඩා ලී රාමුව නූතන අත් යන්ත්‍රයක් හා සසඳනු අපහසුය. එසේ වුවත් නූතන අත් යන්ත්‍රය සිය මුල පටන් ගෙන ඇත්තේ මේ ඉතා සරල ලී රාමුවෙනි.

මානව පිවිතයේ බෙහෙවින් වැදගත් සිදු වීමක්, විල් පත්ලින් ලැබුණු දැව්, කළු වී ගිය කඩ මාල්ලක් අපට කියයි. නිතර සිවු පා හම් ඇදි මිනිසා දැන් තමා වසුරා නෙළා ගත් හණ වලින් තෙමේ ම රෙද්දක් වියා ගත් අයුරු ඉන් පෙන්නුම් කෙරේ.

රෙද්දක් නිමැවීමට වසර දහස් කිපයකට පෙර නිමැවුණු ඉදි කටුව, අවසානයේ දී මිනිස් දිවියේ තමාට නිසි තැන ලබා ගති. එය, සිවු පා සම් නොව නොයෙක් ද්‍රව්‍ය කැබලි එකට මැසීමට පටන් ගත්තේය.

පියකරු, නිල්වන් මලින් බර හණ කුඹුරු ගෘහිනියන්ගේ කනස්සල්ලත්, අවධානයත් පිළිබිඹු කෙ-

ලේය. අස්වනු නෙළා ගැනීමෙදි ඔවුන්ගේ අත් දඬු දැඩි සේ රිදුම් ගත්තේය. තව ද හණ ටික බෙරා ගැනීමට සැහෙන කාලයක් ගත විය. පළමුවෙන් හැම ගසක් ම මූලත් සමඟ උදුරා ගැනීමට ඔවුනට සිදු විය. ඉක්බිති වියළිය යුතුය.

රෙද්දක් වියා ගැනීමට කළ යුතු වැඩ රැසෙක් වූයේය. එහෙත් ගැහැනුනට තමන් විඳි වෙහෙස ප්‍රදර්ශනය කරන්නට මෙන් නන් වන් දාවලු හා වාට් බෝඩර සහිත පියකරු පට කඩ, ඉහ වැසුම් හා සාය ද විය.

මුල් ම පතල් කරුවන් හා වානේ කරුවෝ

මුල් ම තඹ මෙවලම්, විල් පත්ලේ ගිනි ගල් මෙවලම් සමඟ අපට හමු වෙයි.

වසර සිය දහස් ගණනක් තිස්සේ සිය මෙවලම් ගලින් නිමවා ගනිමින් සිටි මිනිසාට හදිසියෙන් ම ඒවා ලෝහයෙන් තනා ගැනීමට හැකි වූයේ කෙසේ ද? අනෙක් අතට ඔහුට වුවමනා කළ ලෝහ ඔහුට ම සොයා ගත හැකි වූයේ කොහෙන් ද?

ඉදින් අපි කෙත්, වතු හෝ කැලෑ මැදින් ඇවිදිමු නම් අපට කිසි දාක පිරිසිදු තඹ ගුලියක් හමු නොවේ. එත්මන්හි ස්වාභාවික තඹ ඉතා දුලබ දෙයෙකි. එහෙත් හැම විට ම තත්ත්වය මෙසේ නොවිය. වසර දහස් කීපයකට පෙර දැනට වඩා වුවමනා-වටත් වැඩියෙන් මිහි පිට තඹ තිබිණි. සැබවින් ම ඒ පයට පැගෙමින් තැන්පත් ව තිබිණි. එහෙත් මිනි-සා ඒ කෙරෙහි අවධානය යොමු නොකෙළේය. සිය මෙවලම් තනා ගන්නට ගිනි ගල් තිබුණු හෙයිනි.

ගිනි ගල් හිඟයක් දැනෙන්නට පටන් නොගන්නා කුරු ඔවුහු මෙවන් තඹ ගැන ගණන් ගැනීමක් නොකළහ. කවර දාක වත් කිසුදු මසුරු කමෙකින් පරිහරණය නොකළ හෙයින් මේ ගිනි ගල් හිඟය ගැන වග කිය යුත්තෝ ද ඒ මිනිස්සු සය. ඔවුන් අලුත් අවියක් තනන විසින් මුලින් ම විශාල ගිනි ගල් කුට්ටියක් ගෙන කුඩා කැබලි කඩ – කඩා ඉවත් කරන විට අන්තිමට පුංචි මෙවලමක් මිස අන් යමක් ඉතිරි

නොවන්නට ඇත. කි සිදු මෙවලමක් තනා ගන්නට නුසුදුසු ගිනි ගල් කැබලි හා පතුරු ගොඩවල් ඔවුන්ගේ නිවහන් වටා ගොඩ ගැසිණ. වඩු කම්හලක් අද වුවත් ලී කුඩු, කැබලි හා තිරු වලින් පිරී ඇති බව ඔබට කියන්නට පුළුවන.

වසර සිය දහස් ගණනක වූ කාලයාගේ ඇවැමෙන් එවන් සුලබ වූ ගිනි ගල් තැන්පතු ක්ෂය වී ගියේය. මේ නයින් බොහෝ රට වල ගිනි ගල් සාගතය ඇති විය. මෙය බිහිසුණු ව්‍යසනයෙක් වූයේය. ප්‍රාගෛතිහාසික මානවයෝ ලෝකයේ මුල් ම පතල් කනින්නට පටන් ගත්හ.

ගිනි ගල් හා හුණු ගල් ද නිරන්තරයෙන් සහගාමීන් වන නිසා හුණු ගල් තැන්පතු අතර, ගිනි ගල් හාරන්නට යොදා ගත් අවි වල මිටි ඇතැම් විට හමු වී ඇත. එසමයෙහි මිහි මතු පිට සිට අඩි තිහ හතළිහක් යට වැඩ කිරීම සාතිශය බිය ජනක කාරියෙක් විය. මිනිස්සු කඹයෙක හෝ කත්තු කැපූ ලියෙක උදවු-වෙන් පතල තුළට බැස්සාහ. පතල තුළ අඳුරු ද දුම් සහිත ද විය. මිනිස්සු ඇවිලෙන ලී කිරි පන්දමෙක හෝ කුඩා තෙල් කුප්පි ලාම්පුවෙක උපකාරයෙන් වැඩ කළහ. එත්මන්හි පතල් හා දෝනාවන්හි යොදා ඇති ආරක්ෂක උපායයන්හි ලා ශක්ති සම්පන්න දැව දඬු යොදා ගෙන ඇත. එහෙත් එදා මිහි කුස උමහක් තුළ බිත්ති හා සිලිම සවි ගැන්වීම ගැන කිසිවකු කිසිවක් දැන සිටියේ නැත. නිරතුරු ව ම බුරුල් ව ඇද හැළෙන සුවිසල් ගල් කුට්ටියක්, පතල් කරුවන් එතුළ මිහිදන් කර දමනු ඇත. ආදිතම ගිනි ගල් පතල් තුළ සුවිසල් හුණු ගල් කුට්ටි යට මිහිදන් වූ පතල් කරුවන්ගේ පොඩි පටටම් වී ගිය ඇට සැකිලි හමු වී ඇත. ඒවාට ඉක්බිති ව මුව අඟින් නිමි, යටුල් වැනි, ඔවුන්ගේ මෙවලම් විය.

කෙසේ හෝ වෙතත්, ප්‍රාගෛතිහාසික මානවයාට ගිනි ගල් වෙනුවට අනුප්‍රාප්තිකයකු සොයන්නට සිදු විය. ඔහු බෙරා ගැනීමට ස්වාභාවික තඹ ඉදිරිපත් වීමෙන් කාරිය පිරී මැසිණ. මේ කොළ පැහැති ගල කිමෙක් ද? කිසියම් කාරියකට එය යොදා ගත හැකි ද? යනුවෙන් මිනිස්සු වඩාත් ළං ව එදෙස බලන්නට වන්හ.

ඔවුහු තඹ ද පාෂාණයක් ලෙස සැලකුයෙන් පිරිසිදු තඹ කැබැල්ලක් ලැබුණු විට පාෂාණ වලින් වැඩ ගත්තාක් මෙන් මෙවලම් තනන්නට සිතා එය තළන්නට පටන් ගත්හ. මෙහි දී ගිනි ගල් මිටි පහර තඹ කුට්ටිය වඩාත් තද බවට පත් කරමින් එහි හැඩය වෙනස් කෙළේය. එහෙත් එය තැළීමට එක්තරා සුදුසු ක්‍රමයෙක් තිබිණ. ඉදින් මිටි පහර ඉතා තද වී නම් තඹ වහා කැඩෙන්නටත්, පතුරු යන්නටත් විය.

මිනිසා පළමුවෙන් ම ලෝහයෙන් වැඩ කරන්නට පටන් ගත්තේ එසේය. සැබැවින් ම මෙය අමු අමුවේ තැළීමෙකි. එහෙත් තඹ උණු කොට තැළීම අරඹන්නට වැඩි කලෙක් ගත නොවීය.

ඇතැම් විටෙක පිරිසිදු තඹ කැබැල්ලෙක් හෝ ලෝපස් ටිකෙක් ගින්නට වැටිණ. නැතහොත් කිසිවෙක් මැටි බඳුන් පලහන්නා සේ තඹ ද පලහන්නට තැත් කෙළේය. මෙහි දී ගින්න නිවී ගිය පසු උදුනේ ගල් හා අළු අතර උණු වූ තඹ ගුලි දකින්නට ලැබිණ.

ඉක්බිති තඹ ගුලියක් කැලි වලට කඩනු ලැබ, ගිනි ගල් මිටියෙන් තළා හැඩ ගන්වන ලද්දේ පොරෝ හිස්, යවුල් හා කොට කඩු ද බවට පත් විය.

මේ අයුරින් මිනිසාට මිහි කුස නමැති අරුම පුදුම ගබඩා ගෙහි දැඩි වූ දිදුලන ලෝහයෙක් හමු විය. ඔහු විසින් ලෝ පස් කුට්ටියක් ගින්නට දැමූ කල තඹ ගුලියක් ලෙස ආපසු ආයේය.

හූදෙක් මානව ශ්‍රමය විසින් ම මේ පෙළහර පාන ලදී.

රුසියාවේ මුල් ම ගොව්යෝ

දහ නව වැනි සිය වස අග දී වී. ඉ්වෝයිකෝ නම් රුසියානු පුරා විදු දරුවෙක් ත්‍රිපොලි නම් ගම අසල කිවි පෙදෙසේ ප්‍රාග්ඓතිහාසික කෘෂිකාර්මික ජනපදයෙක නටඹුන් සොයා ගත්තේය.

ඉක්බිති තවත් එබඳු බොහෝ ගම් වල නටඹුන් දකුණු රුසියාවේ සොයා ගන්නා ලදී.

අනතුරු ව සෝවියට් සමයේ දී වී. පසෙක් හා බී. බොගයෙව්ස්කි ද මේ අධ්‍යයනයන් දිගට ම කර ගෙන ගියහ. අවුරුදු පන්දහසකට පෙර ගොව්යෝ කෙසේ ජීවත් වූවෝ දැ යි සිතා ගන්නට හැකි කරවීමට ඔවුන්ගේ සේවීම් අපට උදව් කරයි.

ප්‍රාග්ඓතිහාසික ගම් උස වැටෙකින් වට කොට තිබිණ. ගම් මැද කොටුවක් සමඟ වූ චතුරශ්‍රයෙක් විය. චතුරශ්‍රය සපුරා වට කොට ලීයෙන් තැනූ ගෙවල් තිබිණ. ඒවායේ වහළ උල් විය.

වසර දහස් ගණනකට පෙර තනන ලද ගෙයෙක කුඩා මැටි ආකෘතියෙක් සොයා ගෙන ඇත. එය ආගමික චාරිත්‍ර උත්සවයෙක දී පාවිච්චි කරන ලද්දෙක් විය හැකිය.

ඉහත කී කුඩා ගෘහාකෘතියෙහි දොරටුවට දකුණු පසින් උදුනෙක් ද, වම් පසින් නොයෙක් දැ දමීමට වේදිකාවෙක්ද වෙයි.

දොරටුවට මුහුණ ලා, ජනේලයකට අසල් ව අල්තාරයෙකි. උඳුන අසල උඳුන් පාලිකාව වූ, වෙනත් ගැහැනියකගේ රූවක් ඇත.

මෙවන් ආකෘතියක් අනු ව තැනුනක් නියම ගෘහයක් ලෙස හැඳින්වීම හැම අතින් ම සාධාරණය. එහි වහළ පරාල වලින් දිරි ගන්වා තිබිණ. උඳුන් දරනුව සහිත උඳුන රුසියන් උඳුණක් වැන්න. ගෙබිම මැටිටෙන් නිමැවිණි. එය ගේ සාදා ගෙන යන අතර දී වෙසෙසින් ගෙබිමෙහි දල්වන ලද ගින්නෙකින් දැඩි ව පදමට පුලුස්සා ගෙන තිබුණේය. මැටි කපලා-රුවෙන් නිම් බිත්ති සිත්තමින් වැසී ගියේය.

හැම නිවසකට ම බිත්ති වලින් වෙන් කැරුණු කාමර කිපයෙක් විය. කෙසේ වෙතත් ඒ ගම් වල විශාල බිම ගෙවල් නිවෙස් ද විය. මේ වන විට ඒ ගමහි දක්ෂ මැටි බඳුන් තනන්නෝ ද, කම්මල් කරු-වෝ ද, තඹ ලෝකුරුවෝ ද වූහ.

මානව ප්‍රයත්නයේ යුග දර්ශකය

අපි කාලය ගිණීමට අවුරුදු සිය හා දහස් මස් යොදා ගනිමු. එහෙත් ප්‍රාගෛතිහාසික මානවයාගේ ජීවන පුවත ගැන අධ්‍යයනය කරන්නහුට යොදා ගැනීමට ඊට වඩා වෙනස් ක්‍රමයෙක කාල මාන දර්ශකයෙක් ඇත. ඈත එපිට දහස් වසර වලින් බොහෝ ගණනකට පෙර කියනු වෙනුවට අපි ''ආදි ශිලා යුගයේ'', ''නව ශිලා යුගයේ'', ''තඹ යුගයේ'' හා ''ලෝකඩ යුගයේ'' යයි කියමු. මෙය වාර්ෂික දින දර්ශකයෙක් නොවේ. හුදෙක් මානව ප්‍රයත්නය පිළිබඳ යුග දර්ශනයෙකි. එය සිය සංවර්ධනයේ ලා මානව සංහතිය කවර මට්ටමෙක සිටියේ ද? එම මහෙහි හේ කවර තැනක ගිමන් හැරියේ ද? යන්න අපට හරියට ම කියා පායි.

දැන් මේ කථාන්තරය, මානව ඉතිහාසයේ පළමු වරට කෘෂිකර්මය හා ගව පාලනය පටන් ගැනෙද්දි ලෝහ මෙවලම් විසින් ගිනි ගල් මෙවලම් වල තැන ගත් අවස්ථාව වෙතට අප ගෙන ගොස් ඇත. මානව ප්‍රයත්නයේ මේ අවස්ථාව භාණ්ඩ හුවමාරුවට මහ පැදිය. ඉදින් යම් තැනෙක්හි තඹමුවා පොරෝ නිපද-

වනු ලැබී නම් ඒවා කෙමෙන් වෙනත් ගෝත්‍රයන් වෙත පත් වන්නට ද පටන් ගැනිණ.

මිනිස්සු ඔරු වල නැඟී ගමෙකින් ගමකට යමින් හම් වලට ධාන්‍ය හෝ මැටි බඳුන් වලට රෙදි හෝ හුවමාරු කරමින් ගංගා වල පහළට යාත්‍රා කළහ. එක් ගෝත්‍රයකට තඹ බහුල වශයෙන් තිබෙන්නට ඇත. ඒ අතර තවත් ගෝත්‍රයක් සිය නිපුණ මැටි බඳුන් කරුවන් නිසා නම් ගත්තක් විය. කිසියම තැනෙක විල් ජල තලයෙක්හි ලී කනු මත නිමි ගමෙක නිවැසියන්, හුවමාරුව සඳහා බඳු ද රැගෙන පැමිණි සිය අසල් වැසි පිරිස් හමු වන්නට ඇත. භාණ්ඩ හුවමාරුව, නව නිෂ්පාදන මාර්ග හා අන්දැකීම් හුවමාරුව ට ද මහ පැදිය. එක් එක් ගෝත්‍රයකට වෙන වෙනම කතා කරන බසක් යොදා ගන්නට සිදු විය. කෙසේ වෙතත් අමුත්තන් වෙන් ව යන විට ඔවුන් අනෙක් පක්ෂය විසින් සපයන ලද භාණ්ඩ පමණකුදු නොව, මෙහි දී උගත් අමුතු නව වදන් ද තමන් සමඟ ගෙන යන්නට ඇත. මේ නයින් ගෝත්‍රික ප්‍රාදේශීය භාෂාවෝ ඔබට මොබට හුවමාරුව මුසු වුහ. ඒ එක්ක ම එක් එක් වචනයක් හා බැඳි තිබුණු අර්ථය, තත්භව වූ අලුත් වචනය ද උකහා ගනු ලැබිණ.

මේ නයින් බඩු මුට්ටු, වචන හා ඇදහිලි ද හුවමාරු විය.

මේ හුවමාරුව හැම විට ම සාමකාමී ව සිදු විණැ යි කිවහොත් වැරදි විය හැකිය. ඉදින් "අමුත්තන්" පිරිසකට තඹ, රෙදි පිළි හා ධාන්‍යත් ඒවා නිපදවූවන්ගෙන් බලයෙන් පැහැර ගත හැකි වී නම් ඔවුහු එසේ කරන්නට කිසි විටෙකත් අදි මදි නොකළහ.

මෙලෙසින් නිතර ම වාගේ කපටි මුහුණුවරෙකින් කෙරුණු රිනියා හුවමාරුව මුළුමනින් ම හොර කමෙක ස්වරූපයට හැරෙන්නට ඉඩ තිබිණි. "අමුත්තෝ" ද "සත්කාරකයෝ" ද, එකෙකා පහර දී ගත්හ. වඩා ශක්තිමත් ඇත්තෝ ජය ගත්හ. සොරකම් කිරීම හෝ අමුත්තකු මැරීම කොහෙත් ම වැරදි සේ නොසැලකිණි.

ඊම හේතුව නිසා හැම ගමක් ම කල් නොයා දී විශාල බල කොටුවක් හා සදිසි ව සැකසෙන්නට පටන් ගැනීමෙහි කිසිදු පුදුමයෙක් නැත. බලාපොරොත්තු රහිත ලෙස නුවුවමනා "අමුත්තන්ගේ" කඩා වැදීම වලක්වනු පිණිස එය මැටි පවුරෙකින් ද, සව්මත් වැටෙකින් ද වට කරන ලද්දේය.

එක් එක් ගෝත්‍රයක් වෙනත් ගෝත්‍ර සාමාජිකයන් කෙරෙහි තබන ලද්දේ ඉතා මඳ විශ්වාසයෙකි. එක් එක් ගෝත්‍රයක් තමන් පමණක් "මිනිස් නමින් හඳුන්වා ගත් අතර අනෙක් ගෝත්‍ර වල සාමාජිකයන් එසේ නොවන්නන් ලෙස සැලකූහ. ඒ අතර තුමූ ම තමන් "හිරුගේ දරුවෝ" හෝ "ගුවනේ මිනිස්සු" යනුවෙන් හඳුන්වා ගත්හ. අනෙක් ගෝත්‍ර අපභාසාත්මක විකට නම් වලින් හඳුන්වනු ලැබිණ. ඇතැම් විට මේ නම් අවසන්හි දී ඔවුන් හඳුන්වන සංඥා

නාම බවට පත් වන තෙක් ම පට බැඳී සම්මත විය.

රතු ඉන්දියානුන් අතර දැනුදු ''දුවිලි නහය'' ''කුඳ ජාතිය'' නමින් හැඳින්වෙන ගෝත්‍ර ඇත. එම ගෝත්‍ර තමන් විසින්ම එම නාමයන් පටබැඳ ගත්හයි සිතීම උගහටය.

මානව කාර්මික කෞශල්‍යය පිළිබඳ යුග දර්ශකයට අනුව සියලු ම සම කාලීන ජාතිහු සමාන ඓතිහාසික වයසකට උරුම කම් කියන්නෝ නොවෙත්.

සමාජ වාදී ඔක්තෝබර මහා විප්ලවයට පෙර රුසියාවේ සියලු ජාතිහු සංවර්ධනය පිළිබඳ එක ම මට්ටමකට හෝ වී නොසිටියහ. ඇතැමෙක් යන්ත්‍ර යුගයේ පීවත් වෙමින් සිටියහ. ඒ අතර අනෙක් අය තවමත් ප්‍රාග්ඓතිහාසික ලී නහුලින් සී සෑවෝය. ප්‍රාග්ඓතිහාසික අත් යන්ත්‍ර වලින් රෙදි වියූහ. එපමණක් නොව යකඩ භාවිතය ගැන නොදැනත් තවමත් සිවු පා ඇට වලින් සිය අවි තනා ගත්තෝ පවා වූහ.

දැන් සෝවියට් එක්සත් රාජ්‍යයේ වසා ඉඳිරියෙන් සිටින ජන කොටස් අතීත පසු බටකාවට ගොදුරු වුවනට උදවු කරත්. ඔක්තෝබර විප්ලවයෙන් පසු දශක තුනක කාලයක් තුළ ඇත උතුරුකර, මධ්‍යම ආසියා හා සයිබීරියා ජාතිහු සිය වස් කීපයෙකින් ඉදිරියේ සිටිත්.

මානව කාර්මික කුසලතා යුග දර්ශකයට අනුව අපේ රටේ (රුසියාවේ) සියලු ම ජාතිහු සමාජ වාදී යුගයෙක පීවත් වෙත්. අපේ රටේ කිසිදු ජාතියක් උසස් හෝ පහත් නොවේ. සියල්ලෝ සමානයෝය.



නීති දෙකක්

යුරෝපීයයන් ඔස්ට්‍රේලියාව සොයා ගත් කල්හි, මුළු මහාද්වීපයක් ම යටත් කර ගනු ලැබූ හෙයින් එය මහා විජයග්‍රහණයෙක් ද විය. එහෙත් ඔවුනගේ මේ විජයග්‍රහණය ඔස්ට්‍රේලියානුනට ඉමහත් ව්‍යසනයෙක් වූයේය. මානව ඉතිහාසයේ යුග දර්ශකයට අනුව ඔස්ට්‍රේලියානුවෝ තවමත් වෙනත් ආදිතම යුගයෙක පිවත් වූහ. යුරෝපීය සිරිත් විරිත් ඔවුනට නොතේරිණ. ඒවාට ගැති වීමට ඔවුනට වුවමනාවෙක් ද නොවිණ. මේ ''වරද'' කිරීමේ ලා ඔස්ට්‍රේලියානුවෝ කවර ලෙසෙකින් වත් සමාවක් නොලද්දෝය. විටුනු ලැබුවාහු වල් සතුන් මෙන් නොයෙක් වද හිංසා වලට ගොදුරු කරනු ලැබූහ. ඔස්ට්‍රේලියානුන් තවමත් කුඩාරම් වල පිවත් වූ අතර යුරෝපයේ නගර වල දැවැන්ත ගොඩනැගිලි ඉදි වෙමින් තිබිණ. ඉදින් පොහොසත් ඉඩම් හිමියකුගේ කැලෑවෙක දී යමකු විසින් මුවෙක් මරනු ලැබී නම්, යුරෝපීය සම්ප්‍රදායයට අනුව, ඔහු දහ ගෙයි ලනු ලැබූ අතර, ඔස්ට්‍රේලියානුවෝ පෞද්ගලික අයිතිය යන්නෙහි තේරුම වත් නොදත්තෝය.

ඔස්ට්‍රේලියානු සම්ප්‍රදායයට අනු ව නීතියක් වුණු දේ යුරෝපීය සම්ප්‍රදායයට අනුව අපරාධයෙක් විය.

ඔස්ට්‍රේලියානු ළදුනට අර්තාපල් ගොවි පොළකට වදින්නට හැකි වූ කල මේ සම්ප්‍රදාය දෙක යළිත් ගැටිණ. මොහොතෙක පවා අදි මදියෙකින් තොර ව මේ වනිතාවෝ ඉම්හිරි අල හාරන්නට පටන් ගනිති. පුදුම වන්නට කිසිවක් නැත. කැමට සුදුසු ඉම්හිරි අල එහි කොතෙකුත් තිබිණ. ඇති පදම එක තැනෙකින් ම ලද හැකිය. පුදුමයෙකි! ඔවුනට මෙහි දී පැයෙකින් හාරා ගත හැකි අල තොගය කවර දාකවත් අන් තැනෙකින් මසක් තුළ දී වත් හාරා ගත නොහැකි විය.

එහෙත් මේ හදිසි මංගල ලාභය ඔවුන්ගේ මිනී

වළ ද විය. වෙඩි හඬ සැණින් පැතිර ගියේය. වනිතාවෝ සිය අල පොදිත් සමඟ ම මිහි වැළඳ ගත්හ. තමන් වෙඩි පහරට ලක් කළෝ කවුරු ද? කුමක් නිසා ද? යන්න ඔවුහු සඳහට ම නොදත්හ.

ඇමෙරිකාව සොයා ගැනීම, තමනට අයිති නැති දෙලොව පිළිබඳ සටන අලුත් කෙළේය.

පැරණි "අලුත් ලොව"

ඇමෙරිකාව සොයා ගත් යුරෝපියයෝ තමනට නව ලොවක් හමු විණැ යි සිතූහ.

එහෙත් ඇත්ත වශයෙන් කියතොත් මේ "නව ලොව" පැරණි එකක් විය. යුරෝපියයන් තමන් බොහෝ කලකට පෙර අමතක කරන ලද සිය යට ගියාව අහම්බෙන් මෙන් ඇමෙරිකාවේ සොයා ගනු ලැබිණ. ඇමෙරිකාවේ රතු ඉන්දියානුන්ගේ සිරිත් විරිත් මලේච්ඡ හා අපූර්ව ඒවා ලෙස යුරෝපියයෝ සැලකූහ. ඔවුන්ගේ ගේ දොර, ඇඳුම් පැළඳුම් හා හැසිරීම රටාව ද යමතමින් වත් යුරෝපිය සම්ප්‍රදායයට අසල් නොවීය.

උතුරු ඇමෙරිකානු රතු ඉන්දියානුන්ගේ හියොවුරු හා ඊහිස්, ගිනි ගල් හා සත්ව ඇට වලින් නිමවා තිබිණ. ඔවුහු යකඩ ගැන කිසිවක් නොදත්හ. කෙසේ වෙතත් කෘෂිකාර්මික දැනුමින් යුතු වූහ. ඉරිහු, වට්ටක්කා, පුහුල්, බෝංචි හා දුම්කොළ ද වැවූහ. ඔවුන්ගේ ප්‍රධානතම රැකියා ව වූයේ දඩයමයි. ඔවුන් දැවමුවා ගෙවල පිවත් වූ අතර, ඔවුන්ගේ ගම් උස් වැටෙකින් වට කරන ලදි.

දකුණට වන විට මෙක්සිකෝ රතු ඉන්දියානුන් අතර තඹ මෙවලම් ද, රන් අබරණ ද භාවිත විය. ඔවුනට නොපලහන ලදෙ ගඩොලින් නිමි විශාල ගෙවල් තිබිණ.

පළමු වන ඇමෙරිකානු යටත් විජිත වාදිහු ද, ආක්‍රමණිකයෝ ද මේ සියලු දෑ විචිත්‍රාකාරයෙන් සිය දින පොත් වල විස්තර කළහ.

එහෙත් පිවත කුමයක් විස්තර කරනුවට වඩා, ද්‍රව්‍ය ගැන විස්තරයක් කිරීම බෙහෙවින් පහසුය.

ඇමෙරිකාවේ පිවත කුමය යුරෝපීය කුමයට බෙහෙවින් අපූර්ව විය. යුරෝපීයයනට එය තේරුම් ගත නොහැකි විණ. එහෙයින් ඒ පිළිබඳ ඔවුන්ගේ විස්තර බෙහෙවින් නොපැහැදිලිද අවුල් සහගත දවිය.

රදළ වාදී යුගයේ ප්‍රවේණි දාස භාවය ඉඩම් පිළිබඳ නීතිය ව තිබිය දී, යට දැක්වූ තත්ත්වය, යුරෝපීයයන් වැරදි ලෙස වටහා ගන්නට හේතු විය.

ඉදින් යුරෝපයේ දී, යමෙක් අනෙකකුට අයිති කිසිවක් ගත්තේ නම්, නගරයේ පිස්කල් මුළාදැනියා ඔහු කර පටියෙන් ඇද ගෙන ගොස් දහ ගෙයි ලෙ බව ඕනෑ ම කෙනෙක් දැන සිටියහ. මෙහි පිස්කල් නිලදරුවෝ නුවූහ. පෞද්ගලික දේ පොළ නොතිබිණ. හිර ගෙවල් නොවිය. එහෙත් හැම දෙයක ම පිළිවෙළක් තිබිණ. එම පිළිවෙළ යුරෝපීය සම්ප්‍රදායයට වෙනස් වුවත් හැම කෙනෙක් ම එය නිසි සේ තබා ගත්හ.

ප්‍රවේණි දාසයන් ඔවුන්ගේ මුළු ජීවිත කාලය පුරා ම ඉඩම් හිමියනට මෙහෙ කරන ලෙසටත්, සේවකයන් හැම විට ම සිය සේව්‍යයනට කීකරු ව සිටින ලෙසටත්, දුප්පතකු පොහොසතකුට අයිති කිසිවක් කිසි දාක නොගන්නා ලෙසටත් සහතික වන සේ යුරෝපයේ නීති සකසා තිබිණි.

එහෙත් මෙහි දී පුද්ගලයෙක් හැම විට ම සිය සාමූහික පවුල හා ගෝත්‍රය ද විසින් ආරක්ෂා කරනු ලැබිය. ඉදින් කිසිවෙක් මරනු ලැබී නම්, මිනිමරුවා ගේ මුළු ගෝත්‍රයයෙන්ම පලිගන්නා ලද්දේය. සමහර විට එය සාමයෙන් කෙළවර විය. මැරූ තැනැත්තාගේ නැයෝ, මළ තැනැත්තාගේ නැයනට, සමාව දෙන ලෙස යැද්දෝ ද, සාම ත්‍යාග පිළිගැන්වූවෝද වූනම් මිනිමැරුම සාමයෙන් කෙළවර විය.

යුරෝපයේ අධිරාජ වරු ද, රජ වරු ද, කුමාර වරු ද සිටියහ. එහෙත් මෙහි රජවරු වත්, සිහසුන් වත් නොවූහ. මුළු ගෝත්‍රය ඉදිරි පිට නායක මණ්ඩලය ගෝත්‍රය පිළිබඳ සියලු කටයුතු ගැන නිගමනයට එළඹියහ. නායකයෝ ඔවුන්ගේ කුසලතා අනුව තෝ-

රා ගනු ලැබුහ. ඉදින් ඔවුහු තමන් සතු කාර්යයන් පවත්වා ගෙන යෑමේ හැකියාව ඔප්පු නොකළෝ නම් තනතුරින් පහ කරනු ලැබුහ. නායකයා ගෝත්‍රයේ පාලකයා නොවිය. ඇතැම් රතු ඉන්දියන් භාෂා වල ''නායකයා'' යන්නෙහි සරල තේරුම ''කථිකයා'' යනුයි.

මේ පවුල් වල කුල පරපුර පිය නමින් නොව මවු නමින් හැඳින්වීමෙහි පුදුමයෙක් නැත. යුරෝපීය දරුවෝ පියාගේ නමේ අන්තිම කොටස තම නමට ඇඳා ගත්හ. එහෙත් මෙහි දරුවන් ඇඳා ගත්තේ මවගේ නමේ අග කොටසයි. පියා ''මුව'' ගෝත්‍රිකයෙක් ද, මව ''වලස්'' ගෝත්‍රිකාවක් ද වුවෝ නම් දරුවෝ ''වලස්'' ගෝත්‍රයට අයිති වුහ. හැම පවුලක් ම ගැහැනුන්ගෙන් ද, ඔවුන්ගේ දරුවන්ගෙන් ද, දූ වරුන්ගේ දරුවන්ගෙන් ද, මිනිබිරියන්ගේ දරුවන්ගෙන් ද සකස් විය.

ඉදින් මේ සියල්ල යුරෝපියයනට මහා අවුල් ජාලයෙක් විය. ඔවුහු රතු ඉන්දියානුන් වනචාරී ගති ඇත්තවුන් හා මලේච්ඡයන් ද ලෙස හැඳින්වූහ.

ප්‍රාථමික හබල් ඔරු හා හාරන මුල්ලු යුගයේ දී ද, ටුනු ඊතල යුගයේ දී ද තමන්ගේ ම ආදි මුතුන් මිත්තන් අතරත් එබඳු ම සිරිත් විරිත් තිබුණු බව මේ වන විට ඔවුනට සපුරා අමතක වී තිබිණ.

මුල් ම යටත් විජිත වාදියෝ ද, ආක්‍රමණිකයෝ ද රතු ඉන්දියානු, ගෝත්‍රික නායකයින්, ජන ප්‍රභූන් හා ඉඩම් හිමියන් ද ලෙස විස්තර කළහ. ඔවුන් එසේ විස්තර කරන ලද්දේ ''නායක'' යන උප පදයෙන් රාජකීය නම්බු නාමයක් හා වංශ විභූතියෙන් මාන පට පැළඳීමක් ද යන දේ අදහස් කැරුණු හෙයිනි. ගෝත්‍ර නායක සභාව, සාමී මන්ත්‍රී මණ්ඩලය හෝ උත්තර මන්ත්‍රී මණ්ඩලයක් හා ගෝත්‍ර රණ දෙටුවා රජ ලෙසත් යුරෝපියයෝ විස්තර කළහ. එහෙත් හමුදා අණ දෙන නිලදරුවකු රජකු ලෙස අප හැඳින්වුවහොත් එහි නොගැලපෙන බවක් දැකිය හැකිය.

සිය වස් කීපයෙක් ගත විය. එහෙත් ඇමෙරි-

කාවේ සුදු පදිංචි කාරයෝ එතෙකුත් ස්වදේශීය ජනතාවගේ සිරිත් විරිත් තේරුම් ගෙන නොසිටියෝය. ලුවි එච්. මෝර්ගන් නම් ඇමෙරිකානුවකු සිය "Ancient Society" නම් ග්‍රන්ථය මගින් දෙවැනි වරට ඇමෙරිකාව සොයා නොගන්නා තෙක් ම මේ වැරදි වැටහීම පැවැත්තේය. ඉරෝක්වෝයිස් හා ඇස්ටෙක් රතු ඉන්දියානු ගෝත්‍රිකයන්ගේ ජීවන ක්‍රමය යුරෝපීයයනට බොහෝ කලකට පෙර අමතක ව ගොස් ඇති සිය ප්‍රගතියේ එක් පියවරක් බව හේ එම පොතෙහි ඔප්පු කෙළේය.

රතු ඉන්දියානුන් හරි හැටි තේරුම් ගැනීමට සුදු මිනිසුනට නොහැකි විය. අනෙක් අතට රතු ඉන්දියානුවෝ ද සුදු මිනිසුන් තේරුම් නොගත්හ. එක් සුදු මිනිසකු රත්රන් අහුරකට තවත් එකකුගේ ගෙල මිරිකන්නට පසු බට නොවූයේ කුමක් නිසා දැ යි ඔවුනට කෙසේ වත් තේරුම් ගත නොහැකි විය. සුදු මිනිස්සු කුමක් නිසා ඇමෙරිකාවට ආවෝ ද යන්නත්, "අනෙකකුගේ ප්‍රදේශයක් ආක්‍රමණය කිරීම" යන්නෙන් කුමක් අදහස් කරනු ලැබේ ද යන්නත්, ඔවුනට තේරුම් ගත නොහැකි විය.

ප්‍රාග්ඓතිහාසික මානවයෝ, භූමිය මුළු ගෝත්‍රයට ම අයිති බවත් එය සිය පේතෘත්මයන් විසින් ආරක්ෂිතැ යි යන්නත් විශ්වාස කළහ. අනෙකකුගේ භූමිය අත් කර ගැනීමෙන් එම ගෝත්‍රික දෙවියන් උදහස් වෙති යි අදහස් කැරිණ.

රතු ඉන්දියානුවෝ ද එකෙකාට එරෙහි ව සටන් කළහ. එහෙත් එක් ගෝත්‍රයක් තවත් එකක් පැරදවූ කල පරාජිතයෝ වහල් භාවයට පත් නොකරන ලද්දෝය. ජයග්‍රාහකයන්ගේ සම්ප්‍රදායයන් හා සිරිත් විරිත් අනුගමනය කරන්නට හෝ නායකයන් තනතුරු වලින් පහ කරන්නට හෝ බල නොකැරිණ. නුදෙක් පරාජිතයන් ලවා තමනට ගරු සරු, බුහුමන් ඇ දැක්වීමට පමණක් සැලැස්වූහ. නායකයකු තනතුරින් පහ කිරීම ඔහුගේ කුලයට හෝ ගෝත්‍රයට පමණක් කළ හැක්කෙක් විය.

ලෝක දෙකක් ද සමාජ ක්‍රම දෙකක් ද ගැටිණ.

ඇමෙරිකාව ජය ගැනීම පිළිබඳ ඉතිහාසය වූ කලී ලෝක දෙකක් අතර සටනේ ඉතිහාසයයි.

එහි ලා කදිම නිදසුනක් ලෙස ස්පාඤ්ඤයන් විසින් මෙක්සිකෝව ජය ගැනීම දැක්විය හැකිය.

වැරදි වැල 1519 වසරේ දිනෙක තුන් කුඹ නැව් දොළොසෙක කණ්ඩායමෙක් මෙක්සිකෝ වෙරළේ දක්නට ලැබිණ.

පුළුල් උර හිස් සහ රැවුළින් ද යුතු වූයේ කුඩා හිස් වැස්මක් ද පැළඳ දෙනෙත් ඉහළටත් පහළටත් යොමු කළ මිනිහෙක් දඳ බැදි නැවේ, සුක්කානම අසල සිට ගෙන සිටියේය.

මේ රවුළාගේ නම කොර්ටිස්ය. මෙක්සිකෝව ජය ගනු පිණිස ස්පාඤ්ඤයෙන් යවන ලද බළ මුළුවෙක බලධරයා හේ විය.

සුදු මිනිසුන්ගේ පැමිණීම ගැන කට කතා වෙරළ දිගටත්, කඳුකර රටටත් වහ වහා පැතිර ගියේය. ''පුවෙබ්ලෝ'' නම් ලත් ඇස්ටෙක් ගම්මාන උස් කඳු බිමෙකින් ඔබ්බෙහි මිටියාවතෙක පිහිටා තිබිණ. සියලු පුවෙබ්ලෝ ගම්මානයන්ගෙන් විසල්තම වූයේ ''ටෙනෝච්ටිට්ලන්'' ගම්මානයයි. එය විලක් මැද පිහිටා තිබිණ. පාලම මහින් ගොඩ බිමට සම්බන්ධ වූයේය. එහි දිළිසෙන සුදු පිරියම් කළ නිවහන් හා රන් අලෙවි දුන් දේවාල එහලවල් දුර සිට දකිනු හැකි විය. ඇස්ටෙක් වරුන්ගේ රණ දෙවුවා වූ මොන්ටිසියුමා ඔහුගේ රණසුරු සගයන් හා විසල්තම නිවහනේ විසීය.

සුදු මිනිසුන් පැමිණීමේ පුවත දැන ගත් විට මොන්ටිසියුමා යුද්ධ සාකච්ඡා සභා වාරයක් කැඳවීය. කුමක් කළ යුතු දැයි නිගමනය කරන්නට උත්සාහ කරමින් නායකයෝ දිගින් දිගටත් සියුම් ලෙසටත් විමසා බැලූහ. ඔවුන්ගේ ප්‍රධාන තම ගැටලුව වූයේ මේ සුදු මිනිස්සු තමන්ගේ රටට කුමකට ආවෝ ද? ඔවුනට කුමක් වුවමනා වී ද? යනු නේරුම් ගැනීමයි.

සුදු මිනිසුන් රන් ගිලුවන් බව ඇස්ටෙක් වරු කට කතා වලින් දැන සිටියෝය. එහෙයින් යුද්ධ මණ්ඩලය සුදු මිනිසුනට රනින් තෑගි යවන්නටත්, ඔවුන්ගේ රටට ආපසු යන ලෙසට ඉල්ලා සිටින්නටත් තීරණය කැරිණ.

මෙය මාරයාට අත වැනීමෙක් විය. රත්රන් වලට කළ හැකි වූයේ සුදු මිනිසුන් ලෝභයෙන් උන්මත්තක භාවයට පත් කිරීම පමණෙකි. එහෙත් ඇස්ටෙක් වරු මෙය නොදත්තෝය. ඔවුන්ට එය දත හැකි මහෙක් ද නොවිණ. එයට හේතුව රතු ඉන්දියානුන් හා සුදු මිනිසුන් ද යුග දෙකෙක මිනිසුන් වීමයි.

මොන්ටිසියුමා රිය සක් වන් රන් මුවා තැටි, රන් අබරණ හා රන්මුවා පිළිම ද සමඟ සිය තානාපති වරුන් පිටත් කර යැවීය.

කෝර්ටිස් හා ඔහුගේ මිනිසුන් ද මේ රන් සම්භාරය දැකිත් ම ඇස්ටෙක් වරුන්ගේ ඉරණමට මුද්‍රා ද තැබුණේය.

එතරම් දිග සයුරු තරණයෙකදී ඊනියා අගහිඟ කම් හා ආපදාවන්ගෙන් පෙළුණු හෙයින් හිස් අතින් ආපසු යාම උමතුවක් ලෙස ඔවුන් සිතන්නට ඇත!

ඔවුහු ගල් කුට්ටි වැනි විස්කෝතු හැපීමෙන් හෙම්බත් ව සිටියෝය. එකෙකා තෙරපුණු, කුඩා කුට්ටි තුළ ඇඳන් වල දැඩි බව ඔවුන්ගේ පිටි කොඳු වලට දැනී තිබිණ. නැවේ තාර ගැවුණු ආම්පන්න, කුණාටු හා ගල් පර සමඟ කොඳු කඩන හැල හැප්පීම් වල යෙදෙන්නට සිදු වී තිබිණ. තව දුරටත් ඔවුන් මේ සියලු දුක් ගැහැට විඳින්දේ, ඉදිරියෙහි අත ඇති ධන ස්කන්ධය සඳහාය.

කෝර්ටිස් කුඩාරම් කඩා දමා ගමන් අරඹන ලෙස සිය නැව්යනට අණ කෙළේය.

පමා වෙමින් නමුත්, නිසැක ලෙස ම ස්පාඤ්ඤයෝ ඉදිරියට ගියහ. ඒ අතර උස් ගිරි දුදුළක් තුළින් විලක් හා ඒ මැද නිම් පුරයක් ද ඔවුහු දුටහ.

ඇස්ටෙක් වරුන් කිසිදු විරෝධයක් නොපෑයෙන් ඊනියා ''අමුත්තෝ'' පුරයට ඇතුළු වූහ. ඔවුන් කළ මුල් ම කාරිය වූයේ සිය ප්‍රතිග්‍රාහකයා වූ රණ දෙවු මොන්ටිසියුමා අත් අඩංගුවට ගැනීමයි.

කෝර්ටිස්ගේ අණින් මොන්ටිසියුමා යදමින් බඳින ලද්දේය. ස්පාඤ්ඤ රජුට අවනත බවට ප්‍රතිඥා දෙන ලෙසට කෝර්ටිස් සිය සිරකරුට ඇණවිය. ඉක්බිති සිරකරු, තෙමේ යළි යළිත් තමා විසින් කිය යුතු බවට අණවන ලද වචන ගොඩවල් පුනපුනා තොල් මතුළේය. රජ යනු කවරෙක් ද යත්, දිවරීම යනු කිමෙක් ද යත් යන මේ කිසිවක අදහස හේ නොදත්තේය.

තමා දිනුහ යි කෝර්ටිස් සිතිය. ඔහු සිතා ගත්තේ තමා මෙක්සිකානු රජු අත් අඩංගුවට ගත් බවයි. තව ද අත් අඩංගුවට ගනු ලැබූ රජු සිය පාලනය ස්පාඤ්ඤ රජුට බාර දුන් හෙයින් සිදු වූ සියල්ල මනාව ඉටු වූ සේ පෙනිණ. එහෙත් ඔහුගේ නිගමනය කනගාටු දායක වැරදීමෙකි. යම් සේ මොන්ටිසියුමාට ස්පාඤ්ඤ

සම්ප්‍රදාය අවිඡය වී ද, එසේ ම කෝර්ටිස්ට මෙක්සිකෝ සම්ප්‍රදාය ද අවිඡය වීය. සැබැවින් ම මොන්ටිසියුමා සිය රට පාලනයෙහි ලා බලයක් නැත්තකු වූ අතර හුදෙක් රණ දෙටුවකු පමණක් වුවත් ''හේ රජෙකි'' යි කෝර්ටිස් සිතීය.

කෝර්ටිස් පමණට වඩා ඉක්මනින් ජය පානෝත්සවය පැවැත්වීය.

ඒ අතර ඇස්ටෙක් වරු ''ඔවුන් කිසි දාක නොකරති'' යි කෝර්ටිස් සිතූ දෙයක් කළහ. ඔවුහු මොන්ටිසියුමාගේ සහෝදරයා නව රණ දෙටුවා ලෙස තෝරා ගත්හ.

නව රණ දෙටු තෙමේ ස්පාඤ්ඤයන් නවාතැන් ගෙන සිටි මහ මැදුරට පහර දෙනු පිණිස සිය සුරු වීරු සෙබළුන් මෙහෙයැවීය.

ස්පාඤ්ඤයෝ කාල තුවක්කු හා අත් තුවක්කු වලින් වෙඩි තැබූහ!

ඇස්ටෙක් වරු ගල්, දුනු හා ඊතල වලින් පහර දුන්හ!

කාල තුවක්කු උණ්ඩයක් හා මුණිස්සමක්, ඊතලයක් හෝ ගලකට වඩා බලසම්පන්න වීය. එහෙත් ඇස්ටෙක් වරුන් ස්වාධීනත්වය උදෙසා සටන් වදිමින් සිටි හෙයින් ඔවුන් නතර කරනු නොහැකි විය. දස දෙනකු මරු මුවට පත් කල සිය දෙනෙක් ඒ තැන ගත්හ. සටනට මැලි වූ කල සහෝදරයා සහෝදරයාට හෝ මාමා බෑණාට හෝ වෛර කෙළේය. එකෙකුත් මරණයට බිය නොවීය. සිය කුලය හෝ ගෝත්‍රය අනතුරට පත් කල්හි ඇස්ටෙක් ජාතිකයාගේ ජීවිතයෙන් අර්ථයෙක් නොවිණ.

තත්ත්වය බැරුරුම් අතට හැරෙනු දුටු කල කෝර්ටිස් ඇස්ටෙක් වරුන් සමඟ සාකච්ඡා කිරීමට තීරණය කෙළේය. මොන්ටිසියුමා මෙක්සිකෝ රජු ලෙස කෝර්ටිස් සිතා සිටියෙන් සාකච්ඡා සඳහා ඉතා හොඳ අතර මැදියා ඔහු වීම මැනව යි සැලකිණ. එහෙයින් මොන්ටිසියුමා ලවා අවි බිම තබන ලෙස

ඇස්ටෙක් වරුනට කියවන්නට කෝර්ටිස්ට හුවමනා විය.

ස්පාඤ්ඤයෝ මොන්ටිසියුමාගේ යදම් ඉවත් කළහ. හේ එක් මැදුරෙක් පැතලි වහලක් මතට යවනු ලැබිණ. එහෙත් ඇස්ටෙක් වරුන් විසින් ඔහු පිළිගනු ලැබුවේ බිය ගුල්ලකු හා ජාති ද්‍රෝහියකු ලෙසිනි. ඔහු පිට ගල් හා ඊතල වැසි වසින්නට විය. හැම පැත්තෙන් ම මහ හඬ නැහෙන්නට විය.

"කට වසනු! කපටියා, කට වසනු! තෝ රණ ශූරයෙක් නොවන්නෙහිය. තෝ වියන්නටත් කටින්නටත් පමණක් උපන් ගැහැනියකි. මේ බල්ලෝ තා සිර කරුවකු කොට ගෙන සිටිත්! තෝ බිය ගුල්ලෙකි!"

ඒ අතර මොන්ටිසියුමා මාරාන්තික තුවාල ලැබ ඇඳ වැටුණේය.

මෙක්සිකානු සාමාන්‍ය සෙබල මුළු කඩා බිඳ ගෙන යන්නට කෝර්ටිස් අසමත් විය. ඔහුගේ මිනිසුන්ගෙන් අඩක් පමණ මරනු ලැබ සිටියහ. වාසනාවකට මෙන් ඇස්ටෙක් වරු ඔහු ලුහු නොබැන්දෝය. එසේ නොවන්නට ඔහුට කිසි දාක පණ පිටින් නම් ටෙනෝච්ටිට්ලන් අත් හැර යන්නට නොලැබෙනු ඇත.

එහෙත් කෝර්ටිස්ට ලිස්සා යන්නට ඉඩ හැරීමෙන් ඇස්ටෙක් වරු තවත් බර පතල වරදක් කර ගත්හ. ඒ කෝර්ටිස් වෙනත් හමුදාවක් රැස් කොට ටෙනෝච්ටිට්ලන් වට ලැමට ආපසු පැමිණි නිසයි.

ඇස්ටෙක් වරු සිය පුරවරය ස්පාඤ්ඤ වරුන්ගෙන් රැක ගනිමින් මාස කීපයක් එඩිතර ලෙස සටන් කළහ. එහෙත් ඔවුන්ගේ දුනුත් ඊතලත් කාල තුවක්කු වලට එරෙහි ව නැඟී සිට කුමක් කරන්න ද? අවසන්හි දී ඒ ප්‍රෞඪ පුර ප්‍රවරය අත් පත් කර ගනු ලැබ වනසා දමන ලදී!

තඹ යුගයේ මිනිස්සු යකඩ යුගයේ මිනිසුන් විසින් අභිභවනය කරනු ලැබුහ. ඉදිරියට යමින් තිබුණු නව ක්‍රමය ඉදිරිපිට, පැරණි පොදු සමාජ වාදී ක්‍රමයට පසු බසින්නට සිදු විය.



හත් ගවු පා වහන්

මානව පිවිතය ගැන අධ්‍යයනය කරන ඉතිහාසඥයාට ද හත් ගවු පා වහන් යුගලක් අවශ්‍යය. මේ පොතේ පිටු මතින් අපි මහා ද්වීපයෙකින් මහා ද්වීපයකටත්, යුගයෙකින් තවත් යුගයකටත් ගියෙමු.

ඇතැම් විට අවකාශයේ දීර්ඝ දුර ප්‍රමාණයන් මොහොතින් ඉක්මවන විටත්, කාලය කලබලයෙන් පියාඹන විටත් අපේ හිස කරකවන ගතියෙක් ද දැනිණ. එහෙත් අපි කිසි විටෙකත්, නොනවත්වා ම ගියෙමු. මිනිසුන් සුපුරුදු පා වහන් දමා යද්දි මෙන් අපට හැම තැන ම නතර වන්නට නොහැකි විය. මහ තොරතුරු සවිස්තර ව හදාරන්නට ද නොහැකි විය.

ඇතැම් විට අප වසර ශතකයන් පැන යද්දි ඇතැම් දේ නොසැලකී ගියේය. එහෙත් ඉදින් අපි මොහොතකට වත් හත් ගවු පා වහන් ගලවා සුපුරුදු සාමාන්‍ය පියවර තබා ගියෙමු නම්, විස්තර තොරතුරු සම්භාරයන් නිසා අප ගිය මහ කවර දාක වත් පැහැදිලි නොවන්නට ඉඩ තිබිණි. ඉදින් ඔබ වනයෙහි ඇති ගස් එක එකක් දැඩි ලෙස විමසත් නම් ගස් හේතු කොට ගෙන වනයක් දකින්නට නොහැකි වන බව දැන ගන්නට ලැබෙයි.

අපි ශාක විද්‍යාවෙන් හා පීව විද්‍යාවෙන් වාග් විද්‍යාවට ගියෙමු. වාග් විද්‍යාවෙන් මෙවලම් ඉතිහාසයට ගියෙමු. එයින් ඇදහිලි හා විශ්වාසයන්ගේ ඉතිහාසයට ගියෙමු. මේ ආගම් ඉතිහාසයෙන්, මහි තලයේ ඉතිහාසයටත් ගියෙමු.

අපි මොහොතකට පෙර, ස්පාඤ්ඤ ජයග්‍රහණය සමයේ ඇමෙරිකාවේ සිටියෙමු.

දැන් අපි ක්‍රිස්තු පූර්ව 4000 - 3000 තෙක් වූ යුරෝපය වෙත එමු. එහි දී අපට ඇමෙරිකාවේ ඉරොක්වෝයිස් හා ඇස්ටෙක් ගෝත්‍රයනට සමාන ව්‍යුහයෙන් යුත් ගෝත්‍ර සොයා ගත හැකිය. එහි දී

කුදු මහත් හැම දෙයක් ස්ත්‍රීන් විසින් මෙහෙයවන ලද ''සාමූහික දිග් ගේ'' අපට හමු වෙයි.

ගෝත්‍රයේ ආදි කර්තෘහු ද, නිවහන් තනන්නාහු ද ස්ත්‍රීන් වන හෙයින් ඔවුහු ගරු සම්මාන ලබත්. ඔවුහු සිසිරයේ දී බඩ වියත උදෙසා ආහාර ගබඩා විමසත්; පොළොව කොටත්; එපුරත්; අස්වනු නෙළත්.

ගැහැනු මිනිසුනට වඩා වැඩියෙන් වැඩ කරත්. තව ද වැඩියෙන් ගරු කොට ද සැලකෙත්. හැම ගමකත් හැම ගෙදරකත් ගෝත්‍රික මාතෘ සංකේතය වන කැටයම් කැරුණු ඇටමුවා හෝ ගිනි ගල්මුවා ස්ත්‍රී ප්‍රතිමාවක් ඇත්තේ ඒ නිසයි. ඇගේ ආත්මය නිවහන ආරක්ෂා කෙළේය. සතුරන්ගෙන් ආරක්ෂාවත්, සමෘද්ධි සම්පන්න අස්වැන්නත් උදෙසා මිනිස්සු ඇයට යැද්දෝය.

පැරණි ගොඩනැගිල්ලේ මුල් ඉරි තැලීම

ආදි කුදු බැවුම ඇදිල්ලෙක සි සාන්නකු නිරූපිත සිත්තමක් ස්වීඩනයෙන් ලැබී ඇත. මේ සිත්තම බෙහෙවින් දළය. නොදියුණුය. සි සාන්නා බැලූ බැල්මට කුඩා දරුවන් අඳින මිනිස් රුවක් වැන්න. එහෙත් එය කොතරම් හොඳට හෝ නරකට සිත්තම් කොට ඇද්දැ යි අපි තර්ක නොකරමු. කුමක් නිසාද යත් අප එදෙස බලන්නේ සාක්කියක් ලෙස මිස සිත්තමක් ලෙස ගෙන නොවන හෙයිනි. ගොන් බානක් නහුලක් අඳින බවත් ඒ පසු පස සි සාන්නකු ගමන් ගන්නා බවත් මේ සාක්කි කරු අපට කියයි.

මේ වනාහි විය හැකි ලෙස, මානව සංහති ඉතිහාසයේ පළමු වැනි ම නහුලයි. මෙය ඒ වන විටත් බෙහෙවින් ම මුල්ලුවකට සමාන විය. එක ම වෙනස නම් දිග රිටක් සවි කර තිබීමත්, මිනිසුන් විසින් නොව ගොනුන් විසින් අදිනු ලැබීමත්ය.

මේ අයුරින් මිනිසා තමාගේ මුල් ම මෝටරය හෙවත් ඇන්පිම නිපදවා තිබිණි. සැබැවින් ම ගොනකු බැඳ වැඩට යොදා ගත් නහුල පණවත් ඇන්පිමෙක් විය. එය අපේ වානේ ට්‍රැක්ටරයේ පිවමාන

ආදි මුත්තාය. මිනිසා යම් විටෙක ගොනුගේ කර පිට විය ගසක් තැබී ද, ඒ මඟින් සිය බර තිරිසනා මත පැටවිය. මේ නයින් මිනිසාට මස් කිරි හා සම ද සැපයූ ගවයා එසේ ම සිය ශක්තිය ද ඔහුට කැප කෙළේය.

මෝටරයක් මෙන් වේගවත් නුවුවත්, ශක්ති සම්පන්න ගොන්නු දැවමුවා වියගස් සිය කර පිට රඳවා ගත්තාහු ලෝකයේ මුල් ම දැවමුවා නගුල් අදින්නට මුල පිරුහ. මේ නඟුල් වලින් මුල්ලු වලට වඩා ගැඹුරට පස යටට හැරීමට හැකි විය. හි විට දිගේ පෙරළී ගිය පස් තිරුව කළු වන් පීත්ත පටියක් සේ ඇතින් ඇතට විහිදු ගියේය.

මේ පළමු වැනි නඟුල් කරුට සිය මුළු ශක්තිය නඟුලිසට බර කොට යොදන්නට සිදු විය.

මේ නයින් ගොනා, මිනිසාගේ සියලු බර තමා පිට පටවා ගත්තේය. ගොනා සී සැවෙය., ධාන්‍ය මඩවා දුන්නේය, මිනිසාගේ නිවහන තෙක් අස්වනු බර ඇද්දේය. සරත් සමයේ දී ගොන්නු කමත් වෙතට මහ පෙන්වනු ලැබුවාහු සිය කුර වලින් ධාන්‍ය මැඩීම කළහ. ඉක්බිති අත් කරත්තයකට බඳින ලද්දෝ කුඹුරු වල සිට අස්වනු මලු නිවෙස් වෙත ඇද ගෙන ගියෝය.

ගොවිතැන සතුන් බෝ කිරීමේ තැන ගත්තේය. එඬේරා සී සාන්නකු බවට ද පත් විය. මෙය පිරිමියාට පවුලෙහි වැඩි බලයක් හිමි කර දුන්නේය.

සත්තකින් ම ගෙවිලියනට මුළු මහත් වැඩ කොටසෙක් තිබිණ. ඔවුහු රෙදි වියූහ. නූල් කැටීම කළහ. අස්වනු නෙළූහ. දරුවන් හදා වඩා ගත්හ.

එහෙත් පෙර ඔවුනට පවුල තුළ වූ බලයත්, ගරු තැනත් අහිමි ව යන්නට විය. තණ බිම්හි දිත්, කුඹුරේ දිත් පිරිමි නායකත්වය දැරූහ.

මේ වන විට පිරිමින්ගේ යම් කිසි කාරියෙකින් ස්ත්‍රීහු නොසතුටට පත් වූවෝ නම් ඔවුහු වෙන දා ගෙදර දොරේ දී නිතර ම කළාක් මෙන් ස්වාමී පුරුෂයන්ගේ ඇහට කඩා ගෙන නොපැන්නෝය.

ස්වාමී පුරුෂයෝ හුදෙක් සුරක්ෂිත තත්ත්වයට පත් වූවාහු පමණක් නොව, එකට එක කියන්නට ද පටන් ගත්හ. පෙර නැන්දම්මලාට, නැන්දලාට සහ ආත්තම්මලාටත් පිරිමියකු ගෙදරින් එලවා ගැනීම බෙහෙවින් පහසු කාරියෙක් විය. ඔවුහු පිරිමියා ගැන වැඩි අවධානයක් යොමු කරන්නට වන්හ. එයට හේතුව වෙනත් පති කුලයෙකින් සිය පවුලට බින්න විවාහ වූ මේ අමුත්තා ඔවුන් සියලු දෙනා ම වෙනුවෙන් වැඩ කළ නිසයි. මේ අමුත්තා පතිනි කුල පෝෂණය පිණිස අත දෙමින් සිටියේය. මේ අතර ඔවුහු තම කුලයේ පිරිමින් වෙනත් පතිනි කුලයකට හිමි කරන්නට අඩු කැමැත්තක් දැක්වූහ. කුලයන් අතර අණ සක පවත්වා ගනු පිණිස, මිනිස්සු ඔවුනොවුන් අතර යුද ගිවිසුම් ඇති කර ගත්හ.

කලින් සිරිතට අනුව, මිනිසකු මළ කල ඔහුගේ උරුමයට නීත්‍යානුකූල හිමි කරුවෝ ඔහුගේ සහෝදරියගේ දරුවෝ වූහ. මේ වන විට මිනිස්සු එම ගෝත්‍රික නීතිය වෙනස් කරන්නට උත්සාහ දැරූහ.

අප්‍රිකානු තුවාරෙක් ගෝත්‍රික නෝමැඩ් වරුන් අතර, ප්‍රවේණියක්, නීත්‍යානුකූල කොටස හා එසේ නොවන කොටස යනුවෙන් දෙකොටසකට බෙදන ලදී. ඉන් නීත්‍යානුකූල කොටස එය හිමි කරුගේ සහෝදරියගේ දරුවනට අයිති විය. මේ කොටසට මළ තැනැත්තාට පිවිත කාලය තුළ සිය මවගෙන් ලැබුණු සියලු දේත්, පොදු නිවසේ දී වැඩ කරමින් ඔහු රැස් කළ සියලු දේත් ඇතුළත් විය. අනෙක් කොටසට යුද ජය සංකේත සහ වෙළ හෙළදාමෙන් රැස් කර ගත් ඕනෑ ම දෙයක් ද ගැනුණේය. ඒ දේ පොළ ඔහුගේ ම දරුවනට හිමි විය.

මාතෘ මූලික සමාජ රටාව වසර දහස් ගණනක් තිස්සේ පැවති තිබිණ.

ඉක්බිති ඒ මුල් බට පිවන සම්ප්‍රදාය පුරාතනතම ඔක් ගසක් මෙන් ඉරී නැළුම් දක්වන්නට පටන් ගති.

වඩ වඩාත් නිරතුරු ව, ගෝත්‍රික සාමාජිකයෝ පැරණි සම්ප්‍රදායයනට එරෙහි ව යන්නට වූහ. කලින්

සිරිත වූයේ බිරිඳක විසින් ස්වාමී පුරුෂයකු සිය පවුල වෙත කැඳවා ගෙන ඒමයි. එහෙත් දැන් සිදුවූයේ ස්වාමී පුරුෂයා බිරිඳක සිය ගෙදරට කැඳවා ගෙන ඒමයි.

මෙය පැරණි සම්ප්‍රදායයනට පටහැනි වූවක් හෙයින් එය බිඳ හෙළූ තැනැත්තේ අපරාධ කාරයකු ලෙස සැලකිණ.

සැබැවින් ම තරුණයකුට වෙනත් ගෝත්‍රයෙකින් බිරිඳකු කැඳවා ගෙන ඒම එතරම් පහසුවෙන් කළ හැක්කක් නොවීය. ඔහුට ඇය පැහැර ගෙන එනු පිණිස සොරකම් කර ගත යුතු විය.

මැදියම් රෑයේ දී තරුණයා සිය පිරිමි නැයන් ද සමඟ හෙල්ල සහ කොට කඩු වලින් ද සන්නද්ධ ව සිය අනාගත සහකාරිය තෝරා ගනු ලබන ගෝත්‍රයේ තරුණියගේ ගෙදරට හොරෙන් රිංගා ගත යුතු විය.

එකල්හි බිරුම් හඬ ලූ බල්ලෝ ගෙවැසියන් අවදි කළහ. ඒ අතර ඌනාලියගේ පැසුණු කෙසින් යුත් ආතා ද, බාල සහෝදරයෝ ද කලබල වී සිය අවි අතට ගත්හ. සටන් වැදි මිනිසුන්ගේ ත්‍රාස ජනක කෑ ගැසීම්, ගැහැනුන්ගේ හැඬීම් වැලපීම් ජනිත කෙළේය. අන්තිමේ දී මනාලයා සිය ගොදුර හෙවත් මනාලිය ඔසොවා ගත්තේ තම ගෝත්‍රිකයන් විසින් වට කර ගනු ලැබ ආරක්ෂිත ව පසු බැස්සේය.

මෙසේ අවුරුදු ගණන් ගත විය. යථා කාලයේ දී, මෙනයින් ගෝත්‍රික නීතිය උල්ලංඝනය කිරීම ගෝත්‍රික සම්ප්‍රදායයක් බවට පත් විය. මෙසේ මනාල මනාලියන්ගේ නැයන් අතර සිදු වුණු මේ පුංචි යුද්ධය චාරිත්‍රයක් බවට පත් වූයේය.

ලේ වැගිරීම වෙනුවට තැගි බෝග පිරි නැමීමත්, වන්දි වශයෙන් දැවැද්ද දීමත් ඇරඹිණ. අඩා දොඩා වැලපුණු මනාලියගේ මවත්, සහෝදරියෝත් විවාහ චාරිත්‍ර වල අවශ්‍යතම අංගයක් වූවාහු මංගල භෝජන සංග්‍රහයෙකින් කටයුතු නිමාවට පත් විය.

වෙනත් ගෝත්‍රයෙක නන් නාඳුනන ගෙදරකට

ගෙන එනු ලැබූ තරුණ මනාලියකගේ ත්‍රාස ජනක ඉරණම පිළිබඳ දුක් අදෝනා ඇතුළත් පැරණි ශෝක ගීත මතක ඇත්තෝ අදත් සිටිති.

තව ද ඇගේ ඉරණම අන් කිසිවකුගේ ඊර්ෂ්‍යාව පිණිස වූවක් නොවිය. මේ ආගන්තුක නිවස තුළ අර තරුණිය හුදෙක් ස්වාමි පුරුෂයාගේ අත් අඩංගුවට පත් වූවක් වූවාය. ඇගේ දුක් කරදර ගැන කිමට කිසිවෙක් එහි නොසිටියේය. එයට හේතුව නැන්ද-මාමලා දෙමහල්ලනුත් ස්වාමියා ගේ අන් සියලු නෑදෑයනුත් හැම විට ම ඔහුගේ පැත්ත ගැනීමයි. ඉදින් තරුණයකු තරුණ මනාලියක ගෙදරට ගෙනා කල ඕ පවුලට අලුත් ශ්‍රමිකයෙක් වූවාය. ඇය මොහොතකට වත් පැත්තකට වී උදාසීන ව බලා නොසිටින්නටත්, ඇයට හිමි ඉතා සුළු ආහාර කොටසට වඩා එක කටක් වත් වැඩි පුර නොකන්නටත් වග බලා ගනු පිණිස ගෙදර හැම කෙනෙක් ම නිතර ඇස ගසා ගෙන සිටියෝය. මේ අසුරින් හැම දෙයක් ම මව විසින් පාලනය කරනු ලැබූ පවුලක් ඇති ගෙය, පියා විසින් පාලනය කරනු ලබන්නක් බවට පත් විය.

මුල් ම සංචාරක එඬේරු

මිනිසා වරෙක තමා විසින් සොයා ගනු ලැබ සිටි අරුම පුදුම ගබඩාගාරයෙන් වඩ වඩාත් පරිත්‍යාගයන් ලබමින් සිටියේය. දහස් ගණන් බැටළුවෝ තණ බිමහි ගොදුරු ගනිමින් සිටියහ. කෙත්හි බුරුල් කළු පස් පොළොව මත, ගවයන් නහුල අදිද්දි සී සාන්නෝ ඔවුන් පසු පස යමින් "ඕසය" ඇද්දෝය. මුල් ම පලතුරු හා මිදි වතුත්, නෙත් සිත් පුබුදුවමින්, සරු මිටියාවත් මලින් වැසීය. සැඳෑ සමයයන්හි සල්ලාපයන් පිණිස රසිකයන් අත්තික්කා ගස් යටට එක් රොක් වන්නට ඇත.

සමීන් නිමි ඇඳුමින් සැරසී අරුම පුදුම දෙවියකු හා ඔහුගේ දුක් වේදනාවන් ද ඇතුළත් ගුප්තාර්ථාන්විත ගී ගැයුහ. මේ සියල්ලෙන් වයින් වල මහිමතාව ගීතයට නැඟිණ.

නදි මිටියාවත් වල හැම දියත්තෙකින් ම පිටාර ගිය දිය කඳ පොළෝ තලය සරු කෙළේය. සොබා දහම සරු අස්වැන්නක් නිපැයීම වස් තෙමේ ම අත් වැල් බැඳ ගත්තාක් වැන්න. එහෙත් මෙයිනුදු ගොවියාගේ අත් වලට නිදහසෙක් නොලැබිණ. ඔවුහු කෙත්හි ජලය රඳවන්නටත් අවශ්‍යතම තැන් වලට ගලා බස්සන්නටත් ඇළවල් කැපීමත්, වේලි බැඳීමත් කළහ.

ඉදින් තමන්ගේ ''කොඳු කඩන ශ්‍රමය මිහි කුසට නොකැවී නම්, සඳහට ම මිහි තලය මත වැවෙන්නට තිබුණේ වල් පැළෑටි ම පමණක් ව තිබිය දිත්, එය සපුරා අමතක කරමින්, මානවයෝ, සිය පස සරු බවට පත්කළැයි හහින නදියට යාච්ඤා පැවැත්වූහ.

කල් යත් යත් ගොවියාට වැඩි වැඩියෙන් රැක ගත යුතු දෑ ඇතිවිය. සතුන් ඇති කරන්නාට ද විවේකය සඳහා අවස්ථාවෙක් නොවිණ. තැනි තලාවන්හි සරුනිල් වන් තණ පලස මත ගව රැළ සිය දෙනෙතට නිතර ලක් වෙමින් වැඩෙමින් ද, බෝ වෙමින් ද සිටියෝය. රැළ විශාල වන විට එඩේරාගේ වැඩ කොටස ද වඩාත් පුළුල් විය. බැටළුවන් දහ දොළොස් දෙනකුන් රැක බලා ගැනීම සුළු කාරියෙකි. එහෙත් දහසකගේ පසු පස යෑම සපුරා බර පතල කටයුත්තෙකි. විශාල රංචුවක් විසින් තණ පිටියක් ඉක්මනින් කා දැමිණ. ඉක්බිති එම රංචුව ගම්මානයෙන් ඇතින් ඇත තණ බිමක් වෙත දක්කා ගෙන යා යුතු විය.

ඉක්බිති හැම ගමකට ම සිය කුඩාරම් හකුලා ගෙන රංචු පසු පස යන්නට සිදු විණ. මේ නයින් මිනිස්සු හකුලා ගත් කුඩාරම් සහ සිය හරුබස්ස ද ඔටුවන් පිට පටවා ගත්තාහු සිය සංචාරක ධනය ද පෙරටු කොට ගෙන පිටත් වූහ.

මෙසේ පිටත් වූ ඔවුහු වහ වහා, වල් පැළෑටියෙන් වැසී ගිය කෙත් යාය වල් තමන් පසු කළ මහෙහි අත් හරිමින් ඉදිරියට ගියහ. වියළි තැනි තලාවන්හි හොඳ අස්වැන්නක් බෙහෙවින් දුලබ වූවත් හෙයින්,

සැබැවින් ම ඔවුහු මෙවන් කෙත් යායවල් අත් හැර දැමීමෙන් කොහෙත් ම පසු තැවිලි නොවූහ.

ඉතිහාසයේ මුල් වරට එක් ගෝත්‍රයෙක මිනිසුන් අතර පමණක් නොව විවිධ ගෝත්‍රිකයන් අතරත් ශ්‍රම භුවමාරුවෙක් ඇති වූයේය.

ධාන්‍ය වලට සතුන් භුවමාරු කළ එඬේර ගෝත්‍රිකයෝ මිටියාවත් වල දක්නා ලදහ. ඔවුහු කිසි දාක එක් තැනෙක පදිංචි නුවූහ. එක් තණ බිමෙකින් තවත් එකෙකට යමින් තැනින් තැනට සංචාරය කළහ. සංචාරක එඬේරුන්ගේ ජීවිතය වනසර වූත්, නිදහස් වූත් එකක් විය.

ඉහට උඩින් තරු පිරි අපරිමිත අහස් කුස මිස අනෙකක් නොවූ එලි මහන් මිටියාවතේ ඔවුන් සිය කුඩාරම් අටවන්නට ඇත. ඉම නොපෙනෙන මිටියාවත ඔවුන්ගේ නිවහන විය. දත් එක ම තොටිල්ල එපමණක් වූයෙන් එවන් දිග ගමන් වල දී කුඩා දරුවන් නිදනු පිණිස ඔටුවන්ගේ පැද්දෙන පිටු තල මත ගුලි වන්නට ඇත.

කෙසේ වෙතත් අප කතා කරමින් සිටින ඒ යුගයන්හි දී තවමත් එඬේර ගෝත්‍රිකයන් අතර නියම සංචාරක එඬේරු ඉතා ටික දෙනෙක් පමණක් වූහ.

පණ ඇති මෙවලම

එඬේර ගෝත්‍රයෙක ජීවිතය සාමකාමී හෝ සන්හුන් එකක් නොවීය. ඔවුන් ගේ සංචාරක ගමන් වල දී ගොවියන්ගේ කෙත් වතු හා සතුන් රංචු ද අහම්බෙන් හමු විය. මෙතන්හි දී සංචාරක එඬේරු තමන් වගා නොකළ යට කී දෑ නිතර ම බලයෙන් අත් පත් කොට ගත්හ. ඔවුන් ගංගා නිමනයක් ඔස්සේ පහළට බසිමින් හෝ තැනි තලාවක් ඔස්සේ වනාතක් දක්වා ඉදිරියට යමින්, ධාන්‍ය වගාවන් පාළු කරමින්, සතුන් රංචු පලවා හරිමින් හා ගැමියන් අත් අඩංගුවට ගනිමින් ද අතර මහ ගම්මාන ගිනි තබන්නට හෝ කොල්ල කන්නට ඇත.

අන් හැමෙකකට ම වඩා ඔවුනට හිර කරුවෝ අවශ්‍ය වූහ. ඔවුන් යොදවා සිටු පා රංචු රැක බලා ගැනීමට හැකි වූ හෙයිනි.

ඒ සංචාරක එඬේරුන් පිවත් වූ ආකාරයයි. එහෙත් ගොවියෝ ද විශේෂයෙන් ම සාම කාමියෝ නොවූහ.

සරදයේ දී අස්වනු අස්-පස් කර ගත් පසු ධාන්‍ය, රෙදි පිළි, අබරණ හා අවි ගබඩා ද කොල්ල කනු පිණිස සිය අසල් වැසියනට පහර දෙන්නට ද ඔවුහු පස බට නුවූහ. තව ද එවන් විට දී අමිල ජය සංකේත වූවාහු නම් ඒ අත් අඩංගුවට ගනු ලැබූ මිනිස්සුය.

එයට හේතුව ඇළවල් කැපීමට, බැම් බැඳීමට හා හරක් පට්ටි දැක්කීමටත් ගොවියනට අමතර ශ්‍රමිකයන් අවශ්‍ය ව තිබීමයි.

අමතර දැතෙකින් විශේෂ වාසියක් නොසැලසිය හැකි වූයෙන් මුල් අවස්ථා වලදී අත් අඩංගුවට ගනු ලැබුවෝ වහලුන් කරනු නොලැබූහ. එකල මිනිසකු වැඩ කළේ, යම් පමණක් ඉපැයී ද එපමණට ම කෑවේ ද විය.

විශාල සිවු පා රංචු ඇති වන්නට පටන් ගත් කල්හි ද, එක් කෙනෙකුගේ ශ්‍රමය ඔහුගේ පරිභෝජන සීමාව ඉක්මවන තරම් ධාන්‍ය, මස් හා ලොම් ප්‍රමාණයක් උපයනු ලැබූ කල්හි ද හැම දෙයක් ම වෙනස් වන්නට පටන් ගත්තේය. ගොවියෝ සිය ධාන්‍ය වලට ලොම් හුවමාරු කරනු පිණිස තමනට වුවමනා පමණටත් වැඩියෙන් ධාන්‍ය පවුලේ තෘණයන් වගා කරන්නට වූහ. මේ අයුරින් ම එඬේරු ද අතිරික්ත ලොම්, ධාන්‍ය හා ආයුධ වලටත් මාරු කළ හැකි වූයෙන්, තමන්ගේ ඇඳුම් හා මස් වලටත් වුවමනා කළ පමණත් ඉක්මවා ගිය වඩා විශාල බැටළු පට්ටි නඩත්තු කරන්නට යත්න දැරූහ.

මේ හුවමාරුවත් නිරන්තර හොර කමත් ඇතැම් කුල හා පවුල් අනෙක් ඒවාට වඩා පොහොසත් වන්නට ඉඩ කඩ උදා කෙළේය. ඔවුන්ගේ බැටළු හා ගව පට්ටි වඩා විශාල වූහ. ඔවුහු වැඩි පුර ධාන්‍ය ද වපුළෝය. එහෙත් ඔවුනට මේ පට්ටි රැක බලා ගන්නට වත්, භූමිය සි සා ගන්නට වත් සෑහෙන කම්කරු රොත්තක් නුවූහ. ඇතැම් මිනිස් කොටසක්,

තවත් මිනිස් කොටසක් වහල් බවෙහි තබන්නට ඇරඹුණේ එකල්හිය.

වහලකුගේ ශ්‍රමය තෙමේ ම ද, ඔහුගේ ස්වාමියා ද පෝෂණය කෙළේය. ස්වාමියාට කරන්නට තිබුණු මුළු මහත් කාරිය වූයේ ''වහලාට වැඩියෙන් වැඩත්, අඩුවෙන් කෑමත්'' යන දෙකරුණෙහි ලා වග බලා ගැනීමයි. මේ නයින් එක් මිනිසෙක්, තවත් මිනිසකු තමාගේ පණ ඇති මෙවලමක් බවට පත් කර ගත්තේය.

මිනිසකු විසින් තවත් මිනිසෙක් පහත් පන්තියකට ඇද දමන ලද්දේය. ඉදින් ගොනෙක් වී නම් පිටි කරෙහි විය ගසක් තැබූ සේය.

මෙසේ මානව ඉතිහාසයේ මුල් වරට වහල් හිමියෝ ද වහල්ලු ද ජනිත වූහ.

ස්මෘතිය
හා ස්මාරකය

දැන් ඉතින් අතීතය වෙත අපේ ගමන වඩාත් බැරෑරුම් එකක් වී ඇත. එයට හේතුව නිකම් සොබා සිරි නරඹන්නන් මෙන් නොව ගවේෂකයන් මෙන් අප ගල් ලෙන් වංගගිරි වල මං මුළා වී සිටීමයි. ලැබුණු හැම දෙයක් ම විසඳුමක් දිය යුතු අබිරහසෙක් විය. අපේ සෙවුම් බැලුම් වලට උදවු පිණිස, මහ දිගට දැන්වීම් පුවරු හෝ යා යුතු දිසාව දක්වමින් රී සලකුණු හෝ නොවිණ. ගල් යුගයේ පීවත් වෙමින්, අපට ඉතිරි කරන්නට මොන වගයේ සලකුණු ක්‍රමයක් පාෂාන යුගයේ මානවයාට තිබුණේ ද? සැබැවින් ම ලියන්නේ කෙසේ ද යන්න පවා හේ නොදැන සිටියේය!

අවසන් විසින් දැන් අපි, දිගට ම සලකුණු සහිත මහකට පිවිස සිටිමු. අපි මුල් ගල් ලිපි, සොහොන් කොත් හා දෙව් මැඳුරු බිත්ති වලත් සොයා ගතුමු. ඒවා තව දුරටත් භූතාත්මයන් එලවීමට අදහස් කැරුණු මැජික් සලකුණු නොවේ. මේවා පින්තූර මඟින් කියූ අංග සම්පූර්ණ කතාය. මිනිසුන් උදෙසා මිනිසුන් ගැන ලියූ පුවත්ය.

එසේ ද වුවත් ඒවායේ අද අපේ අකුරු වල සෙවණැල්ලක් පවා නැත. ''ගොනා'' යන්න දැක්-වූයේ ගොනකුගේ පින්තූරයක් ඇඳීමෙනි. ගසක් එහි සියලු ම අතු සමඟ අඳින ලදී.

ලේඛන ඉතිහාසය රූපාක්ෂර වල ආරම්භයත් සමඟ පටන් ගනී. මේ රූපාක්ෂර සරල බවට පත් ව සංකේත බවට විකාශනය වීමට සිය වස් බොහෝ ගණනක් ගත වූයේය.

මිනිසා ඉතා සෙමින්, සැකයෙන් හා බියෙන් ද ලියන්නට උගත්තේය.

එසේ ද වුවත් ඔහු ලිවීමට උගත යුතු සමය එය විය!

ලබා ගැනීමට විශාල දැනුමක් හෝ තොරතුරු හෝ නොමැති ව නිබිය දිත්, මානව වර්ගයා දැන සිටි සියල්ල ඔවුන්ගේ මතකයෙහි රඳවා රැක ගනු හැකි විය. අඛ්‍යාන, උපමා කතා හා සුර-ගනා කතා ද කෙනකුගෙන් කෙනකුට කටින් කට පැවත ඇවිත් තිබිණ. හැම මහල්ලෙක් ම පණ ඇති පොතක් විය. මිනිස්සු කතන්දර, ආඛ්‍යාන සහ සාමාන්‍ය ඥානය පිළිබඳ නීති ද මතකයේ රඳවා ගෙන පරපුරින් පරපු-රට උරුම කර දෙනු හැකි වනු පිණිස, මහඟු දායා-දයක් ලෙස සිය දරුවනට පවරා දුන්හ. එහෙත් මේ බර වඩාත් ඉහළ යද්දී, ඒ සියල්ල මතක තබා ගැනීම ද වඩාත් අපහසු විය.

මේ අතර කෙනෙකුගේ ස්මෘතියට උපකාරක-යකු ලෙස ස්මාරකය පැමිණියේය. මෙහි දී අත් දැකීම් දියුණු වෙමින් ලියන බස, දොඩන බසට පිටු බල වන්නට පටන් ගති. පසු පරම්පරාවන්ගේ මතකයෙහි පැහැදිලි ව තැන්පත් වනු පිණිස ජන නායකයකුගේ ආක්‍රමණ හා සටන් ඔහුගේ සොහොන් ගලෙහි සට-හන් කරන ලදී.

වෙනත් මිත්‍ර ගෝත්‍රික නායකයන් වෙත පණිවිඩ කරුවන් යැවුණු විට සිහි වටන ලෙස ගස් පොතු කඬක හෝ මැටි පුවරුවෙක නොයෙක් රූපාක්ෂර-වචන සූරා සටහන් කොට යවන ලද්දේය.

සොහොන් ගල මුල් ම පොත විය. මුල් ම ලියන කඩදාසිය වූයේ බර්ච් පොතු කැබැල්ලකි.

මේ ස්මාරකයන්ගෙන් බොහෝවක්, වසර දහස් ගණන් වලට පෙර සිදු වූ ඔවුන්ගේ මහා ආක්‍රමණ හා සංග්‍රාම පිළිබඳ කතා පුවත අපට කියන්නට තවමත් ඉතිරි ව ඇත. කඩු හා හෙල්ල වලින් හරණ පාන වීරයන්ගේ රූප ගල් වල කැටයම් කර ඇත්තේය. මොවුහු නම් ජයග්‍රහණය කොට සිය නිවෙස් කරා එන ජයග්‍රාහකයෝය. සිර භාරයට ගනු ලැබුවාහු, පිටි කර හයා බඳනා ලද අත් හා බීමට නමා ගත් හිස් ඇති ව, ඔවුන් පසු පස වෙහෙසින් යුතු ව ඇදෙත්. තව ද මෙහි රූපාක්ෂරවචන අතර, වහල් භාවයේත්, අසමානත්වයේත් සංකේතය වන යදමින් කළ අත් හැකිල්ලෙක චිත්‍රයක් අපට හමු වෙයි. මේ සංකේතය මානව ඉතිහාසයේ නව යුගයෙක උදාව හෙවත් දාස භාවයේ වහල් කමේ ආරම්භය අපට හඳ නහා කියයි. අපට මෙවන් බොහෝ පින්තූර-සාක්කි කරුවෝ ඉපිප්තියානු දෙවොල් බිත්ති වල පසු ව සොයා ගනු හැකි වෙත්.

වහල්ලු
සහ
නිවහල්ලු

ඔබ ''ඔඩිසි'' කාව්‍යය කියවා ඇතොත් සිය ස්වාමියා සමඟ එක ම මෙසයේ කන බොන, ඌරන් බලෙන මහලු ඉසුමාසියුස් මතක් විය හැකිය. ගෝත්‍රික නායකයකු ඇමතූ පරිදි ඉසුමාසියුස් ද අමතනු ලැබුවේ ''දෙවියන් වහන්සේගේ සමානයා'' යනුවෙනි.

එහෙත් ඔබට ගීතයෙක වචන ගැන සියයට සියයක් විශ්වාසය තැබිය නොහැකිය. ඌරන් බැලූ ඉසුමාසියුස් දෙවියකුට සමාන නොවූයේ පමණක් නොව ඔහුගේ ස්වාමියාට ද සමාන නොවීය. ඔහු බල කිරීම මත වැඩ කළ අතර ඔහුගේ ස්වාමියා නිදහස් ලෙස වැඩ කළේය. පවුලේ සාමාජිකයකුට වඩා වැඩ කොටසක් වහලකුට නියම කරනු ලැබිණ.

එහෙත් ඔහු ලද පංගුව බෙහෙවින් අඩු විය. වහලා ඔහුගේ ස්වාමියාගේ ධනය විය. ඔහුගේ ස්වාමියා ධන හිමියා විය.

මහලු ස්වාමියා මළ කල, ඔහුගේ අනෙකුත් දේ පොල, බඩු ගබඩා හා ගව රැළ සමඟ වහල්ලු ද, ඔහුගේ පුතුන්ගේ වස්තුව බවට පත් වූහ.

තව දුරටත් මේ පවුල් සමාජයේ සමානත්වය පිළිබඳ අන් කිසිදු සලකුණෙක් නොවීය.

කුලයන් හා සමාජයන් අතර කලින් වූ සමානාත්මතාව ද නැති වී ගියේය. ඇතැමුනට වැඩියෙන් ද, ඇතැමුනට අඩුවෙන් ද ගවයෝ වූහ. ගවයා ධනවත් කම මනින මිම්ම විය. ගවයෙක් රෙදි හෝ ආයුධ වෙනුවට හුවමාරු කළ හැකි වූයේය. මුල් ම ලෝකඩ කාසි, දිග හරින ලද ගව සමක හැඩයට තැළීමට වැදගත් හේතුවෙක් තිබිණ.

කෙසේ වෙතත්, එතෙකුත් වහලෙක් ගවයකුට වඩා වටනේ විය.

වහලා උෂරන්, දෙනුන් හා බැටළුවන් ද රැක බලා ගත්තේය. දවස පුරා තණ බිම් වල ඔවුන් සමඟ හුදෙකලා වූ හේ සැඳෑ සමයේ ඔවුන් ආපසු දක්කා ගෙනවුත් වැට කොටු තුළ ගාල් කෙළේය. වහලා අස්වනු එක් රැස් කිරීමට උදවු කෙළේය. හේ මිදි වලින් යුෂත්, ඔලිව් ඇටයෙන් තෙලුත් මිරිකා දුන්නේය. රන් වන් ධාන්‍ය ගොඩවල් අටු-කොටු වල පුරවා ලූයේත් හෙතෙමේ මය. ඔහුගේ අත් වල ශක්තියෙන් මිරිකී කාන්දු වන සුවඳ තෙල් විශාල මැටි බඳුන් තුළ තැන්පත් විය.

වහල් මිනිසා නිවහල් මිනිසාට උදවු කෙළේය. එහෙත් එහි දී දුෂ්කරතම කොටස කෙළේ වහලාය.

මේ අතර වහලුන් සපයා ගත හැකි හෙයින් ද, ඔවුන් වහල් හිමියනට මහා පරිමාණ ධනස්කන්ධයක් ඉපැයූ හෙයින් ද යුද්ධය වාසි දායක ව්‍යාපාරයක් බවට පත් විය. තව ද මේ අසුරින් සිය සතුන් රැක බලා ගැනීමත්, ගොවි බිම් වල වැඩ කිරීමත් වහලුනට තබා, නිවහල්ලු යුද්ධයට පිටත් වූහ.

කුඩාරම නිවෙසක් වූයේත් නිවෙස පුරයක් වූයේත් කෙසේ ද?

රුසියන් පුරා විදූ දරු එස්. තොල්ස්තොව් සිය ''පුරාණ හොරෙසම්'' නම් කෘතියෙහි, මධ්‍යම ආසියාවේ කාන්තාර වල සොයා ගනු ලැබූ නටබුන් බලකොටු-නිවෙස් ගැන විස්තර කරයි.

මේවායේ සැලැස්ම නිවෙසකට වඩා නගරයෙක ප්‍රමාණය සේ විශාල විය.

දැඩි සේ පුළුස්සනු ලැබූ මැටි බිත්ති, සෑතපුම් කිපයක් ඇතට විහිදෙමින් ඒ තුළ දැවැන්ත නිදහස් චතුරශ්‍රයත් අවුරා සිටියේය. සාමූහික සමාජය, සිලමේ කුඩා ජනේලයෙන් හා ආරුක්කු සහිත කොරිඩෝරයෙන් ද යුතු වූ බිත්ති මැද පිවත් වූහ.

මැද හිස් ව ඉතිරි වූ විශාල චතුරශ්‍රයක් තිබිය දී, බිත්ති අතර බාධිත අඳුරු කොරිඩෝර තුළ, දහස් ගණන් මිනිසුන් පිවත් වූ ආකාරය සොයා ගැනීම පුදුමයට හේතුවෙක් විය.

තොල්ස්තොව් මේ ප්‍රශ්නයට ඉතා සරල පිළිතුරක් දුටුවේය. එකල හෝරේස්ම් වැසියන්ගේ ධනය වූයේ ගව පට්ටිය. චතුරශ්‍රය සැබවින් ම ඉමහත් සිවු පා රැළ පිණිස වූ යෝධ කොටුවෙක් විය. ඒ අතර කුරුබිලි හා මුර කනු සහිත බිත්ති, සතුරු පහර දීමෙකින් මේ ධනය ආරක්ෂා කෙළේය.

ඉදින් සතුරෙක් පහර දීමක් ඇරඹී නම්, සියලු බල කොටු නිවැසියෝ කුරුබිලි අසල තමන්ගේ නිල තැන සිට ආක්‍රමණිකයන් මත හිසර වැසි වැස්වූහ.

හැම දෙන ම අනන්‍ය නෑදෑයන් වුවත්, ඇතැම් පවුලකට බැටළුවන්, ගවයන් හා අසුන් වැඩි පුර සිටියෙන්, ඔවුන් විසින් සාමූහික ව ආරක්ෂිත වූ අර ධනය පොදු වස්තුවක් ලෙස වැඩි කලක් නොරැඳුණේය.

ඇත එපිට සමයයන්හි පවා ''පොහොසත්'' යන වාක්‍ය ඛණ්ඩය යෙදුණු බව පැරණි පුරාවෘත්ත අපට කියයි. එදා මිනිස්සු ''අසවලා පොහොසත් යැ'' යි නිකම් ම නොකිහ. ඔවුන් කිවේ ''ගව සම්පතින්

පොහොසත්'' හෝ ''අස් සම්පතින් පොහොසත්'' යනුවෙනි.

අසල් වැසි බලකොටුවකට එල්ල කළ හැම පහර දිමෙකදි මරණ දෙටුවන්ගේ සතුන් රැළ වැඩි වූයේ පමණක් නොව ඇත්තන් හා නැත්තන් අතර පරතරය ද වැඩි වූයේය.

තොල්ස්තොව් සහ ඔහුගේ සගයනට වෙනත් වගයෙක බල කොටු ද හමු විය. ඒවා පසු කලෙක ගොඩ නහන ලද්දාහ. නිවෙස් හා පුර යන ලක්ෂණ දෙක ම දරත්.

කාන්තාරයන්හි ඔවුන්ගේ කැණීම් වසර ගණනක් තිස්සේ පැවතිණ. මේ කාරිය බෙහෙවින් දුෂ්කර හා බරපතල ව්‍යාපාරයෙක් විය. සෝවියට් විද්‍යාඥයෝ දිගු කලක් යටපත් සංස්කෘතියෙක පිය සටහන් විමසමින් ඔටුවන්ගෙන්, මොටෝ රියෙන්, මෝටර බෝට්ටුවෙන් සහ අහස් යානයෙන් ද ගමන් කළහ. ඇතැම් විටෙක ඔවු මොල්ලියක් හෝ ගොඩැල්ලක් මත දී ඔවුනට දකින්නට ලැබුණේ දුඹුරු පැහැති ලවණ තට්ටුවෙකින් වැසී ගිය පස් ගොඩක් පමණි. එහෙත් අහස් යානයෙක නැඟි කාන්තාරය උඩින් පහත මට්ටමෙකින් පියාඹමින් යන අතර බිත්ති පදනම් වල පැහැදිලි දළ සටහන්, විදි හා විශාල සාමූහික නිවෙස් ද ඔවුනට සොයා ගත හැකි විය.

මේ නිවෙස් හා පුරයන් ගැන තතු තේරුම් ගත් ඔවුනට අවසන්හි, ප්‍රාග්-සාමූහික සම්ප්‍රදායයන්, වහල්-හිමිසම්ප්‍රදායයකට විකාශනය වීම පිළිබඳ කතා පුවත ගොනු කර ගනු හැකි විය.

මෙහි ''ද්ජම්බාස්-කාලා'' නම් තැන අසල, ඩිචර්යන්ගේ සාමූහිකකුඩාරම් නිවසෙක් වෙයි. එහි පොහොසත්තු හෝ දුප්පත්තු නොවූහ. සියලු ම උදුන් එක ම ප්‍රමාණයෙන් යුක්තය. හැම දෙනා ම එක සේ දුප්පත් හෙයින් එක සමාන වූහ. මේ නිවහනට ආරක්ෂාසංවිධාන යොදා නොතිබිණි. ආරක්ෂා සංවිධාන යෙදීමට තරම් සම්පතෙක් එහි නොවිය.

මේ කුඩාරම් පෙදෙසට නුදුරින් මැටියෙන් තැනුණු "දික් ගෙයෙක" නටබුන් පුරා විද්‍යාභූයනට හමු විය. සියලු ම උදුන්, අඩි 150 ක් බැගින් දිග කොරිඩෝර් දෙකක් දිගේ පෙළට, එකක් පසු පස එකක් සේ සිටින්නට සකසා තිබිණ.

මේ නිවහනට ද ආරක්ෂා සංවිධානයෙක් නොවිය. එහෙත් සියවස් ගණන් ගෙවී ගියේය. වෙන වෙන ම වූ දික් ගෙවල බිත්ති විශාල එක් ගෙයෙක බිත්තියක් වන සේ සම්බන්ධ කරන ලදී. මේ ගෙවලින් වට ව විශාල සතරැස් ආංගනයෙක් විය.

"කුයිසෙලි-ගීර්" නම් තැන කොටු කර තැනුණු නිවහන් ආකෘතිය මෙබඳු වෙයි. මෙහි බිත්ති වල කුරුබිලිත්, මුර කනුන් අපට හමුවෙයි. මෙහි නිවැසියෝ මේ අයුරින් සිය සිවු පා රංචු සතුරු කඩා වැදීම් වලින් රැක ගත්හ. එහෙත් ඔවුහු සිය අසල් වැසියනට පහර දීමට හෝ අන් සතු දේ පොල පැහැර ගෙන පලායාමට හෝ නොසිතූහ. ඔප්පු කිරීමට තරම් නියත සාධක නැතත්, මෙහි ඇතැම් පවුල් අනෙක් ඒවාට වඩා පොහොසත් වූහ. මෙසේ පැවති පරතරයන් ගැන පුරා විද්‍යාභූයනට හුදෙක් අනුමාන කළ හැක්කේ වෙනත් රට වල හා ලෝකයේ වෙනත් කොටස් වල ජීවත් වන ජාතීන්ගේ සිරිත් විරිත් හා සම්ප්‍රදායයන් අධ්‍යයනය කිරීමෙනි.

ඉක්බිති පියවර වූයේ "ද්ජමබාස්-කාලා" බල කොටුවයි. දෑවැන්ත, බහුකුටික, සාමූහික නිවෙස් දෙකෙකින් අවකාශය වැසී ගිය හෙයින්, එහි බිත්ති වලින් වට වී තිබුණු හතරැස් මිදුල හිස් නොවිණ. ගෙවල් දෙක මැදින් "ගිනි හල් ගෙය" වෙත විදියක් දිවෙයි. ප්‍රාග්ගෛතිහාසික ධීවරයන්ගේ කුඩාරම් තුළ ඒ පැරණි උදුනෙහි "නොනිවා තබා රැකි ගින්න" මෙහි දී දේවාලයක් බවට සංවර්ධනය වී ඇත.

බල කොටුව වැඩි කලක් එක ම කුලයෙකින් පමණක් ආවාසික නොවිණ. කුල කණ්ඩායම් දෙකක් වෙන වෙන ම තමන්ගේ ම ගෙවල් දෙකෙහි සිටි සේ පෙනේ. මෙහි නිවැසියන්ගේ ප්‍රධාන දිවි පෙවෙන

සත්ව පාලනය නොව කෘෂිකර්මය වූයෙන් එතුළ කොටුවක් නැත. බල කොටු පවුරින් පිට, දිගට හරහට විහිදි ඇළ මං සහිත කුඹුරුය. බල කොටුව විසින් කුඹුරු සහ ඇළ මං ද සංචාරක එඬේරුන්ගෙන් ආරක්ෂා කරනු ලැබේ.

තව ද මෙහි ම ඇති ''ටොප්රක්-කාලා'' බල කොටුව පසු කාලීන වඩා දියුණු පියවරක් දක්වයි. මෙහි බල කොටු පවුර තුළ දුසිමකට කිට්ටු බහු කුටික නිවහන් කිපයෙක් ඇත. විශාල කුලුනු සහිත පවුරින් මුළු පුරය සිවු පසින් ම වට කෙරෙයි. ආගන්තුකයකුට සැනෙකින් එහි ඇතුළු විය නොහෙයි. ඔහු විසින් පළමුවෙන් ම, නියම මහ ආරක්ෂා කරනු ලබන වංගගිරියෙකින් ගමන් කළ යුතුය.

පිවිසුම් දොරටුවෙන් ඇරඹෙන මහ විදිය කෙළින් ම පුරය මැදින් එක් කෙළවරෙක සිට අනෙකට දිවෙයි. ඒ දෙපස සිය ගණන් කුටි සහිත විශාල සාමූහික නිවෙස් ද, කුඩා කුලුනු ද, මීදුල් ද වෙයි. මහ විදිය විසින් ''ගිනි හල් ගෙය'' සහ පුර පතියාගේ මහානුභාව සම්පන්න තුන් ටැම් පහයටත් මහ පෙන්වනු ලැබේ.

මේ ඉතුරු බිතුරු සියල්ල අද ඒවාට හිමි පරිදි ඒ ඒ තැන මැටියෙන් හා වැල්ලෙන් වැසී ගිය නටබුන්ය. පුරා විද්‍යාභ්‍යයනට මේ පුරයේ මුහුණුවර මතු කර ගොඩ නගන්නට දිගින් දිගටත් දැඩි වෙහෙසිනුත් කටයුතු කරන්නට සිදු විය.

ඔවුන්ගේ ඒ උදාර පරිශ්‍රමයට නිසි දායාද, අඛණ්ඩ වූ සොයා ගැනීම් වලින් හිමි කැරිණ. වඩාත් සිත් අදනා දායාද වූයේ තුන්-ටැම්-පායේ උදාර පෙනුමැති කුටි බිත්ති වල ප්‍රතිභා පූර්ණ නිපුණයන් විසින් නිමවන ලදුව, තවමත්, යම්තම් සලකුණු සේ ඉතිරි වී ඇති බිතුවම්ය. ඉදින් මේ කාන්තාරයේ නග්න වැලි තලාවේ ප්‍රාසාද බිත්ති මත දිස් වුණු අතීත දර්ශනයන් යළිත් පිවමානත්වයට පත් වූව හොත් එහි හාර්ප් නම් විණාව වයන දැරියක්, හිස මත පැසක් සම බර කර ගෙන මීදි නෙළන්නියක්,

කළු කබා කාරයෙක්, අශ්වයෝ, කොටියෝ සහ ගොවියෝ ද දකිනු හැකි වෙත්. එසේ ම එහි, කුසලතා පූර්ණ ශිල්පීන් නෙළූ ප්‍රතිමා වල සුන් බුන් ද විය.

ප්‍රසාද නටබුන් හැමෙකකින් ම මතු වී පෙනුණේ එහි හිමි කරුවන් අනෙක් පුර වැසියනට වඩා පොහොසත් ද, වඩා කුලවත් ද වූ බවයි.

තව ද මේ ප්‍රාසාදය, තෙමේ අනෙක් නිවහන් අතරින් ඒවාට අභියෝගාත්මක ව අහසට විහිදුණු ආකාරය එහි වැසියන් අනෙකුන්ට වඩා ඉසුරුමත් බවට සාධකයෙක් විය.

මේ වනාහි පුරයෙන්, මුළු රටෙක පාලකයා වූ හොරේසම් ෂාගේ, ඔහුගේ පවුලේ සහ ඔහුගේ අපමණ වහලුන්ගේත් නිවහනයි.

පුරය එයට ම හිමි තනි උරුමය ඇති රාජ්‍යයෙක් විය. මෙහි පාලකයාට වහලුන් හා දුප්පතුන් මැඩ පවත්වන්නටත්, ඉසුරුමත් හා කුලවත් පවුල් වල අයිතිවාසිකම් ආරක්ෂා කරන්නටත්, වාරි මාර්ග ව්‍යාපාරයන් පරීක්ෂා කරන්නටත් උදවු කළ හමුදාවෙක් විය. යෝධ වාරි මාර්ග ව්‍යාපාරයක් නිමැවීමට වහල්ලු දහස් ගණනින් යොදන ලද්දෝය. එක් බල කොටුවක් විසින් නොව බල කොටු කිපයක් විසින් ද, නිත්‍ය හමුදාවක් විසින් ද, කුඹුරු, ඇළවේ සහ හොරේසම්හි ගොවියන්ගේ සරල නිවහන් ද ආරක්ෂා කරන ලදී.

මෙසේ වසර දහස් ගණනෙක ඉතිහාසයක් අධ්‍යයනය කළ උගතුනට, කුඩාරම් නිවසක් වූයේත්, නිවෙස පුරයක් වූයේත් සමානාත්මතා වාදී සමාජයක් වහලුන් හිමි රාජ්‍යයක් බවට පත් වූයෙත් කෙසේ ද යි සියැසින් දැක බලා ගනු හැකි විය.

පුරා විද්‍යාඥයනට මෙබඳු විශාල බල කොටුගෙවල් වෙනත් තන්හි පමණක් නොව මධ්‍යම ආසියාවෙහි ලැබී ඇත. මිනිසුනට ඔවුන්ගේ ධනය සතුරු ආක්‍රමණ වලින් ආරක්ෂා කර ගන්නට සිදු වූ හැම තැනෙක ම ඔවුනට මෙවා ලැබී ඇත්තේය.

මළ ගිය ඇත්තෝ
පීවත් වන්නවුන්
ගැන අපට කියත්

දකුණු රුසියාව දිගේ විහිදෙන තැනි තලා බිමහි, ඇසට පෙනෙන තෙක් සීමාව දක්වා දිස් වන, දිගට විහිදුණු උස් පස් ගොඩැලි-පේළි සහිත තැන් ඇත. සම තලා තැන්න මත මෙවා කෙසේ ජනිත වීද? නැතහොත් කවරකු විසින් ගොඩ නහන ලද ද යන්න මතක ඇති කිසිවෙක් එහි පෙදෙස් වැසියන් අතර නැත.

අර ගොඩැලි වනාහි කලෙක තැනි තලා වල පීවත් වූ මිනිසුන්ගේ පැරණි මිනි කඳු හෙවත් සොහොන් වළවල්ය.

යමකු මළ පසුත් ඔහුට කන්නටත්, වැඩ කරන්නටත් සිදු වන හෙයින් ගැහැනු පරාණයකට ඇගේ නුල් කටින ඉද්දත්, පිරිමි පරාණයකට ඔහුගේ

හෙල්ලත් වුවමනා වෙති යි මිනිස්සු විශ්වාස කළහ.

පැරණි මිනී කඳු ගොඩැලි වලින් වැඩි හරියක් හැමතින් ම එක සමානය.

එම යට ගිය මුල් සමයයන්හි පුද්ගලයකු සතු උරුමය සොච්චමක් වූයෙන් මළ තැනැත්තා සතු වූ ද්‍රව්‍ය කිපයක් ඔහු පසෙකින් තැන්පත් කැරිණ. මෙසේ ඔහුට තමාගේ ය යි කිය හැකි වූයේ කිමෙක් ද? සැබෑවින් ම කර වට පැළඳි යන්තරය, සුරය හෝ රණ බිමට ඔසොවා ගෙන ගිය හෙල්ල පමණෙකි.

මුළු පවුල හෙවත් කුලය ම එකක් හැටියට ගෙදර-දොරේ කටයුතු සාමූහික පදනමක් මත හසුරුවන ලද බැවින් නිවහනේ වූ මුළු හරුබස්ස ම පොදු වස්තුවක් වූයේය.

පැරණිතම සොහොන් ගොඩැලි වල පොහොසත් හෝ දුප්පත් සොහොන් ගෙවල් දක්නට නැත්තේ එහෙයිනි. මළ සියලු මිනිස්සු ම එක සමානයෝය.

මළවුන් අතරත් දුප්පත්-පොහොසත් අය දක්නට ලැබුණේ පසු කලෙකය.

යෙලිසවෙතෝව්ස්කයා ගම අසල ''දොන්'' නම් තැන මිනී කඳු ගොඩැලි සහිත සොහොන් බිමක් සොයා ගන්නා ලදී. එහි තුන් ගණයෙක සොහොන් ගෙවල් විය. එනම් පොහොසතුන්ගේ, මධ්‍යම පාන්තිකයන්ගේ හා දුප්පතුන්ගේ වශයෙනි.

විශාලතම සෙහොන් ගොඩැලි තුළ මැද, ලොකු වළක් විය. මෙය මිනී වළයි. එතුළ සායම් කළ ග්‍රීක් මල් බඳුන්, රන් ඔබබන ලද සන්නාහ සහ සංකීර්ණ මෝස්තර කැටයම් කරන ලද කොට කඩු ද විය.

ඊට වඩා කුඩා මිනී වළවල් තුළ කලාතුරෙකින් කිසියම් රන්මුවා දෙයක් තිබිණ. කිසි විටෙකත් සායම් කළ මල් බඳුන් නම් නැත. නිසැකයෙන් ම මෙවා දුප්පතුන්ගේ සොහොන් ගෙවල් ය යි නොකිය හැකිය. ඉදින් මළ ගිය තැනැත්තා දුප්පතෙක් වී නම් වළ තුළ ඔහු පසෙකින් තැන්පත් කැරුණු කළු ලාකඩ දිසියක් හෝ ලෝහ තහඩු

වලින් දක්ෂ ලෙස නිමැවුණු සන්නාහයක් හෝ තිබෙන්නට නොහැකි ව තිබිණ.

කුඩාතම සොහොන් ගොඩැලි වනාහි බෙහෙවින් ම අනේකාකාර විය. මේවා නම් දුප්පතුන්ගේ සොහොන් වළවල් වෙයි. මෙහි මළ තැනැත්තාගේ දකුණු අත පැත්තෙන් පටු කානුව තුළ හෙල්ලක් හා වම් පසින් පිපාසය ඇති වුවහොත් බීමට හැකි වනු පිණිස කළයක් ද පමණක් විය. දුප්පතා සිය සොහොන තුළ ද නැති බැරි කමින් යුතු ව ම නැවති සිටියේය.

මිනිසා අලුත් ලෝභයක් නිමවයි

මිනී වළවල් තුළ අඳුරේ, අවුරුදු දහස් ගණනක් තැන්පත් වූ මේ අමිල දේත්, බල කොටු නගරයේ නටබුනුත් දැන් කටු ගෙවල ප්‍රදර්ශනය වෙයි. සිය වස් ගණන් පුරා, දර්ශන පථයෙන් ඈත් ව තිබුණු දේ, ඈත අතීතය ගැන වැඩි වැඩියෙන් දැන ගනු කැමති හැම දෙනා විසින් දැන් දැක ගත හැකිය.

මේ එක් එක් කෘතියක් සඳහා කොතරම් විශාල ශ්‍රමයක් හා කලා කෞශල්‍යයක් වැය වන්නට ඇද්ද!

ලෝකඩ කොට කඩු වලින් සරලතම එකක් නිමවා ගන්නට වුවත් බොහෝ දවසක් ගත විය.

පළමුවෙන් ම ලෝ පස් හාරා ගත යුතු විය. ස්වාභාවික තඹ දෙපයට පැගෙන යුග ගෙවී ගොස් තිබිණ. මිනිසාට තඹ පස් සෙවීමට පොළොව යට ගැඹුරට හාරා ගෙන යාමට සිදු වී තිබුණේය. කම්කරුවෝ ගැඹුරු පතල් ළිඳ පතුලේ වූ තඹ පස් යවුලින් කඩා හම් පැස් වල දමා මතු පිටට එවූහ.

ලොකු ගල් ගෙඩි පිපිරවීමේ කාරිය පහසු කරනු පිණිස ඔවුහු පොළොව යට ගිනි දැල්වූහ. ගල් ගිනි රතට හැරුණු විට ඔවුනට ඒ මතට සිසිල් දිය වත් කළ හැකි විය. එවිට දිය කඳ ''සූ'' හඬ දෙමින් හුමාල රොදවල් බවට පත් ව පා වී ගියේය. මේ අතර ගල දෙදරුම් කා පැලී කුඩා කැබලි බවට පත් විය. මෙසේ ගිනි-දිය යමා පෙළහර පතල් කරුගේ යවුලට උදව්වූ පසා ඉදිරිපත් වූයේය.

මේ සිද්ධියේ දී පතලය ගිනි කන්දක් සේ දිස් විය. පතල් පත්ලේ දැල්වුණු ගින්නෙන් මුදා හරින ලද දුම් රොදවල් ගිනි කඳු කටෙකින් සේ පතල් කටින් පිට වී ගියේය.

ලෝ පස් හාරා ගැනීමෙන් පසු උණු කොට ලෝහ කොටස වෙන් කර ගන්නා ලදී. මෙය ද ඉමහත් දක්ෂතාවක් ලෙස දැක්විය හැකිය. නිවුණු ලෝහය තද වීමටත්, උණු වූ ලෝහය පහසුවෙන් අච්චු වලට වත් කර ගැනීමටත් තඹ ලෝ පසට ''කැසිටරයිට්'' එක් කරන ලදී.

උණු වූ ලෝපස් හා ''කැසිටරයිට්'', තඹ-බෙලෙක් නම් නව ලෝහ මාත්තුවක් ජනිත කෙළේය. මෙය හුදෙක් සාමාන්‍ය තඹ නොවේ. එය මිනිසා තමා විසින් ම නිපදවාගනු ලැබූ, අලුත් ගුණ විශේෂයන් සහිත අලුත් ලෝහයක් වූ ''ලෝකඩ'' නම් වූයේය.

මමත්වය හා ඔබත්වය

මුලින් හැම ශිල්පියෙක් ම සමාජයටත් සිය ගමටත් පමණක් වැඩ කෙළේය.

එහෙත් යථා කාලයේ දී අවි තනන්නා හෝ කුඹල් කරුවා තමන් නිමැවූ දෑ වැඩි වැඩියෙන් හා නිතර නිතරත් අනෙක් ශිල්පින් නිමැවූ ධාන්‍ය, රෙදි හෝ වෙනත් දෑ සමඟ හුවමාරු කර ගන්නට පටන් ගත්තේය.

සිසිල් දියෙන් නාවන විට පතලක් තුළ දෙදරමින් පුපුරන ගිනි රත් පැහැගත් ගලක් මෙන්, පැරණි ගෝත්‍රික සමාජ ක්‍රමය ද ඉරී තළන්නට පටන් ගෙන තිබිණි.

මූලාරම්භයේ දී සියලු ම ගම් වැසියෝ එක සමාන වූහ. එහෙත් පසු ව එක් ඉරි තැළීමක් ධනවත් පවුල්, දුප්පත් පවුල්වලින් වෙන් කෙළේය. තවත් ඉරි තැළීමක් ශිල්පියා ගොවියාගෙන් වෙන් කෙළේය.

ශිල්පියා, සාමූහික සමාජය උදෙසා වැඩ කරන තාක් ඒ සමාජය ඔහු පෝෂණය කෙළේය. මිනිස්සු එකට වැඩ කළහ. තමන් සෑදූ හා වැවූ සියලු දේ බෙදා-හදා ගත්හ.

එහෙත් ශිල්පියා සිය කේතල හා කඩු ද, අනෙක් ගම් සමඟ වෙළෙඳ හුවමාරුවක් කරන්නට පටන් ගත් කල්හි, එම හුවමාරුවේ දී තමාට ලැබුණු ධාන්‍ය හෝ රෙදි-පිළි තමාගේ බොහෝ නැයන් සමඟ බෙදා ගන්නට ඔහුට වුවමනා නොවිය.

එසේ වූයේ අර ධාන්‍යත්, අර රෙදි-පිළිත්, උපයා ගත් ඔහුත් ඔහුගේ පුතුනුත් හැර, අන් එකෙක් වත් ඔවුනට උදව් නොකළ නිසාය.

මෙසෙයින් මිනිසා සිය අනන්‍ය පවුල නැදෑයන්ගේ අන්‍ය පවුල් වලින් වෙන් කිරීමට ''මගේ'' හා ''තගේ'' අතර වෙනස සලකන්නට පටන් ගත්තේය.

මිනිස්සු තම කුඩා පවුල් කණ්ඩායම් වශයෙන් ජීවත් වන්නට පටන් ගත්හ.

පුරාතන ග්‍රීසියේ ''මයිසිනායි'' සහ ''ටයිරින්ස්'' හි ද නගරයන්හි, මේ වෙනස තියුණු කරන ජනපද නටබුන් පුරා විද්‍යාඥයනට හමු විය.

ධනවත්තම හා බලවත්තම පවුල ශක්ති සම්පන්න ප්‍රකාරයෙකින් ඔබබෙහි කඳු මුදුනෙක පිවත් විය. මෙවන් සෙල්ලිවා පවුරෙකින් ඔබබෙහි සුරැකෙන්නට තරම් සැහෙන වත් පොහොසත් කමෙක් ඔවුනට විය. ගෝත්‍රයේ රණ දෙටුවා සිය බිරියන්, පුතුන්, ඔවුන්ගේ බිරියන් සහ දරුවන් ද සමඟ මෙහි පිවත් විය.

රිට වඩා දුප්පත් ගොවියෝ පහළ තැනි තලාවේ සිය පැල්පත් තුළ ගුලි වී මිරිකී පිවත් වූහ. ශිල්පීන් අවි තනන්නන්, කුඹලුන් හා තඹ කරුවන්ගේ ගෙවල්, අවට කඳු මුදුන්හි විසිර තිබිණ.

මේ ආකෘතියෙන් සැදි ගමේ, මිනිස්සු වැඩි කලක් එකෙකාට සමානයන් ලෙස ආමන්ත්‍රණය නොකලහ. දනවත් හා බලවත් ගෝත්‍ර නායකයා යනු දුටු කල ගොවියෝ, ''දෙවියන් තුමූ ම අනුශාසකයන් වෙතොත් මෙවන් බලවතුනට ම පමණක් වෙති'' යි විශ්වාස කළහු ඔහුට ගරු සම්මාන පැවැත්වූහ. නායක පූජකයෝ මෙවන් අදහස් ඔවුනට ඉගැන්වූහ. මෙවන් අදහස් ළමා කල මුල් අවදියේ පටන් ම ඔවුන්ගේ සිත් වලට ටිකින් ටික ම කාන්දු වන්නට සලස්වන ලදි.

නව නැමීමෙක

උදාව

අපි නැවතත් මිනිසා විසින් හරස් කපන ලද මහෙහි ආපසු හැරී බලමු.

එහි පොහොසතුන් හෝ දුප්පතුන් වත් වහලුන් හෝ වහල් හිමියන් වත් නොමැති අවදියෙක් විය.

සිය තාවකාලික මුස්පේන්තු බිම ගෙවල් වල මිරිකී පිවත් වූ ප්‍රාග්ඓතිහාසික දඬයක් කාරයෝ හැම ම එක සමාන දුප්පත්තු වූහ. ගිනි ගලින් හා ඇට වලින් තැනුණු ඔවුන්ගේ අවි බෙහෙවින් දළු විය. වල් සතුන්, හාමත හා සීතල යන දෙයින් ඔවුන් බෙරා ගනු ලැබූ එක ම හේතුව නම් එකට පිවත්

වීමත්, එකට දඩයම් කිරීමත්, සිය සාමූහික ශක්තිය ආපදාවට එරෙහි ව යොදා තුබූ ම ආරක්ෂා වීමත්, සාමූහික නිවාස ගොඩ නැඟීමත්ය.

තව ද වසර දහස් ගණන් ගෙවී ගියේය. ප්‍රාගෛතිහාසික කුඩාරම් සහ තාවකාලික බිම් ගෙවල් වල තැන දියුණු නිවහන් විසින් අයත් කර ගැනිණ. ගිනි ගලින් හා ඇට වලින් තැනුණු උපකරණ වල තැනට ලෝහ උපකරණ පැමිණියේය.

මිනිස්සු පළමුවෙන් ම මුල්ලු වලින් බිම හැරූහ. ඉක්බිති ලී නඟුලිනි. ඔවුහු අශ්වයා, එළදෙන සහ බැටළුවා ද හීලෑ කර ගත්හ. කිනිහිරී මත කුළු ගෙඩි පහර වදින හඬ කම්මල් වෙතින් නිකුත් විය. කුඹල් සක කැරකෙන්නට පටන් ගත්තේය. ශ්‍රමය වෙනස් ගමනක් අරඹා සිටියේය. පොරොවක් හෝ දෑකැත්තක් වෙනුවට ධාන්‍ය හුවමාරු කර ගැනීම පහසු වූයෙන්, කම්මල් කරුවකු තුළ ගොවිතැන් කිරීම ගැන අදහසෙක් ඇති නොවිය. තමාට වුවමනා තරම් ලෝම පිණිස සිය ධාන්‍ය හුවමාරු කළ හැකි වූයෙන්, ගොවියාට බැටළු පට්ටි පාලනය කරමින් කරදර වන්නට අවශ්‍ය නොවිණ.

මෙසේ පළමුවෙන් බෝට්ටුත්, ඉක්බිති යාන්ත්‍රික නැවත් ගමෙකින් ගමකට පිටත් විය. ඒවා ධාන්‍ය හා ලොම් වලින් ද, පොරෝ සහ මැටි බඳුන් වලින් ද බර වී තිබිණ. හොර කමත්, හුවමාරුවත් අත් වැල් බැඳ ගත්තක් වූයෙන් වෙනත් පෙදෙසෙකින් ආ ''අමුත්තෝ'' හොරුන් බවට ද පත් වූහ.

මූල දී කිසිවකුට සිය නෑයනට වඩා පොහොසත් විය නොහැකි වූයේය. සියල්ලෝ ම එක සේ දුප්පත් වූහ.

කාලයාගේ ඇවෑමෙන් කෙසේ හෝ, ධනවත් හෝ බලවත් පවුල් වලට හිමි ගෙවල් වටා ගොඩ නැඟුණු උස් ගල් තාප්ප දුප්පතුන්ගේ පැල්පත් වලට ඉහළින් කඳු මත දිස් වුණේය. ධනවතුන්ගේ ගබඩා ගෙවල් බඩු වලින් පිරී පුපුරන්නට ළං ව තිබිණ. වසරින් වසර ඔවුන්ගේ ධනය වැඩිණ; ගුණ වීණ.

ධනවත්තු දුප්පතුන් තමන් යටතේ තබමින් සමාජය තුළ බලය සියතට ගත්හ. තමන් වඩ වඩාත් නිරතුරු ව අසල් වැසි පොහොසතාගෙන් උදවු ඉල්ලීමට බල කරනු ලැබූ බව දුප්පතාට දැනෙන්නට විය. දුෂ්කර සිසිරයෙක දී තමා විසින් ණයට ගෙන තිබුණු ධාන්‍ය උදෙසා ධනවතාට ණය ගෙවන්නට දුප්පතා විසින් අවුරුදු ගණන් වැඩ කළ යුතු වූයෙන් මේ උදවුව බෙහෙවින් වියදම් සහිත එකක් විය.

මේ නයින් ඇතැම්මු වෙනත් අය වහලුන් කර ගැනීමට පටන් ගත්හ. එහෙත් වහල් කම විකාශයට පත්වූ එක ම ක්‍රමය මෙය නොවේ. යුද්ධ වල දී මිනිස්සු අල්ලා ගනු ලැබූහ. ඉක්බිති මේ නිවහල් මිනිස්සු වහලුන් කරනු ලැබූහ.

මෙසේ ප්‍රාථමික-සාමූහික සමාජ ක්‍රමය අලුත් එකක් වූ වහල් හිමි ක්‍රමය විසින් යටපත් කරන ලදී.



විද්‍යාවේ මුල් බිඳුවට

මුළු ලොව ම මිනිසාට අබිරහසක් වූ සමයයෙක් විය. හැම එකක් ම ප්‍රහේලිකාවක් හා අමුතු දෙයක් ද විය.

ඉදිරියට තැබූ හැම පියවරක්මත්, අතෙහි හැම වලනයක්මත් විපතක් හෝ සැපතක් පිණිස හේතු වන බල වේගයක් ක්‍රියාවට නැඟිය.

එහෙත් නොයෙක් කාර්යයන්හි යෙදුණු මිනිසා ලෝකය ගැනත් ද්‍රව්‍යයන්හි ඇති විවිධාකාර විශේෂත්වයන් ගැනත් වඩ වඩාත් උගත්තේය.

පිවිතය ඔහුට විශේෂත්වයන්ගෙන් පිරී ගියේ කුමක් නිසා ද යත්, ඒ පිළිබඳ පොදු නීති ඇද මතු කොට ගන්නට නොහැකි වූ නිසයි. කවර දාක වත් ගල් දෙකක් එක සේ නොවන බව හේ දුටුවේය. ඒ එක එකක වෙනස් වෙනස් වූ විශේෂ ගති ගුණ ඇතැයි ඔහු සිතුවේ එහෙයිනි. අලුත් ගිනි ගල් මුල්ලුවක් තනන විට නුලට ම පැරණි මුල්ලුව සේ ම තනන්නට හේ උත්සාහ කෙළේය. එසේ නොවූ කල පැරණි එකෙන් තරම් ම හොඳින් ඉන් පොළොව නොහැරෙති යි ඔහුගේ අදහස විය.

වසර සිය දහස් ගණන් ගෙවී ගියේය. සිය අත්ලෙහි ගැටී ඉන් ගිලිහී ගිය බොහෝ වූ විවිධාකාර විසමතා යුත් ගල් වර්ග වලින්, මිනිසා ගල් පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ලබන්නට පටන් ගත්තේය. සියලු ම ගල් තද වූ බැවින් නියත වශයෙන් ගල් තද බව ඔහුට කිය හැකි විය. කිසි දිනෙක එක ද ගලක් වත් කතා නොකර තිබුණු හෙයින් ගල් කතා නෙකරති යි ද ඔහුට කිය හැකි විය.

මෙසේ ද්‍රව්‍යයන්ගේ සාමාන්‍ය ප්‍රත්‍යයන් හෙවත් විද්‍යාත්මක අදහස් පිළිබඳ මූලික සංකල්ප දකින්නට ලැබිණ.

''සිසිරයට පසු වසන්තය එයි.'' නියතයෙන් ම මේ ගැන පුදුම වන්නට දෙයක් නැත. සිසිරයට පසු සරදය නොව වසන්තය ම එන බව ඉඳුරා පැ-

හැදිලිය. අපේ මුතුන් මිත්තන් බහුල නිරීක්ෂණයෙන් කළ මුල් ම විද්‍යාත්මක සොයා ගැනීම් වලින් එකක් නම් ඍතු විපර්යාසයයි. සිසිරයත්, ගිම්හානයත් අතර ඔබෙන් පැමිණෙන්නක් නොවන බව වටහා ගත් පසු පමණක් මිනිස්සු, අවුරුදු ගණන් ගන්නට උගත්හ. හැම විට ම සිසිරයට පසු වසන්තයත්, ඉන් පසු ගිම්හානයත්, ඒ එක්ක ම සරඳයත් උදා වන බව ඔවුහු වටහා ගත්හ.

ඉපිප්තියානුන් මෙය සොයා ගත්තේ නයිල් ගඟේ ජල ගැල්ම විමැසීමෙනි. එක් ජල ගැල්මෙක සිට අනෙක දක්වා කාලය එක් අලුත් අවුරුද්දක් ලෙස ඔවුහු ගැණ බලා ගත්හ.

ගඟ දෙවියෙකි යි මිනිසුන් සැලකූ හෙයින් නායක පූජකයෝ ගඟ නිරීක්ෂණයේ යෙදී සිටියෝය. අදත් නයිල් නදී බඩ ඉපිප්තියානු දෙවොල් බිත්ති වල, පූජකයන් ජල මට්ටම ලකුණු කිරීමට යොදා ගත් කුඩා ඉරි ඇත.

ජූලි මාසයේ දී කුඹුරු වල පොළොව පැවිල්ලෙන් ඉරි තැළී ගිය කල, නයිල් නදියේ කහ පැහැති රොන් මඩ සහිත ජලය ඇළ මං දිගේ ගලා ගෙන යන මොහොත තෙක් කනස්සල්ලෙන් බලා සිටීමට ගොවියනට සිදු වන්නට ඇත. එහෙත් ඇතැම් විට එවැන්නක් මේ අවුරුද්දේ දකින්නට නොලැබේ ද? ඉදින් දෙවියෝ මිනිසුන් සමඟ කිපී සිටියෝ නම් ඔවුන්ගේ කුඹුරු වලට ජලය නොඑවනු ඇත්තේ ද?

හෙමින් හෙමින් හා පියවරින් පියවර මිනිස්සු, සුරාංගනා කතාවන් හා ඉන්ද්‍ර ජාලයන් පිළිබඳ ලෝකයෙහි නොව තමන් පිවත් වූ අරුම පුදුම භෞතික සම්භාර ලෝකයෙහි ස්වාමිත්වයට පත් වූහ. මුල් ම තාරකා විද්‍යා පරීක්ෂණාගාර වූයේ දේවාල වහලවල්ය. මුල් ම පර්යේෂණයන් මෙහෙයවන ලද, මුල් ම විද්‍යාගාර වූයේ කුඹල් කරුවන් හා ලෝකරුවන්ගේ කම්මල්ය.

තමන් අත් දුටු දෙයින්, නිගමන වලට එළඹෙනු පිණිස නිරීක්ෂණය කරන්නට හා ගැණ බලන්නටත් මිනිස්සු උගත්හ.

දෙව් වරු ඔලිම්පස් කඳු මුදුනට පසු බසින්

සුරාංගනා කතා ලෝකය නමැති ගන බහල මිදුම් පටලය මැද සිදු වීම් පිළිබඳ සැබෑ තත්ත්වය ගැන වූ දළ සටහන් මිනිසාට කෙමෙන් අවබෝධ වන්නට පටන් ගති.

හැම ගසක්, ගලක් හා තිරිසනකුත් තුළ යනාදි හැම තැනෙක ම භූතාත්මයක් වෙති යි ප්‍රාගෛතිහාසික මානවයන් විශ්වාස කළ සමයයෙක් විය.

එහෙත් කල් නොයා දී මේ විශ්වාසය අතුරුදන් විය.

මිනිසා, හැම තිරිසනකු තුළ ම භූතාත්මයක් පිවත් වෙති යි තව දුරටත් නොසිතිය. හුදෙක් සිතිවිලි මාත්‍රයක් ලෙස, ගන වන ලැහැබ වල විසූ වන දෙවියෝ සියලු තිරිසන් භූතාත්මයන්ගේ තැනට පත් වූහ.

ගොවියා, හැම තිරිහු කරලෙක ම භූතාත්මයන් වෙති යි සිතීම නතර කෙළේය. ධාන්‍ය වලට අරක් ගත් සියලු භූතාත්මයෝ, හැම දෙයක ම වැඩීමට හේතු සාධක වූ, සශ්‍රීකත්වය පිළිබඳ දෙව් දුවගේ පුද්ගලත්වය බවට ඔහුගේ සිත තුළ එකමිති වූහ.

මේ දෙව් වරු භූතාත්මයන්ගේ තැන ගත්හ. එහෙත් ඔවුහු වැඩි කලක් සාමාන්‍ය මිනිසුන් සමඟ එක් ව නොවසූහ. දැනුම විසින් ඔවුහු මිනිස් නිවහන් වලින් වඩ වඩාත් ඈතට පලවා හරිනු ලැබූහ. මිනිසා කිසි දිනෙක අත නොපෙවූ අඳුර, ශුද්ධ වූ ගන වන ලැහැබ හා ගහ කොළින් වැසී ගිය කඳු මුදුන් වැනි තැනක් සොයා ගන්නට මේ හේතුව ඔවුන් පෙලැඹීය.

එහෙත් මිනිසා කල් නොයා දී මේ තැන් වලට ද ළඟා වූයේය. දැනුම විසින් අඳුරු වනය ද ආලෝකවත් කැරිණ. දැනුම, කඳු බෑවුම් වසා පැතිර ගිය මුළාව නමැති ගන මිදුම් පටලය ද විසුරුවා හැරියේය.

තව ද මේ අයුරින් දෙව් වරු නැවතත් වරක් ඔවුන්ගේ අලුත් නිවහන් වලින් ද එලවා දමනු ලැබූහ. ඉක්බිති ඇතැම් දෙව් වරු අහස් කුසට පියාසර කළහ. ඇතැමෙක් මුහුදු පත්ලට කිමිදී ගියෝය. ඇතැමෙක් පොළෝ තලයේ යටි පැත්තෙහි, පාතාල ලෝකයේ අඳුරෙහි ගිලි නොපෙනී ගියෝය.

දෙව් වරු වඩ වඩාත් කලාතුරකින් මහ පොළොවට බැස්සෝය. බල කොටුවක් වට ලැමේ දී හෝ සටනෙකැ දී හෝ හටුල් වීමට ස්වර්ගයේ සිට මිහි මතට බසින්නට දෙවියන් පුරුදු ව සිටි අවස්ථා ගැන වූ මිථ්‍යා ආඛ්‍යාන පරපුරින් පරපුරට පැවත ආයේය.

කලින්, කටටඩියා දඬයම් නැටුමෙක අධ්‍යක්ෂ වරයා පමණක් විය. හේ සිය ගෝත්‍රිකයනට වඩා භූතාත්මයන් සමඟ වැඩිතර සුහද බවක් ඇත්තෙක් නොවීය.

එහෙත් දැන් කවර හැටියෙන් හෝ පුජකයා සම්පූර්ණයෙන් ම රිට වඩා අමුතු පුද්ගලයෙක් විය. හේ දෙවි වරුනට කිට්ටුව ශුද්ධ වූ කුටියක් තුළ පිවත් විය. හේ තරු මඬල නමැති පොතෙහි දෙවියන්ගේ නියමයන් කියවීමට දේවස්ථානයේ වහළ මතට නැග්ගේය. මේ පොත කියැවිය හැකි වූයේ ඔහුට පමණය. යුද්ධයකට පෙර, බිල්ලට කැප වූ සිවු පාවකුගේ අතුණු බහන් දෙස යමතම බැල්මක් හෙලීමෙන් සටනේ ප්‍රතිඵලය වන ජය හෝ පරාජය කියන්නට ඔහුට හැකි විය! අන්තිමට පුජකයෝ මිනිසුන් හා දෙවියන් අතර, තැරැව්කාරයන් බවට පත් වූහ.

සිය පිය වරුන්ගේ පව් වලට, දරුවනට දඬුවම් කරනු ලබද්දීත්, සත්පුරුෂයා තැවෙන අතර අසත්පුරුෂයා යහතින් පිවත් වෙද්දීත්, සියුස් දෙවියාගේ මොන සාධාරණත්වයෙක් දැ යි කාහල හඬ නහා ග්‍රීක් කවියකු කවර දා හෝ අසනු ඇත. එහෙත් ඒ මොහොතේත් ඔහු අවවාද කෙළේ, කරන්නට ඉතිරි වී ඇති එක ම දේ නම්, තවමත් මිනිසුන් අතර ඉතිරි වී සිටින එක ම දෙව් දුව වූ "විශ්වාසය" වෙත කන්නලව් කරන්නටය. අනෙක් සියලු ම දෙව් වරුන්, ග්‍රීක් දේව ගණයා වෙසෙන කඳු මුදුන වූ "ඔලිම්පස්" වෙත පසු බැස සිටි හෙයිනි.

අවබෝධයේ සීමා
පුළුල් වෙයි.

ප්‍රාග්ඓතිහාසික මානවයා සත්‍යය හා සුරාංගනා කතාව අතරත්, භාජන සම්භාරය හා අන්ධ විශ්වාසය අතරත්, වෙනස නොදත්තේය.

කිරෙන් යොදය වෙන් වන්නා සේ, මිථ්‍යා විශ්වාසයෙන් සම්‍යක් දෘෂ්ටිය වෙන් වන්නට දහස් වස් පිට දහස් වස් ගත වී ගෙවී ගියේය.

අපට උරුම වී ඇති ගීත හා මහා කාව්‍යයන්හි එන දෙවි වරුන් හා වීරයන් පිළිබඳ සුරාංගනා කතාවන්ගෙන් නොයෙක් ගෝත්‍ර හා නායකයන්ගේ ඉතිහාසයත්, කල්පිත ව ගොතන ලද භූගෝල විද්‍යා-

වෙන් සැබෑ භූගෝල විද්‍යාත්මක දැනුමත්, ආදිතම මිථ්‍යා ආඛ්‍යානයන්ගෙන් තාරකා පිළිබඳ මූල් ම තොරතුරුත් වෙන් කර ගැනීම බෙහෙවින් ම අසීරුය.

තමන්ගේ ආදිතම ගීතයන් සහ මිථ්‍යා ආඛ්‍යානයන් වටා ගෙතුණු මහා කාව්‍යයන් දෙක වන ''ඉලියඩ්'' සහ ''ඔඩිසි'' ග්‍රීකයන් විසින් අප අතට පත් කොට ඇත. මේවා නම් ග්‍රීක හමුදා වන් විසින් අල්ලා ගනු ලැබූ ට්‍රෝයි නගරය වට ලෑම සහ එහි වැටීමත්, අන්තිමට සිය මවු බිම වූ ඉතැකාවට ආපසු එන තුරු විදේශයන්හි සහ මුහුදු වලත්, ඔඩිසියස් හෙවත් යුලිසස් නම් ග්‍රීක වීරයකුගේ මං මුලා වීමුත් පිළිබඳ මිථ්‍යා ආඛ්‍යානයෝය. දෙව් වරු ට්‍රෝයි නගරයේ පවුරු පදනම් අසල මිනිසුන් සමඟ උරෙනුර ගැටී සටන් කළහ. ඇතැම් දෙව් වරු පහර දෙන්නන්ගේ ද, ඇතැම්මු පහර කන්නන්ගේ ද පැත්ත ගෙන සටන් වැදුණහ. ඉදින් දෙව්යන්ගෙන් ප්‍රියතමයෙක් මාරාන්තික අනතුරකට මුහුණ පා සිටියේ නම්, දෙවියෝ ඔහු වහා එතැනින් ඉවත් කොට ආරක්ෂාව පිණිස ගෙන ගියෝය. දෙවියෝ, ඔලිම්පස් කඳු මුදුනෙහි පේස්ත කමින් සටන තව දුරටත් පවත්වා ගෙන යාමට හෝ නොයාමටත්, නැතහොත් යුද වැද සිටී දෙපිල සාමදාන කරන්නටත් සාකච්ඡා කළහ.

මේ මිථ්‍යා ආඛ්‍යානයන්හි කල්පිතයන් සමඟ සත්‍යය මිශ්‍ර වී ඇත. එහෙත් බොරුව අවසන් වන්නේත්, සත්‍යය පටන් ගන්නේත් කොහේ ද? කවර දාක හෝ ග්‍රීකයෝ ට්‍රෝයි නගරය වට ලැවෝ ද? කවර දාක හෝ ට්‍රෝයි නගරය සත්‍ය වශයෙන් ම පැවැත්තේ ද?

අන්තිමට පුරා විද්‍යාඥයකුගේ යවුලක් විසින් ඔවුන්ගේ සියලු සැකයනට විසඳුමක් දෙන තුරු, උගත්තු මේ ගැන අවුරුදු බොහෝ ගණනක් දිගින් දිගට වාද කළහ. ඉලියඩ් කාව්‍යයේ දැක්වුණු පිය සටහන් ඔස්සේ, සුළු ආසියාවට පිටත් වූ පුරා විද්‍යාඥයෝ ට්‍රෝයි නගරය ඉඳුරා ම විය හැකි යි සිතූ තන්හි නටබුන් කැණුහ!

එසමයෙහි මිනිස්සු සිය අත ළඟ පරිසරය ගැන පමණක් දැන ඇඳින සිටියෝ වූහ. ඇත්තේ හැටියට නම් වෙළෙන්දෝ සිය නැව් වලින් මුහුදු යාත්‍රා කළහ. එහෙත් එක මුහුදෙකින් පිටත යාත්‍රා කිරීම බෙහෙවින් ත්‍රාස ජනක වූවක් වූ හෙයින් ඔවුහු කිසි දාක වෙරළින් ඇතට යාත්‍රා කරන්නට, ඉදිරිපත් වන්නට පවා ධෛර්යයක් නැත්තෝ වූහ. ඒ කාලයෙහි කොම්පාසු හෝ සිතියම් නොවීණ. යාත්‍රිකයෝ ඉරු හා තරු මඟින් අහම්බෙන් මෙන් සිය ගමන් මඟ සොයා ගත්හ. මුහුදු වෙරළේ වූ උස් ගසක් හෝ උස් කඳු මුදුනක් ඔවුන්ගේ ප්‍රදීපස්ථම්භය විය.

මුහුදු දහසක් අනතුරු වසන් කොට සිටියේය. පුළුල් පෙනැලි පතුල් ඇති නැව් යම්තම් සුළඟෙකිනුදු රළ මතු පිට සසල ව ගියේය. දුබල රුවල් ඔරොත්තු දී සිටුවීම දුෂ්කර විය. මිනිසාට කිකරු වීමට සුළඟට වූවමනා නොවිණ. සුළඟ මිනිසාගේ නැව් සමඟ, රළ මත කරණම් ගසන ලී පතුරු සමඟ මෙන් දඟ කෙළේය.

මෙවන් හැම මුහුදු චාරිකාවක් ම මිනිසාගේ දැනුම් සීමා ඉඳුරා පුළුල් කෙළේය. නොදන්නා දැයෙහිත්, සුරාංගනා කතා වලත් සීමා ඇතින් ඇතට තල්ලු කැරිණ. නාවිකයන්ගෙන් නිර්භීතතමයෝ මහා සාගරය පටන් ගන්නා තැන තෙක් එපිට, ඇතින් ඇත වූ සාගරයට ඇතුළුවන මුහුදු දොරටු තෙක් යාත්‍රා කළහ. මේ සාගරය විශ්වය මෙන් අනන්තාපරිමාණ යයි ඔවුන් විසින් සිතන ලදී. ඔවුන් සිය ගම රට බලා, ආපසු පැමිණි ඉක්බිති, තමන් ලෝකාන්තය තෙක් ගිය බවත්, එය හැම පැත්තෙකින් ම මහා සාගරයෙන් වට වූ බවත් සිය මිතුරනට කියන්නට ඇත.

එහෙත් ඉන් වසර දහස් ගණනෙකින් මත්තෙහි මිනිසුන් යුරෝපයේ සිට ඉන්දියාවටත්, චීනයේ සිට යුරෝපයටත් යාත්‍රා කරනු ඇත. නාවිකයන් සාගරය තරණය කර මනුෂ්‍ය ප්‍රාණීන් වාසස්ථාන කොට

ගත් ගොඩ බිම පෘථිවි ගෝලයේ අනෙක් පස සොයා ගනු ඇත. තව ද පෘථිවිය පිළිබඳ විද්‍යාත්මක කථා න්තරයෙහි නිරූපිත සුරාංගනා කතාව තවත් බොහෝ යුගයන් තුළ පිළිබිඹු හෙළිය.

මුල් ම ගායකයෝ

ගෙවී යන එක් එක් සිය වසක් සමඟ පිවිතය පිළිබඳ ගුප්ත ස්වභාව, අපූර්වත්වය හා කරුණු නොදන්නා බව ද අඩු අඩුවෙන් ඉතිරි විය. ශිල්පියෝ තමන් තුළ ආත්ම විශ්වාසය වැඩි වැඩියෙන් ඇති කර ගැනීමට සමත් වූහ. දෙවියනට කරන යාතිකාවේ දී අඩු අඩුවෙන් අනුන්ගේ පිහිට සෙවූහ. හිරු උදාවේ දි මිටියාවතෙකින් මීදුම පටලයක් වියැකී යන්නා සේ, දෛනික පිවිතයෙන් පුද පූජා කෙමෙන් ඉවත් වී යමින් තිබිණ.

සිය ග්‍රහණය දැඩි කොට ගෙන සිටි හෙයින්, විජ්ජාකාරී ස්වභාව විවිධ සිරිත් විරිත්, සාම්ප්‍රදායික ක්‍රීඩා, නැටුම් හා ගීත වලත් රැඳී තිබිණ. එහෙත් මිනිසාගේ මනස, අර විජ්ජාකාරී ස්වභාවයන්ගේ නිවාසස්ථානය වූ යට කී දැයින් ද ඒවා පලවා හැරීමට පටන් ගත්තේය.

එහෙයින් විජ්ජාකාරී ස්වභාව පුද පූජා, නැටුම් හා ගීතයන්ගෙන් ද වහ වහා ඉවත් වෙමින් තිබිණ. ඉතිරි වූයේ හුදෙක් සරල නැටුම් හා ගීත පමණි.

කල් යාමේ දී චාරිත්‍ර විධියෙන් ගීතය වෙන් කරනු ලැබිණ. ගායකයා පුද පූජාත්මක ක්‍රීඩා වල දිත්, ගෝත්‍ර නායකයාගේ සහ ඔහුගේ සෙබළුන්ගේ සංග්‍රහ මෙසයේ දිත් ගායනය කෙළේය. හේ ආවාට ගියාට සිය විණාව වයමින් පැරණි සම්ප්‍රදායයට අනුව වචන, ස ිතය හා අභිනයත් සම්බන්ධ කර ගනිමින් ද ගායනය කෙළේය. ඒ අතර ඉඳ හිට නැටුවේ ද විය. මෙ නයින් හේ ප්‍රධාන ගායකයාගේත්, ගායක කණ්ඩායමේත් යන දෙකෙහි ම තැන ගත්තේය. ඔහු විසින් ගියත්, අත්වැල් ගියත් යන දෙක ම ගැයිණ.

එහෙත් ඔහු ගැයුවේ කුමක් ගැන ද? සටන්

බිමේ දී නිර්ගීතමයන් පලා යාමට සැලැස්වූ සිය ගෝත්‍රික නායකයන්, වීරයන් හා දෙවියන් ද ගැන හේ ගැයීය. සිය සහෝදරයන් විසින් සතුරන්ගෙන් ආපසු පලි ගැනීමට හේතු කරවා, සටන් බිමේ දී මරණයට පත් වීරයන් ගැනත් ගැයුවේය.

මේ ගීත යාතිකා හෝ මන්තර නොවීය. ඒ වනාහි සැබවින් ම තව දුරටත් නිර්ගීතත්වයට පොලොඹවනු ලබන එඩිතර ක්‍රියා පිළිබඳ වෘත්තාන්තයෝය.

ඉදින් ආදරය, වසන්තය හෝ ගෝත්‍රය පිළිබඳ වූ ගීත ගැන තතු කෙසේ ද? ඒවා ද එක් සමයෙක්හි ආවාහ විවාහ හා අවමංගලෝත්සවයන්හි දී ද, තණ කොළ කපන හෝ මිදි නෙළන අවස්ථාවන්හි දීද අනුගමික වාර්ත්‍රාංගයෝ වුහ. ඒකල්හි ගායක කණ්ඩායම් දෙකක් කෙටි ගීත කණ්ඩ මාරුවට ගයන්නට ඇත.

ඇතැම් විට තරුණියකට නුල් කටිමින් මේ ගී ගයන්නට පුළුවන. මවකට සිය දරුවා නළවමින් ගයන්නට පුළුවන.

එත්මන්හි වසන්තය පිළිබඳ ගී අවශ්‍යයෙන් ම වසන්ත සමයේ දී හෝ ආදරය පිළිබඳ ගී විවා මගුල් උළෙලක දී පමණක් ම හෝ ගයනු නොලැබේ.

වීරයන් හෝ ආදරය පිළිබඳ මුල් ම ගී කවුරුන් විසින් පැබැදුණේ ද?

ගායකයෙක් කිසි දාක, තමේ ගීයෙක රචකයා හෝ නිර්මාපකයා ලෙස නොසැලකීය. ඉදින් ඔහු සංශෝධනය හෝ වැඩි දියුණු කරන ලද්දක් වී නම් එය ද පෙර පරම්පරාවන්ගෙන් ඔහු වෙත පත් වූවක් විය.

එහෙත් යථා කාලයේ දී මිනිසා "ඔබත්වය" වෙන් කරන්නට පටන් ගත්තේය. සාමූහික කුල හැඟීම දිය වී යන්නට විය. පෙර පැවති එක්සත් බව දෙදරා ගියේය. එතැන් සිට ශිල්පියා තමා ම පිණිස වැඩ කෙළේය. තමා තුල අධිෂ්ඨානය සපුරන මෙවලමක් නොවන බව වැඩි දුරටත් ඔහුට හැඟිණ.

සිය වස් කිපයකට පසු මෙගරාහි තියෝග්නිස් මෙසේ ලිව්වේය.

''මගේ කලා කෞශල්‍යයේ ඵලය වූ මේ පද්‍යයන් මත මගේ මුද්‍රාව මවිසින් තබා ඇත. කිසිවෙක් ඒවා සොරකම් නොකෙරෙත්වා! වෙනස් නොකෙරෙත්වා! මින් මතු තනි තනිවත්, හැම දෙනාත් මෙසේ කියන්නෝය. මේ පද්‍යයෝ මෙගරාහි තියෝග්නිස් විසින් නිර්මාණය කරන ලද්දෝය!''

සාමූහික – සමානාත්මතා වාදී සමාජ ක්‍රමයෙක සාමාජිකයෙක් කවර දාක වත් මෙසේ කියා නැත.

ක්‍රමයෙන් මිනිසා ''මම'' යන වචනය, වඩාත් නිරතුරු ව යොදන්නට පටන් ගත්තේය. වැඩ කරන්නේ තමා නොව, තමා මහින් වෙනත් කෙනෙක් වැඩ කරති යි මිනිසා විශ්වාස කළ යුගය බොහෝ කලකට පෙර ගෙවී ගොස් තිබිණ. කිවිඳියක්, පහත එන ප්‍රකාශයෙන් තමන්ගේ සහජ ගීතමය කුසලතාව දෙවියන්ගෙන් ලැබුණක් බව කියමින්, නමුත් තමාගේ හැකියාව ද අමතක නොකර, ගී ගායනයට හා රචනයට තමන් පෙළඹවූ කලාපිත දෙව් දුන් නවදෙනා ගැන තව දුරටත් කතා කරයි.

''මා අමතක නොකරන බවට දෙවියෝ පොරොන්දු වී සිටිත්!''

පැරණි ග්‍රීක කිවිඳියක වූ සැපෝගේ මේ කියමන් පැරණි මතය, නව මතය හා සම්බන්ධ වෙයි. පතල් කරුවකු විසින් කන්දක් තුළ ලෝහ මිශ්‍ර පස් සොයා ගන්නා සේ වාග් වාතුර්ය දායාදය තමාගේ බස තුළින් තමාට ම ලැබුණක් නොව, කලාපති දෙවි වූ මූසෙස් විසින් ප්‍රදානය කරන ලද්දක් බව ඕ විශ්වාස කළාය. එහෙත් එම කියුමෙහි ම තමාගේ නම අමතක නොවනු ඇතැ යි දන්නා නිර්මාණිකයකුගේ උද්දාමය හෙවත් කිවියකුගේ අභිමානය අපට අත වනයි.

මිනිසා මෙසේ ප්‍රගතියට ගියේය. වඩ වඩාත් ඉහළ නැග්ගේය. ඔහුගේ ක්ෂිතිජය වඩ වඩාත් පුළුල් වූයේය.

චතුර්ථික අවධියේ මුල් කාලයේ
පැලෑටි සහ සත්ත්ව ලෝකය

▲මිනිසාගේ ආදි යුගයේ නැවතුම්පොළවල්

1

සත්ත්ව ලෝකය:

ට්‍රොගන්ථීරියස් ඇතෙක්,
රයිනෝසිරස්,
කඩුදත්ඇති ව්‍යාඝ්‍රයෙක්,
යෝධ ත්‍රුවෙක්,
වල් අශ්වයෙක්

ආදි යුගයේ යුරෝපීය පරිසරය උෂ්ණ දේශගුණය සහිත සත්ත්වයන් තුළ පිවත්වූහ.

2

1. චතුර්ථික අවධියේ පැලෑටි ලෝකය හා සත්ත්ව ලෝකය දක්වෙන (සෝවියට් දේශය) සිතියමක්

2. ස්ත්‍රී පිළිමයක්. පක්ෂි රූපයක්. පැලියොලිතික සමය (පුරාණ පාෂාණ යුගය). අඩුරුද්ද 100000–40000 පමණ පූර්ව අවධිය

3. ග්ලැසියර් අවධියේ පැලෑටි ලෝකය හා සත්ත්ව ලෝකය පෙන්වන (සෝවියට් දේශය) සිතියමක්

4. උෂ්ණාත් ග්ලැසියර අවධිය පෙන්වන (සෝවියට් දේශයේ යුරෝපීය කොටස) සිතියමක්

5. ගලෙහි අඳන ලද සත්ත්ව රූප. ආදි පැලියොලිතික සමයේ ග්‍රාමීය සත්ත්වානුරූපක කලාව

ග්ලැසියර අවධියේ පැලෑටි ලෝකය
සහ සත්ත්ව ලෝකය

3

උපරිම ග්ලැසියර් තත්ත්වය

අවසාන ග්ලැසියර් තත්ත්වය

ප්‍රස්ට්වියන් යුගයේ ප්‍රධාන නැවතුම් පොළවල්

පශ්චාත් ග්ලැසියර අවධියේ
සත්ව ලෝකය සහ ප්‍රධාන
මෙසොලිතික නැවතුම්පොළවල්

4

සත්ත්ව ලෝකය:

මැමත් ඇතා, ලොමි සහිත රයිනොසිරස්, ලෙන් වලහා, රයිසන්, ගුැව බූරා, වල් අශ්වයා

නැවතුම්පොළවල්

1. කුන්දා
2. දෙමෙෂිය
3. ස්ත්‍රාසිනෝ
4. රසීලෙවස්කය
5. යෙලින් ඔස්ට්‍රොව්
6. ෆ්‍රෙමාවිය
7. පෂ්ටොවිගින
8. මෙසොවිස්තොය
9. ශ්‍රීමෙනිකි
10. සල් ඉල්-කෝන
11. නිශ්නෙදිවෙව්ස්කය
12. කසා-ඉලානවිස්කය
13. ඕරිව්ස්තිංනොව්සියානික්

5



6. පැලියොලිතික සමයේ පාෂාන පිඹිම

7. පැලියොලිතික සමයේ අස්ථි (ඇට) වලින් නිවැරු ආභරණ

6

7

8. පාෂාන යුගයේ ඔන්දර නිපදවූ හැඩි

9. ඔන්දර නිපදවීම සඳහා පාවිච්චි කරන ලද ලැල්ලක්

10. පාෂාන පොරවක් හා මිටියක්. පැලියොලිතික සමය

11. සෝඩියට දේශයේ ආසියානු කොටසෙහි සොයාගන්නා ලද අස්ථිමය (ඇට) රූප සහ ආභරණ. අවසාන පැලියොලිතික සමය (වර්ෂ 35000–10000 පෙර)

8

10

9

11

12

13

14

16

15

12. පාෂාන මිටි. වලස් රූපයක්. මෙසොලිතික (මධ්‍යම පාෂාන) සමය. වර්ෂ 10000–5000 පෙර

13. මෙසොලිතික සමයේ වැයක්

14. පාෂාන අවධාරයක් මෙසොලිතික සමය

15. වල්දෑරු හෙල්ලයක සහ ඊතලයක පාෂාන තුඩු. මෙසොලිතික සමය

17

18 19

16. හෙලි තුඩක්

17. පාෂාන වීදිමේ හා ඔප දැමීමේ නාක්ෂණය

18. පාෂාන සුරුනයක්. මෙසොලිතික සමය

19. ඇටවලින් සාදන ලද බිලි කටු

20. ඇටවලින් සාදන ලද ඇටුලුම් බිලි. මෙසොලිතික සමය

20

21

24

22

25

23

21. කුණ්ඩ කර්මාන්තය (ක්‍රි. පූ. වර්ෂ 6000–5000)

22,23,25,27,29. මැටි භාජන. නියොලිතික සමය (නව පාෂාණ යුගය) ක්‍රි. පූ. වර්ෂ 5000–2000

24,26,28. ලෝහ භාණ්ඩ. ලෝහඩ සමයේ අවසානය. ක්‍රි පූර්ව වර්ෂ 2000–500

26



27

28

29

30

31



32

31, 32, 33, 34, 35. නියොලිතික හා ආදි ලෝකඩ සමයට අයත් මැටි භාජන. ක්‍රි. පූ. වර්ෂ 5000–2500.

33

36

34



37

35

30,36,37. සත්ත්ව හා අර්ධ මිනිස් මිනුම්, ගලේ මිනුම් මවෙනසි

39 38



38,40,41. කතරෝ (දකුණු දොරේ කඳුවැටිය) ලෙනෙහි පිටපත් කරගන්නා ලද පැලියොලිතික චිත්‍ර

40

41

39. නියොලිතික සමයේ ඇටි සඳුන්

42. අවහාරයක්. නියොලිතික සමය

42

43



44

45

46

43. කපෙවෙ ලෙනට ඇතුල්වන දොරටුව

44. ලෝහ වැඩ සඳහා පාවිච්චි කරන ලද ගල් අච්චුවක්. අය-රිලන්කය

45. ලෙන් සිතුවමක්. කපෙවෙ ලෙන

46. ලෝකඩ ආභරණ

47. ප්‍රංශයේ. නියොලිතික සමය. දකුණු අප්‍රිකාවේ බුෂ්මෑන් ගෝත්‍රිකයින්ගේ ලෙන් සිතුවම්

48. රුමේනියාවේ සොයාගත් නියොලිතික සමයට අයත් රූපයක්

49. සහරා වෙඩරුන්ගේ කලා කෘති. නියොලිතික සමය

47



48

49

50

52



51

53

50. කැටයම් සහිත ගලක්. දඩයම් රූහුම් රූපයකි. රෝමය. නියොලිතික සමය

51. කොටහලද රූපයක් සහිත ගලක්. රුමේනියාවෙන් සොයාගත් නියොලිතික සමයට අයත් දඩයම් රූහුම් රූපයකි

52. ග්‍රහතාරකා සිහිවටනයක්. නියොලිතික සමය

54

57

53–56. ඇටවලින් නිමවන ලද රූප. නියොලිතික සමය. රුමේනියාව

57. සුවිය දේවාලය. නියොලිතික සමය. එංගලන්තය

58. වීලිපුජායාය. නියොලිතික සමය. එංගලන්තය

59. නැටුම් රූපයක් හොඩයක්. නියොලිතික සමය. දකුණු අප්‍රිකාවේ හෙලා කෑහි

55

58

56

59

60. ගළවක හැඩයක් ඇති බඳුනක් පෙන්නුම් කරන පිඹිමයක්. නියොලිතික සමය. රුමේනියාව

61,64. ඇටවලින් තෙලෙන ලද පිඹිම. පැලියොලිතික සමය. රුමේනියාව

62. පිඹිමයක්. නියොලිතික සමය. රුමේනියාව

63. පිඹිමයක කොටසක්. නියොලිතික සමය. රුමේනියාව

61

62

60

63

65. මිනිස් ළදුනෙක් සහිත දේව රූප නියොලිතික සමය. කොරියකා දිවයින

64

65

66. සුදු සායමින් ඇඳ ඇති ගලෙහි නෙලන ලද සත්ත්ව රූප. නියොලිතික සමය. නෝර්වේජියාව

67. ප්‍රජා සංකේතයක් සමග රථවෙකුගේ රූපයක්. නියොලිතික සමය

66

67

68. දුව ද හා සර්පයින් සමෙ දේව (ප්‍රජක) රූප: පහළ - දෙ-වියන් සදින්නෙක්. යකඩ යුගය. ඉතාලිය

69. ඇත් දෙයක අදිනලද මැ-දත් ඇත් රූපයක්. නියොලිතික සමය



68

70. සුදු හා රන් පැහැයෙන් අඳින ලද ළුව රංචුවක්. දකුණු අප්‍රිකානු කලා කෘතියකි. නියොලිතික සමය

71. ස්ත්‍රී පිළිමයක්. සත්‍රිකත්වයේ අධිපති දේවතාවාට පෙන්නුම් කරන සංකේතයකි

72. ඉතලියානු ළිඳ පදිංචිකරුවන් විසින් අඳින ලද සිතියම: අසරුවෙක්, විවිධ සත්තු ලී කණු වෙත සැදි ගෙයක්

73. ලැහුණන් ගෝත්‍රික කලා කෘති. දකුණු අප්‍රිකාවේ කේප්ටවුන් ප්‍රාන්තයේ සොයාගන්නා ලද්දකි.

69

70



71

72

73

74

74. ගිනි කඳු ලාවා වලින් නිමි දැවැන්ත පිළිමයක්. පස්ගී දිවයින. පොලිනීසියාව

75

75. අප්‍රිකාවේ ගෙනින් කලා කෘති. ලෝකඩ පැන්ථරයෙක්

සංසුද්ධ මිනිසා

ආදී මිනිසා

සෝලෝ මිනිසා

චතුර්විත අවධිය

අවුරුදු 150000 පෙර

අවුරුදු 40000 පෙර

අවුරුදු මිලියන
මිනිසා

නියැන්ඩර්තාල්
මිනිසා

ක්‍රෝ-මැග්නියන්,
ඉන්ද ඉලෙන් සහ
රොඩේසොද මිනිසුන්

නූතන මිනිසා

ප්‍රගති ප්‍රකාශක මන්දිර

ඉඳින්. සෙහේ

ඒත් මේ මොහොතේ ප්‍රාග්ඓතිහාසික මානවයා ගැන වූ කාරුණිකත්වය කියා නිම කළා පමණි. මේ කතා ඔවුන් වාහේ බිම් සමතලාවේ වෙන්ගැනුම් තරම් ඈතට යන බවත් යයි.

මේ කාර්යය එක ගසන්නට පෙර අපි තොහොත් මොත් කියැලුවෙමු.

මෙයත් වෙයෝන්. මිනිසා හෙළ වන තෙක් ගිරිපිට යකඩ ඔවින් වෙනස්වෙමින් හා වර්ගයෙට යමින් පැවතියේ තෙවේද යි අපි ඉංග්‍රීසි ජාතික වාර්ෂ ඩාවින් හා රුසියානු විද්‍යාඥයින් වන වලදිමීර් කවලියෙවිච්කි හා ක්ලිමෙන්ත් තිමිරියාසිවිගෙන් ද උගත්මු.

ඒ සඳහාව යම් විද්‍යාඥයන්, ඉතිහාසඥයන් හා ගවේෂකයන් වසින් ලියන ලද වෙනත් තොහොත් මොත්ද කියැලුවෙමු.

ඉතින් මානව ඉතිහාසය ගැන වසන් ඉගෙන ගන්නට යනවත් පුරෙහෝ නම් එය කළ යුදු කරන්න. මානව ශාස්ත්‍රයේ සවිවිධතයත්, විශි ෂ්ට වියත් ගැන අධ්‍යයනය කළ විද්‍යාඥයන් වසින් ලියා දැති ඳාන සම්භාරය විමිනාද පුලාගුයන් වෙතට යන්න.

එහේ ඉඳක්කිය පුහේ යන ඳාන සම්භාරය නැගෙනි මහා තෙදිරහේ සවිවත වෙතට ගෙනවුත් මෙහේ කියන්නවයි:

"පිවිසෙන්න!"